199 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 199 - இல. 9
**Volume 199 - No. 9**

2011 ජුනි 09 වන බ්‍රහස්පතින්දා
2011 யூன் 09, வியாழக்கிழமை
**Thursday, 09th June, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ත්‍රිවිධ හමුදා නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් ගණනය කිරීම

**පාසල් ක්ෂේත්‍රයේ පැන නැඟී ඇති ගැටලු:**
අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත -[ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය]-
පළමුවන වර කියවන ලදී

**බුද්ධිමය දේපළ පනත:**
නියෝග

**සත්ව පනත:**
නියෝග

**කල්තැබීමේ යෝජනාව:**
මත්ස්‍ය සම්පත ආරක්ෂා කර ගැනීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா**
முப்படை அதிகாரிகளின் ஓய்வூதியத்தைக் கணித்தல்

**பாடசாலை முறைமையில் எழுந்துள்ள பிரச்சினைகள்:**
கல்வி அமைச்சரினது கூற்று

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
ஜயந்திபுர நலன்புரிச் சங்கம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம]–
முதன்முறை மதிப்பிடப்பட்டது

**புலமைச் சொத்துச் சட்டம்:**
ஒழுங்குவிதிகள்

**விலங்குச் சட்டம்:**
ஒழுங்குவிதிகள்

**ஒத்திவைப்புப் பிரேரணை:**
கடல்சார் வளங்களைப் பாதுகாத்தல்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Calculation of Pension for Personnel of Armed Forces

PROBLEMS ARISEN IN SCHOOL SYSTEM:
Statement By Minister of Education

PRIVATE MEMBERS’ BILLS:
Jayanthipura Subasadaka Sangamaya (Incorporation) – [The Hon. (Mrs.) Sriyani Wijewickrama ]-
Read the First time

INTELLECTUAL PROPERTY ACT:
Regulations

ANIMALS ACT:
Regulations

ADJOURNMENT MOTION:
Conservation of Fisheries Resources

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2011 ජුනි 09 වන බ්‍රහස්පතින්දා*
*2011 யூன் 09, வியாழக்கிழமை*
*Thursday, 09th June, 2011*

*අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.*
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2011 ජුනි මස 09 වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

(203 වැනි අධිකාරය වන) මෝටර් රථ ප්‍රවාහන පනතේ 237 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 9 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ සහ එම පනතේ 21, 22, 23 සහ 24 වැනි වගන්ති සමඟ කියවිය යුතු 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2011 මැයි මස 04 දිනැති අංක 1704/09 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග.-[ ගරු ප්‍රවාහන අමාත්‍ය කුමාර වෙල්ගම මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව
## நிலைக்கட்டளை இல. 47 (5)இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கை
## REPORTS PRESENTED UNDER STANDING ORDER NO. 47(5)

### ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### "லெஸ்டர் ஜேம்ஸ் பீரிஸ் மற்றும் சுமித்ரா பீரிஸ் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### LESTER JAMES PERIES AND SUMITRA PERIES FOUNDATION (INCORPORATION) BILL

"ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව" - [ගරු ටී.බී. ඒකනායක මහතා]

*පනත් කෙටුම්පත 2011 ජුනි මස 10 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.*
*சட்டமூலம் 2011 யூன் 10, வெள்ளிக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Bill ordered to be read a Second time upon Friday, 10th June, 2011.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ජීවන් කුමාරණතුංග මහතා - පැමිණ නැත.

**ගරු මහින්ද සමරසිංහ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පානදුර, මාලමුල්ල, මණ්ඩාවල පාර, අංක 200 දරන ස්ථානයෙහි පදිංචි එම්.ටී. පීරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කිරිවත්තුඩුව, තලගල, අංක 191/බී.දරන ස්ථානයෙහි පදිංචි එම්. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඩිලාන් පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා - පැමිණ නැත.

ගරු පාඨලී චම්පික රණවක මහතා - පැමිණ නැත.

ගරු ෆයිසර් මුස්තාපා මහතා - පැමිණ නැත.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුරය, ප්‍රීමන් මාවත, අංක 512/ඒ. දරන ස්ථානයෙහි පදිංචි ටී.සී. ඩේරියස් ද සා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අම්බලන්තොට, රුහුණු රිදියගම, බෝලාන, අංක 04 දරන ස්ථානයෙහි පදිංචි ජී.එම්.කේ. ලාලනී ප්‍රසන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අම්බලන්තොට, රජයේ වී ගොවිපොළෙහි පදිංචි රාජපක්ෂ පතිරණගේ චන්ද්‍රපාල මහතාගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සනත් ජයසූරිය මහතා - පැමිණ නැත.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අකුරැස්ස, බෝපගොඩ, "සුරම්‍ය" නිවසෙහි පදිංචි දයාවතී හෙට්ටිආරච්චි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.
ගරු රොෂාන් රණසිංහ මහතා - පැමිණ නැත.
ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

**ගරු පොන්. සෙල්වරාසා මහතා**
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)
Hon. Deputy Speaker, I present a petition from Mr. Kandaiah Kulanthaivelu of No. 29, Main Street, Periyakallar 01, Kallar, Eastern Province.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මාලඹේ, උතුරු තලංගම, මිල්ලගහවත්ත පාර, අංක 779/1 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එම්.ජේ. මහවිතාන මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල් : යටිතල පහසුකම්
### வெலிப்பிட்டிய கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள்: உட்கட்டமைப்பு வசதிகள்
### SCHOOLS ADMINISTERED BY WELIPITIYA DIVISIONAL EDUCATION OFFICE : INFRASTRUCTURE FACILITIES

0804/'10

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවන්ගේ ඌනතාවන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව ;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩු පාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩු පාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் அகுரெஸ்ஸ வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் வெலிப்பிட்டிய கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலைகளில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கையையும்;

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கையையும்;

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கையையும்;

(vi) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலைகளின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்குமென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the Government schools administered by the Welipitiya Divisional Education Office of the Akuressa Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools -

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers' quarters without electricity;

(v) the number of schools with furniture requirements; and

(vi) the names, addresses and telephone numbers of schools with aforesaid shortages?

(c) Will he state-

(i) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

(ii0 if so, the period of time taken for it?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඌනතාවන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) විදුලිය නොමැති පාසල් 01

(ii) පුස්තකාල සහ විද්‍යාගාර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ. සමහර පාසල්වල පංති කාමරය තුළ කුඩා පුස්තකාල ඇත.

(iii) ගුරු නිවාස සංඛ්‍යාව 04

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව 04

(v) ලී භාණ්ඩ අවශ්‍යතා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දේ.

(vi) සඳහන් කරමි. ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි

(ඇ) (i) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත කටයුතු කරමි.

(ii) අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*

*Annex tabled:*

විදුලිය නොමැති පාසල් - වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | කොට්ඨාසය | පාසලේ නම | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| 01 | වැලිපිටිය | මාර/ඉඹීබාවෙල ක.වි. | වැලිගම | - |

පුස්තකාල පහසුකම් නොමැති පාසල් - වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | කොට්ඨාසය | පාසලේ නම | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| 01 | වැලිපිටිය | මාර/සහිරා ම.වි. | වැලිගම | – |
| 02 | වැලිපිටිය | මාර/ජඹුරගොඩ ම.වි. | වැලිගම | – |
| 03 | වැලිපිටිය | මාර/කනංකේ සිරි පැරකුම්බා ම.ම.වි | කනංකේ කඩවීදිය | – |
| 04 | වැලිපිටිය | මාර/උඩුකාව ක.වි. | උඩුකාව | – |
| 05 | වැලිපිටිය | මාර/පල්ලල ක.වි. | වැලිගම | – |
| 06 | වැලිපිටිය | මාර/වැල්ලාන ගුණතිලක ක.වි. | වැලිගම | – |
| 07 | වැලිපිටිය | මාර/ඛරවදෙනිය ක.වි. | වැලිගම | – |
| 08 | වැලිපිටිය | මාර/මකුළුවලහේන ක.වි. | කනංකේ කඩවීදිය | – |
| 09 | වැලිපිටිය | මාර/එළුවාවල ක.වි. | දෙනිපිටිය | – |
| 10 | වැලිපිටිය | මාර/පැනැටියන සද්ධාතිස්ස ක.වි. | වැලිගම | – |
| 11 | වැලිපිටිය | මාර/කනංකේ ආදර්ශ ක.වි. | කනංකේ කඩවීදිය | – |
| 12 | වැලිපිටිය | මාර/පුහුලහේන ක.වි. | කනංකේ කඩවීදිය | – |
| 13 | වැලිපිටිය | මාර/ඛටපොත ක.වි. | වැලිගම | – |
| 14 | වැලිපිටිය | මාර/ඉඹිබාවල ක.වි. | වැලිගම | – |

විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් - වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | කොට්ඨාසය | පාසලේ නම | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| 01 | වැලිපිටිය | මාර/සහිරා ම.වි. | වැලිගම | - |
| 02 | වැලිපිටිය | මාර/වරකපිටිය ම.වි. | දෙනිපිටිය | - |
| 03 | වැලිපිටිය | මාර/අන්නූර් මුස්ලිම් බා.ම.වි | දෙනිපිටිය | - |
| 04 | වැලිපිටිය | මාර/වටගෙදර මුල්ල ක.වි. | දෙනිපිටිය | - |
| 05 | වැලිපිටිය | මාර/අස්සපා ක.වි. | දෙනිපිටිය | - |
| 06 | වැලිපිටිය | මාර/කඩොල්ගල්ල ක.වි. | දෙනිපිටිය | - |
| 07 | වැලිපිටිය | මාර/උඩුකාව ක.වි. | උඩුකාව | - |
| 08 | වැලිපිටිය | මාර/ජඹුරගොඩ ම.වි. | වැලිගම | - |
| 09 | වැලිපිටිය | මාර/කොක්මාදුව ක.වි. | කොක්මාදුව | - |
| 10 | වැලිපිටිය | මාර/පලල්ල ක.වි. | කනංකේ කඩවීදිය | - |
| 11 | වැලිපිටිය | මාර/මකුළුවලහේන ක.වි. | පිටබැද්දර | - |
| 12 | වැලිපිටිය | මාර/වැල්ලාන ගුණතිලක ක.වි. | වැලිගම | - |
| 13 | වැලිපිටිය | මාර/බරවදෙනිය ක.වි. | වැලිගම | - |
| 14 | වැලිපිටිය | මාර/ඉබ්බාවල ක.වි. | වැලිගම | - |

ලී බඩු නොමැති පාසල් - වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | කොට්ඨාසය | පාසලේ නම | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| 01 | වැලිපිටිය | මාර/දෙනිපිටිය ම.වි. | දෙනිපිටිය | 041-2252385 |
| 02 | වැලිපිටිය | මාර/වරකපිටිය ම.වි. | දෙනිපිටිය | - |
| 03 | වැලිපිටිය | මාර/සහිරා ම.වි. | වැලිගම | - |
| 04 | වැලිපිටිය | මාර/ජඹුරගොඩ ම.වි. | වැලිගම | - |
| 05 | වැලිපිටිය | මාර/කොක්මාදුව ක.වි. | වැලිගම | - |
| 06 | වැලිපිටිය | මාර/දෙනිපිටිය ළදරු ක.වි. | දෙනිපිටිය | 041-2251931 |
| 07 | වැලිපිටිය | මාර/කනංකේ ආදර්ශ ක.වි. | කනංකේ කඩවීදිය | - |
| 08 | වැලිපිටිය | මාර/උඩුකාව ක.වි. | උඩුකාව | - |
| 09 | වැලිපිටිය | මාර/අස්සපා ක.වි. | දෙනිපිටිය | - |
| 10 | වැලිපිටිය | මාර/අන්නුර මුස්ලිම් බාලිකා ක.වි. | දෙනිපිටිය | - |
| 11 | වැලිපිටිය | මාර/වැල්ලාන ගුණතිලක ම.වි. | වැලිගම | - |
| 12 | වැලිපිටිය | මාර/කඩොල්ල ගල්ල ක.වි. | දෙනිපිටිය | 041-5679516 |
| 13 | වැලිපිටිය | මාර/කනංකේ සිරිපැරකුම්බා ම.ම.වි. | කනංකේ කඩවීදිය | 091-3902728 |
| 14 | වැලිපිටිය | මාර/ගල්ලල ම.වි. | වැලිගම | - |
| 15 | වැලිපිටිය | මාර/වටගෙදරමුල්ල ක.වි. | දෙනිපිටිය | - |

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න නැහැ.

## උපාධිධාරී විරැකියා ප්‍රශ්නය: ක්‍රියාමාර්ග
## பட்டதாரிகளின் தொழில் பிரச்சினை:நடவடிக்கை
## UNEMPLOYMENT PROBLEM OF GRADUATES: MEASURES TAKEN

1025/'10

5. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2007, 2008, 2009 සහ 2010 යන වර්ෂවලදී වාර්තා වූ රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංඛ්‍යාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම උදෙසා රජය ගන්නා වූ ක්‍රියාමාර්ගයන් කවරේද;

(iii) එම පියවර උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

வினைத்திறன் மேம்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2007, 2008, 2009 மற்றும் 2010 ஆம் ஆண்டுகளில் அறிக்கையிடப்பட்ட தொழிலற்ற பட்டதாரிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) பட்டதாரிகளின் தொழில் பிரச்சினையைத் தீர்ப்பதற்கு அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) இந்நடவடிக்கைகள், பட்டதாரிகளின் தொழில் பிரச்சினையைத் தீர்ப்பதற்கு போதியனவா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Productivity Promotion:

(a) Will he state-

(i) separately, the number of unemployed graduates recorded in the years 2007, 2008 and 2010;

(ii) the measures that are to be taken by the Government to solve the employment problem of graduates; and

(iii) whether such measures are adequate to solve the employment problem of graduates?

(b) If not, why ?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)

(අ) (i) මාගේ අමාත්‍යාංශය මඟින් සහ ඊට පෙර පැවති කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද සමීක්ෂණයන්ට අනුව 2007 සිට 2010 දක්වා එක් එක් වර්ෂයන් තුළ ඇස්තමේන්තුගත රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාවන් පහත පරිදි වේ.

| වර්ෂය | ඇස්තමේන්තුගත රැකියා විරහිත උපාධිධාරී සංඛ්‍යාව |
|---|---|
| 2007 | 11,930 |
| 2008 | 17,339 |
| 2009 | 22,560 |
| 2010 | 28,720 |

(ii) 1. රාජ්‍ය අංශයේ පවතින පුරප්පාඩු සඳහා විධිමත් බඳවා ගැනීමේ ක්‍රමවේදයන්ට අනුකූලව බඳවා ගැනීම් සිදු කිරීම.

2. යුද්ධමය වාතාවරණය අවසන් වීමත් සමඟ ඇති කෙරෙන වේගවත් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය යටතේ පවතින රැකියා

අවස්ථාවන්ට ගැළපෙන පරිදි රැකියා විරහිත උපාධිධාරීන්ගේ රැකියා යෝග්‍යතාව වර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම අරඹා ඇත.

3. උපාධිධාරීන් ඇතුළු සියලු රැකියා විරහිත අයවලුන් ස්වයං රැකියා ක්ෂේත්‍රයන්ට යොමු කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සම්බන්ධීකරණයෙන් සිදු කෙරේ.

4. උපාධිධාරීන් ඇතුළු සියලු රැකියා අපේක්ෂකයන්ට සුදුසු රැකියා අවස්ථා හඳුනා ගැනීමේ පහසුකම් සැලසීම පිණිස මෙම අමාත්‍යාංශය යටතේ රැකියා පියස (jobs net) ආයතනයද, මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවද රැකියා තොරතුරු සම්බන්ධීකරණ (job matching services) සේවාවන් පවත්වාගෙන යයි.

5. දැනට රැකියා විරහිතව සිටින උපාධිධාරීන් සඳහා රජයේ රැකියා අවස්ථා තවදුරටත් පුළුල් කිරීමේ හැකියාව පිළිබඳව මේ වන විට ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරමින් පවතී.

(iii) උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය පිළිබඳව වර්තමාන රජය ප්‍රමාණවත් පියවර ගෙන ඇත. 2005 වර්ෂය දක්වා රැකියා විරහිතව සිටි සියලු උපාධිධාරීන්ගේ ගැටලු සම්පූර්ණයෙන් විසඳීමට මෙම රජය ක්‍රියා කළ අතර ඉන් පසු රැකියා වෙළෙඳ පොළට පිවිසෙන උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා පුළුල් කිරීමට පහත සඳහන් පියවර ගන්නා ලදී.

එනම්, උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවයට පවතින රැකියා අවස්ථාවන් ප්‍රමාණවත් නොවීම මෙන්ම එම උපාධිධාරීන්ගේ හැකියාවන් ශ්‍රම වෙළෙඳ පොළ අවශ්‍යතාවන්ට නොගැළපීම ද -skills mismatch- රැකියා විරහිත උපාධිධාරීන්ගේම ආකල්පද බලපායි. විශේෂයෙන්ම රජයේ රැකියා අවස්ථා පමණක් අපේක්ෂා කරන උපාධිධාරීහු විශාල ප්‍රමාණයක්ද තවමත් සිටිති.

මෙම තත්ත්වයට පිළියම් ලෙස, ඉහත දැක්වූ පියවරයන්ට අමතරව විශ්වවිද්‍යාලයන්හි විෂය මාලා සංවර්ධනය හා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ පෞරුෂ වර්ධනය කිරීම මඟින් ඔවුන් වර්තමාන ශ්‍රම වෙළෙඳ පොළට ගැළපෙන සේ සංවර්ධනය කිරීමට ද රජය දැනටමත් පියවර ගෙන ඇත.

(ආ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
( பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
( மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට සමා වෙලා අතුරු ප්‍රශ්නවලට පෙර (අ) (i) පිළිතුරේ කරුණු ටික පොඩ්ඩක් නැවත දැන ගන්න පුළුවන්ද? ගරු ඇමතිතුමනි, 2007, 2008, 2009 හා 2010 උපාධිධාරීන් සංඛ්‍යාව පොඩ්ඩක් කියනවාද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

(අ) (i) පිළිතුරේ, 2007 වර්ෂයේ 11,930යි. 2008 වර්ෂයේ 17,339යි. 2009 වර්ෂයේ 22,560යි. 2010 වර්ෂයේ 28,720යි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

බොහොම ස්තුතියි ගරු ඇමතිතුමනි. මගේ අතුරු ප්‍රශ්න 3ක් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අමාත්‍යතුමා පිළිතුරු දුන් ආකාරයට මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි.

අමාත්‍යතුමා සඳහන් කරපු දත්තයන්ට අනුකූලව 2007, 2008, 2009, 2010 වසරවල උපාධිධාරීන් 80,000කට වැඩි ප්‍රමාණයක් විරැකියා පෝලිමේ සිටිනවා. විශේෂයෙන්ම පසු ගිය දවසක මාධ්‍ය හරහා දැන ගන්නට ලැබුණා, උපාධිධාරීන් 15,000ක් බඳවා ගැනීමට වර්තමාන රජය කටයුතු කරනවා කියා. මා අහන්න කැමැතියි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. කුමන පදනමක් මතද මෙම උපාධිධාරීන් 15,000 බඳවා ගන්නට කටයුතු කරන්නේ?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ඇත්තටම ඒ ගැන තවම හරියට තීරණයක් අර ගෙන නැහැ. ඉදිරි කාලයේදී එය ගැසට් කරාවි. රජයේ බඳවා ගැනීමේ පටිපාටියක් තිබෙනවා. රජයේ බඳවා ගැනීමේ පටිපාටියෙන් පරිබාහිරව කිසිම බඳවා ගැනීමක් කරන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 2.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

දැන් අමාත්‍යතුමා සඳහන් කරපු දත්තයන්ට අනුකූලව අපේ රටේ උපාධිධාරීන් 80,000කට වැඩි ප්‍රමාණයක් විරැකියාවෙන් පෙළෙනවා. 15,000කට රැකියා සපයන කොට තවත් 65,000ක් ඉතිරි වෙනවා ඒ විරැකියා පෝලිමේ. මම අහන්න කැමැතියි, ඒ 65,000ට රැකියා සපයන්නට කොපමණ කාලයක් ගත කරනවාද කියලා.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

මේක ඇත්තටම සරල ප්‍රශ්නයක් නොවෙයි මගේ මිත්‍ර සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මේක සරල උත්තරයක් දෙන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මේක ඇත්තටම ප්‍රශ්නයක්. නමුත් අද මේ රටේ පෞද්ගලික අංශයේ රැකියා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒකයි මා කිව්වේ විශේෂයෙන්ම මෘදු තාක්ෂණයන් -soft skills- පිළිබඳව මේ උපාධිධාරීන් දැනුවත් කරලා පෞද්ගලික අංශයට යැමට ඔවුන්ගේ ආකල්ප වෙනසක් කරන්න ඕනෑ කියා. හැම ඉරිදා පත්තරයක්ම ගත්තොත් පෞද්ගලික අංශයේ රැකියා -හොඳ උසස් ගණයේ රැකියා- හත්අටදාහකට වැඩිය තිබෙන බව සඳහන් වෙනවා.

ඉතින් ඔවුන්ගේ ඒ ආකල්ප වෙනස තමයි මේ කර ගෙන යන්නේ. මේකට ටික කාලයක් ගත වෙයි. ඒ තුළින් පමණක් තවත් රැකියා දහස් ගණනාවක් දෙන්නට පුළුවන් වනවා. නායකත්ව පුහුණුව වාගේම ඔබතුමා දන්නවා soft skills කියන්නේ මොනවාද කියලා. පෞරුෂත්වය වාගේ දේවල්, ඉංග්‍රීසි දැනුම, මෘදු තාක්ෂණය -soft skills - පිළිබඳ දැනුම ලබා දීමෙන් -අද විශාල වශයෙන් මේ වැඩ පිළිවෙළ කෙරී ගෙන යන අවස්ථාවක්- අපි විශ්වාස කරනවා, ඉදිරි කාලයේ දී සෑහෙන පිරිසකට මේ තුළින් රැකී රක්ෂා සපයා දෙන්නට පුළුවන් වෙයි කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 3.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, විරැකියාවෙන් පෙළෙන උපාධිධාරීන් 80,000ක් ඉන්නවා. ඒ අයගෙන් 15,000ක් රාජ්‍ය ක්ෂේත්‍රයට බඳවා ගන්නවාය කියලා කියනවා. ඉතිරි 65,000ට රාජ්‍ය ක්ෂේත්‍රය තුළ රැකියා ලබා දෙනවාය කියලා සහතිකයක් මේ ගරු සභාවට ලබා දෙනවාද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, ඔබතුමා යි, මම යි, දන්නවා නේ. 2001- 2003 අපේ කාලයේ උපාධිධාරීන් තබා, මැස්සෙකුටවත් රක්ෂාවක් දුන්නේ නැති අපි, අර වෙඩි කාපු කොල්ලෝ දෙන්නාගේ සහෝදරයෝ දෙන්නාටවත් එදා රක්ෂාවක් දුන්නේ නැති අපි, මේ කුමන කථාද? අපට මේ ගැන හරියටම අවුරුද්ද කියන්න බැහැ. නමුත්- [බාධා කිරීමක්] අනිවාර්යෙන්ම. ඔබතුමාත් දන්නවා අවුරුදු 30ක් තිස්සේ පැවතුණු යුද්ධය ගැන. මේ අවුරුදු 30ක් තිස්සේ පැවතුණු යුද්ධය නිසා ලංකාව අවුරුදු 20කින්, 30කින් ආපස්සට ගියා. ඒ ආපස්සට ගිය එක නතර වෙලා, දැන් තමයි ලංකාව ඉස්සරහට යන්න පටන් ගෙන තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම සංවර්ධන ක්‍රියාදාමය පටන් ගෙන තිබෙන මේ අවස්ථාවේ දී, ඒ සඳහා ටික කාලයක් දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම සරල ප්‍රශ්නයක් ඇහුවේ. උපාධිධාරීන් 80,000කට රජයේ රැකියා ලබා දෙනවාද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මගේ මිත්‍රයෙක්. සරල ප්‍රශ්නයට සරලව උත්තර දෙන්න හොඳ නැහැ නේ. සරල ප්‍රශ්නයට ටිකක් ලොකුවට උත්තරයක් දෙන්න ඕනෑ නේ.

ඇත්තටම නායකතුමාට soft skills ටිකක් පුරුදු කළොත් හොඳයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, උත්තර දීලා ඉවරද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ 80,000ට රජයේ රැකියා ලබා දෙනවාද කියලායි මා අහන්නේ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
රජයේ රැකියා දීමක් පිළිබඳව පොරොන්දුවක් දෙන්න අවශ්‍ය නැහැ නේ. දැන් බලන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අවශ්‍යයි.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
නැහැ, අවශ්‍යතාවක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අනිවාර්යයෙන්ම අවශ්‍යයි.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප ගැන බලන්න. මේ සුළු සුළු අඩු පාඩුකම් ටික හදා ගෙන මෙතැනට අරගෙන ආවා නම් විශ්‍රාම වැටුපත් සමඟ කී දහසකට රක්ෂා හම්බ වනවාද කියලා කල්පනා කර බලන්න. කී දහසකට රක්ෂා ලැබෙනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ, මේ රජයට වාර්ෂිකව විරැකියා පෝලිමට එකතු වන උපාධිධාරීන්ට -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරය දුන්නාද, ගරු ඇමතිතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
උත්තරය මට පැහැදිලි නැහැ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මම කියන්න කැමැතියි, මම හිටපු එක්සත් ජාතික පාක්ෂිකයකු වශයෙන් ලජ්ජා වනවා, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට උත්තරය පැහැදිලි නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා උත්තරය දීලා ඉවරද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. උත්තරය දීලා ඉවර නැහැ. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එක්සත් ජාතික පක්ෂයේ හිටපු නියෝජ්‍ය මහ ලේකම්වරයා හැටියට මේ කාරණය කියන්න ඕනෑ. මේ ආණ්ඩුව පත් වුණු ගමන් 45,000ක් උපාධිධාරීන්ට රක්ෂා දුන්නා. අපි ඒ පැත්තේ ඉඳ ගෙන දත නියව නියවා සිටියා, කර ගන්න දෙයක් නැතුව. මේක තමයි ඇත්ත. අඩු පාඩුකම් තිබෙනවා. ඒකයි මම කිව්වේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමා, මා ඒක ප්‍රශංසාවට ලක් කරනවා. ඒ 40,000කට රැකියා ලබා දුන් එක ප්‍රශංසාවට ලක් කරනවා.

ඒක නොවෙයි මගේ ප්‍රශ්නය. මේ විරැකියා පෝලිමේ ඉන්න 80,000ට රජයේ රැකියා ලබා දෙනවාද කියන එකයි මගේ ප්‍රශ්නය.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අපි දත නියව නියවා සිටියදී 45,000කට එක වරටම රැකියා දුන්නා නම්, මේ 80,000ට රැකියා දීමත් කජ්ජක්ද, මගේ මිත්‍ර සජිත් ප්‍රේමදාස මැතිතුමනි?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරය දුන්නාද, ගරු ඇමතිතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමා, ඒ සහතිකය දෙනවාද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
රජයක් හැටියට අනිවාර්යයෙන්ම ලබා දිය යුතුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊ ළඟ ප්‍රශ්නය. ප්‍රශ්න අංක 6.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
There was a reference made that during the UNP regime, jobs were not created. The Central Bank Report shows that the highest number of jobs were created during the UNP regime.- [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You cannot raise that question now. - [*Interruption.*]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Why cannot I? - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
This is the time allotted to ask Oral Questions. - [*Interruption.*] ප්‍රශ්න අංක 6-1047/'10-(1), ගරු මොහොමඩ් අස්ලම් මහතා.

**ගරු මොහමඩ් අස්ලම් මහතා**
(மாண்புமிகு மொஹமட் அஸ்லம்)
(The Hon. Mohamed Aslam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7-0770/'10 - (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හක්මණ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල් :යටිතල පහසුකම්
## ஹக்மன கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள்:உட்கட்டமைப்பு வசதிகள்
## SCHOOLS ADMINISTERED BY HAKMANA DIVISIONAL EDUCATION OFFICE : INFRASTRUCTURE FACILIITES

0826/'10

8. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හක්මණ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

(vi) ඉහත අඩු පාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩු පාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் முலடியன வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் ஹக்மன கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலைகளில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(vi) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலைகளின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்குமென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the Government schools administered by the Hakmana Divisional Education Office of the Mulatiyana Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools-

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers quarters without electricity;

(v) the number of schools with furniture requirements; and

(vi) the names, addresses and telephone numbers of schools with aforesaid shortages ?

(b) Will he state-

(i) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

(ii) if so, the period of time taken for it ?

(c) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඌනතාවන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) විදුලිය නොමැති පාසල් නොමැත.

(ii) පුස්තකාල සහ විද්‍යාගාර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ. සමහර පාසල්වල පන්ති කාමරය තුළ කුඩා පුස්තකාල ඇත.

(iii) 04.

(iv) 02.

(v) ලී භාණ්ඩ අවශ්‍යතා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දේ.

(vi) සඳහන් කරමි. ඇමුණුමෙහි ඇත. ඇමුණුම **සභාගත*** කරමි. දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.

(ඇ) (i) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත පළාත් සභාව විසින් කළමනාකරණය කරනු ලැබේ.

(ii) මූල්‍ය පහසුකම් ලැබෙන ආකාරය අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

මුලටියන අධ්‍යාපන කලාපයේ හක්මණ කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසලේ නම හා ලිපිනය | පුස්තකාල | විද්‍යාගාර | ගුරු නිවාස | ලී බඩු අවශ්‍යතා |
|---|---|---|---|---|---|
| 01 | මාර/කෝංගල ම.ම.වි., හක්මන | ඇත | ඇත | — | ඇත |
| 02 | මාර/මෙතෝදිස්ත ම.ම.වි., හක්මණ | ඇත | ඇත | — | නැත |
| 03 | මාර/තරවැල්පිට ද ම.වි. නරවැල්පිට , හක්මණ | ඇත | ඇත | | නැත |
| 04 | මාර/හෙන්රි ආරියරත්න ම.වි. හක්මණ | නැත | ඇත | — | ඇත |
| 05 | මාර/කන්දෙගොඩ ක.වි. | නැත | ඇත | — | නැත |
| 06 | මාර/සපුගහආර ක.වි. හක්මණ | නැත | නැත | — | නැත |
| 07 | මාර/ඇල්ලේවෙල ක.වි. නරවැල්පිට හක්මණ | නැත | නැත | - | නැත |
| 08 | මාර/ගංගොඩගම ජයවර්ධන ම.වි. හක්මණ | ඇත | ඇත | — | නැත |
| 09 | මාර/දෙනගම ම.වි. දෙනගම හක්මණ | ඇත | ඇත | ඇත | ඇත |
| 10 | මාර/දෙනගම නැ ක.වි දෙනගම, හක්මණ | නැත | නැත | ඇත | නැත |
| 11 | මාර/වෙපතඉර ගුණසේකර ක.වි. හක්මණ | නැත | ඇත | — | නැත |
| 12 | මාර/පන්නවේල ක.වි. හක්මණ | නැත | ඇත | — | නැත |
| 13 | මාර/මීඇල්ල කරගොඩ ක.වි. හක්මණ | ඇත | ඇත | | නැත |
| 14 | මාර/මීඇල්ල අල්මිනා ම.වි. හක්මණ | නැත | ඇත | ඇත | නැත |
| 15 | මාර/ලාල්පේ ක.වි හක්මණ | ඇත | නැත | — | නැත |
| 16 | මාර/කැබිලියපොල ක.වි හක්මණ | නැත | නැත | — | නැත |
| 17 | මාර/කැබිලියපොල ගුණරතන ක.වි. හක්මණ | නැත | නැත | — | නැත |
| 18 | මාර/බුද්ධ ජයන්ති ක.වි. හක්මණ | නැත | අදාල නොවේ | — | ඇත |
| 19 | මාර/කෝංගල ක.වි. හක්මණ | නැත | අදාල නොවේ | — | ඇත |
| 20 | මාර/මිද්දෙනිය ක.වි. හක්මණ | නැත | නැත | ඇත | නැත |
| 21 | මාර/කරතොට ක.වි. හක්මණ | නැත | නැත | — | නැත |
| 22 | මාර/කුඹල්ගොඩ ක.වි. හක්මණ | නැත | අදාළ නොවේ | | නැත |
| 23 | මාර/කොහුලියද්ද ක.වි. හක්මණ | නැත | අදාළ නොවේ | | නැත |
| 24 | මාර/උඩුපිල්ලගොඩ ක.වි. හක්මණ | නැත | නැත | | නැත |
| 25 | මාර/බේරුවේවෙල ක.වි. හක්මණ | නැත | අදාළ නොවේ | | නැත |
| 26 | මාර/බඩබද්ද ම.වි. මී ඇල්ල | ඇත | ඇත | | නැත |

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පළමුවන අතුරු ප්‍රශ්නය?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙකයි. මේ කලාපය තුළ 2010 පහ වසරේ ශිෂ්‍යත්වලාභීන්ට උපහාර පුද කරන්න දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය පසු ගිය දෙසැම්බර් මාසයේ 27 වන දා සහ 29 වන දා "ජයසංඛ" කියලා උපහාර උළෙලක් පැවැත්වුවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, මේ පිළිතුරෙන් පැන නඟින්නේ නැති-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නම්, කොහොමද පැන නඟින්නේ කියලා. ඒකේ සංග්‍රහ කටයුතුවලට පළාත් අමාත්‍යාංශයෙන් සල්ලි දීලා තියෙද්දී, ප්‍රාථමික අංශය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරිය මේ පාසල්වල විදුහල්පතිවරුන්ගෙන් රුපියල් 1,000 ගානේ එකතු කළා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම තව ප්‍රශ්නය ඇහුවේ නැහැ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
හොඳයි, අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සල්ලි දීලා තියෙද්දී, මේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරියට මෙහෙම සල්ලි එකතු කරන්න කුමන ආකාරයේ බලයක් තිබෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අහපු අතුරු ප්‍රශ්නයට, මේ ප්‍රශ්නයට අදාළව පිළිතුරු සැපයීමට පදනමක් නැහැ. පළමුවන කාරණාව ඒකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලාපයෙන් කලාපයට කොට්ඨාසයෙන් කොට්ඨාසයට ගරු මන්ත්‍රීතුමා මේ අහන ප්‍රශ්න පළාත් සභාව වග කියන කාරණා. නමුත් රටේ අධ්‍යාපන ප්‍රතිපත්තිය බාරව කටයුතු කරන අමාත්‍යාංශය හැටියට අපේ වග කීමක් වෙනවා, ඒ පිළිබඳව අවධානයෙන් කටයුතු කිරීම. ගරු මන්ත්‍රීතුමා, ඒක පිළිගන්නවා ඇති. ගරු මන්ත්‍රීතුමාට මම මතක් කරන්න කැමැතියි, ඔබතුමන්ලාගේ පාලන කාලයේ ඔබතුමන්ලා රෙදි ටික බෙදපු හැටි. කොහොමද, ඔබතුමන්ලා රෙදි බෙදුවේ? ග්‍රාම නිලධාරි ළඟට යන්න ඕනෑ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන්න ඕනෑ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නොවෙයි මම ඇහුවේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් 1,000ක රෙදි ටික ගන්න රුපියල් 1,500ක් විතර -

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
රුපියල් 1,000 ගානේ එකතු කරපු එක සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගන්නවාද, යම් පරීක්ෂණයක් කරනවාද? මොන බලයක් යටතේද ඒක අය කළේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
කියන්න, කියන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා උත්තරය දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නියෝජ්‍ය අමාත්‍යතුමා, ඒ කොයි කාලෙද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
කාලයද? කාලය 2001. මතකද? අප්පච්චිගේ කාලයේ නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මම අහපු ප්‍රශ්නයට මට උත්තරයක් දෙන්න කියා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම එතැනට එනවා. ඔබතුමා පොඩ්ඩක් ඇහුම් කන් දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල්වල අතිරේක කටයුතු කිරීම සඳහා සමහර විට පළාත් සභාවෙන් යම් මුදලක් වියදම් කළත්, එම මුදල ප්‍රමාණවත් නොවන නිසා, එකඟතාව මත බාහිර ක්‍රියාකාරකම් සඳහා මුදල් එකතු කරනවා. ඒ පිළිබඳව අපට වග කීමක් නැහැ. පාසල් සංවර්ධන සමිති, පාසල් ආදි ශිෂ්‍ය සංගම්, ආදි ශිෂ්‍යාවන්ගේ සංගම් මේ කටයුතු කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාගේ උත්තරය ඒකද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔව්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරය දුන්නා. මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුහල්පතිවරුන්ගෙන් මේ සල්ලි අරගෙන තිබෙන්නේ අධ්‍යාපන අධ්‍යක්ෂවරියක්. ඒක කොහොමද ආදි ශිෂ්‍ය සංගම් වන්නේ? මේක උත්තරය නොවෙයි. මම කියන්නේ නියෝජ්‍ය ඇමතිතුමා මේකෙදි නිලධාරින් සුද්ධ කරන්නේ නැතිව-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අහන ලද අතුරු ප්‍රශ්නය මේ මූලික ප්‍රශ්නයට දෙන ලද පිළිතුරෙන් පැන නඟින එකක් නොවෙයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පරීක්ෂණයක් කරනවාද නැද්ද කියලා අහන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

කරුණාකරලා අදාළ ප්‍රශ්නයේ පිළිතුරෙන් පැන නඟින අතුරු ප්‍රශ්නයක් අහන්න. නැත්නම් එතුමා දෙන උත්තරය එකක්, ඔබතුමා අහන්නේ තව එකක්. ඒකෙන් කිසිම ප්‍රයෝජනයක් වන්නේ නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නයට යන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම අහන්නේ පරීක්ෂණයක් කරනවාද නැද්ද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඔබතුමා වාඩි වෙන්න කරුණාකරලා. මමයි, මන්ත්‍රීතුමායි මේක හොඳින් කර ගෙන යනවා. [බාධා කිරීම්] වාඩි වෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

That Supplementary Question does not arise from the original Question. That is the issue. You cannot ask such questions.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

කොහේද යන්නේ මල්ලෙ පොල් උත්තරයක් දුන්නාම ඔබතුමා ඒක රකින්න එපා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඇමතිතුමාගේ උත්තරය මොකක්ද? උත්තරය දුන්නාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

නැහැ. උත්තරය දුන්නේ නැහැ. මම අහන්නේ පරීක්ෂණයක් කරනවාද, නැද්ද කියලායි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුරු හරි නිලධාරියෙකු එවැනි වරදක් කරනවා නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මන්ත්‍රීතුමාට පැමිණිලි කරන්න පුළුවන්. මන්ත්‍රීතුමා ළමයෙක් දමා ගන්න ගිහිල්ලා බැරි වුණු හින්දා අධ්‍යක්ෂතුමියත් එක්ක පොඩි ප්‍රශ්නයක් තිබෙනවා වාගේයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

නැහැ, නැහැ. පරීක්ෂණයක් කරනවාද, නැද්ද කියලායි මම අහන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඔබතුමාගේ උත්තරය දුන්නාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඔව්. දුන්නා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මොකක්ද උත්තරය?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

උත්තරය වන්නේ, මෙතැන නියෝජනය නොකරන යම් නිලධාරියෙකු වෙනුවෙන් මෙතැන තීන්දු ගන්න පුළුවන්කමක් නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පරීක්ෂණයක් කරනවාද, නැද්ද කියලායි මම අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

එහෙම පරීක්ෂණ කරන්න බැහැ. ඔබතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඔබතුමා පැමිණිලි කරන්න. ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවා. තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්. තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
තුන්වැනි අතුරු ප්‍රශ්නය විධියට මම අහන්නේ මේ සම්බන්ධයෙන්-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මොකක් සම්බන්ධයෙන්ද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඇයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අපට පැමිණිලි කරන්න කියන්නේ? ඇයි ඔබතුමාට බැරි අමාත්‍යාංශයෙන් නිලධාරින් කණ්ඩායමක් යවලා පරීක්ෂණයක් කරන්න?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මේක පළාත් සභාවේ වැඩක් ගරු මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් සභාවට සල්ලි දෙන්නේ කවුද? පළාත් සභාවට ගුරුවරුන් පත් කරන්නේ කවුද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා දක්ෂ සූත්තරකාරයෙක් නේ. ඔබතුමා හොඳ සූත්තරකාරයෙක් නිසා ඔබතුමාට හොඳ සූත්තරයක් මම කිව්වේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් සභාවට සල්ලි දෙන්නේ කවුද? පළාත් සභාවට ගුරුවරු ටික යවන්නේ කවුද? පළාත් සභාවට පොත් ටික යවන්නේ කවුද, පළාත් සභාවට නිල ඇඳුම් යවන්නේ කවුද? ගරු ඇමතිතුමනි, ඔක්කෝම යවන්නේ ජාතික අමාත්‍යාංශයෙන්. ඒ නිසා ජාතික අමාත්‍යාංශයට මේ වග කීමෙන් ගැලවෙන්න බැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමාට පුළුවන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා මේ ගැන පැමිණිලි කරන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක නම් ලබා දෙන උත්තරය, හරි කනගාටුදායකයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අපිත් පරීක්ෂණයක් කරන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරය දුන්නද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
දුන්නා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වගකිව යුතු ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු ඒ සම්බන්ධව උත්තර නොදී සියල්ල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට දාන්න කියනවා නම්, දෙයියන්ගේම පිහිටයි.

## ගර්භිණී මව්වරුන් : පෝෂණ සලාක
## கர்ப்பிணித் தாய்மார்:போஷாக்குப் பங்கீடு
## PREGNANT MOTHERS: NUTRITIONAL RATIONS

1029/'10

9. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ සිටි සමස්ත ගර්භිණී මව්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ මැදිහත් වීමෙන් ගර්භිණී මව්වරුන්ට පෝෂණ සලාක ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, පෝෂණ සලාක ලබා දෙන මව්වරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ගර්භිණී මව්වරුන්ට පෝෂණ සලාක ලබා දෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(v) එසේ ලබා දෙන පෝෂණ සලාකය ගැබිනි මව්වරුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு முடிவடைகின்றபோது இலங்கையிலிருந்த மொத்தக் கர்ப்பிணித் தாய்மாரின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அரசாங்கத்தின் தலையீட்டில் கர்ப்பிணித் தாய்மாருக்கு போஷாக்குப் பங்கீட்டைப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுகின்றதா என்பதையும்;

(iii) ஆமெனில், போஷாக்குப் பங்கீடு வழங்கப்படுகின்ற தாய்மாரின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) கர்ப்பிணித் தாய்மாருக்கு போஷாக்குப் பங்கீட்டை வழங்குகின்ற பிரதேச செயலகப் பிரிவுகள் யாவையென்பதையும்;

(v) அவ்வாறு வழங்கப்படுகின்ற போஷாக்குப் பங்கீடு கர்ப்பிணித் தாய்மாரின் போஷாக்குத் தேவையைப் பெற்றுக் கொடுப்பதற்குப் போதுமானதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state-

(i) the total number of pregnant mothers in Sri Lanka by the end of the year 2010;

(ii) whether action has been taken to provide nutritional rations to pregnant mothers with the intervention of the government;

(iii) if so, the number of mothers provided with nutritional rations;

(iv) the Divisional Secretaries Divisions in which nutritional rations are provided to pregnant mothers;

(v) whether the nutritional ration thus provided is sufficient to fulfil the nutritional requirements of pregnant mothers?

(b) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 3,85,000කි.

(ii) ඔව්. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සෑම ගර්භිණී මවකටම
ත්‍රිපෝෂ ලබා දෙයි.

(iii) සමස්ත ගර්භිණී මවුවරුන් සංඛ්‍යාව වන 385,000ක් සඳහා.

(iv) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම.

(v) ප්‍රමාණවත්ය.

(ආ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න අසන්නට පෙර මා කියන්නට ඕනෑ, ගරු ඇමතිතුමා උත්තර දුන්නේ මා ඇහුව ප්‍රශ්නයට නොවෙයි කියන එක. මා ඇහුවේ ගර්භිණී මව්වරුන්ට ලබා දෙන පෝෂණ මල්ල ගැන. මෙතුමා උත්තර දුන්නේ ත්‍රිපෝෂ සලාක ගැන.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මෙතැන ප්‍රශ්නය තෝරා ගන්නටත් ඕනෑ. එතුමා අසා තිබෙන ප්‍රශ්නය හා උත්තරය මේ ආකාරයටයි.

(අ) (i) 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ සිටි සමස්ත ගර්භිණී මව්වරුන් සංඛ්‍යාව කොපමණ ද;

385,000කි.

(ii) රජයේ මැදිහත් වීමෙන් ගර්භිණී මව්වරුන්ට පෝෂණ සලාක ලබා දීමට කටයුතු කරන්නේ ද;

ඔව්. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සෑම ගර්භිණී මවකටම ත්‍රිපෝෂ ලබා දෙයි.

(iii) එසේ නම්, පෝෂණ සලාක ලබා දෙන මව්වරුන් සංඛ්‍යාව කොපමණ ද?

සමස්ත ගර්භිණී මවුවරුන් සංඛ්‍යාව වන 385,000ක් සඳහා.

(iv) ගර්භිණී මව්වරුන්ට පෝෂණ සලාක ලබා දෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේ ද?

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම.

(v) එසේ ලබා දෙන පෝෂණ සලාකය ගැබිනි මව්වරුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් ද යන්න එතුමා සඳහන් කරන්නෙහි ද;

ප්‍රමාණවත්ය.

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පැන නොනඟී.

ප්‍රශ්න අංකය - 1029/'10. මේකයි අසා තිබෙන ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. ඔබතුමා පිළිතුර දෙනකොට ඔබතුමාට කිය වුණා ත්‍රිපෝෂ සලාකය ගැන.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ ප්‍රශ්නයට නියෝජ්‍ය ඇමතිතුමා දෙන පිළිතුරද ඒ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මේක තමයි උත්තරය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුර දීලා. ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගර්භිණී මව්වරුන්ට ලබා දෙන පෝෂණ සලාකයේ වටිනාකම කොපමණද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්ද රාජපක්ෂ ජනාධිතිතුමාගේ මහින්ද චින්තනය යටතේ මේ රජය රුපියල් 500ක පෝෂණ මල්ලක් ලබා දෙනවා. රුපියල් 200න් පටන් ගත්තේ. 2006 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 112කින් පටන් අරගෙන ඊට පස්සේ 2007 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 48කට, 2008 වර්ෂයේ 52කට, 2009 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 36කට වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 2,248කට මේ මහින්ද චින්තනය යටතේ ලබා දෙන්නට පොරොන්දු වුණු ආකාරයට දැනට පෝෂණ මල්ල ලබා දෙනවා. මිලියන 500ක මුදලක් දැනට මේ සඳහා වෙන් කර තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නියෝජ්‍ය ඇමතිතුමා, අපේ රටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙදහස් ගණනක් නැහැ. තුන්සිය තිස්දෙකයි තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස-[බාධා කිරීමක්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මේක අහගෙන ඉන්නකෝ ඉස්සෙල්ලා. පස්සේ උත්තර දෙන්න.

මේ රුපියල් 500න් රුපියල් 300ක සුදු කැකුළු, රතු කැකුළු හෝ එහෙම නැත්නම් සම්බා හාල් හෝ ගන්න පුළුවන්. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේක නිර්දේශ කරලා තිබෙනවා. ඊ ළඟට සෝයා, මුං ඇට වාගේ දේවල් ගන්නටත් මුදලක් වෙන් කරලා තිබෙනවා. මුළු මුදල රුපියල් 500යි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ පෝෂණය ගැන. පෝෂණය කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ප්‍රධාන පෝෂණ වැඩසටහනට අමතරව-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මොකක්ද මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න කියන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මොකක්ද ඔබතුමා අහපු ප්‍රශ්නය, නැවත කියන්න?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සරල ප්‍රශ්නයක් මම ඇහුවේ. මම ඇහුවේ පෝෂණ සලාකයක වටිනාකම රුපියල් කීයද කියලා?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පෝෂණය මනින්නේ රුපියල්වලින් නොවෙයි. ඒකේ ප්‍රධාන දේ තමයි ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථාන හරහා ත්‍රිපෝෂ ලබා දීම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොනවාද මේ දෙන උත්තර?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඊට අමතරව අතිගරු ජනාධිපතිතුමා පොරොන්දු වුණ ආකාරයට මහින්ද චින්තනය යටතේ රුපියල් 500ක පෝෂණ මල්ලක් දෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 248ක සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල කාන්තාවන් මාස 2ක ගර්භිණී තත්ත්වයට ආවාට පසුව මාස 8 දක්වා ඒ පෝෂණ මල්ල දෙනවා. දරුවා හම්බ වුණාට පසුව තව මාස 12ක් සමඟ මාස 20ක් ඒ පෝෂණ මල්ල දෙනවා. මේ පෝෂණ මල්ල ලබා දීම සඳහා රුපියල් මිලියන 550ක් වෙන් කරලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අහන ප්‍රශ්නයට නොවෙයි උත්තරය දෙන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඊට අමතරව සමස්තයක් හැටියට ජාතික පෝෂණ වැඩසටහන යටතේ මවුවරුන්ට අදාළ පෝෂණ ප්‍රමාණයක් ලබා දෙනවා. ඒ, ත්‍රිපෝෂ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා දෙන පිළිතුර ඒකද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒක නොවෙයි ඇහුවේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මෙතුමා මේ වැඩසටහන ගැන අහනවා, මේකේ වටිනාකම කොච්චරද කියලා. එදා මෙතුමාගේ පියා ජනසවිය පටන් අරගෙන දුන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 100කටත් අඩුවෙන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර කුමක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අහපු ප්‍රශ්නයට උත්තරය දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා මගෙන් අහලා තිබෙන්නේ මෙම පෝෂණ -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. මම අහපු අතුරු ප්‍රශ්නයට උත්තරය දෙන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
වටිනාකම අදාළ නැහැ. හැම මවකටම ත්‍රිපෝෂ ප්‍රමාණයක් ලබා දෙනවා. ඒකේ වටිනාකම මට මේ වෙලාවේ කියන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ වෙලාවේ වටිනාකම කියන්න බැරිලු. ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට සමාවෙන්න. මම ප්‍රශ්නයක් ඇහුවා, පෝෂණ මල්ලක් ලබා දෙනවාද කියලා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා, ඔව් කියලා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි, පෝෂණ මල්ල ලබා දෙනවා නම් ඒකේ වටිනාකම කීයද කියන එක. බොහොම සරල ප්‍රශ්නයක් නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පෝෂණ මල්ලක් ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, රජයේ වැඩසටහන යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දිය යුතු පෝෂණ මල්ල සඳහා එක් මවකට රුපියල් 500ක් වෙන් කරලා තිබෙනවා. දැනට ඒ රුපියල් 500 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 248ටම හැම අවුරුද්දේම මාසිකව ලබා දෙනවා. එච්චරයි. ඒක තේරෙන්නේ නැද්ද? ඔබතුමාට තේරෙන්නේ නැති නිසා තමයි පක්ෂයේ නායකකමවත් ගන්න බැරි වෙලා තිබෙන්නේ. අඩු ගණනේ මොනවාවත් කර ගන්න බැරි වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේගේ පියා පොරොන්දු වුණත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 100කටවත් ජනසවිය දුන්නේ නැහැ. අපේ ජනාධිපතිතුමා ඒ සියල්ලම ලබා දීලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. නියෝජ්‍ය ඇමතිතුමා දැන් ප්‍රකාශ කළා, මේ රටේ සෑම ගර්භිණී මවකටම - 3,85,000කටම- මාසිකව රුපියල් 500ක පෝෂණ මල්ලක් ලබා දෙනවා කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නැහැ, නැහැ. එහෙම නොවෙයි. කොටස් දෙකක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. එකක්, සෑම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයක් මඟින්ම ජාතික පෝෂණ වැඩසටහන යටතේ ත්‍රිපෝෂ ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක නොවෙයි මම අහන ප්‍රශ්නය. අහන ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පොඩ්ඩක් ඉන්න මම කියනකල්. ඒ අයට ත්‍රිපෝෂ ලබා දෙනවා. ඊට අමතරව මහින්ද චින්තනය යටතේ අතිගරු ජනාධිපතිතුමාගේ වැඩසටහනක් අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 248ක සමෘද්ධි ප්‍රතිලාභී මව්වරුන්ට රුපියල් 500ක් වටිනා පෝෂණ මල්ලක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. සමෘද්ධි ප්‍රතිලාභී ගර්භිණී මව්වරුන්ට තමයි ඒක ලබා දෙන්නේ. 3,85,000ක්ම වන ගර්භිණී මව්වරුන්ට ලැබෙන්නේ නැහැ. ඒක ලැබෙන්නේ සමෘද්ධි ප්‍රතිලාභී ගර්භිණී මව්වරුන්ටයි. ඉදිරියේදී ඒක සියල්ලන්ටම ලබා දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා. සමහර විට ඒ මුදල් ප්‍රතිපාදන ලැබුණොත් ඒකත් කරන්න පුළුවන්. එච්චරයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි.

මහින්ද චින්තන පොතේ, 18 වන පිටුවේ අංක 4 කෙරෙහි ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මෙහෙම සඳහන් වනවා:

"ගැබිනි මව්වරුන්ට පෝෂණ මල්ලක් නොමිලේ ලබා දෙන්නෙමි."

මේ පොරොන්දුව ලබා දුන්නේ 2005 දී. කවදාද, මේ මැතිවරණ පොරොන්දුව ඉෂ්ට සිද්ධ කරලා අවසන් කරන්නේ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ පෝෂණ මල්ල ලබා දෙනවා. මා කලිනුත් කිව්වේ ඒකයි. පෝෂණ මල්ල ලබා දීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 112කින් තමයි පටන් ගත්තේ. දැන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 248ක ක්‍රියාත්මක වනවා. තමුන්නාන්සේගේ පියාණන් පටන් ගත්ත ජනසවියත් දීලා ඉවර කර ගන්න බැරි වුණා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔක්කොම උප දිසාපති කොට්ඨාස 332ක් තිබෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
1988 ඉඳන්1994 දක්වා ඔක්කොටම ජනසවිය දෙනවා කියලා පොරොන්දු වුණා. නමුත් වට තුනක්වත් දෙන්න බැරි වුණා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 100ටයි දුන්නේ. අපේ ජනාධිපතිතුමා දැන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 248ට දෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුන්සිය ගණනක් තිබෙනවා. වදනවා කියලා ඒ ඔක්කෝටම එක වතාවට දෙන්න බැහැ. අපට මතකයි, තමුන්නාන්සේගේ පියා ටීවී එකෙන් කිව්වේ සියලු දෙනාට දෙනවා කියලායි. පැපොල් කැල්ලක් දෙනවා කිව්වා; සපත්තු දෙනවා කිව්වා. සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ජනසවිය දෙනවා කිව්වා. ඉතුරු කරලා රුපියල් 25,000ක් දෙනවා කිව්වත්, තමුන්නාන්සේගේ පියාණන් ඒ රුපියල් 25,000 දුන්නේත් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහන ප්‍රශ්නය මේකයි. 2005 ලබා දුන්නු පොරොන්දුව කවදාද ඉෂ්ට කරන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයට උත්තරය දෙන්න කියන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මා අභියෝග කරනවා. පුළුවන් නම් කියන්න. තමුන්නාන්සේගේ පියා ජනතාවට පොරොන්දු වුණා ජනසවිය මඟින් ඉතුරු කරලා රුපියල් 25,000ක් දෙනවා කියලා. ඒ රුපියල් 25,000න් ශතයක්වත් දුන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුළුවන් නම් ඔප්පු කරන්න කියන්න. ප්‍රේමදාස ජනාධිපතිතුමා ජනතාවට පොරොන්දු වුණා, ජනසවියෙන් ඉතුරු කරලා රුපියල් 25,000ක් දෙනවා කියලා. නමුත් දුන්නේ නැහැ. පුළුවන් නම් ඔප්පු කරන්න. අපේ ජනාධිපතිතුමා එහෙම නොවෙයි. පොරොන්දු දීලා ඒවා ඉටු කර තිබෙනවා. තව දෙන්නත් තිබෙනවා. ඒවා අපි දෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා උත්තර දුන්නාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා උගත් නීතිඥවරයෙක්. මම ඇහුවේ බොහොම සරල ප්‍රශ්නයක්. කවදාද මේ පෝෂණ සලාකය දීලා ඉවර කරන්නේ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ප්‍රශ්නයට උත්තර දුන්නා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමාට තේරුම් ගන්න බැහැ. [බාධා කිරීම්] රවි කරුණානායක මහත්තයාට විරුද්ධවත් නඩු දමලා තිබෙන්නේ. තමන්ගේ ජාතික සංවිධායකට විරුද්ධව,- [බාධා කිරීමක්] තේරුම් යනවා නම් ප්‍රශ්නයක් නැහැ. තමන්ගේ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයක් තිබෙනවා. තවත් කෘත්‍යාධිකාරී මණ්ඩලයක් දමලා. මේ හොඳ ජ්‍යෙෂ්ඨ නායකයෙක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා නීතිඥවරයෙක්ද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ප්‍රශ්නයට පිළිතුරු දුන්නාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පිළිතුරු දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, පිළිතුරු දුන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාධාරණ වන්න. ඔබතුමාත් නීතිඥවරයෙක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එතුමා ප්‍රශ්නයට පිළිතුරු දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නයට උත්තර දෙන්න කියන්න. ඔබතුමාත් නීතිඥවරයෙක්.[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා පිළිතුර ප්‍රකාශ කළාය කිව්වාට පස්සේ ස්ථාවර නියෝගවලට අනුව අපට,- [බාධා කිරීමක්]- එතුමාට අනුව පිළිතුරු ලබා දීලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම කොහොමද එතුමාට අනුව කියන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒක තමයි ස්ථාවර නියෝග අනුව කියන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න කියන්න. අහපු නැති ප්‍රශ්නවලටයි උත්තර දුන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10-1048/'10 -(1), ගරු මොහමඩ් අස්ලම් මහතා.

**ගරු මොහමඩ් අස්ලම් මහතා**
(மாண்புமிகு மொஹமட் அஸ்லம்)
(The Hon. Mohamed Aslam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මොරටුව යූ.සී. ලැන්ඩ් ඉඩම්ලාභීන්: ඔප්පු
## மொரட்டுவ யூ.சீ.லேன்ட் காணி பெறுனர்: உறுதிகள்
MORATUWA U.C LAND RECIPIENTS: DEEDS

1137/'11

11.**ගරු අනුර දිසානායක මහතා**
( மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ, ඉඩම, පීරිස් මාවතේ, යූ. සී. ලැන්ඩ් (U.C. Land) නමින් තිබෙන පිඹුරු අංක 515 A දරන, හෙක්ටයාර් 0.64516ක වපසරියකින් යුත් ඉඩම, ඉඩම් කොටස් 44කට බෙදා ඉඩම්ලාභීන්ට ලබා දී ඇති බවත්;

(ii) එම ඉඩම්ලාභීන්ට නිරවුල් ඔප්පු නොලැබීම සම්බන්ධයෙන්, 2009 සැප්තැම්බර් 24 දින එවකට පළාත් පාලන අමාත්‍යතුමාගෙන් පාර්ලිමේන්තුවේදී වාචික ප්‍රශ්නයක් අසන ලද බවත්;

(iii) ඊට පිළිතුරු වශයෙන් අදාළ ඔප්පු ලබා දීමට ඒ වනවිටත් කටයුතු සිදු කෙරෙමින් පවතින බව සඳහන් කර ඇති බවත්;

(iv) එසේ වුවද මෙතෙක් එම ඉඩම් සඳහා නිරවුල් ඔප්පු ලබා දීමට කටයුතු කර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) ඉහත ඉඩම්ලාභීන් හට කඩිනමින් නිරවුල් ඔප්පු ලබා දීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொரட்டுவ மாநகர சபை அதிகாரப் பிரதேசத்தின், இடம, பீரிஸ் மாவத்தையில், யூ.சீ.லேன்ட் (U.C. Land) எனும் பெயரிலுள்ள 515 A வரைபட இலக்கத்தைக் கொண்ட, 0.64516 ஹெக்டெயர் பரப்பளவுடைய காணி, 44 காணித் துண்டுகளாகப் பிரிக்கப்பட்டு காணி பெறுனர்களுக்கு வழங்கப்பட்டுள்ளதென்பதையும்;

(ii) இக் காணி பெறுனர்களுக்கு உறுதிகள் கிடைக்காமை சம்பந்தமாக 2009 செப்டெம்பர் 24 ஆம் திகதி முன்னாள் உள்ளூராட்சி அமைச்சரிடம் பாராளுமன்றத்தில் வாய்மூல வினாவொன்று கேட்கப்பட்டதென்பதையும்;

(iii) அதற்குப் பதிலளித்து உரிய உறுதிகளைப் பெற்றுக் கொடுப்பதற்கு ஏற்கனவே நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருவதாக தெரிவிக்கப்பட்டுள்ளது என்பதையும்;

(iv) இருப்பினும் இதுவரை மேற்படி காணிகளுக்கு உரித்துரிமை உறுதிகளைப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்கப்படவில்லை என்பதையும்

அவர் ஏற்றுக் கொள்வாரா?

(ஆ) மேற்படி காணி பெறுனர்களுக்குத் துரிதமாக உரித்துரிமை உறுதிகளைப் பெற்றுக்கொடுப்தற்குத் தேவையான நடவடிக்கைகளை எடுப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Will he admit that-

(i) the land known as U.C. land bearing plan number 515 A, with an extent of 0.64516 hectres located on Peiris Mawatha, Idama in the Moratuwa Municipal Council area, has been fragmented into 44 plots and distributed among recipients;

(ii) an Oral Question was asked from the the Minister of Local Government in the Parliament on 24th September 2009, in relation to these recipients not receiving clear deeds;

(iii) the minister replied that arrangements were already being made to provide the relevant deeds;

(iv) However, arrangements have not yet been made to provide clear deeds for those lands ?

(b) Will he state whether necessary steps will be taken to provide the recipients of lands with clear deeds soon ?

(c) If not, why ?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) (ii) (iii) (iv) - අදාළ ඉඩමේ ඉඩම්ලාභීන් වශයෙන් පවුල් 33ක් පදිංචිව සිටින අතර මේ සම්බන්ධයෙන් මීට පෙර අවස්ථාවක ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් එකී ඉඩම්ලාභීන් වෙත ඔප්පු ලබා දීම සඳහා කටයුතු කරන බවට ප්‍රකාශ කර ඇති නමුත් ඒ සඳහා වන පූර්ව කටයුතු අවසන් වී නොමැති බැවින් අදාළ ඔප්පු ලබා දීමට නොහැකි වී ඇත.

(ආ) අවශ්‍ය පියවර ගනිමි.

(ඇ) පැන නොනඟී.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. නියෝජ්‍ය ඇමතිතුමා කිව්ව පරිදිම, 2009 සැප්තැම්බර් 24 වන දින මේ පාර්ලිමේන්තුවේ දී පළාත් පාලන අමාත්‍යතුමා පිළිතුරු ලබා දුන්නා, මේ ඔප්පු ලබා දීමට කටයුතු කරමින් සිටිනවා කියලා. ඒ, මීට අවුරුදු දෙකකට පමණ පෙර. නමුත් ගරු නියෝජ්‍ය ඇමතිතුමා අදත් දෙන පිළිතුර තමයි, මේ ඔප්පු ලබා දෙමින් තිබෙනවාය කියන එක. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඒ ඉඩම්ලාභීන්ට ඔප්පු ලබා දීලා මේ කටයුත්ත අහවර කරන්න ඔබතුමා කොච්චර කාලයක් ගන්නවාද කියලා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉඩම් වෙන් කර දීම දීර්ඝ ක්‍රියාවලියක්. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් තිබෙනවා. මම ඔබතුමාට කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් කැබලි වෙන් කර දීමේදී 33 දෙනකු හිමිකම් ලබා තිබෙනවා. එයින් තුන් දෙනකු මොරටුව මහ නගර සභාවේ සුළු සේවකයන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කුලී නිවැසියන්.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ඔවුන් එහි සේවය කරන බැවින්, 1979 අංක 63 දරන පළාත් පාලන නිවාස (සංශෝධන) පනතින් සංශෝධිත 1964 අංක 14 දරන පළාත් පාලන නිවාස පනතේ විධිවිධානවලින් පැවරී ඇති බලතල අනුව අඩු කුලී නිවාස යන පදනමින් සින්නක්කර ඔප්පු මේ තුන් දෙනාට ලබා දී තිබෙනවා. ඉතිරි 30 දෙනා අපි සලකන්නේ අනවසර පදිංචිකරුවන් වශයෙන්. මොකද, ඒ උදවිය මහ නගර සභාවේ සේවකයන් නොවන නිසා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අනවසර පදිංචිකරුවන්ට මහ නගර සභාව සතු ඉඩම් පවරා දීම සඳහා නීතිමය විධිවිධාන සැලසිලා නැහැ. එහෙත් එවකට පැවැති රජය විසින් එසේ අනවසරයෙන් පදිංචි වී ඇති අයට සහන සැලසීමට පියවරක් වශයෙන් 1988.04.21 වන දින මහ නගර සභාවේ අනුමැතිය ඇතිව, ඉඩම් පවරා දීම වෙනුවට නියමානුකූල කිරීමක් කර, එහි පැල්පත් ඉවත් කර, නිවාස දස ලක්ෂයේ වැඩසටහන යටතේ එම ඉඩම්වල ස්ථිර නිවාස ඉදි කර ගැනීමට අවසර දී ඇත. ඒ සඳහා ඔවුන්ට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් එම වකවානුවේදී රුපියල් 15,000ක ආධාරයක්ද ලබා දී තිබෙනවා.

දැනට පදිංචිව සිටින පදිංචිකරුවන්ට ඉඩම් අමාත්‍යාංශය මාර්ගයෙන් ඉඩම් හිමිකම් පවරා දීම සඳහා මහ නගර සභාවේ අනුමැතියත් මේ වන කොට ලැබිලා තිබෙනවා. තවද, මෙම ඉඩම් සඳහා පළමු මැනුම් නියෝගය අනුව මැනුම් කටයුතු සිදු කර ඇති අතර, මෙම ඉඩම් පැවරීම සඳහා ඉඩම් කොමසාරිස් මොරටුව ප්‍රාදේශීය ලේකම් සමඟ පැවැති සාකච්ඡාවකදී නැවත මැනුම් නියෝගයක් යැවීමට තීරණය වී ඇති බැවින්, එකී මැනුම් නියෝගයට අනුව මැනුම් කටයුතු මේ වන කොටත් සිද්ධ වෙමින් පවතිනවා.

මෙම ඉඩම් එහි පදිංචිකරුවන් වෙත ලබා දීම සඳහා එවකට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා ලෙස කටයුතු කළ ගරු ජීවන් කුමාරණතුංග මැතිතුමාගේ මැදිහත් වීම මත ඉඩම් අමාත්‍යාංශය, මොරටුව ප්‍රාදේශීය ලේකම්, පළාත් ඉඩම් කොමසාරිස් සහ ඉඩම් කොමසාරිස් මාර්ගයෙන් බදු ඔප්පු ලබා දීමට මේ වන කොටත් කටයුතු කරමින් පවතිනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

2009 සැප්තැම්බර් මාසයේ 24වැනිදා ලබා දීපු පිළිතුරට අමතරව මේ පිළිතුරේ වාක්‍ය දෙකයි තිබෙන්නේ. ඒ ජීවන් කුමාරණතුංග ගරු අමාත්‍යතුමා සහ නිලධාරීන් එක්ක සාකච්ඡාවක් කළා කියන එක විතරයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එදා පිළිතුරේත් තිබෙනවා, "අදාළ පදිංචිකරුවන්ට ඉඩම් ඔප්පු ලබා දීමට දැනටමත් කටයුතු සිදු කරමින් පවතින බව වාර්තා වන හෙයින් එම කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමි." කියලා. මේක තමයි 2009 සැප්තැම්බර් මාසයේ 24වැනිදා මේ පාර්ලිමේන්තුවේදී ලබා දීපු පිළිතුර.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි කඩිනම් පියවර ගන්නවා කියලා එකඟතාවකට ඇවිල්ලාත් තිබෙනවා. දැනට කටයුතු කෙරෙමින් තිබෙනවා කියලාත් තිබෙනවා. දැනට අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා ඒ ප්‍රශ්නය යොමු කළාට පසුවත්. නමුත් තවම ඒ කටයුතු කෙරිලා නැහැ. මම කලිනුත් ගරු ඇමතිතුමාගෙන් ඇහුවේ ඒකයි. මම දන්නවා ඉඩම් බෙදා දීමේදී සැලකිය යුතු සංකීර්ණ ක්‍රියාවලියක් තිබෙන බව. මෙම කටයුත්ත කොච්චර කාලයක් ඇතුළත අවසන් කරන්න එකඟතාවකට එනවාද කියන ප්‍රශ්නය තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් විමසන්න තිබෙන්නේ.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු මන්ත්‍රීතුමා, මේක නගර සභාවෙන් වන ක්‍රියාවලියක්. ඒ කටයුතු අපි කඩිනමින් කර ගෙන යනවා. ඇත්තටම දින වකවානු සඳහන් කරන්න නම් අපහසුයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වැනි අතුරු ප්‍රශ්නය. කවදාද මොරටුව මහ නගර සභාවේ ඡන්දය පවත්වන්න යන්නේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒක අදාළ නැහැ නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ඒ ප්‍රශ්නය යටතේ නේ. [බාධා කිරීම්] ඒ ඇමතිතුමා යටතේ මොරටුවේ තිබෙන පළාත් පාලන ආයතනය. [බාධා කිරීම්] ඔබතුමා වාගේ නොවෙයි. එතුමා දක්ෂ නියෝජ්‍ය ඇමතිවරයෙක්. එතුමා භය නැතිව උත්තර දෙයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මැදවච්චියයි, කිලිනොච්චියයි, පාමංකඩයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
දින වකවානු කියන්න බැහැ. අපි හැකි තරම් ඉක්මනින් ඡන්දය පවත්වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 12-0771/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති හයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය : දෙල්ගහවල ජලාශය
### வெலிப்பிட்டிய பிரதேச செயலக அதிகாரப் பிரதேசம்: தெல்கஹவல நீர்த்தேக்கம்
### WELIPITIYA DIVISIONAL SECRETARY'S DIVISION: DELGAHAWALA RESERVOIR

0929/'10

13.**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, 375/B, සහබන්දු කොක්මාදුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙල්ගහවල ජලාශය යටතේ අස්වද්දනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ජලාශය අක්කර හතක (07) පමණ වපසරියකින් යුක්ත වර්ෂ සියයක් (100) පමණ පැරණි ජලාශයක් බවත්;

(ii) වර්ෂ 10 ක පමණ කාලයක සිට පුද්ගලයින් දෙදෙනෙකු විසින් එම වැවට හිමිකම් කියාපෑම නිසා කුඹුරු ඉඩම්වලට ජලය ලබා ගැනීමට බාධා ඇති වී තිබෙන බවත්;

(iii) මේ වන විට එය වල් බිහි වී කුඹුරු ඉඩම්වලට ජලය ලබා ගැනීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ජලාශය නැවත රජයට පවරා ගෙන හෝ ප්‍රතිසංස්කරණය කොට කුඹුරු ඉඩම් වගා කිරීමට අවශ්‍ය ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் வெலிப்பிட்டிய பிரதேச செயலக அதிகாரப் பிரதேசத்தில் 375/B சஹபந்து கொக்மாதுக கிராம உத்தியோகத்தர் பிரிவில் அமைந்துள்ள தெல்கஹவல நீர்த்தேக்கத்தின் கீழ் சாகுபடி செய்யப்படுகின்ற வயல்களின் ஏக்கரளவு யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நீர்த்தேக்கம் சுமார் ஏழு (07) ஏக்கர் பரப்பளவுடைய ஏறக்குறைய நூறு (100) ஆண்டுகள் பழமை வாய்ந்த நீர்த்தேக்கம் என்பதையும்;

(ii) ஏறக்குறைய 10 வருடங்களாக இரண்டு ஆட்களினால் மேற்படி குளத்திற்கு உரிமை பாராட்டப்பட்டு வருவதனால் வயற்காணிகளுக்கு நீரைப் பெற்றுக் கொள்ள தடையேற்பட்டுள்ளதென்பதையும்;

(iii) தற்போது இது காடுமண்டி வயற்காணிகளுக்கு நீரைப் பெற்றுக் கொள்ள முடியாத நிலையை அடைந்துள்ளதென்பதையும்

அவர்அறிவாரா?

(இ) (i) மேற்படி நீர்த்தேக்கத்தை அரசாங்கம் மீண்டும் சுவீகரித்தேனும் புனரமைத்து, வயற்காணிகளைப் பயிர்செய்ய அவசியமான நீரை வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்காக எடுக்கும் காலம் எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agrarian Services and Wildlife:

(a) Will he state the acreage of paddy land cultivated under Delgahawala Reservoir situated in 375/B, Sahabandu Kokmaduwa Grama Niladhari Division of Welipitiya Divisional Secretary's Division in the Matara District?

(b) Is he aware that -

(i) the aforesaid reservoir, which has an area of about seven (07) acres is about one hundred (100) years old;

(ii) obtaining water for the paddy lands has been hindered because two persons have been claiming ownership of that tank for a period of about 10 years;

(iii) it is covered by forest at present and fallen to such a state that water cannot be obtained for paddy lands from that reservoir?

(c) Will he inform this House-

(i) whether measures will be taken to provide the water required for the cultivation of paddy lands by reconstructing it at least after transferring that tank to the State again;

(ii) if so, the period of time required for it?

(d) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

(අ) ඉහත ජලාශය යටතේ කුඹුරු අක්කර 75කට සෘජුව වාරි පහසුකම් සපයන අතර ලෝමස්ථාය, ගස්විටයාය, බුහරයාය යන යායන් තුනෙහි අක්කර 250කට වක්‍රව වාරි පහසුකම් සපයයි. මේ අනුව වාරි පහසුකම් සපයනු ලබන මුළු අක්කර ප්‍රමාණය අක්කර 325කි.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ඇ) (i) ඔව්.

(ii) අදාළ ජලාශයට යට වන බිම් ප්‍රමාණය පවරා ගැනීමට මේ වන විට අවශ්‍ය ලේඛන සකස් කරමින් පවතී.

(ඈ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න අහන්න කලින් ගරු ඇමතිතුමා සඳහන් කළ පිළිතුරෙහි අස්වද්දන සමස්ත අක්කර ප්‍රමාණය නැවත කියන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අක්කර 325යි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේක රජයට අයිති කොටසක්. ඒ සම්බන්ධයෙන් ඇමතිතුමා පිළිතුරු දුන්නේ "ඔව්" කියායි. මේ රජයට අයිති කොටස තමයි පුද්ගලයින් දෙදෙනෙක් හිමිකම් පාලා බුක්ති විඳින්නේ. මේකෙන් අහිංසක ගොවීන් අපහසුතාවයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ වරද නිවැරදි කරලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න අමාත්‍යාංශය මඟින් කටයුතු කරනවාද කියා මම අහනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඒ ප්‍රශ්නයට "ඔව්'" කියා පිළිතුරු දී තිබෙනවා. පැහැදිලිවම අපි ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කරනවා. බලෙන් ඉන්න අය ඉවත් කරලා, වැව නිදහස් කරලා ගොවීන්ට අවශ්‍ය ජලය රැස් කර ගන්න පුළුවන් විධියට අපි වැව සකස් කරලා දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ සඳහා කොපමණ කාලයක් ගත වේවිද කියා මම අහනවා. මොකද, මේ දෙදෙනා විවිධ කුමන්ත්‍රණ දියත් කරමින් ඉන්නවා, මේ පවරා ගැනීම නතර කරන්න. ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමාගේ මැදිහත් වීමක් නොවෙයි. නිලධාරි මට්ටමෙන් එවැනි කුමන්ත්‍රණ දියත් කරමින් ඉන්නවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මොන කුමන්ත්‍රණ කළත් ඒ කුමන්ත්‍රණවලට ඉඩ දෙන්නේ නැතුව අපි මේ අවුරුද්ද තුළ මේ කටයුත්ත කරලා අවසන් කර දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් මේ ප්‍රදේශයේ ඉතා බරපතළ විධියට කෙටල වගාව පැතිරී තිබෙනවා. ඒ නිසා මදුරුවන් සහ විසකුරු සර්පයින් බෝ වීමේ ප්‍රවණතාව වැඩි වෙලා තිබෙනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මදුරු උවදුර සම්බන්ධ ඒ ප්‍රශ්නය සෞඛ්‍ය ඇමතිතුමාගෙන් තමයි අහන්න ඕනෑ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම දන්නවා. හැබැයි මේ කෙටල වගාව තිබෙන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයට අයිති කොටසකයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
කෙටල වගාව ගැන නම් කතා කරන්න පුළුවන්. මදුරු උවදුර ගැන නම් සෞඛ්‍ය ඇමතිතුමාගෙන් තමයි අහන්න ඕනෑ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම මදුරුවා ගැන නොවෙයි අහන්නේ ඇමතිතුමනි. මම අහන්නේ මේ ඩෙංගු උවදුරෙන් බරපතළ ප්‍රශ්න ඇති වෙලා තිබෙන තත්ත්වයක් යටතේ ඔබතුමා මනුෂ්‍ය ජීවිත ගැන යම් කිසි කැක්කුමක් තිබෙන පුද්ගලයෙක් විධියට සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක මැදිහත් වෙලා මේකට මොකක් හරි පියවරක් ගන්නවාද කියන එකයි. මේක බලන්න සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් යනවා නම් බෝට්ටු ඕනෑ. ඒ උපකරණ අවශ්‍යයි. ඒ නිසා ඒ අවශ්‍ය මැදිහත්වීම අමාත්‍යාංශය විධියට ඔබතුමන්ලා කරනවාද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

දැන් මදුරුවෝ විනාශ කරලා කොටල අල ටික රැක දෙන්න නේ, තමුන්නාන්සේට ඕනෑ?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒක තමුන්නාන්සේගේ ප්‍රතිපත්තිය වෙන්න ඇති. අපට ඕනෑ කොටල අල ටික රැක ගන්න නොවෙයි. මනුෂ්‍ය ජීවිත ටික රැක ගන්න. කොටල අල ටික රැකෙන්න ඕනෑ නැහැ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ඒක තමයි. මදුරුවෝ විනාශ කරලා මිනිස් ජීවිත රැක දීලා ඊළඟට වගාවත් රැකලා දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

කොටල අල ටික ඔබතුමා ගෙදර ගෙනිච්චත් ප්‍රශ්නයක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඒකට පිළිතුර ලැබුණා.

## මන්දපෝෂණයෙන් පෙළෙන වතුකරයේ ළදරුවන්: ක්‍රියාමාර්ග
## பெருந்தோட்டத்துறைச் சிசுக்களின் போஷாக்கின்மை: நடவடிக்கை
## MALNUTRITION IN INFANTS OF PLANTATION SECTOR: MEASURES TAKEN

1031/'10

14. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
( மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වතුකරයේ මන්ද පෝෂණයෙන් පෙළුණු ළදරු ප්‍රතිශතය කවරේද;

(ii) එම තත්ත්වයන් මඟ හැරවීම සඳහා රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) රජය විසින් ගනු ලබන එම ක්‍රියාමාර්ග එම ළදරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டின் இறுதியாகும்போது இலங்கையின் பெருந்தோட்டங்களில் போஷாக்கின்மையால் பாதிக்கப்பட்டிருந்த சிசுக்களின் சதவீதம் யாது;

(ii) இந் நிலைமைகளைத் தவிர்ப்பதற்காக அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

(iii) அரசாங்கத்தினால் மேற்கொள்ளப்படும் அந்நடவடிக்கைகள் மேற்படி சிசுக்களின் போஷாக்குத் தரத்தை மேம்படுத்த போதுமானதா

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state-

(i) the percentage of children in the plantation sector of Sri Lanka who suffered from malnutrition by the end of 2010;

(ii) the steps to be taken by the Government to arrest this situation; and

(iii) whether the steps taken by the Government are sufficient to raise the nutritional level of those children?

(d) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා පෝෂණය ගැන තමයි දිගටම අහන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇයි අමාරුද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

නැහැ, කිසි අමාරුවක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එහෙනම් උත්තර දෙන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
උත්තර දෙනවා ප්‍රශ්නයක් නැහැ. තමුන්නාන්සේ කලබල වෙන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට මා පිළිතුරු දෙනවා.

(අ) (i) ජන විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය (DHS) 2006—2007ට අනුව වතුකරයේ සිටින අවුරුදු 5ට අඩු දරුවන් පිළිබඳ දත්ත පහත සපයා ඇත.

| පෝෂණ ඌනතා දර්ශකය | වයස අවුරුදු 5ට අඩු ළමා ජනගහණයේ ප්‍රතිශතය |
|---|---|
| මිටි බව සහිත (වයසට නිසි උස නැති) දරුවන් ප්‍රතිශතය | 40.2% |
| කෘශ බව සහිත (උසට සරිලන බර නොමැති) දරුවන් ප්‍රතිශතය | 13.5% |
| අඩු බර සහිත (වයසට සරිලන බර නොමැති) දරුවන් ප්‍රතිශතය | 30.1% |

(ii) ඇමුණුම සභාගත කරමි.

(iii) ඔව්.

(ආ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

මුලු දිවයින පුරා ක්‍රියාත්මක වන වැඩසටහන්

1. සෑම අලුත උපන් දරුවෙකුටම උපතේදී ළදරු ළමා වර්ධන සටහන් පතක් ලබා දීම තුළින් ළදරු ළමා සෞඛ්‍යයට අදාළ පණිවිඩ සහ පෝෂණ තත්ත්වය ඇගයීම ආරම්භ කිරීම.
2. මාස 06 දක්වා මව් කිරි පමණක් ලබා දීම හා අවුරුදු 2 දක්වා පවත්වා ගෙන යාමට අවශය උපදෙස් ලබා දීම සහ ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ විශේෂිත පුහුණුවක් ලබා දීම.
3. ළදරුවන්ගේ සහ ළමුන්ගේ වර්ධන තත්ත්වය ක්‍රමානුකූලව ඇගයීම සහ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය උපකරණ සැපයීම.
4. ළදරුවන්ට හා ළමුන්ට අවශ්‍ය අමතර ආහාර ලබා දීම පිළිබඳ නව සංකල්ප හඳුන්වා දීම.
5. ඒකාබද්ධ පෝෂණ වැඩසටහන (ජීවන චක්‍රයේ විවිධ අවස්ථාවන් අරමුණු කරගත් පෝෂණ වැඩසටහන්)
   - යොවුන් වියේදී විවාහයට පෙර කාන්තාවගේ, ගැබිණි මවගේ සහ කිරි දෙන මවගේ පෝෂණය නංවාලීම තුළින් අඩු බර උපත් අවම කිරීම.
   - ළදරුවන්ගේ හා පෙර පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම තුළින් මන්දපෝෂණය අවම කිරීම.
6. අවුරුදු 5ට අඩු වයස් කාණ්ඩවල දරුවන්ගේ පෝෂණ ඌනතා හඳුනා ගැනීම සහ පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
   - ත්‍රිපෝෂ ලබා දීම
   - ක්ෂුද්‍ර පෝෂක (විටමින් සහ ඛනිජ ලවණ) ලබා දීම
   - විටමින් ඒ අධිමාත්‍රා ලබා දීම
7. උග්‍ර තීව්‍ර මන්දපෝෂණය වැඩි දිස්ත්‍රික්ක හඳුනා ගෙන (වතු ඇතුළත්ව) පෝෂණ පුනරුත්ථාපන වැඩසටහන් දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම (උතුරු නැඟෙනහිර සියලුම දිස්ත්‍රික්ක සහ හම්බන්තොට, මොණරාගල, බදුල්ල, නුවරඑළිය)
   - උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහිත ළමුන් සඳහා ඖෂධීය ආහාර (BP 100, Plumpy nut, F100, F75) ලබා දීම.
   - මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය සහිත ළමුන් සඳහා පරිපූරක ආහාර (ත්‍රිපෝෂ, කෝන් සෝයා පිටි, අධිපෝෂිත ආහාර) ලබා දීම.
   - උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහිත රෝගී දරුවන් සඳහා රෝහල් තුළ විශේෂ ප්‍රතිකාර ලබා දීම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ලබා දුන්න පිළිතුරට ප්‍රකාරව එතුමා සඳහන් කළා අඩු උපත් බර දරුවන් සියයට 30කට වැඩි ප්‍රමාණයක් වතුකරයේ ඉන්නවා කියලා. ඒක ලංකාවෙන්ම අංක එක. ඒ වාගේම ලංකාවෙන්ම අංක එකේ ළදරු මරණ අනුපාතය සියයට 19.7ක්. ඒකත් වතුකරයේ. ඒ වාගේම ක්ෂය වීම සියයට 40ත් වතුකරයේ. මම අහන්න කැමැතියි ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන්, මේ විශේෂිත වූ තත්ත්වයන් නිසා වතුකර ක්ෂේත්‍රයේ ළදරුවන්ගේ සෞඛ්‍ය සම්පන්නභාවය වර්ධනය කරන්නට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විශේෂ මැදිහත්වීමක් ක්‍රියාත්මක කරන්නට ඔබතුමා කටයුතු කරනවාද කියලා?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික පෝෂණ මාසය වෙනුවෙන් පසු ගිය 3 වැනිදා නුවරඑළිය දිස්ත්‍රික්කයේ "පෝෂණ ප්‍රවර්ධන සහයෝගිතා වැඩසටහන" කියලා වතුකරයේ ජනතාව වෙනුවෙන් විශේෂිත වූ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට කටයුතු කළා. -එදත් මම මේ උත්තරය දුන්නා.- ඒ සඳහා මේ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා.

අපි අතිගරු ජනාධිපතිතුමාටත්, රජයටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, පෝෂණයට ආදායම බලපානවා. අද වතුකරයේ සමස්ත ජනතාවගේ වැටුප් වැඩි කරන්න මේ රජය කටයුතු කරලා තිබෙනවා. මම හිතන්නේ රුපියල් 405ක්ව තිබුණු වැටුප රුපියල් 515 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ කියන්නේ කලින් රුපියල් 285ක්ව තිබුණු දීමනාව රුපියල් 380ක් කරලා තිබෙනවා. ඊ ළඟට වැඩට පැමිණීම අනුව දෙන රුපියල් 90ක් වූ දීමනාව -පැමිණීමේ ප්‍රතිශතයක් ගන්නේ නැතුව- රුපියල් 105 දක්වා වැඩි කරලා තිබෙනවා. ඊට අමතරව තේ දළු කඩන ප්‍රමාණය අනුව රුපියල් 12ක් ගෙව්වා. ඒක රුපියල් 12 සිට රුපියල් 17 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ අනුව අද රුපියල් 515 දක්වා වැටුප් වැඩි කිරීමක් කරලා තිබෙනවා. මම හිතන්නේ මේ ආදායම් වැඩි වන තත්ත්වය යටතේ පෝෂණයටත් ඒක බලපානවා.

ඊ ළඟට මෙතුමාට කියන්න ඕනෑ, වතුකරයේ ප්‍රතිශතයත් ඇතුළුව ජාතික මට්ටමෙන් ගත්තත් අවුරුදු 5ට අඩු, වයසට සරිලන බර නොමැති දරුවන්ගේ ප්‍රතිශතය සියයට 22.8ක් තමයි තිබෙන්නේ. ඒක 2007 තත්ත්වය සහ අනෙකුත් තත්ත්වයන් අනුව ගත්තාම ඊට වඩා අඩු වෙනවා. පොදුවේ ගත්තාම පෝෂණ තත්ත්වයට කෘෂිකර්ම අමාත්‍යාංශයත් සම්බන්ධ වෙනවා. ඒ අනුව විවිධ අමාත්‍යාංශවල සහයෝගය අරගෙන තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. ඒක තනිකර සෞඛ්‍ය අමාත්‍යාංශයටම කරන්න බැහැ. අනෙකුත් අංශත් දැනුවත් කරලා ඒ අනුව තමයි

ක්‍රියාත්මක කරන්නේ. විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයට මේක වැදගත් වන නිසා ඒ දිස්ත්‍රික්කය ඉලක්ක කර ගෙන තමයි ඒ විශේෂිත වූ වැඩසටහන පසු ගිය 3 වැනිදා ක්‍රියාත්මක කරන්න කටයුතු කළේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක දෙක.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. විශේෂයෙන්ම අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළා, ජාතික පෝෂණ මාසය ගැන. විශේෂයෙන්ම මම මේකත් එතුමාට මතක් කරලා දෙන්නට ඕනෑ. මහින්ද චින්තන ඉදිරි දැක්මේ කියනවා, "මාතෘ සහ ළදරු මරණ අනුපාතිකයන් තව දුරටත් අඩු කිරීම සඳහා තිරසාර වැඩ පිළිවෙළක් නිර්මාණය කර ඇති අතර, ඒ යටතේ ගර්භිණී මව්වරුන්, ළදරුවන් සහ ළමුන් සඳහා වන විශේෂ සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහනක් දියත් කරමි." කියලා. එතකොට මේ ජාතික පෝෂණ මාසයෙන් ක්‍රියාත්මක වන විශේෂ වැඩසටහනක් නැහැ. රුපියලකවත් වැඩිපුර අරමුදලක් පෝෂණය වෙනුවෙන් වෙන් වෙන්නේ නැහැ. සිදු වුණු විශේෂත්වය මොකක්ද? වාර්ෂිකව පවත්වන ජාතික පෝෂණ මාසය කොළඹ පවත්වනවා වෙනුවට ඒක නුවරඑළියේ ගිහිල්ලා පැවැත්වූවා. මට කියන්න, මන්ද පෝෂණ තත්ත්වය මඟ හරවා ගන්නට රජය දක්වන සෘජු දායකත්වය මොකක්ද කියලා? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ජාතික පෝෂණ සතියක් පවත්වලා පෝෂණ මට්ටම ඉහළ නංවාලන්නට බැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්නිදිග ආසියානු කලාපයේ සෞඛ්‍ය තත්ත්වය ගත්තාම -මෙතුමා කිව්ව එක මම පිළිගන්නවා. අපේ මාතෘ මරණ සංඛ්‍යාව ඉතාම අඩු ප්‍රමාණයකයි තිබෙන්නේ.

අවුරුදු 5ට අඩු දරුවන්ගේ මරණ අනුපාතය ගත්තාම 1,000ට 12.1යි. ඒ කියන්නේ කලාපීය වශයෙන් ගත්තාම ඒක ඉතාම හොඳ මට්ටමක් බවයි. මාතෘ මරණ අනුපාතය සජීවී උපත් ලක්ෂයකට 39.3යි. ඒක ඉතාම හොඳ තත්ත්වයක් මේ අග්නිදිග ආසියානු කලාපය හා සසඳන විට. ලෝක සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම අග්නිදිග ආසියානු කලාපීය රටවල් අතරින් අපි ඉහළ තත්ත්වයක ඉන්නවා. මේ ක්‍රියාත්මක වන පෝෂණ වැඩසටහන විශේෂ වූ වැඩසටහනක්. ගරු ඇමතිතුමා තමයි එය නුවරඑළියේ තියන්න තීන්දු කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අපේ රටේ අගය නොකළාට එතැනට ආපු UNICEF සංවිධානයේ ලංකාවේ නිත්‍ය නියෝජිතතුමා කිව්වා මේක ඉතාම අගය කරනවා කියලා. ගරු ඇමතිතුමා වෙනත් අමාත්‍යාංශ -කෘෂිකර්ම අමාත්‍යාංශය සහ තවත් අමාත්‍යාංශ- සම්බන්ධ කර ගෙන මේ වැඩසටහන මේ විධියට නුවරඑළියට ගෙන ගිහිල්ලා ක්‍රියාත්මක කිරීම ගැන එතුමා බොහොම හොඳ ඇගැයීමක් කළා. UNICEF ආයතනය තමයි අපට ගොඩක් ආධාර දෙන්නේ. ඒ ඇගයීම කළේ අප හොඳ වැඩසටහනක් ක්‍රියාත්මක කරන නිසා. මමත් එතැන සිටියා. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තරය මේකයි. මෙය දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක කරන විශේෂ වැඩසටහනක්. ඊට අමතරව තිබෙනවා ජාතික වශයෙන් වැඩසටහනක්. පෝෂණ ඌනතාව කියන්නේ දීර්ඝ කාලීන ප්‍රශ්නයක්. අතිගරු ජනාධිපතිතුමා ඒ සම්බන්ධයෙන් "මහින්ද චින්තන" යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. පෝෂණ මල්ල වැඩසටහන ආදි සියල්ල ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කරනවා. එක එක ප්‍රශ්නය උද්ගත වෙන කොට නොවෙයි පිළියම් යොදන්නේ. ඩෙංගු රෝගය ගත්තොත්, ඩෙංගු සම්බන්ධයෙන් අද ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වෙනවා. ඩෙංගු රෝගය උත්සන්න වෙන කොට මදුරුවන් මරන්න යනවා නොවෙයි. ඒ සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. ජාතික මට්ටමේ ප්‍රතිපත්තියක් සකස් කරලා ඒ වැඩසටහන අද පළාත් සභා හරහා ක්‍රියාත්මක වෙනවා. පෝෂණ වැඩසටහනත් ඒ ආකාරයටම ක්‍රියාත්මක වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා නැවත වරක් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි ලංකාවේ අඩු උපත් බර දරුවන් වැඩියෙන්ම සිටින්නේ වතුකරයේ නම්, ක්ෂය වීමේ දීර්ඝ කාලීන මන්ද පෝෂණ තත්ත්වය වැඩියෙන්ම තිබෙන්නේ වතුකරයේ නම්, ලංකාවෙන්ම අංක එකේ ළදරු මරණ අනුපාතය තිබෙන්නේ වතුකරයේ නම් ඒ දූ දරුවන්ගේ, ඒ ළදරු පරපුරේ පෝෂණ මට්ටම වර්ධනය කරන්නේ කොහොමද ඒ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන් 10 දෙනකුගේ පුරප්පාඩු තිබෙනවා නම්, දොස්තරවරුන් 128කගේ පුරප්පාඩු තිබෙනවා නම්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් 191කගේ අඩු පාඩු තිබෙනවා නම්? මම මේ දත්තයන් විදහා දක්වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන්. කාරුණිකව උත්තර දෙන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියන ආකාරයට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මේ විශේෂ වූ සේවාවන්හි නිලධාරි සියල්ල කොහොම හරි සම්පූර්ණ කරලා කරන්න බැහැ. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගේ අඩුවක් නැහැ. ඔවුන්ගේ අඩුවක් තිබුණොත් ඒ සඳහා වැඩ ආවරණය කරන්න කටයුතු කරනවා. ඒ වාගේම පවුල් සෞඛ්‍ය නිලධාරින් බලන්න. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයකට අද වෛද්‍යවරුන් දෙදෙනකු පත් කරලා තිබෙනවා. ඉස්සර සිටියේ එක ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියකුයි. අද සහකාර ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයකු පත් කරලා තිබෙනවා.

එතකොට ඒ අංශයේ අදාළ හෙදියන් ඉන්නවා. ඊට අමතරව පවුල් සෞඛ්‍ය සේවිකාවන් ඉන්නවා. එතකොට යම් ඒකකයක පවුල් සෞඛ්‍ය සේවිකාවක් නැත්නම්, ඒ සඳහා වැඩ ආවරණය කරන්න කෙනෙක් පත් කරනවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමාත් එදා කිව්වා, විශේෂයෙන්ම මේ වතු රෝහල් රජයට පවරා ගෙන රජය විශේෂිත වැඩ සටහනක් ක්‍රියාත්මක කර තිබෙන බව. ඒ, වතු රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීලා වෛද්‍යවරුන් සපයන්න. ඒ නිසා අඩු පාඩු එකක් දෙකක් තිබුණත් ඉදිරියේ දී -දැන් මේ ඊයේ පෙරේදාත් විශාල පත්වීම් ප්‍රමාණයක් ලබා දුන්නා- මේවා සමථයකට පත් වනවා. ඒ නිසා සෞඛ්‍ය මධ්‍යස්ථානයක් නැහැ යි කියලා ඒ බඩ දරු අම්මලා බලන්නේ නැතිව ඉන්නේ නැහැ. ඒ කටයුත්ත ක්‍රියාත්මක කරන්න ප්‍රජා ශාලා තිබෙනවා. සමහරවිට ගෙයක් වන්නට පුළුවන්, එහි කාමරයක වෛද්‍යවරයා ඇවිල්ලා ඒ කටයුතු කරනවා. ඒ නිසා සෞඛ්‍ය

[ගරු ලලිත් දිසානායක මහතා]

සේවාව කඩා වැටෙන්නට ඉඩ හැරලා නැහැ. වෛද්‍යවරයෙක් නැති වුණා කියලා හරි, එහෙම නැත්නම් සෞඛ්‍ය මධ්‍යස්ථානයක් නැහැ යි කියලා හරි, මේ පෝෂණ වැඩසටහන හෝ ජනතාවට සෞඛ්‍ය සේවා සැපයීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම වළක්වා නැහැ. එම සේවාවන් නියම ආකාරයෙන් සැපයීම වෙනත් නිලධාරියෙක් හරහා හරි ක්‍රියාත්මක කරන්නට කටයුතු කරලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හරි, බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාවන්න. මම ඇහුව ප්‍රශ්නයට එතුමා උත්තර දුන්නේ නැහැ. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ලා 190කගේ, ඒ වාගේම දොස්තරවරුන් 128කගේ, ඒ වාගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන් 10 දෙනෙකුගේ පුරප්පාඩු පුරවන්නේ කවදාද කියලා යි මම ඇහුවේ. එතුමා ඒකට නොවෙයි උත්තර දෙන්නේ. වැල්වටාරම් දොඩවන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට ඒක අදාළත් නැහැ. නමුත් මම උත්තර දෙනවා. මෙහෙමයි, දැනට ඒ පුරප්පාඩු පුරවමින් පවතිනවා. පවුල් සෞඛ්‍ය සේවිකාවන් 1,000ක් බඳවා ගන්නට කටයුතු කර තිබෙනවා. දැන් 500ක් පුහුණු කර ගෙන යනවා. තවත් 500ක් ඉදිරියේ දී පුහුණු කරනවා. එතකොට ඒ අය ආවාම මේ තත්ත්වය විසඳෙයි. ක්ෂණිකව මේවා දෙන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 15, ගරු අනුර කුමාර දිසානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
This is under Standing Order No. 84(vi). The Minister says that the Government has made a salary increase. There is no such salary increase that the Government has made.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Standing Order No. 84(vi) does not refer to what you are saying. ස්ථාවර නියෝග 84 (vi)හි සඳහන් වන්නේ, "අධිකරණ විනිශ්චයට භාජනව ඇති කාරණයක් පිළිබඳ කථා කළ නොහැක." කියලායි. So, there is no such Standing Order.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Under 84 and 85 -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the relevant section? Under what subsection of Standing Order No. 84?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Misleading Parliament, Sir.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Misleading Parliament, under which subsection?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am saying that the President has told that there is a salary increase for the - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member this is not the time to take up such issues, this is Question time. So you raise it - [*Interruption.*]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am saying that this statement is misleading Parliament. The President has -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You cannot raise it now. You raise it at the correct time.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The President has not increased the salaries. This is misleading information.

## බිත්තර හා කුකුළු මස් ආනයනය: පිරිවැය
## முட்டைகள் மற்றும் கோழி இறைச்சி இறக்குமதி: செலவினம்
## EGGS AND CHICKEN IMPORT: COST

1168/'11

15. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බිත්තර හා කුකුළු මස් මිල ඉහළ යාමේ අර්බුදය හමුවේ පිට රටින් ගෙන්වන ලද බිත්තර හා කුකුළු මස් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පිට රටින් එක් බිත්තරයක් ගෙන්වීමේදී මිලදී ගැනීමේ පිරිවැය, වරාය ගාස්තු හා ප්‍රවාහන ගාස්තු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ අනුව ශ්‍රී ලංකාවට ගෙන්වන ලද බිත්තරයක මිල හා එම බිත්තරයක් වෙළඳ පොළේදී විකුණූ මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முட்டைகள் மற்றும் கோழி இறைச்சி விலைகள் அதிகரிக்கின்ற நெருக்கடிக்கு மத்தியில் வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யப்பட்ட முட்டைகள் மற்றும் கோழி இறைச்சியின் அளவு வெவ்வேறாக எவ்வளவு;

(ii) வெளிநாட்டிலிருந்து முட்டையொன்றை இறக்குமதி செய்யும்போது கொள்வனவுச் செலவு, துறைமுகக் கட்டணம் மற்றும் போக்குவரத்து கட்டணங்கள் வெவ்வேறாக எவ்வளவு;

(iii) அதன்படி இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட முட்டையொன்றின் விலை மற்றும் அந்த முட்டை சந்தையில் விற்கப்பட்ட விலை யாது

என்பதை இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he inform this House-

(i) separately the amounts of eggs and chicken imported from abroad in the face of the crisis of rising egg and chicken prices;

(ii) separately the purchasing cost, port charges and transport charges when importing an egg from abroad;

(iii) accordingly, the price of an egg imported to Sri Lanka, and the price at which such an egg was sold in the market ?

(b) If not , why ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

(අ) (i) බිත්තර 99,18,720යි.

කුකුළු මස් මෙට්‍රික් ටොන් 496.353යි.

(ii) එක් බිත්තරයක් සඳහා නැව් ගාස්තු සහිත මිල - රුපියල් 8.656

එක් බිත්තරයකට මෙරටදී ගෙවන ලද රක්ෂණ ගාස්තු - රුපියල් 0.008

එක් බිත්තරයක් සඳහා ගැනුම් මිල නැව් ගාස්තු හා - රක්ෂණ ගාස්තු සහිතව රුපියල් 8.664

එක් බිත්තරයක් සඳහා වරාය ගාස්තු හා නැව් නියෝජිතයන්- වෙනුවෙන් මෙරටදී ගෙවන ලද ගාස්තු -රුපියල් 0.184

එක් බිත්තරයකට ප්‍රවාහන හා පැහැදුම් කිරීමේ ගාස්තු - රුපියල් 0.096

එක් බිත්තරයකට ගෙවන ලද බදු මුදල් ප්‍රමාණය - රුපියල් 0.637

එක් බිත්තරයක් සඳහා ගෙවන ලද බැංකු ගාස්තු - රුපියල් 0.029

එක් බිත්තරයක් සඳහා මුළු මිලදී ගැනීමේ පිරිවැය - රුපියල් 9.61

(iii) බිත්තරයක මිල (පිරිවැය) - රුපියල් 9.61

බිත්තරයක විකුණුම් මිල (තොග)- රුපියල් 11.00

බිත්තරයක විකුණුම් මිල (සිල්ලර) - රුපියල් 12.00

(ආ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, කුකුළු මස් මෙට්‍රික් ටොන් 496.353ක් ගෙනාවාය කියා ඔබතුමා සඳහන් කළා. මා මේ ප්‍රශ්නය අසා නැති වුණත් මෙයින් පැන නැඟෙන අතුරු ප්‍රශ්නයක් ලෙස ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, එහි අළෙවිය සහ මිල ගණන් ඉදිරිපත් කරන්න පුළුවන්ද කියලා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔබතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මා ඒ විස්තර ගෙනැවිත් නැහැ. අද මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ බිත්තර ගැන විතරයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොල් ගැනත් කියන්න අමාරු වෙයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
පොල් ගැනත් අහලා නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා ඔබතුමාගෙන් පොල් ගැන අහන්නේ සරල ප්‍රශ්නයක්. ඒ කියන්නේ මිල ගණන් ගැන නොවෙයි. ඉන්දියාවෙන් පොල් ගෙන්වීමට ඔබතුමන්ලා තීරණයක් ගත්තා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය නේද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. අපට ලැබී තිබෙන සමහර තොරතුරු අනුව පොල් යම් ප්‍රමාණයක් ආවා. මොකක් හරි හේතුවක් නිසා ඒ පොල් ලංකාව ඇතුළට ගෙන එන්න බැරි වුණාද? ලංකාවේ වෙළෙඳ පොළට ඒ පොල් නිකුත් කරන්න පුළුවන්කම ලැබුණාද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැ. වෙළෙඳ පොළට නිකුත් කළේ නැහැ. වරායේදීම සම්පූර්ණයෙන්ම විනාශ කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තොගය කොච්චර ප්‍රමාණයක්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
පොල් ගෙඩි හැත්තෑපන්දහසක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන වටය. ප්‍රශ්න අංක 1-0479/'10- (2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයට උත්තරයක් ලැබෙනවා කියා සිතමින් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රැඳවුම් භාරයේ සිටින එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්: විස්තර
## தடுப்புக் காவலிலுள்ள எல்.ரி.ரீ.ஈ. உறுப்பினர்கள்: விபரம்
## LTTE CADRES IN DETENTION : DETAILS

0632/'10

2. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) යුද්ධයෙන් පසු රැඳවුම් භාරයේ තබා ගෙන සිටින එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;
(ii) එම රැඳවියන්ට අදාළ චෝදනා මේ වන විට ගොනු කර තිබේද;
(iii) ඔවුන් රඳවා තිබෙන කඳවුරු සංඛ්‍යාව කොපමණද;
(iv) එම කඳවුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රැඳවුම් කඳවුරුවල රඳවා ගෙන සිටින එල්.ටී.ටී.ඊ. නොවන සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;
(ii) එම සැකකරුවන්ගේ නාම ලේඛනයක් සකසා තිබේද;
(iii) එසේ නම්, එම නාම ලේඛනය ඉදිරිපත් කරන්නේද;
(iv) එකී සැකකරුවන්ට එරෙහිව චෝදනා ගොනු කර තිබේද;
(v) එම චෝදනා විභාග කරන දිනය කවරේද;
(vi) එම නඩු විභාග පැවැත්වෙන අධිකරණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) யுத்தத்தின் பின்னர் தடுப்புக் காவலில் வைக்கப்பட்டுள்ள எல்.ரி.ரீ.ஈ. அங்கத்தவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;
(ii) இவ்வாறு தடுத்து வைக்கப்பட்டுள்ளவர்களுக்கு ஏற்புடைய குற்றச்சாட்டுகள் ஏற்கெனவே தாக்கல் செய்யப்பட்டுள்ளனவா என்பதையும்;
(iii) இவர்கள் தடுத்துவைக்கப்பட்டுள்ள முகாம்களின் எண்ணிக்கை யாதென்பதையும்;
(iv) அந்த முகாம்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) தடுப்பு முகாம்களில் தடுத்துவைக்கப்பட்டுள்ள எல்.ரி.ரீ.ஈ. அல்லாத சந்தேக நபர்களின் எண்ணிக்கை யாதென்பதையும்;
(ii) மேற்படி சந்தேக நபர்களின் பெயர்ப் பட்டியலொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;
(iii) ஆமெனில், அப்பெயர்ப் பட்டியலைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) மேற்படி சந்தேக நபர்களுக்கு எதிராக குற்றச்சாட்டுகள் தாக்கல் செய்யப்பட்டுள்ளனவா என்பதையும்;

(v) மேற்படி குற்றச்சாட்டுகள் விசாரிக்கப்படும் திகதி யாதென்பதையும்;

(vi) மேற்படி வழக்கு விசாரணை நடாத்தப்படும் நீதிமன்றம் எது என்பதையும்

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs :

(a) Will he state-

(i) the number of LTTE cadres held under detention in the aftermath of the war;

(ii) whether charges have been framed against them by now;

(iii) the number of camps in which they are detained;

(iv) what those camps are ?

(b) Will he inform this House-

(i) of the number of non LTTE suspects detained in detection camps;

(ii) whether a list of names of those suspects has been prepared;

(iii) if so, whether that list will be submitted;

(iv) whether charges have been framed against those suspects;

(v) the date on which such charges will be tried;

(vi) the court in which such trials shall take place ?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පිළිතුර සභාගත කරන්නද?

**ගරු අනුර දිසානායක මහත**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුර කියවනවා නම් හොඳයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) සාමාජිකයන් 839කි.

(ii) එම රැඳවියන්ගෙන් දෙදෙනෙකුට පමණක් චෝදනා ගොනු කර ඇති අතර, අනෙක් රැඳවියන්ගේ විමර්ශන කටයුතු සිදු කෙරෙමින් පවතී.

(iii) කඳවුරු සංඛ්‍යාව 03කි.

(iv) අ. බූස්ස රැඳවුම් කඳවුර

ආ. කොළඹ 01, නව මහලේකම් ගොඩනැඟිල්ල, 06 වන මහල

ඇ. වව්නියාව මූලස්ථාන පොලිස් ස්ථානය

(ආ) (i) රැඳවුම් කඳවුරුවල එල්ටීටීඊ නොවන සැකකරුවන් කිසිවෙකු නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

උත්තරය දීලා තිබෙන නිසා "අදාළ නොවේ".

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ආණ්ඩුව විසින් මේ සම්බන්ධයෙන් විවිධ අවස්ථාවල ප්‍රකාශයන් කළා. එක විටෙක හිටපු හමුදාපතිතුමා ප්‍රකාශ කරලා තිබුණා. තව විටෙක ආරක්ෂක ලේකම්තුමා ප්‍රකාශ කරලා තිබුණා. තව විටෙකදී මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා. එල්ටීටීඊ සැක කරුවන් රැඳවුම්භාරයේ ඉන්නවාය කියලා කිව්වා. එක විටෙක 8,000ක් ඉන්නවා කිව්වා; තව විටෙක 12,000ක් ඉන්නවා කිව්වා; තවත් විටෙක 15,000ක් ඉන්නවා කිව්වා. දැන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිතුරේ ලබා දීලා තිබෙන්නේ 839යි කියලායි. ඒ විතරක් නොවෙයි. ගරු ඇමතිතුමා සඳහන් කරලා තිබෙන්නේ කඳවුරු තුනක් ගැනයි.

බූස්ස, කොළඹ සහ වවුනියාව පොලිස් මූලස්ථානය කියන කඳවුරු තුනක් පිළිබඳව සඳහන් කර තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දන්නා පරිදි වැලිකන්දේ රැඳවුම් කඳවුරක් තිබෙනවා; ත්‍රිකුණාමලයේ රැඳවුම් කඳවුරක් තිබෙනවා. ඒ නිසා මේ පිළිතුර සම්පූර්ණ නැහැ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ 839ක්ය කියන සංඛ්‍යාව ඔබතුමා මේ පාර්ලිමේන්තුවට වග කීමකින් යුතුව ප්‍රකාශ කරන ලද්දක්ද කියා. වග කියනවා තමයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කඳවුරු තුනක් පිළිබඳව අපි පිළිතුරු දුන්නා. බූස්ස රැඳවුම් කඳවුර, කොළඹ 01, නව මහලේකම් ගොඩනැඟිල්ල සහ වවුනියාව පොලිස් මූලස්ථානය. රැඳවියන් 839 දෙනෙක් -එල්ටීටීඊ සාමාජිකයන්- රඳවා ගෙන සිටිනවා. මන්ත්‍රීතුමා කියන කඳවුරු ගැන අපට පිළිතුරක් දෙන්න බැහැ. එහෙම කඳවුරක්, කඳවුරක් හැටියට අපි බාර ගන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නයේ (අ) (i) කොටසෙන් මම අහලා තිබෙනවා, යුද්ධයෙන් පසු රැඳවුම් භාරයේ තබා ගෙන සිටින එල්ටීටීඊ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද කියා. ගරු ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පිළිතුරේ සඳහන් කරනවා, 839යි කියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්, යුද්ධයෙන් පසු අදට අදාළවයි අපි පිළිතුරු දෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම නම් අදට අදාළව රැඳවුම් භාරයේ ඉන්නේ 839යි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපේ මානුෂීය ක්‍රියා දාමයෙන් පසු, 2,85,000ක් අපේ පැත්තට පැමිණ ඒ රැඳවුම් කඳවුරුවලට පත් වුණු බව පාර්ලිමේන්තුවටත් රටටත් ලොවටත් අපි ප්‍රකාශ කර තිබෙනවා. ඒ ප්‍රමාණය වේගයෙන් අඩු වෙලා අද මේ තත්ත්වයට පැමිණ තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවතැන් කඳවුරුවල ඉන්න සංඛ්‍යාව තමයි 2,85,000. ගරු ඇමතිතුමා අවතැන් කඳවුරු සහ රැඳවුම් කඳවුරු පටලවා ගෙන තිබෙනවා. යුද්ධයෙන් පසු, 2,85,000ක්ය කියලා කියන්නේ රැඳවුම් කඳවුරුවල හිටපු අය නොවෙයි. 2,85,000ක් කොහෙවත් රැඳවුම් කඳවුරුවල සිටියේ නැහැ. යුද්ධයෙන් පසුව, අවසන් මොහොතේදී සහ විවිධ අවස්ථාවන්වලදී එම පළාත්වල හිටපු දෙමළ ජනතාව ආවා. ඒ අය 2,85,000කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. ඒ, අවතැන් කඳවුරුවල හිටපු අය. ඒ අය පදිංචි කිරීම පිළිබඳවයි එතුමා කියන්නේ. මම අහන්නේ ඒක නොවෙයි. මම පැහැදිලි ලෙස අසන්නේ රැඳවුම් කඳවුරු ගැනයි. එල්ටීටීඊ සැකකරුවන්ය කියලා සමහර අය බාර වුණා; සමහර අය අත් අඩංගුවට ගත්තා; සමහර අය අනෙක් අය විසින් තොරතුරු දීලා අත් අඩංගුවට ගනු ලැබුවා. මේ විධියට විශාල කඳවුරු ප්‍රමාණයක් හැදුවා. මේ පාර්ලිමේන්තුව විවිධ අවස්ථාවලදී ඒ අයගේ නාම ලේඛනයක් ඉල්ලුවා. එහෙම නාම ලේඛනයක් ඉදිරිපත් කළේ නැහැ. අද එතුමා කියනවා, රැඳවුම් බාරයේ සිටින්නේ 839යි කියලා. අනෙක් අය කෝ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ අත් අඩංගුවට අරගෙන රැඳවුම් කඳවුරුවල ඉන්නේ අවිහිංසාව පිළිනොගන්නා නිසායි. ඒකට ආවට පස්සේ ආයුධ අතට ගත් බොහෝ අය අවිහිංසාවාදයට පැමිණෙනවා. ආයුධ ගත් අය එසේ වෙනස් වෙනවා. ඉතින් සංඛ්‍යාව අඩු වෙන්න ඕනෑ. එහෙම තමයි කඳවුරුවල සිටින එල්ටීටීඊ පුද්ගලයින්ගේ සංඛ්‍යාව අඩු වෙලා තිබෙන්නේ. බොහෝ අය දැන් ගිහිල්ලා තිබෙනවා. ඒ ගම් නියම් ගම්වල ඔවුන් දැන් ගොවිතැන්බත් කරනවා. විවිධ වෘත්තීයමය කටයුතු කරනවා. ඒ නිසා සැමදා ඒ අය රැඳවුම් කඳවුරුවල සිටින අය හැටියට අපි සලකන්නේ නැහැ. ඔබතුමා හිතන තත්ත්වයට වඩා දැන් තත්ත්වය හාත්පසින්ම වෙනස්. මුළු උතුරුකරයේ තත්ත්වය අද වෙනසකට භාජනය වෙලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය වන්නේ මේකයි. මේ රැඳවුම් භාරයේ හිටපු සංඛ්‍යාව ගැන එක විටක පාර්ලිමේන්තුවේ කිව්වා 12,000ක් කියලා, මාධ්‍යවලට කිව්වා 15,000ක් කියලා, තව විටක 8,000ක් කිව්වා. සැබෑ ප්‍රමාණය කීයද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සත්‍ය තමයි මා ඉදිරිපත් කරලා තිබෙන්නේ. ආරක්ෂක අමාත්‍යාංශයෙන් එවා තිබෙන සත්‍ය තොරතුරු.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, පස්වැනි අතුරු ප්‍රශ්නය. අපි දැන් ඊ ළඟ කටයුත්තට යමු ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සරත් ෆොන්සේකා මහතාව ඔය වාගේ නිදහස් කරන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සරත් ෆොන්සේකාට ලණු දීපු මිනිස්සු දැන ගන්න ඕනෑ සරත් ෆොන්සේකාට දීපු ලණුව ගැන. රාජකාරිය කරන්නේ නැතිව වෙන රාජකාරියකට දාගත්තා. විරුද්ධ පක්ෂයේ නායකතුමාට එදා තරග කරන්න තිබුණා. එතුමාට තරග කරන්න දුන්නේ නැහැ. වෙන කුමන්ත්‍රණයක් මෙහෙයවුවා. මේ කුමන්ත්‍රණය පැරදුණාම දැන් අහනවා සරත් ෆොන්සේකා කවදාද නිදහස් කරන්නේ කියලා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ප්‍රශ්න දෙකක් තිබෙනවා. යුද්ධයේ අවසාන වෙලාවේදී භාර වූ පිරිස් රැඳවුම් භාරයේ සිටිනවා. තව පිරිසක් ඉන්නවා, යුද්ධයට පෙර විවිධ අවස්ථාවල සැකකරුවන් ලෙස අත් අඩංගුවට ගත්ත අය. ඒ අත් අඩංගුවට ගත්ත අය ඉන්නේ රැඳවුම් භාරයේ නොවෙයි, විවිධ අධිකරණ තීන්දු මත බන්ධනාගාරගත වෙලා. දැන් ඔවුන්ගේ ප්‍රශ්නයක් තිබෙනවා. මේ අයගෙන් වැඩි දෙනෙක් දෙමළ භාෂාව පමණක් පුළුවන් අය. ඒ අයගේ නඩු විභාග පැවැත් වෙන්නේ සිංහල භාෂාවෙන්. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානයටයි මේ ප්‍රශ්නය යොමු කරන්නේ. එක දෙමළ තරුණයෙක් මට හමු වුණා, ඔහු දෙමළ භාෂාව විතරයි දන්නේ. ඔහු වැලිකඩ බන්ධනාගාරයේ සිටිනවා. ඔහුගේ නඩු තීන්දුවේදී ඔහුට අවුරුදු

50ක සිර දඬුවමක් දෙන බව ප්‍රකාශයට පත් කර තිබෙනවා. නමුත් සැබවින්ම ඔහුට ඒක තේරුණේ නැහැ. ඔහු දැන ගෙන ඉඳලා තිබෙන්නේ ඔහු නිදහස් වුණා කියලා. නැවත බන්ධනාගාරයට දමන කොට තමයි ඒ තරුණයා දන්නේ තමන්ට අවුරුදු 50ක සිර දඬුවමක් දීලා තිබෙනවා කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතා පැහැදිලිව අතුරු ප්‍රශ්නයයි අහන්නේ. මම අහන්නේ, එම අත් අඩංගුවේ සිටින දෙමළ තරුණයන්ගේ නඩු විභාග එම භාෂාවෙන් කටයුතු කරන අධිකරණ පද්ධතියකට මාරු කරන්න තීරණයක් ගන්නවාද කියලායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන්නේ කවුරු හරි කිව්වාය කියන කථාවක්. ඔබතුමාත් දන්නවා අධිකරණය ඉදිරියේ කිසිවකු තමන්ගේ බසින් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටියොත් අනිවාර්යයෙන් නඩුකාරවරයා හා ඒ පැමිණිල්ල මෙහෙයවන අය ඒ කටයුතු අධිකරණයේ සූදානම් කළ යුතුයි කියලා. දෙවැන්න නඩු තීන්දුව පවා පැහැදිලි කර දිය යුතුයි. ඒ අයිතිය තිබෙනවා. ඒ අයිතිය ඉල්ලා ගන්න පුළුවන්. ඉතින් මේ කථා කරන්නේ සත්‍ය තත්ත්වයක් නොවෙයි.

## ජල හා වාරි කෞතුකාගාරයක් ඉදි කිරීම : ක්‍රියාමාර්ග
## நீர் மற்றும் நீர்ப்பாசன நூதனசாலை நிர்மாணம்: நடவடிக்கை
## CONSTRUCTION OF WATER AND IRRIGATION MUSEUM : MEASURES TAKEN

0999/'10

4. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Gamini Jayawickrama Perera)
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ලෝකයේ වාරි හා කෘෂි ශිෂ්ටාචාරය අනුව ශ්‍රී ලංකාවට ඉතා වැදගත් තැනක් හිමි වන හෙයින් එම තත්ත්වය මතු පරපුරට දායාද කිරීමට හැකි වන පරිදි ජල හා වාරි කෞතුකාගාරයක් ඉදි කිරීම සුදුසු බවත්;

(ii) එමඟින් ලාංකීය කෘෂි හා වාරි කර්මාන්ත ඉතිහාසය පිළිබඳව අනාගත පරපුරට අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසෙන බවත්;

(iii) එවැනි කෞතුකාගාරයක් ඉදි කිරීම මගින් වාරි හා කෘෂි ක්ෂේත්‍රයේ නියැලී සිටින අයට පර්යේෂණ කිරීමට අවස්ථාවක් සැලසෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එවැනි කෞතුකාගාරයක් ඉදි කිරීම කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உலகின் நீர்ப்பாசன விவசாய நாகரிகத்துக்கேற்ப இலங்கைக்கு மிக முக்கிய இடம் உரித்தாவதானல் இந்நிலைமையை எதிர்கால சந்ததிக்கு பெற்றுக்கொடுக்கக் கூடிய வகையில் நீர் மற்றும் நீர்ப்பாசன நூதனசாலையொன்றை நிர்மாணிப்பது பொருத்தமானதென்பதையும்;

(ii) அதனூடாக இலங்கையின் விவசாய மற்றும் நீர்ப்பாசனத் துறையின் வரலாறு தொடர்பாக எதிர்கால சந்ததிக்கு கற்றுக்கொள்வதற்கான வாய்ப்புக் கிடைக்கும் என்பதையும்;

(iii) மேற்படி நூதனசாலையை நிர்மாணிப்பதனூடாக நீர்ப்பாசன மற்றும் விவசாயத்துறையில் ஈடுபட்டுள்ளவர்களுக்கு ஆராய்ச்சிகளை மேற்கொள்வதற்கான வாய்ப்புக் கிடைக்கும் என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) ஆமெனில், மேற்படி நூதனசாலையை நிர்மாணிப்பதை துரிதமாக ஆரம்பிக்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management :

(a) Will he admit that -

(i) as Sri Lanka holds a prominent place in the world with respect to civilization based on irrigation and agriculture it is appropriate to construct a museum of water and irrigation so that the aforesaid prominence could be endowed upon the future generation ;

(ii) the future generation will be provided with the opportunity to study the history of Sri Lanka agriculture and irrigation works through that ;

(iii) those who are engaged in the field of irrigation and agriculture will be provided an opportunity to carry out researches, through the construction of such a museum ?

(b) If so, will he inform this House whether measures will be taken to start the construction of such a museum speedily ?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පිළිගනිමි.

(ii) පිළිගනිමි.

(iii) පිළිගනිමි.

(ආ) කොළඹ මහවැලි කේන්ද්‍රයේ බිම් මහලේ වාරි කෞතුකාගාරය ඉදි කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. මේ සඳහා දැනටමත් පහත සඳහන් විද්වත් මණ්ඩලය පත් කොට ඇත.

පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි

මහාචාර්ය රාජ් සෝම දේව මහතා - පශ්චාත් උපාධි ආයතනය

මහාචාර්ය නිමල් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල

ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මහතා

ආචාර්ය නන්දා වික්‍රමසිංහ මිය - අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාරය

සෙනරත් වික්‍රමසිංහ මහතා - සහකාර අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාරය

සුගත් වටගෙදර මහතා - බාහිර කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

සිරිනිමල් ලද්දුසිංහ මහතා- හිටපු අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාරය

මෙම විද්වත් මණ්ඩලය කිහිප වතාවක්ම රැස් වී වාරි කෞතුකාගාරය සකස් කළ යුතු ආකාරය පිළිබඳව ක්ෂේත්‍රයේ පරිණතයන් සමඟ සාකච්ඡා කරමින් සැලසුමක් සකස් කර තිබේ.

මෙම සැලසුම පියවර කිහිපයකින් ක්‍රියාත්මක කොට ශ්‍රී ලංකාවේ ඓතිහාසික වාරි කර්මාන්තය මෙන්ම නූතන වාරි කර්මාන්තයද විදහා දැක්වෙන

අයුරින් කෞතුකාගාරයක් සකස් කරනු ලැබේ.

විශේෂයෙන් එකී කෞතුකාගාරය තුළ වාරි කර්මාන්තයට අදාළ ලේඛන, පුවත් සඟරා සහිත පුස්තකාලයක් ද ස්ථාපිත කිරීමට නියමිතය.

(ඇ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## ත්‍රිවිධ හමුදා නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ගණනය කිරීම
## முப்படை அதிகாரிகளின் ஓய்வூதியத்தைக் கணித்தல்
## CALCULATION OF PENSION FOR PERSONNEL OF ARMED FORCES

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය මතු කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ත්‍රිවිධ හමුදා නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී මතු වී ඇති ගැටලුකාරි තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි. ත්‍රිවිධ හමුදා නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී මතුව ඇති ගැටලුකාරි තත්ත්වයන් හේතුවෙන් විශ්‍රාම ලත් යුද, නාවික හා ගුවන් හමුදා නිලධාරින් රැසක් හා ඔවුන්ගෙන් යැපෙන්නන් දැඩි පීඩාවකට ලක් වී තිබෙනවා.

ආණ්ඩුව විසින් 2009.12.24 වැනි දින, වසර 22ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ත්‍රිවිධ හමුදාවේ නිලධාරින් හා සෙසු නිලයන් සඳහා පූර්ණ විශ්‍රාම වැටුපක්, එනම් වැටුපෙන් සියයට 85ක මුදලක් 2010 ජනවාරි සිට විශ්‍රාම වැටුප් ලෙස ගෙවීමට කැබිනට් මණ්ඩල තීරණයක් ගෙන තිබුණා. ඒ දිනවල ආණ්ඩුව එයට මාධ්‍ය මඟින් විශාල ප්‍රචාරයක් ලබා දුන්නා.

එහෙත් ආණ්ඩුව, ත්‍රිවිධ හමුදා නිලධාරින් කෙරෙහි දක්වන උනන්දුවේ ඇති තත්ත්වය පෙන්වමින් එයට අදාළ 6/2010 යන චක්‍රලේඛය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළේ 2010 වසරේ මාස හයකට වැඩි කාලයක් ගත වී 2010.06.29වන දිනයි. එයට අනුව සියයට 85කට නොඅඩු උපරිම විශ්‍රාම වැටුපකට හිමිකම ලැබීමට 2010.01.01 දිනට පෙර විශ්‍රාම ලැබූ වසර 22ක් සේවා කාලය සම්පූර්ණ කළ ත්‍රිවිධ හමුදාවේ සියලු දෙනාට හිමිකම් ලැබෙනවා. 2010 ජනවාරි මාසයේ 1වන දාට පෙර විශ්‍රාම ගිහින් තිබෙනවා නම්, අවුරුදු 22ක් සම්පූර්ණ කර ඇත්නම් මෙම සියයට අසූපහේ විශ්‍රාම වැටුප ලැබෙනවා. එය විවිධ අවස්ථාවල ත්‍රිවිධ හමුදාවේ නිලධාරින්ගේ ඉල්ලීම්වලට අනුකූලව ඉදිරිපත් වී තිබුණා. එය තමයි ඔවුන්ගේ ඉල්ලීම බවට පත් වී තිබුණේ. එයට අනුව චක්‍රලේඛය නිකුත් කළා. නමුත් එම චක්‍රලේඛයට පසුව 2010.07.06වන දින - සතියකින් පසුව- ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියුමක් යවමින් සන්නද්ධ සේවා නිලධාරින් සහ සෙසු නිලයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ කොන්දේසි කිහිපයක් පනවනවා. මෙයයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ කොන්දේසි අනුව සියයට 85ක විශ්‍රාම වැටුපක් ලබා ගැනීම සඳහා අදාළ සේවා නියුක්තිකයා -අදාළ හමුදාවේ නිලධාරියා- 2009.05.19වන දිනට සේවයේ නියුක්තව සිටිය යුතුයි. යුද්ධය අවසන් වූ දිනයට සේවයේ නියුතුව සිටිය යුතුයි කියා කොන්දේසියක් දැම්මා. එසේ නොවන, එම දිනට පෙර විශ්‍රාම ලබා සිටින නිලධාරින් හා සෙසු නිලධාරින්ට සියයට 85ක විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ගැනීම සඳහා අවම වශයෙන් වසර පහක් ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටිය යුතුයි. එවැනි කොන්දේසි ටිකක් ඇතුළත් කර නව චක්‍රලේඛයක් නිකුත් කරනවා. මෙම කොන්දේසි අදාළ නිලධාරින්ගේ හිමිකම් කප්පාදු කරමින් අතිශය බරපතළ තත්ත්වයක් නිර්මාණය කරනවා.

පළමුවැන්න, කැබිනට් තීරණයක් හා ඒ අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය අබිබවමින් ඊට පසුව නිකුත් කර තිබීමයි. දෙවැන්න, වසර 22ක සේවා කාලය සම්පූර්ණ කර විශ්‍රාම ලබා ඇති ත්‍රිවිධ හමුදා නිලධාරින්ට වසර පහක ක්‍රියාන්විත සේවයක් තිබිය යුතු බවට කොන්දේසියක් ඉදිරිපත් කිරීමයි. එය සාධාරණ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්‍රාමලත් මෙම ත්‍රිවිධ හමුදා නිලධාරින්ට ඔවුන්ගේ වුවමනාව හා කැමැත්ත පරිදි එවැනි ක්‍රියාන්විත සේවයක් ලබා දීමට නොහැකි අවස්ථාවකදී ඔවුන්ට එවැනි කොන්දේසියක් ඉදිරිපත් කිරීම අයුක්තිසහගතයි. ඔවුන් ක්‍රියාන්විතයට නොගියේ ඔවුන්ගේම කැමැත්තෙන් නොවන්නට පුළුවන්. දේශපාලන හිතවත්කම් පාවිච්චි කර ක්‍රියාන්විත සේවය මඟ හැර ගන්නන් අතළොස්සක් දෙනායි. දේශපාලන හිතවත්කම් මත යුද්ධයට සහභාගි නොවුණේ ඉතා කුඩා ප්‍රමාණයයි. නමුත් ත්‍රිවිධ හමුදාවේ වැඩි දෙනාගේ රාජකාරි කරනු ලබන ස්ථානය තීරණය වන්නේ සේවා අවශ්‍යතාවන් මත බව අපි කවුරුත් දන්නා කාරණයක්. සන්නද්ධ හමුදා සාමාජිකයන් නිරත වන්නේ උණ්ඩයක් නැවෙන් ගොඩ බෑමේ සිට එය යුද බිමේ පත්තු වීම දක්වා ඒකාබද්ධ වූ සමස්ත ක්‍රියාවකයි. එවැනි සේවයක නිරත වූ නිලධාරියා විශ්‍රාම ලැබූ පසු ක්‍රියාන්විත, ක්‍රියාන්විත නොවන

යනුවෙන් වර්ග කිරීම කිසිසේත්ම සාධාරණ නැහැ. ඒ අනුව අසාධාරණයට ලක් වූ විශ්‍රාමලත් ත්‍රිවිධ හමුදා නිලධාරින් වෙනුවෙන් පැන නඟින පහත ප්‍රශ්න පිළිබඳව ආණ්ඩුව මෙම ගරු සභාව දැනුවත් කිරීමට පියවර ගනු ඇතැයි මා බලාපොරොත්තු වනවා.

1. 2009.12.24වන දින ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාම වැටුප් පිළිබඳ කැබිනට් මණ්ඩලය ගන්නා ලද තීරණය කුමක්ද?
2. එය මත පදනම්ව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2010.06.29වැනි දින නිකුත් කරන ලද චක්‍රලේඛනයක් තිබියදී ඊට දින හතකට පසුව, 2010.07.06වන දින ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඊට කොන්දේසි යවන්නේ කුමක් නිසාද?
3. කඩ ඉම් දිනය ලෙස 2009.05.19 දිනය යොදා ගැනීමෙන් ඊට පෙර විශ්‍රාම ලැබූ ක්‍රියාන්විත යැයි කියනු ලබන සේවයක් නොමැති විශාල පිරිසකට මෙම විශ්‍රාම වැටුප් හිමිකම අහිමි වෙන බව පිළිගන්නවාද?
4. මෙම ක්‍රියාන්විත සේවය අහිමි වූයේ ඔවුන්ගේ පෞද්ගලික කැමැත්ත අනුවද, නැතහොත් සේවයේ අවශ්‍යතාව මත කාර්යාල, ගබඩා, කර්මාන්තශාලා, සන්නිවේදන, පරිගණක අංශ වැනි ක්‍රියාන්විත සේවා ඇතුළත් වන ක්ෂේත්‍රයන්හි සේවය කිරීම නිසාද?
5. සිදු වී ඇති අසාධාරණය වළක්වා එම නිලධාරින්ට ද, පූර්ණ විශ්‍රාම වැටුපක් පිළිබඳව බලාපොරොත්තු තබා සිටි ත්‍රිවිධ හමුදා විශ්‍රාමිකයන් සඳහා ද සහන ලබා දීමට ආණ්ඩුව පියවර ගන්නේද, නැතහොත් ඒ මන්ද?

උක්ත ප්‍රශ්න පිළිබඳව රජය විසින් මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර, මෙම ගැටලුව විසඳීම කෙරෙහි මෙම ගරු සභාවේ දැඩි අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්තුතියි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)

(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2008 වර්ෂයේ රටේ භෞමික අඛණ්ඩතාව, ස්වෛරීභාවය හා ස්වාධීනත්වය සුරැකීම වෙනුවෙන් දුෂ්කර ප්‍රදේශයන්හි මානසික හා කායික පීඩාවන්ට ලක් වෙමින්, විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙමින්, ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ හමුදා සාමාජිකයින්ට සියයට 85ක පූර්ණ විශ්‍රාම වැටුපක් ලබා දීමට යෝජනා කෙරුණා. ගරු අමාත්‍ය මණ්ඩලය අදාළ නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කළා. එම කමිටුවට ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, භාණ්ඩාගාර නිලධාරින්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිලධාරින් ඇතුළත් වුණා. එකී නිර්දේශ සැලකිල්ලට ගෙන ගරු අමාත්‍ය මණ්ඩලය පහත සඳහන් අනුමැතිය ලබා දීලා තිබෙනවා.

වසර 22ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරින් සහ සෙසු නිලයන් විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා ගණන් ගනු ලබන පාරිශ්‍රමිකයෙන් සියයට 85ක අඩු නොකළ උපරිම විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබීම. 2010.01.01 දින දක්වා විශ්‍රාම වැටුප් හිඟ මුදල් නොගෙවීම මත එය ක්‍රියාත්මක කිරීම හා ඒ අනුව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විමසමින් ත්‍රිවිධ හමුදාව සම්බන්ධයෙන් වූ 1981 විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආකාරයට යම් යම් තීන්දුවලට පැමිණියා:

2009.05.19 දිනට සේවයේ යෙදී සිටි එනම්, ත්‍රස්තවාදී යුද්ධයට සෘජුව දායක වූ සියලු හමුදා නිලධාරින් හා සෙසු නිලයන් සඳහා පූර්ණ විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීම.

තිස් අවුරුදු යුද්ධයේදී ක්‍රියාන්විත රාජකාරිවල වසර 5කට වඩා සේවය කළාවූ සියලු විශ්‍රාමික නිලධාරින් සහ සෙසු නිලයන් සඳහාද මෙම හිමිකම ලබා දී තිබෙනවා. යුද්ධය අවසාන වීමෙන් පසු, සේවයට බැඳුණ හා සේවා අකාර්යක්ෂමතාව, විනය හේතු මත විශ්‍රාම යන සහ අවම වශයෙන් වසර 5ක්වත් ක්‍රියාන්විත රාජකාරියේ නියුක්ත නොවූ නිලධාරින් හා සෙසු නිලයන් සඳහා පමණක් ඉහත පූර්ණ විශ්‍රාම වැටුප හිමි නොවේ.

ගරු මන්ත්‍රීතුමා ඉල්ලා සිටින්නේ, ඉහත කණ්ඩායම් තුනෙන් අවම වශයෙන් වසර 5ක්වත් ක්‍රියාන්විත රාජකාරියේ නියුක්ත නොවූ නිලධාරින් හා සෙසු නිලයන් සඳහාද පූර්ණ විශ්‍රාම වැටුප් හිමිකම ලබා දෙන ලෙසය. එනම්, යුද්ධයට සක්‍රීය ලෙස දායක වූවන්ට හිමි සහන අනිකුත් කණ්ඩායම් සඳහාද ලබා දෙන ලෙසය.

තමුන්ගේ ජීවිත පරදුවට තියලා, තමුන්ගේ අඹු දරුවන් අමතක කරලා, ඉතාමත් දුෂ්කර පරිසරයක් මැද්දේ ක්‍රියාන්විත රාජකාරිවල යෙදුණ අයට දෙන විශ්‍රාම වැටුප, සමහර විට එක දවසක්වත් සක්‍රීයව සහභාගි නොවූ අයටත් දෙන ලෙස තමයි ගරු ඇමතිතුමා ඉල්ලා සිටින්නේ. [බාධා කිරීමක්] මා උත්තර දෙන්නම්. [බාධා කිරීමක්] හොඳයි. වෙන්න පුළුවන්. නමුත් මෙතැන නිර්ණායකයක් තිබෙනවා. අවුරුදු 5ක කාල සීමාවක් ක්‍රියාන්විතයේ සේවය නොකළ අයට දෙනවා කියන්නේ සමහර විට අවුරුදු 20, 22 ක්‍රියාන්විතයේ වැඩ කළ අයට සමාන සැලකීමක් කොළඹ, පනාගොඩ ඉඳ ගෙන කටයුතු කළ අයටත් දෙනවාය කියන එකයි.

මේ වන විට යුද, ගුවන් හා නාවික නිලධාරින්, සෙසු නිලයන් 60,000ක් පමණ විශ්‍රාම වැටුප් ලබමින් සිටිනවා. ඉන් බොහෝ දෙනෙකු ක්‍රියාන්විත රාජකාරි වසර 5කට වඩා ඉටු කළ පුද්ගලයන්. එබැවින්, පූර්ණ විශ්‍රාම වැටුප ලබා ගැනීමට සුදුසුකම් ලබා තිබෙනවා. විශේෂයෙන්ම ගුවන් සහ නාවික හමුදා විශ්‍රාමිකයින් සියල්ලම පාහේ මෙම සුදුසුකම ලබා තිබෙනවා. ගුවන් හා නාවික හමුදාවල සියයට සියයක්ම නිලධාරින් මේ විශ්‍රාම වැටුපට හිමිකම් කියනවා.

පසු ගිය කාලසීමාව තුළ දී හමුදා නිලධාරින්/සෙසු නිලයන් සඳහා විවිධ සහන අපගේ රජය ලබා දී තිබෙනවා. ඉහත පූර්ණ විශ්‍රාම වැටුප ද ලබා දී ඇත්තේ එවැනි සහනයන්ට අමතරවය. සැබවින්ම කුරිරු ත්‍රස්තවාදී යුද්ධයට දායක වූවනට ඉහත පූර්ණ විශ්‍රාම වැටුප හිමි කර දී ඇති බව සතුටින් ප්‍රකාශ කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි මම කියන්නට ඕනෑ, පසු ගිය අවුරුදු හය ඇතුළත -2005 වර්ෂයෙන් පසුව- විශාල සහන රාශියක් අපි ත්‍රිවිධ හමුදාවට ලබා දී තිබෙන බව. ඒ අතර, දීර්ඝකාලීනව නිලධාරින්/සෙසු නිලයන්ගේ ඒකාබද්ධ වැටුපෙන් ගෙවල් කුලී වශයෙන් අය කර ගත් සියයට 10ක මුදල අය කර ගැනීම අත් හිටුවා සම්පූර්ණ ගෙවල් කුලී සීමිතය ලබා දීමට කටයුතු කිරීම, ජීවන වියදම් දීමනාව රුපියල් 4,500 දක්වා වැඩි කිරීම, ප්‍රධාන වශයෙන්ම ක්‍රියාන්විත රාජකාරියේ සිටි යුද හමුදා සාමාජිකයන්ගේ විශ්‍රාම වැටුප සියයට 85 දක්වා වැඩි කිරීමට නිර්දේශ කිරීම, ක්‍රියාන්විත නොවන හේතූන් මත ක්‍රියාන්විත ප්‍රදේශවලදී මිය ගිය අය හට වැටුප් හා දීමනා ගෙවීමට කටයුතු කිරීම, ශ්‍රී ලංකා යුද හමුදාවේ ස්වේච්ඡා කාන්තා බලකා නිලධාරිනියන් සහ සෙබළියන් හට වසර 15ක සේවා කාලයකින් පසුව විශ්‍රාම වැටුප් ලබා දීමට කටයුතු කිරීම, යුද හමුදාවේ ස්වේච්ඡා බල සේනාවේ නිලධාරින් සහ සෙසු නිලයන් මිය ගිය පසු ළඟම ඥාතියා හට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් 1981 වර්ෂයේ සිට ලබා දීමට කටයුතු කිරීම, ආබාධිත, විශ්‍රාම වැටුප් හිමි අය හට අවුරුදු 55කට පසු අවසන් වරට ලද වැටුපට

[ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා]

සරිලන පරිදි විශ්‍රාම වැටුපක් සකසා දීමට කටයුතු කිරීම, වෛද්‍ය හේතූන් මත යුද සේවයෙන් ඉවත් වූ තනිකඩ අය විවාහ වූ පසු ඔවුන් මිය ගියහොත් වැන්දඹු බිරිඳ හා අනත් දරුවන් හට විශ්‍රාම වැටුප ගෙවීමට කටයුතු කිරීම, සේවයේ යෙදී සිටින මිය ගිය අතුරුදහන් සහ ආබාධිත අයගේ දරුවන් රජයේ පාසල්වලට ඇතුළත් කර ගැනීමේ ඉඩකඩ වැඩි කිරීම, ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ අයගේ දූදරුවන් වෙනුවෙන් ආරක්ෂක සේවා විද්‍යාලය කොළඹ විවෘත කිරීම, ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ අයගේ නිල උසස් කිරීමේ පැරණි ක්‍රියා පටිපාටිය සංශෝධනය කර නව ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීම, ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ නිල උසස් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට කටයුතු කිරීම යනාදිය හඳුන්වන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආකාරයට පසු ගිය අවුරුදු හය තුළ අපි සහන රාශියක් ලබා දීලා තිබෙනවා. අපි මෙතැනදී විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ, අවුරුදු පහක් හෝ ඊට වැඩි කාලයක් ක්‍රියාන්විතයේ සේවය කරපු නිලධාරින් සම්බන්ධව කටයුතු කරන කොට, ඒ අයත් ක්‍රියාන්විතයේ සේවය නොකළ නිලධාරින් හා සමානව සැලකීමේ දී ක්‍රියාන්විතයේ සේවය කරපු ඒ අයට යම් කිසි අසාධාරණයක් සිද්ධ වන බව.

ඒ නිසා අය වැය අධ්‍යක්ෂ ජනරාල්වරයා, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා සමඟ සාකච්ඡා කොට අදාළ නිරීක්ෂණ ලබා දී තිබෙනවා. ඒ තුළින් බලාපොරොත්තු වූයේ ත්‍රස්තවාදී කුරිරු යුද්ධය නිමා කිරීමට ක්‍රියාන්විතයේ මෙහෙයුම් කළ හමුදා නිලධාරින් සහ සෙසු නිලයන් සඳහා උපරිම සහන ලබා දීම බව ප්‍රකාශ කරමින් මගේ ප්‍රකාශය අවසන් කරනවා.

## පාසල් ක්ෂේත්‍රයේ පැන නැඟී ඇති ගැටලු: අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## பாடசாலை முறைமையில் எழுந்துள்ள பிரச்சினைகள்: கல்வி அமைச்சரினது கூற்று
## PROBLEMS ARISEN IN SCHOOL SYSTEM : STATEMENT BY MINISTER OF EDUCATION

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දිනයේදී 23(2) ස්ථාවර නියෝගය යටතේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයට මම පැහැදිලි, දීර්ඝ පිළිතුරක් ලබා දුන්නා. ඒ පිළිබඳව සියලුම මාධ්‍යවලින් විශාල ප්‍රමාණයෙන් දැනුවත් කිරීමක් කරලා තිබුණා. ඒ ගැන මම මාධ්‍යවලට ස්තුතිවන්ත වනවා. නමුත් ඒ ප්‍රධාන හරය වෙනුවට යම් කිසි වැරදි අදහසක් ඇති වන ලෙස තමයි මේ වාර්තා බොහොමයක් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. අද "ලංකාදීප" පුවත් පත මෙසේ වාර්තා කරනවා:

"ද්විතීය පාසල් දහසෙන් 238 ක ප්‍රාථමික අංශ ඉවත් කරයි."

ඊළඟට අද "දිනමිණ" පුවත් පත වාර්තා කරනවා, මෙහෙම:

"ද්විතීයික පාසල් 1000 සංවර්ධනය කිරීම යටතේ පළමුව පාසල් 238ක ප්‍රාථමික අංශ ඉවත් කරයි"

"ලක්බිම" පුවත් පත අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාටත් සලකනවා. එහි මෙසේ කියනවා:

"දැනට පාසල් 238ක ප්‍රාථමික අංශය ඉවත් කරනවා"

එහි අනුර කුමාර දිසානායක මහතා මෙසේ කියනවා:

"හුදු ප්‍රචාරණවාදී දේශපාලන ව්‍යාපෘතියක්"

අද "ඩේලි මිරර්" පුවත් පත පමණක් වෙනත් ආකාරයකට මෙසේ වාර්තා කර තිබෙනවා:

"Several Schools without A/L science facilities - Minister"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතා පැහැදිලිව ප්‍රකාශ කළේ මෙයයි. මේ පාසල් දහස තුළ ඇති පාසල් 238ක දැනට ප්‍රාථමික අංශයක් නැහැ. ඒ කියන්නේ ඒවා දැනටම හය වන ශ්‍රේණියෙන් ඉහළ පන්ති පවත්වා ගෙන යන පාසල්. -ද්විතීයික පාසල්- අපි උදාහරණ-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා තවත් ලොකු ප්‍රශ්නයක්,-[බාධා කිරීමක්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, නැහැ. මම පැහැදිලි කරලා ඉවර වුණාම ඔබතුමාට අහන්න පුළුවන්.

අපි උදාහරණ කීපයක් කිව්වොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පවතින මධ්‍ය මහා විද්‍යාල බොහොමයක කන්නන්ගර යුගයේ වාගේම තවමත් පවත්වා ගෙන යන්නේ හයවන ශ්‍රේණියෙන් ඉහළ පන්ති. එතකොට ඒවා එහෙමම තිබෙනවා. හයවන ශ්‍රේණියේ සිට දහතුන්වන ශ්‍රේණිය දක්වා තිබෙන එවැනි පාසල් විශාල ප්‍රමාණයක් -238ක්- තිබෙනවා. මම මෙතැනදී සඳහන් කළේ, ඒ පාසල් 238 සඳහා කිසිදු ප්‍රශ්නයකින් තොරව ද්විතීයික පාසල් දහසේ වැඩසටහන ප්‍රථමයෙන්, වහාම ක්‍රියාත්මක කරන්න පුළුවන් බවයි. ඒ ටික ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒක මේ පාසල් දහසට ඇතුළු කරලායි තිබෙන්නේ.

"ද්විතීයික පාසල්" කියන සංකල්පය තුළම පාසල්වල ප්‍රාථමික අංශයක් තිබෙන්න බැහැ. ප්‍රාථමික අංශය අහෝසි වනවා. ඒ වාගේම, එක දවසකින් මේ තිබෙන ප්‍රාථමික පන්ති ඉවත් කරන්නේ නැහැ. තිබෙන ප්‍රාථමික පන්ති සියල්ලම එලෙසින්ම තියනවා. සිද්ධ වන දේ තමයි, දෙමව්පියන්ගේ හා ආදි ශිෂ්‍ය සංගම්වල එකඟතාව මත ලබන වර්ෂයේදී පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළු කර ගන්නේ නැති එක. 2012 වර්ෂයේදී -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙක අතිශය සංකීර්ණ ප්‍රශ්නයක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්, පැහැදිලි කර ගැනීමක් කර ගන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දවස්වල පාසල්වලට ළමයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් ඇප්ලිකේෂන් දමනවා. ඒ නිසාමයි මම මේ නිරවුල් කර ගන්න හදන්නේ.

ගරු ඇමතිතුමා කිව්වා, සපිරි පාසල් ව්‍යාපෘතියට පාසල් 1,096ක් තෝරා ගෙන තිබෙනවා කියලා. ඒක දහසක් කියලා කිව්වාට දැන් 1,096ක් තිබෙනවා. ඔබතුමා කියන පරිදි තෝරා ගන්නා ලද ඒ පාසල් 1,096න් පාසල් 238ක තමයි ප්‍රාථමික අංශ නැතුව තිබෙන්නේ. එහෙම නම්, ප්‍රාථමික අංශ සහිතව පාසල් 858ක් තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්. ඒ පාසල් 858න් -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, අර මාධ්‍යවල වාර්තා කරපු විධියට තමයි මටත් ඇහුණේ නම්. පාසල් 238ක මේ වන විටත් ප්‍රාථමික අංශය ඉවත් කරලා තිබෙනවා කියන අදහසක්. ඔබතුමා වෙන අදහසක් කියනවා නම් කමක් නැහැ. හැබැයි දැන් තත්ත්වය ඊට වඩා භයානකයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
කිසි භයානකකමක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉස්සර වෙලා වාර්තා කරලා තිබුණේ පාසල් 238ක ප්‍රාථමික අංශ ඉවත් කරනවා කියලා. හැබැයි, මේ අනුව වන දේ තමයි පාසල් 858ක ප්‍රාථමික අංශය ක්‍රමානුකූලව ඉවත් කිරීම.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්. ඒ-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වචනය වෙනස් වන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ක්‍රමානුකූලව" කියන එකෙන්. පාසල් 858ක ප්‍රාථමික අංශ ඉවත් කිරීමක් සිද්ධ වනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්. මම පැහැදිලි කරන්නම්. ඒවා කරන්නේ මේ විධියටයි. මම ඊයේත් සියලුම දත්ත, සංඛ්‍යා සහිතව මේ කරුණු සඳහන් කළා. කිසිම දරුවෙක් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන්නේ නැති පාසල් 124ක් තිබෙනවා. දරුවන් 10 දෙනෙකුට වඩා අඩුවෙන් ප්‍රාථමික අංශයට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන පාසල් එක්දහස් දෙසිය ගණනක් තිබෙනවා. මේ ද්විතීයික පාසල වටා පෝෂිත පාසල් ප්‍රමාණයක් තිබෙනවා. ප්‍රාථමික පාසල් තුනකට, හතරකට, පහකට එක සංවර්ධිත ද්විතීයික පාසලක් ඇති වෙනවා. අපි මේ ව්‍යාපෘතියේ මූලික හරය ලෙස රටට සහ ජනතාවට කිව යුතු දෙයක් තිබෙනවා. ලංකාවේ ඈත එපිට ගම්මානවල සිට පැමිණෙන, ඒ පළාත් නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාට ඊයේ මම මේ ගැන දැනුම් දුන්නා. එතුමන්ලාගේ බල ප්‍රදේශවල තිබෙනවා, විද්‍යා අංශය සහිත එකම පාසලක්වත් නැති -ඒ කියන්නේ 1ඒ, බී පාසල්- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක්. ඒවාට අපි පාසල් 156ක් ලබා දෙනවා. විද්‍යා අංශය සහිත එක පාසලක් තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 100ක් තිබෙනවා. මේ යෝජනා ක්‍රමය යටතේ ඒ 100ට උසස් පෙළ විද්‍යා අංශය සහිත පාසල් 288ක් ලැබෙනවා. එයින් ඇති වෙන ප්‍රතිඵලය තමයි, අද විද්‍යා විෂයය හදාරන සියයට 22ක් වන ගම්බද දරුවන් ප්‍රමාණය 2015 වන විට සියයට 45ක් වෙන එකත්, වාණිජ විෂයය හදාරන සියයට 25ක් වන දරුවන් ප්‍රමාණය සියයට 30ක් වෙන එකත්, කලා විෂයයන් හදාරන සියයට 53ක් වන දරුවන් ප්‍රමාණය සියයට 25ක් වෙන එකත්. ඒ අරමුණ සඳහා තමයි මේ ද්විතීයික පාසල් දහස සකස් කරන්නේ.

මම අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට පැහැදිලිව කිව්වා, අද සෑම පළාතකින්ම මීට වඩා මෙවැනි පාසල් ඉල්ලනවා, එහෙම ඉල්ලලා තමයි මේ උද්ඝෝෂණ කරන්නේ කියලා. යම් කිසි තැනකදී දෙමව්පියන්ට මේ කරුණ අවබෝධ කර ගන්න අසීරු නම්, දෙමව්පියන්ගේ මතයක් තිබෙනවා නම් මේ පාසලෙන් ප්‍රාථමික අංශය ඉවත් කරන්න ඉඩ දෙන්නේ නැහැ කියලා අපි ඒවා එහෙමම තිබෙන්න අරිනවා. අපි ඒක කැමැත්තෙන්ම කරනවා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ.

මේ ව්‍යාපෘතියෙන් අපට අවශ්‍ය වෙන්නේ රටේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අවම වශයෙන් සංවර්ධිත ද්විතීයික පාසල් දෙකක් හෝ තුනක් ඇති කර ගෙන, ඉහළ අධ්‍යාපනයේ ඇති වෙලා තිබෙන කඩා වැටීම නවත්වන්නයි. ඒ සඳහායි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා තමයි මම තමුන්නාන්සේලාට කියා සිටියේ, මේක දේශපාලන ව්‍යාපෘතියක් නොවෙයි, ප්‍රචාරකවාදී ව්‍යාපෘතියක් නොවෙයි, සමස්ත රටේ නිදහස් අධ්‍යාපනය සුරක්ෂිතකොට පෝෂණය කරන්නට, දැනුම කේන්ද්‍රීය සංවර්ධනයේදී අවශ්‍ය ඉලක්ක කරා ළඟා වෙන්නට සද්භාවයෙන් අපි සියලු දෙනා එකතු වෙලා කළ යුතු ප්‍රතිව්‍යුහගත කිරීමක්ය කියන එක.

මේක දේශපාලන ප්‍රචාරකවාදී ව්‍යාපාරයක් ද කියලා අනුර දිසානායක මන්ත්‍රීතුමා එතුමාගේ ප්‍රශ්නයේදී මුලින් අහලා තිබුණත්, මගේ පැහැදිලි කිරීමෙන් පසු එතුමා එවැනි ප්‍රකාශයක් කළේ නැහැ. මම ඒක කියන්න ඕනෑ, එතුමාට කරන ගෞරවයක් වශයෙන්. මොකද, මේක රටට හංගන්න ඕනෑ දෙයක් නොවෙයි. මේක ඇති විය යුතුව තිබෙන වෙනසක්. මම එදාත් කිව්වා, ඕනෑම වෙනසක් කරනකොට -නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කළ අවස්ථාවේදීත්, රජයට පාසල් පවරා ගත් අවස්ථාවේදීත් අනික් සෑම කටයුත්තකදීත්- යම් කිසි කොටසක් විරුද්ධ වෙන බව. මෙහිදී නම් කිසිම විරෝධතාවක් පළ කරන්නට ඕනෑ නැහැ. මොකද මම පැහැදිලිව කිව්වා, ද්විතීයික පාසලේ ප්‍රාථමික අංශය ඉවත් කරන්න එපා කියලා කවුරු හරි කියනවා නම්, ඒ ගැන පිකටින් කරන්න, උද්ඝෝෂණ කරන්න, බෝඩ් උස්සන්න මොකුත් ඕනෑ නැහැ, ඒ අදාළ පාසල පාසල් දහසේ වැඩ සටහනින් ඉවත් කරන්න කියලා අපට ලිපියකින් දැනුම් දුන්නාම අපි ඒක ඒ වැඩ සටහනින් ඉවත් කරලා කැබිනට් මණ්ඩලයට දැනුම් දෙන බව.

බොහොම ස්තුතියි, මේ පැහැදිලි කිරීමට ඉඩ දුන්නාට.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසන් වශයෙන් තව එක අවස්ථාවක් දෙන්න මේක වැදගත් කරුණක් නිසාමි. ගරු අමාත්‍යතුමාගෙන් මම ඊයේ විමසා සිටියා, මේ අනුව මේ පාසල් දහසට ඇතුළත් කර නොගන්නා පාසල්වලට යම් අසාධාරණයක් සිදු වෙච්ච කියලා. පැහැදිලි ලිපි ලේඛන මා සතුව තිබෙනවා. මේ තිබෙන්නේ බස්නාහිර පළාතේ, මතුගම, ශාන්ත මේරි මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා කලාප අධ්‍යක්ෂතුමාට යවපු ලිපියක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ලිපිය ගරු ඇමතිතුමාට ලබා දෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

විනාඩියක් දෙන්න. මම විනාඩියෙන් කියවන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මොකද, අපට කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ලිපිය කෙටියෙන් කියවන්නම්:

"මතුගම ශාන්ත මේරි මහා විද්‍යාලය ද්විතීයික පාසල් සංවර්ධන ව්‍යාපෘතියට ඇතුළත් කිරීම පිළිබඳ යෝජනාව ඔබ විසින් සංවිධානය කර ගත් සුළු පිරිසක් විසින් කඩාකප්පල් කර දැමූ බැවින්, ද්විතීයික පාසල් සංවර්ධන ව්‍යාපෘතියේ මුදල් මේ සඳහා යෝජනා කළ නොහැකි බවත් දැනුම් දෙන අතර හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා යෝග්‍ය ආයතනික සංවර්ධන උපාය මාර්ග ඔබගේ උපදේශකත්වයෙන් විදුහල්පති සමඟ සාකච්ඡා කර ගන්නා ලෙසත් අවශ්‍ය පරිපාලනමය සහය අපට ලබා දිය හැකි බවත් කරුණාවෙන් දන්වා සිටිමි."

එතකොට ඒ පහසුකම් දෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, ඒ ලිපියේ තව මෙහෙමත් කියා තිබෙනවා:

"අලුත්වැඩියා කටයුතු පමා වීම හෝ සිදු නොවීම සම්බන්ධයෙන් සිසුන්ගේ අනාරක්ෂිත තත්ත්වයක් සම්බන්ධයෙන් මින් ඉදිරියට සිදු වන ආපදා තත්ත්වයන් සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වග නොකියන බවත් කරුණාවෙන් දන්වමි."

එතකොට ගරු ඇමතිතුමනි,-

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඉන්න. මම පැහැදිලි කරන්නම්. ඒක එක සිද්ධියක් වන්න පුළුවන්. ඒක ඒ පළාත් කාර්යාලයෙන් කරලා තිබෙන්නේ. අපි ඒක ගැන බලන්නම්. මම ඔබතුමාට කිව්වා, මේ පාසල් මෙයට ඇතුළු වුණේ නැහැ කියා කිසිම පළිගැනීමක්, තර්ජනය කිරීමක් -එහෙම එකක්- කෙරෙන්නේ නැහැ කියලා. මම උදාහරණයක් ලෙස කිව්වොත්, කොළඹ රාජකීය විද්‍යාලය මෙයට ඇතුළත් නැහැ. වහළය සම්පූර්ණයෙන් අලුත්වැඩියා කරන්න මුදල් දෙනවා. දේවි බාලිකා විද්‍යාලයට රට පුරාම ශිෂ්‍යත්වය සමත් ළමයි එනවා. මේ ව්‍යාපෘතියට ඇතුළත් නැහැ. අලුතින් ගොඩනැඟිල්ල හදනවා. ආනන්ද විද්‍යාලයේ, දරුවෝ 1,600ක් ඉන්න තැන ගිලා බහිනවා. එතකොට අපි ඒකට විකල්පයක් වශයෙන් ආදි ශිෂ්‍ය සංගම් හා සාකච්ඡා කරලා වෙන තැනක් හදනවා. කිසිම පාසලක් අවතක්සේරු කිරීමක් හෝ එහෙම එකක් නැහැ. නමුත් එක ප්‍රශ්නයක් තිබෙනවා. මේ පාසල් දහසේ ව්‍යාපෘතියට ලැබෙන පරිගණක 50ක පරිගණක විද්‍යාගාරය, ඊළඟට භාෂාගාර යනාදියට නේ, මේ ණය ලැබෙන්නේ. [බාධා කිරීමක්] ඔව්. ඒ ටික වෙන පාසලකට දෙන්න බැහැ. අනික් පාසල්වල තිබෙන අඩු පාඩු නැති කරලා ඒ පාසල සංවර්ධනය කිරීමේ කටයුත්ත අඛණ්ඩව සිද්ධ වෙනවා. [බාධා කිරීමක්] මම ඒක බලනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දැන් ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

### ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஜயந்திபுர நலன்புரிச் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
JAYANTHIPURA SUBASADAKA SANGAMAYA (INCORPORATION) BILL

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ජයන්තිපුර සුභසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி, சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අද දිනට නියමිත කටයුතු. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා.

## බුද්ධිමය දේපළ පනත : නියෝග
## புலமைச் சொத்துச் சட்டம் : ஒழுங்குவிதிகள்
## INTELLECTUAL PROPERTY ACT : REGULATIONS

[අ.භා. 2.38]

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 5 වැනි, 9 වැනි සහ 17 වැනි වගන්ති සමඟ කියවිය යුතු, 204 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් පනවනු ලැබ, 2011 ජනවාරි 05 දිනැති අංක 1687/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලාකරුවන්ට තමන්ගේ ගීත ආදිය ප්‍රචාරය වීමේදී ගෙවිය යුතු කර්තෘභාගය ගෙවීම සඳහා බුද්ධිමය දේපළ පනතේ රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමයි මේකේ අරමුණ වන්නේ. 1860 දී නිකුත් කරන ලද නව නිපැයුම් සඳහා වූ ප්‍රථම පේටන්ට් බලපත්‍රය ඇරඹූ ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ ක්‍රමය පාලනය වන්නේ 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත මඟිනි. මේ පනතින් විවිධ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිගෙන ඒවා ශ්‍රී ලංකාව තුළ ආරක්ෂා කිරීමට සහ වග බලා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සකසා තිබෙනවා. එමඟින් බුද්ධිමය දේපළ හා බැඳුණු සමාජයීය පොදු අවශ්‍යතා ඉටු කර ගැනීමටද උත්සාහ කර ඇත.

ඊළඟට අප බැලිය යුත්තේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" තුළ මොන වාගේ දේවල් සඳහන් වෙලා තිබෙනවාද කියන එකයි. ඉදිරියේදී ලංකාව ආසියාවේ දැක්ම පිළිබඳ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමේදී එහි අභිලාෂයන්, ඒ වාගේම කාර්මික, කෘෂිකාර්මික, කලාත්මක නිෂ්පාදන හා නිපැයුම් දිරිමත් කිරීම, විවිධ වර්ගයේ පහසුකම් සැපයීම ආදී වශයෙන් රජය පියවර රාශියක් අරගෙන තිබෙනවා.

බුද්ධිමය දේපළ කියන්නේ මිනිසකු තම බුද්ධිය මෙහෙයවමින් භාවිතාවට ගැනීමට කරනු ලබන නිර්මාණයන්ය. අපගේ ජීවිතවල හැම අවස්ථාවකම උදේ අවදි වූ මොහොතේ සිට රාත්‍රි නින්දට යන තෙක්ම සැම විට අපි සැවොම බුද්ධිමය දේපළ සමඟ සම්බන්ධකම් පවත්වනවා. නිවසේදී, මහ තොටේදී, වැඩ පොළේදී, කාර්යාලයේදී, පාසලේදී ආදී හැම තැනකදීම බුද්ධිමය දේපළ අපගේ ජීවිත හා බද්ධ වී පවතිනවා. අඳින ඇඳුම් පැළඳුම්, භාවිත කරන භාණ්ඩ, සවන් දෙන සංගීතය, නරඹන නාට්‍ය, බුද්ධිමය දේපළවලට උදාහරණ ලෙස පෙන්වන්න පුළුවන්. තවත් ආකාරයෙන් සඳහන් කරන්නේ නම්, තාක්ෂණික නව නිපැයුම්, වෙළෙඳාමට යොදා ගනු ලබන වෙළෙඳ ලකුණු, යම් භාණ්ඩයකට නව පෙනුමක් ලබා දෙන කාර්මික සැලසුම්, ශාස්ත්‍රීය කලාත්මක කෘතීන්, නාට්‍ය නිෂ්පාදන, ප්‍රාසාංගික ශිල්පීන් ඉදිරිපත් කරන ගායනා වැනි කලාත්මක කෘතීන් ඇතුළත් කරමින් තැටි පටිගත කිරීම්, ගුවන් විදුලි රූපවාහිනී විකාශන, හෙළිදරව් නොකරන විකාශන, ව්‍යාපෘති හා තාක්ෂණික තොරතුරු ආදී නිර්මාණ ඇතුළත් කළ හැක.

ශාස්ත්‍රීය හෝ කලාත්මක නිර්මාණකරුවෙකුට තම කෘතිය සම්බන්ධයෙන් ඇති හිමිකම ප්‍රකාශන, හිමිකම යන්නෙන් සඳහන් වේ. අදාළ පනත් ක්‍රියාත්මක කරන අමාත්‍යාංශය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේ ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, කථාව කර ගෙන යන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදාළ පනත ක්‍රියාත්මක කරන ආයතනය ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයයි. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ ක්‍රමය පරිපාලනය කරන රාජ්‍ය ආයතනය වශයෙන් ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය පවතිනවා. මෙම කාර්යාලයේ ප්‍රධාන කාර්ය වන්නේ වෙළෙඳ ලකුණු, නව නිපැයුම් සහ පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම්, නිර්මාණ සංයුති, කලාකරුවන්ගේ සාමූහික සංගම් ලියාපදිංචි කිරීම, පරිපාලනය කිරීම; ඒ වාගේම බුද්ධිමය දේපළ පිළිබඳ තොරතුරු රැස් කිරීම හා ප්‍රචලිත කිරීම; බුද්ධිමය දේපළ පිළිබඳ දැනුම වර්ධනය කිරීම; ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය හා බුද්ධිමය දේපළ භාවිතය ප්‍රවර්ධනය කිරීම; බුද්ධිමය දේපළ ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම් සපුරාලීම සහ ඒ පිළිබඳ කාලීන සහ අන්තර්ජාතික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම; බුද්ධිමය දේපළ පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා කිරීම; ප්‍රකාශන අයිතිය සම්බන්ධයෙන් අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයේ ආරවුල් නිරාකරණය කිරීම; බුද්ධිමය දේපළ අයිතිවාසිකම් බලාත්මක කිරීම, පහසුකම් සැලසීම හා බුද්ධිමය දේපළ නියුක්තිකයන් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම වැනි කාරණායි.

මෙම පනත අදාළ වන්නේ මේ ආකාරයෙනුයි. සාහිත්‍ය හා කලාව අයත් වන සියලුම නිර්මාණයන් පිළිබඳව වගකීම දරන්නේ

[ගරු ටී. බී. ඒකනායක මහතා]

සාහිත්‍යකරුවන්, ලේඛකයින්, රචකයින්, ප්‍රබන්ධකයින්, නළු නිළියන් හා ගායක ගායිකාවන් වැනි නිර්මාණකරුවන් බැවින් මෙම යෝජනාවට අදහස් ඉදිරිපත් කිරීම සම්බන්ධ විශාල වග කීමක් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයට ඇත. ඒ වාගේම මෙම අමාත්‍යාංශයෙන් කලාකරුවන් සිය දෙනෙකුගේ සහභාගිත්වයෙන් බුද්ධිමය දේපළ ප්‍රකාශන අයිතිය පිළිබඳ වැඩමුළුවක්, දැනුවත් කිරීමේ වැඩසටහනක් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ සහයෝගය ලබා ගෙන 2011 මාර්තු 14 වනදා අපි කොළඹදී පැවැත්වූවා. මෙම වැඩමුළුවේදී ශ්‍රී ලංකාවේ කර්තෘ හිමිකම පිළිබඳ සංගීත ක්ෂේත්‍රයේ සිටින සංගීතඥයන්ගේ අයිතිය සුරැකීමට, සාමූහිකව ශ්‍රී ලංකාවේ කලාත්මක ක්ෂේත්‍රයේ සාමාජිකයින්ට පවත්නා අභියෝගයන් වැනි කරුණු ඔස්සේ කලාකරුවන් දැනුවත් කිරීමට අපට හැකියාව ලැබුණා. මේ වැඩමුළුවට සහභාගි වූ කලාකරුවන් සියලු දෙනාම අවසානයේ සාමූහික තීරණයකට එළඹුණා, කලාකරුවන්ගේ යහපත වෙනුවෙන් සාමූහික කළමනාකරණ සංගමයක් පිහිටුවිය යුතුයි කියලා. හෙළයේ විශිෂ්ට පඬිරුවනක් වන මුණිදාස කුමාරතුංග ශූරීන් විසින් සඳහන් කරලා තිබෙනවා, "අලුත් අලුත් දෑ නොතකන ජාතිය ලොව නොනඟී." කියලා. රටක් ලෙස සංවර්ධනය වෙන්න නම් අපි, අපිවත් අලුත් දෑ තනන්නට අවශ්‍යයි; නව නිර්මාණ කරන්නට ඕනෑ; අලුත් නිෂ්පාදන බිහි කරන්නට ඕනෑ. විද්‍යාවේ, තාක්ෂණයේ නව සොයා ගැනීම් නිසා අද අපිට රූපවාහිනිය ඇතුළු නව තාක්ෂණික උපකරණ පාවිච්චි කිරීමට අවස්ථාව ලැබී තිබෙනවා. ලෝකය විශ්ව ගම්මානයක් වෙලා තිබෙන්නේ ඒ නිසායි.

ඊට අමතරව නිර්මාණකරුවන් දිරිමත් කිරීමට අපට විවිධ යෝජනා තිබෙනවා. උදාහරණයක් ලෙස තාක්ෂණික නව නිපැයුම් පිළිබඳ අයිතිය තහවුරු කිරීමෙන් නිර්මාණකරු තව තවත් නිපැයුම් කිරීමට පෙළඹෙනවා. කලාකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමෙන් ඔවුන් නිර්මාණය සඳහා තවත් යෙදෙනවා. ඒ වාගේම නව නිර්මාණ තුළින් රටේ ආර්ථික සංවර්ධනයට ක්‍රියාශීලිව දායකත්වය දෙනවා. එමඟින් අලුත් නිෂ්පාදන, කර්මාන්ත මෙන්ම රැකියා අවස්ථා බිහි වෙනවා. ඒ අනුව රටේ සංවර්ධනය සඳහා නව නිර්මාණ ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කාරණයක්.

හෙළයේ මහා නාට්‍යකරු වූ මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් සහ සිංහල නාට්‍ය වංශකථාවේ මූලාරම්භය පෙන්වූ කොග්ගල මාටින් වික්‍රමසිංහ ශූරීන්, ස්වකීය නිර්මාණවලින් මෙරටට දායාද කරන ලද නිර්මාණ තරම් නිර්මාණ මේ වන තුරු කිසිවකුගෙන් දායාද වී නැහැ. එවැනි විශිෂ්ට නිර්මාණයන් ආරක්ෂා කිරීම අප සතු ප්‍රධාන වග කීමක්. මෙම නව නීති රීති මඟින් බලාපොරොත්තු වන්නේ මෙවන් නව නිපැයුම් රටට හඳුන්වා දෙන සාහිත්‍යයට, කලාවට නීතියේ සුරක්ෂිතතාව ලබා දීමටයි. ඒ නිසා නිර්මාණ අයිතිකරුවාට තමන්ගේ නිමැයුම් පිළිබඳ හිමිකාර සහතිකය ලබා දීම ආරක්ෂිත බවයි හැඟෙන්නේ. ඒ වාගේම කර්තෘභාගය සඳහා ගෙවන ගාස්තුව නිශ්චිත කළ විට කලාකරුවන්ට තවත් කෙනෙකුට, ආයතනයකට ඉල්ලීම් කරන්න අවශ්‍ය වන්නේත් නැහැ.

අපට මේ ගාස්තුව දෙන්න කියලා තමන්ගේ ගරුත්වය ආරක්ෂා කර ගෙන වැදගත් ලෙස ඉන්න පුළුවන්. ඒ වාගේම සමහර කලාකරුවන් ඉතා දුෂ්කර ආර්ථික තත්ත්වයන් යටතේ ඉන්නවා. තවත් සමහරු වයස්ගත වෙලා ඉන්නවා. තවත් සමහරු අසනීප තත්ත්වයෙන් පසු වෙනවා. ඒ අයට මෙම ක්‍රමය නිසා විශාල සහනයක් ලැබෙනවා. එම ගාස්තු ගෙවීමට නීතියෙන් බැඳී ඇති නිසා මෙවැනි ක්‍රම මඟින් කලාකරුවන්ට සුරක්ෂිතභාවය ලැබෙනවා; ඔවුන් තව තවත් නිර්මාණවලට පෙළඹෙන්න පුළුවන්. මේ යෝජනාව 2010 අගෝස්තු 13වැනි දින අදාළ පාර්ශ්වකරුවන් සමඟ පැවැත්වූ රැස්වීමකදී අතිගරු ජනාධිපතිතුමා විසින් නිවැරදිව අවධානයට ලක් කර තිබෙනවා. සියලු විකාශන සංවිධාන විසින් කලාත්මක නිර්මාණ හිමිකම් කර්තෘභාගය ගෙවීම සඳහා කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන් මේ අවස්ථාවේ ඒ යෝජනාව සම්මත වුණා. විශේෂයෙන් මානව හිමිකම් පිළිබඳ විශ්ව සම්මුතියේ 27වැනි ව්‍යවස්ථාවේ බුද්ධිමය දේපළ මානව හිමිකම් ලෙසද පිළිගෙන තිබෙනවා. ඒ නිසා මෙයට අදාළ වන, විශේෂයෙන් ආරක්ෂා කළ යුතු මුල්ම ශාස්ත්‍රීය හා කලාත්මක කෘතීන් යන්නට පොත, ලිපි ලේඛන, පරිඝනක මෘදුකාංග, වේදිකා නාට්‍ය, මූර්ති, සංගීත, චිත්‍ර, ඡායාරූප ඇතුළු තවත් නව නිර්මාණ රැසක් ඇතුළත් වෙනවා. ඒ නිසා මෙම පාර්ලිමේන්තුවෙන් අපි අවසර ඉල්ලා සිටිනවා, කලාකරුවන් සඳහා, නිර්මාණකරුවන් සඳහා බුද්ධිමය දේපළ පනත යටතේ නියෝගවලට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලෙස. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ස්තුතියි. දැන් කථා කරන්නේ ගරු ජයන්ත කැටගොඩ මන්ත්‍රීතුමා.

[අ.භා. 2.46]

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අප රැස්ව සාකච්ඡා කරන්නේ 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් පනවනු ලැබ, 2011 අංක 01 දරන බුද්ධිමය දේපළ යනුවෙන් පනවා ඇති නියෝග සම්බන්ධවයි. මූලික වශයෙන් 2003 වර්ෂයේ, එනම් මෙයට වසර 08කට පමණ පෙර සාකච්ඡා කර සම්මත කරනු ලැබූ පනතකින් අරමුණු කරන ලද බුද්ධිමය දේපළ හිමිකරුවාට යම් කිසි ප්‍රතිලාභයක් ලබා දීම සඳහා ප්‍රමාද වී හෝ පියවර ගැනීම ගැන සතුටු වෙනවා. 2003 දී බුද්ධිමය දේපළ පනත සම්මත වන අවස්ථාවේ එය ඉදිරිපත් කළ රජයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස මෙම පනතට සහාය ලබා දීමට මට වාසනාවක් ලැබුණා. මට මතකයි එදා විපක්ෂයේ සිටි ඇතැම් මන්ත්‍රීවරු මෙම පනත් කෙටුම්පත සම්මත වීම ප්‍රමාද වන අන්දමට දිගින් දිගටම තර්ක විතර්ක ඉදිරිපත් කළා. කෙසේ හෝ එදා එම පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අපට හැකියාව ලැබුණා.

අද කලාකරුවන්ට කිසියම් සහනයක් ලබා දෙන්නට අවශ්‍ය නියෝග පනවන්න අවස්ථාව ලැබී තිබෙන්නේ මෙන්න මේ නිසයි. එදා දෙපැත්තේ ඉඳ ගෙන තර්ක කරපු විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අද ආණ්ඩු පක්ෂයේ එකට වාඩි වෙලා ඉන්නවා. ඒ අවස්ථාවාදය මැනවින් අද ප්‍රදර්ශනය වනවා. බුද්ධිමය දේපළ නිර්මාණය කරන පුද්ගලයන්ට එම බුද්ධිමය දේපළවලට ඉපැයෙන ධනයෙන් ප්‍රතිලාභයක් ලබා දීමට බුද්ධිමය දේපළ සම්බන්ධව පනවන අණපනත් හා නීතිවල මූලික පදනමක් වනවා. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක දිගු කාලීන පැවැත්ම සඳහා එම සමාජයේ පුද්ගලයින්ට, ආයතනවලට දේපළ අයිතිවාසිකම් තහවුරු විය යුතුයි. එමෙන්ම ඒ දේපළවලින් ලැබෙන ප්‍රතිලාභ දේපළ හිමිකරුවන්ට ලැබිය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකින් ඉටු විය යුතු සමාජ සාධාරණය එයයි. මුල් යුගයේ දේපළ, ඉඩකඩම්, නිවාස වැනි නිශ්චල දේපළවලට මෙන්ම යානවාහන වැනි චංචල දේපළවලට සීමා වුණත් සමාජය ඉදිරියට යාමත් සමඟම පුද්ගලයින් හෝ ආයතන තුළ ඇති සුවිශේෂ නිර්මාණශීලීත්වය මත ඉපැයෙන ධනයෙන් ප්‍රතිලාභයක් ඒවායේ

නිර්මාණකරුවන්ට ලැබිය යුතු බවට සමාජ සම්මතයක් ඇති වන්නට පටන් ගත්තා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි ලෝකයේ නොයෙක් රටවල බුද්ධිමය දේපළවලට නිර්වචනය සපයා ඒවා පිළිගැනීමට ලක් කර ඒ බුද්ධිමය දේපළ භාවිත කරන අයගෙන්, ප්‍රයෝජනයට ගන්නා අයගෙන් මෙන්ම ඇතැම් ඒවායෙන් ආස්වාදයක්, වින්දනයක් ලබන අයගෙන් බුද්ධිමය දේපළ නිර්මාණය කරන අයට සාධාරණ ආදායමක් ලබා ගැනීමට හැකි වන අන්දමේ නීතිමය විධිවිධාන සැලැස්වීම කර තිබෙන්නේ.

අපි සියලු දෙනාටම සමාන අයිතිවාසිකම් තිබුණත්, ජාති, කුල, පන්ති භේද කුමක් වුවත් පුද්ගලයන් විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිගැනීමට ලක් වුවත් අප එක් එක් කෙනාට වෙන වෙනම දක්ෂතා ඇති බව අපි පිළිගත යුතු වනවා. එය එසේ නම් ඒ දක්ෂතාවට නිර්මාණශීලී වටිනාකමක් ලැබිය යුතු වනවා. එමෙන්ම අද වෙළෙඳ පොළ පදනම් කර ගත් ආර්ථිකයක් තුළ එම වටිනාකම මුදලින් ලැබිය යුතු වනවා. නව නියෝගවලින් මූලික වශයෙන් බලාපොරොත්තු වන්නේ කලාකරුවන්ට ඔවුන්ගේ නිර්මාණවලට කිසියම් මුදල් කොටසක් ඉපැයීමට -ජනමාධ්‍ය ආයතනවලින් එය ලබා ගැනීමට පුළුවන් වන අන්දමට- අවශ්‍ය නීතිමය විධිවිධාන සැලැස්වීමයි. වෘත්තීය වශයෙන් රංගන ශිල්පියකු ලෙස කලා ක්ෂේත්‍රයට සම්බන්ධ කෙනෙක් විධියට මගේ සහෝදර කලාකරුවන්ට යම් කිසි ආර්ථික සහනයක් සැලසෙනවා නම් මම ඒ ගැන අතිශයින්ම සතුටු වනවා. එහෙත් මෙම නියෝගවල තිබෙන ඇතැම් වචනවල අපැහැදිලිකම අනුව සිදු වන්නේ මොකක්ද? උදාහරණයක් වශයෙන් කිව්වොත් එහි "සැලකිය යුතු කොටසක්" - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අංක 1687/28 දරන ගැසට් පත්‍රයේ සඳහන්ව තිබෙනවා, ගායක ගායිකාවන්ට, ඒ වාගේම සංගීතඥයන්ට, පද රචකයින්ට මේකේ "සැලකිය යුතු කොටසක්" කියලා. මේ කොටස නිර්ණය කරන්නේ කොහොමද කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමනි, එහි සඳහන්ව නැහැ.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතට අනුව මාධ්‍ය ආයතන ඒ වාගේම ශ්‍රව්‍ය දෘශ්‍ය ආයතන එක්ක සාකච්ඡාවක් කරලා තමයි එකඟතාවකට එළැඹෙන්නේ. මොකද සමහර ආයතන රජය යටතේ තිබෙන අතර සමහර ආයතන තිබෙන්නේ පෞද්ගලිකව. පෞද්ගලිකව නියෝග පැනවීමේදී අපට ප්‍රශ්නයක් තිබෙනවා, රෙගුලාසි පිළිබඳව. ඒ නිසා අපි මෙය පාර්ලිමේන්තුවේ අනුමත වුණාට පස්සේ ඒ ගොල්ලත් එක්ක සාකච්ඡා කරලා කලාකරුවන්ටත්, ශ්‍රව්‍ය දෘශ්‍ය ආයතනවලටත් හැමෝටම සාධාරණයක් වන විධියට කටයුතු කරනවා. රජයේ ආයතන ගැන අපට ප්‍රශ්නයක් නැහැ. පෞද්ගලික ආයතනත් එක්ක සාකච්ඡා කරලා ගෞරවාන්විත තත්ත්වයක් ලබා දීම සඳහා කටයුතු කරන්නට අපි මේ වන විට සැලසුම් කරලා තිබෙනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
ගරු ඇමතිතුමා, එම ගැසට් පත්‍රයේ සඳහන්ව තියෙන්නේ "ගායකයෙකුට, ගායනයට හෝ එහි කොටසක් සඳහා රුපියල් තුනයි." කියලායි. එතකොට සංගීතඥයාට ඒ සංගීතය සඳහා -

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
දැන් ඒ තත්ත්වය වෙනස් වනවා. ඒ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වනවා. ඒ අය ඉල්ලන්න ඕනෑත් නැහැ. Cheque එක ඔවුන්ගේ ගෙදරට යන ආකාරයට මේ කටයුතු කරලා තිබෙනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
එම ගැසට් පත්‍රයේ සඳහන්ව තිබෙන්නේ මේ ආකාරයටයි. "ගායකයාට, වාදනයට, සංගීතඥයන්ට ඒ එක්කම පද රචකයාට රුපියල් තුන ගණනේ" කියලායි.

එහිම තිබෙනවා "...සැලකිය යුතු කොටසක්..." කියලා. ඒ සැලකිය යුතු කොටස මොකක්ද කියන එක මෙහි තීන්දු කරලා නැහැ. මේක කලබලයෙන් ගැසට් කරලාද දන්නේ නැහැ.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ඒකට නැවත සංශෝධනයක් ගෙනෙන්න අපට පුළුවන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
ඒ සැලකිය යුතු කොටස තත්පර කීපයක්ද? සාමාන්‍යයෙන් ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව නම් සැලකිය යුතු කොටසක් කියන්නේ තත්පර ගණනක් වෙන්න පුළුවන්. නමුත් ඇමතිතුමා, මෙහි අඩුම ගණනේ තත්පර ගණනක් කියලාවත් කාල සීමාවක් දාලා නැහැ. ඒක මේ ගැසට් නිවේදනයේ තිබෙන ලොකු අඩු පාඩුවක්.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මේක අනුමත වුණාට පස්සේ අපට පුළුවන් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් නම් මිලක් තීන්දු කරන්න අපට පුළුවන්. දැන් පෞද්ගලික රූපවාහිනී නාලිකා තිබෙනවා. පෞද්ගලික ගුවන්විදුලි නාලිකා තිබෙනවා. ඒ නිසා අපි ඒ අයත් එක්ක සාකච්ඡා කරන්න ඕනෑ. මොකද, සමහරු අපට කථා කරලාම කිව්වා, "අපට ගෙවන්න බැහැ" කියලා. ඒ නිසා තමයි ඒ ගෙවීම් කරන්න ඒ අය හැම දෙනාම බැඳී ඉන්නට අවශ්‍යයි කියන එක නීතියක් බවට පත් කරන්න යන්නේ. සමහරු අපට පෞද්ගලිකව කථා කරලා කිව්වා, "අපට ගෙවන්න බැහැ. මොකද, අපි පාඩු ලබමින් ඉන්නේ." කියලා. සමහර ගුවන්විදුලි ආයතන එහෙම කිව්වා. ඒ නිසා ඒ ගොල්ලන් එක්ක වෙනම සාකච්ඡා කරලා මේ අයට සැලකිය යුතු ප්‍රමාණයක ආදායමක් ලැබෙන ක්‍රමයක් අපි මේ මඟින් හදනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
ඒක සංශෝධනයක් මඟින් හෝ කරන්න වෙනවා ගරු ඇමතිතුමා. මොකද, රුපියල් තුනක් වැනි සොච්චමක් ලැබෙන්නේ.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
අපි ඒක පිළිගන්නවා.

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)
ගරු මන්ත්‍රීතුමා, අප මෙය කරන්නේ ආරම්භයක් විධියටයි. මේක අලුත් අත් දැකීමක්. මෙය ආරම්භ වුණාට පස්සේ

[ගරු ජයරත්න හේරත් මහතා]

දෙපාර්ශ්වයට සාකච්ඡා කරලා ඉදිරි පියවරවලට යන්න පුළුවන්. දෙපාර්ශ්වයත් එක්ක එකඟතාවක් නැතිව තීන්දුවක් ගන්න බැරි නිසා තමයි පළමුවැනි වටයේදී අප මේ විධියට ආරම්භයක් තියලා තිබෙන්නේ. නියෝග පැනෙව්වාට පස්සේ අපි මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා එදිනෙදා තිබෙන තත්ත්වයනුත් සැලකිල්ලට අර ගෙන මේක විධිමත් කරන්න කටයුතු කරනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ඔබතුමන්ලා ගත්තු ඒ පියවර ගැන සතුටු වෙනවා. අද කලාකරුවන් පිළිබඳව අප කථා කළ යුතුයි. මොකද, ඔවුන් ආර්ථික අපහසුකම් මැද බොහොම අමාරුවෙනුයි ජීවත් වන්නේ. ඔබතුමාගේ කථාවේදීත් කිව්වා, ඒ අය පෝෂණය කරන්නයි මේ කටයුත්ත කරන්නේ කියලා. මේ මුදල පිළිබඳවත් සංශෝධනයක් කරන්න වේවි. මොකද, මේ මුදල ඇත්තටම ඉතාම සොච්චමක්. එක්කෙනකුගේ ගීත 200ක් මාසයකට වාදනය වුණත් මං හිතන්නේ රුපියල් 600කට වඩා මුදලක් ලැබෙන්නේ නැහැ ඔහුට. ඒ නිසා මේ මුදල පිළිබඳව ඇගයීමක් කරන්න සිදු වෙනවා ගරු ඇමතිතුමා. රුපියල් තුනකට සීමා කළාම මේ ගැසට් පත්‍රයේ-

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

මේ පිරිස් දීර්ඝ කාලයක් මෙය නොසලකා හැරපු මට්ටමක් තිබුණේ. දිගින් දිගටම කලාකරුවන් ඉල්ලීමක් කළත් මේ ආයතන ඒ තරම් ලොකු සැලකිල්ලක් දැක්වූයේ නැහැ. මොකද, ඒ ගොල්ලන්ගේ පැත්තෙන් ප්‍රශ්නයක් තිබෙනවා. මේ තරම් මුදලක් ගෙව්වාම මේ ආයතන පවත්වා ගෙන යන්නට පුළුවන්ද කියන ගැටලුවක් මතු වෙලා. ඒ නිසා දිගින් දිගටම ඒ ගොල්ලෝ විරෝධය ප්‍රකාශ කළා. නමුත් අවසානයේදී අතිගරු ජනාධිපතිතුමා මැදිහත් වෙලා තමයි අපි මේ ආරම්භය තැබුවේ. ඔබතුමා කියන අදහස අපි පිළිගන්නවා. මේ සම්බන්ධයෙන් නියෝග පැනෙව්වාට පස්සේ දෙවනුව ඒ දෙගොල්ලන්ට තිබෙන තත්ත්වයන් සැලකිල්ලට අර ගෙන ඒ මිල ගණන් තීන්දු කර ගන්න අපට පුළුවන්කමක් තිබෙනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ගරු ඇමතිතුමා, ඔබතුමා කියන කථාව හරි. ආරම්භයක් හැටියට, සැලකිය යුතු කොටස පිළිබඳව කොයි කාල සීමාවක්ද කියලා ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න වෙනවා. විනාඩි තුනක සින්දුවද, නැත්නම් සංගීත කොටසද, තත්පර ගණනක්ද, විනාඩියක්ද කියන එක තමුන්නාන්සේලා තීන්දු කරන්න වෙනවා. ඒකත් ගැසට් පත්‍රයට ඇතුළත් කළ යුතුයි. රුපියල් තුනයි දෙන්න පුළුවන් කියලා ඇතුළත් කළා නම් ඒ ගැනත් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න කියා මම කියනවා. මොකද, සැලකිය යුතු කොටස ගැන අපැහැදිලිකමක් තිබෙනවා මේ ගැසට් නිවේදනයේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා ගායක ගායිකාවන්, සංගීතඥයන්, පද රචකයන් ඉතාම වෙහෙස මහන්සි වෙලා තමයි හොඳ නිර්මාණයක් කරන්නේ කියන එක. පද රචකයා, සංගීතඥයා සහ ගායකයා පුදුම විධියේ මානසික ඒකාග්‍රතාවකින් තමයි ඒ කටයුත්ත කරන්නේ. මේ තුන් දෙනා දම්වැලක් වගේ එකට බැඳිලා තමයි ඒ නිර්මාණය බිහි කරන්නේ. එවැනි නිර්මාණයක් බිහි කළාට පස්සේ මොකද වෙන්නේ? අද අපි දකිනවා විවිධ නාළිකා ඒ අයගේ ගීත වාදනය කරමින් විශාල මුදලක් සොයන ආකාරය. නමුත් ඒ නිර්මාණකරුවන්ට අද කිසිම හව්හරණක් නැහැ. ඒ ගායකයන්ට සංගීත සංදර්ශනයකටවත්, ප්‍රසංගයකටවත් ආරාධනා කරන්නේ නැහැ. ඒ ගායකයාගේ සින්දුව කියන කෙනාට තමයි එන්න කියන්නේ. මේ නිසා ගායකයෝ අද මහත් අසරණ තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. තමන්ගේ ජනප්‍රියතම ගීතය වෙනත් කෙනකු ගායනා කරලා විශාල මුදල් කන්දරාවක් සොයනවා. අර ගායකයා අසරණ විධියට ගෙදරට වෙලා බලා ගෙන ඉන්නවා. ඉතින් මං හිතන්නේ මෙහි යම්කිසි ප්‍රමිතියක් ඇති විය යුතුයි. අද "රියල් ස්ටාර්" කියාවි, තවත් මොකක් හරි "ස්ටාර්" එකක් කියාවි, ඒවායේ අර අහිංසක ගායකයාගේ ගීතය ගායනා කරලා අද රුපියල් මිලියන ගණන් සොයනවා.

ඒ සින්දුවට දෙන තෑග්ග ලැබෙන්නේ කාටද? ඒක original ගායනයත් නොවෙයි නේ. සින්දුව අයිති ගායකයා ගෙදර. ආධුනිකයා ඒ සින්දුව ගායනා කරලා කෝටි ගණන් මුදල් හම්බ කරනවා. සින්දුව අයිති ගායකයා ගෙදරට වෙලා බලා ගෙන ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන කථා කරපු නිසා මා ඔබතුමාට යෝජනාවක් කරනවා. මෙහි සිදු වන්නේ වෙළෙඳ හරඹයක්. ව්‍යාපාරික වැඩ පිළිවෙළක් ගෙන යන්නේ. මේ රටේ තිබෙන ව්‍යාපාරික ආයතන තමයි මේ කටයුත්තට දායක වන්නේ. ලංකාවේ තිබෙන ප්‍රධාන පෙළේ ව්‍යාපාරික ආයතන ඒ අයගේ ව්‍යාපාරය ප්‍රචලිත කරන අතරම, මේ අහිංසක ගායකයාගේ සින්දු ටික උදුරා ගෙන ඒවා ජනතාව අතර ප්‍රචාරය කිරීමේ සංවිධානාත්මක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. එහෙම නම් මෙම ප්‍රසංග පවත්වා මිලියන ගණන් තෑගි දෙන කොට, ඒ පළමුවන ත්‍යාගයෙන්, දෙවන ත්‍යාගයෙන්, තුන්වන ත්‍යාගයෙන් අඩුම වශයෙන් සියයට 25ක හෝ සියයට 50කවත් කොටසක් එම ගීතය හිමි ගායකයාට, සංගීතඥයාට, පද රචකයාට ලැබිය යුතුයි කියලා මා යෝජනා කරනවා. මේ අහිංසක ගායකයෝ කාලයක් තිස්සේ නොයෙකුත් අපහසුතා මැද සංගීතයෙන් ලද පරිචය තුළින් තමයි තමන්ගේ ගායනාවන් මේ ලෝකයට, රටට ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාගේ අවධානය මේ පිළිබඳව යොමු කරන්න. පෞද්ගලික නාලිකා ඇතුළු රජයේ නාලිකාවලත් අද මෙය ක්‍රියාත්මක වනවා. අඩුම වශයෙන් රජයේ රූපවාහිනී නාලිකාව මඟින් හෝ මේ කටයුත්ත ඉටු කරන්න මූලිකත්වය ගන්න කියලා මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා.

අද කලා ක්ෂේත්‍රයේ විවිධ හැකියාවන් ඇති විශාල සංඛ්‍යාවක් සිටිනවා. ගායකයන්, ගීත රචකයන් ඇතුළු සංගීත ක්ෂේත්‍රයේ සිටින ඇතැම් අයගේ තිබෙන චෝදනාවක් තමයි, ඇතැම් ජන මාධ්‍ය ඉදිරිපත් කරන්නේ තෝරා ගත් පිරිසකගේ ගීත පමණක් බවයි කියන එක. විශේෂයෙන්ම රජයේ විද්‍යුත් මාධ්‍යවල දේශපාලන නිර්ණායකයන් මත තෝරා ගැනීම් කරන බවටත් බරපතළ චෝදනාවක් තිබෙනවා. එම නිසා මෙම නියෝගවලින් බලාපොරොත්තු වන ගෙවීම් කිරීමේදී රජයේ දේශපාලන හිතවතුන්ට පමණක් එම වාසිය ක්‍රියාත්මක කළොත් මෙම නියෝගවල අරමුණ සම්පූර්ණයෙන් බිඳ වැටෙනවා. අද රජයේ විද්‍යුත් නාලිකාවල තමන්ගේ දේශපාලන හිතවතුන්ගේ ගීත පමණක්, එහෙම නැත්නම් ඔවුන්ගේ සංගීතය පමණක් ටෙලි නාට්‍යයක් හෝ වෙනත් වැඩ සටහනක් තුළින් ප්‍රචාරය කරනවා නම් තමුන්නාන්සේලා සද් භාවයෙන් මේ පාර්ලිමේන්තුවට ගෙන එන අණ පනත්වලින් ප්‍රයෝජනයක් නැති වනවා. විශේෂයෙන්ම රජයේ නාලිකාවල දේශපාලන ගැත්තන්ට අවශ්‍ය විධියට මෙය ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ නිසා ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා. ඒ වාගේම පෞද්ගලික නාලිකාවලිනුත් එම කලාකරුවන්ගේ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වෙලාව අවසන්.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
අපේ අනෙක් මන්ත්‍රීතුමාගේ වෙලාවත් මම ගන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන්නේ නැහැ. හොඳයි, තව මිනිත්තුවකින් අවසන් කරන්න.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
ඒ වාගේම මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මේ රටේ බුද්ධිමය දේපළවලට අද තැනක් දීලා නැති බව. මේ රටේ බුද්ධිමය දේපළක් අද සිර කුටියක දමලා සිර කරලා තිබෙනවා. මේ යුද්ධය පිළිබඳ බුද්ධිය පාවිච්චි කරලා, මේ රටෙන් ත්‍රස්තවාදය නැත්තටම නැති කරන්නට කටයුතු කරපු ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාගේ ඒ බුද්ධිය අද සිර ගෙයකට දමලා, සිර කරලා තිබෙනවා. එතුමා කාලයක් තිස්සේ තමන්ගේ බුද්ධිය මෙහෙයවලා, තමන්ගේ කායික ශක්තිය සහ මනස ක්‍රියාත්මක කරලා ලබා ගත් තාන්න, මාන්න, සම්මාන සියලු දෙයක්ම අද එතුමාට අහිමි කර තිබෙනවා. එතුමාගේ බුද්ධිය මෙහෙයවලා සේවය කර ලබා ගත් විශ්‍රාම වැටුප අද අහිමි කර තිබෙනවා. ඒ එක්කම එතුමාට තෑගි වශයෙන් ලබා දුන් පර්චස් 20ක ඉඩම් කැබැල්ලට අද ඇතුළු වන්නට බැහැ. නාවික හමුදාපතිට, ගුවන් හමුදාපතිට, යුද හමුදාපතිවරයා වශයෙන් ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාට පර්චස් 20 බැගින් වූ ඉඩම් කැබැලි ලබා දුන්නා. නමුත් අද සරත් ෆොන්සේකා මැතිතුමාට එතුමාගේ ඉඩමට ඇතුළු වන්නට බැහැ. එයට කම්බි ගහලා තිබෙනවා. මේ බුද්ධිමය දේපළ පිළිබඳව කථා කරන අපට අද ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක් මේ රටේ ඇති වෙලා තිබෙන බව පෙනෙනවා. මේ රටේ ගීත ගායනා අහන්න, සංගීතය රස විඳින්න, මේ රටේ කලාකරුවන්ගේ කෘති නරඹලා වින්දනයක් ලබන්න, ආස්වාදයක් ලබන්න හැකි වෙන්න මේ රටේ පැවැති ත්‍රස්තවාදී යුද්ධය නවත්වන්නට යුදමය නායකත්වය දීපු ඒ හිටපු යුද හමුදාපති ජෙනරල් සරත් ෆොන්සේකා මැතිතුමාගේ බුද්ධිමය දේපොළ අහිමි කර තිබෙනවා විතරක් නොවෙයි, එතුමාව මේ පාර්ලිමේන්තුවට එවූ එතුමාගේ මන්ත්‍රී ධුරය පවා අහිමි කරලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බුද්ධිමය දේපොළ ගැන කථා කරන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. මොකද, මේ රටේ අහිංසක ජනතාවට අද හොඳින් ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් ඇති කරපු ජෙනරල් සරත් ෆොන්සේකා මැතිතුමාව හිර කුටියක දාලා එතුමාගේ බුද්ධිමය දේපොළ සොරා ගත්ත රජයක් බවට අද මේ රජය පත් වෙලා තිබෙනවා. ඒක සම්බන්ධයෙන් තමුන්නාන්සේලා නිර්දෝෂී විය යුතුයි.

අද මේ රජය විශ්‍රාම වැටුප් දෙන්න හදන ආකාරය ලෝකයේ කොහේවත් නැති විධියේ දෙයක් වෙලා තිබෙනවා. ඒක ආසියාවේ ආශ්චර්යක් බවට පත් වෙලා තිබෙනවා. අද මේ රට ගහලා, වෙඩි තියලා මරලා විශ්‍රාම වැටුප් දෙන රටක් බවට පරිවර්තනය කර තිබෙනවා. ඒ නිසා බුද්ධිමය දේපොළ ගැන කථා කරන මේ අවස්ථාවේදී බුද්ධිමය දේපොළ ගැන මීට වඩා හොඳ අවධානයෙන් කටයුතු කරන්නය කියා තමුන්නාන්සේලාගෙන් මා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමිය.

[අ.භා. 3.04]

**ගරු මාලනී ෆොන්සේකා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs.) Malani Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ සෑම දියුණු රටකම ඉතා ප්‍රබලව ක්‍රියාත්මක වන බුද්ධිමය දේපොළ නීතිය යටතේ කිසියම් පුද්ගලයකු විසින් තම බුද්ධිය මෙහෙයවා නිර්මාණය කරන නවතම, කලාත්මක හෝ විමර්ශනාත්මක, විද්‍යාත්මක සොයා ගැනීමක් හෝ නව නිර්මාණාත්මක සැලසුමක් හෝ මෙවලමක් සමාජගත කරන්නේ නම් එය පුද්ගලයකුට අයත් වන පුද්ගලික බුද්ධිමය දේපළක් ලෙස හැඳින්වේ. කලාවට, කලාකරුවන්ට හැකි උපරිම අයුරින් කටයුතු කරමින් ඔවුන්ගේ හැකියාවන්, අයිතීන් සුරකිමින් ශ්‍රී ලංකාව ආශ්චර්යවත් දේශයක් කරා රැගෙන යන මෙවන් වකවානුවක, කලාකරුවන්ගේ ස්වර්ණමය අයිතිවාසිකමක් ඔවුන්ට ලබා දීමට කටයුතු සලස්වන මෙවැනි නියෝග සම්මත කර ගැනීමට යන ඓතිහාසික අවස්ථාවක මෙසේ මෙම උත්තරීතර සභාව ඇමතීමට අවස්ථාවක් ලැබීම කලාකාරිනියක් ලෙස මා ඉතා අගය කොට සලකන අතර, ස්තුතියද පුද කර සිටිනවා.

බුද්ධිමය දේපළ යනු කුමක්ද? මේ දේපොළවලට වටිනාකමක් තිබේද? කර්තෘභාගය ගෙවීම යනු කුමක්ද? මේවා ගෙවන්නේ කුමක් නිසාද? නිර්මාණකරුවන් තම බුද්ධිය මෙහෙයවා කරනු ලබන නිර්මාණ යනු ඔවුන්ගේ පූර්ණකාලීන රැකියාවයි. එසේ නම් ඔවුන්ට ගෙවනු ලබන වැටුප, ඔවුන්ගේ ජීවිත කාලයම සුරක්ෂිත කරනු ලබන වේතනය වන්නේ ඔවුන්ගේ නිර්මාණ වෙනුවෙන් ඔවුන් ලබන මූල්‍යමය ගෙවීමයි. මේ වටිනාකම හඳුනා ගත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ වර්තමාන රජය විද්‍යුත් මාධ්‍ය තුළින් ගීත ප්‍රචාරය වන සෑම අවස්ථාවකම එම ගීතයේ පදමාලාවට, සංගීත දායකත්වයට, ගායනයට දායක වූ ශිල්පීන්ට කර්තෘභාගය ගෙවීම සඳහා නියෝගයක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවේදී කලාකරුවන්ගේ මෙම අයිතිවාසිකම වෙනුවෙන් මීට වසර ගණනාවකට පෙර සිට බොහෝ අවංක මිනිසුන් දැරූ උත්සාහය පිළිබඳ කෙටියෙන් මේ ගරු සභාව දැනුවත් කර අතීතයට යෑම ඔවුනට කරන ගෞරවයක් ලෙස මා සලකමි.

2002 වසර මුල් භාගයේදී "ගීත නිර්මාණක කේන්ද්‍රය" එනම් OSCA බිහි විය. මේ සංවිධානය පිහිටුවීමෙහිලා මූලික සංකල්පය ගොඩ නැඟුවේ නවලෝක සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂවරයකු වන ජයන්ත ධර්මදාස මහතාය. මේ සංවිධානය වෙත කලාකරුවන් ඒකරාශී කිරීමේ කාර්යය සඳහා ජයන්ත ධර්මදාසයන්ට අත්වැලක් දුන්නේ ගරු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා, ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී සනත් ජයසූරිය මහතා, නලින්ද ඉලංගකෝන් මහතා, සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහතා හා තිස්ස නාගොඩවිතාන මහතා යන විද්වත්හුය.

මේ සඳහා මූලික වශයෙන් සාමාජික සාමාජිකාවන් 300ක් පමණ ඒකරාශී කර ගැනීමට හැකි විය. මේ අතර දිවයිනේ ප්‍රවීණතම ගීත රචකයින්, සංගීතඥයින් සහ ගායන ශිල්පී - ශිල්පිනියන් විය.

සාමාජිකත්වයේ වෘත්තීයමය ස්ථාවරත්වය සුරැකීම, අයිතීන් දිනා ගැනීම සහ සුභ සාධනය මේ සංවිධානයේ ප්‍රධාන අරමුණ විය. මේ අයිතීන් හමුවේ ප්‍රධාන තැනක් හිමි වූයේ කර්තෘභාග හිමිකමටය. 2005 ජනාධිපතිවරණය එළඹීමත් සමඟ OSCA සංවිධානයේ නියෝජිත පිරිසක් එවකට ගරු අග්‍රාමාත්‍යවරයා වූද, රජයේ පාර්ශවයෙන් ජනාධිපති අපේක්ෂකයා වූද මහින්ද රාජපක්ෂ මැතිතුමා හමු වී කලාකරුවන්ගේ ප්‍රශ්න කිහිපයක් පිළිබඳව

[ගරු මාලනී ෆොන්සේකා මහත්මිය]

එතුමාව දැනුවත් කළ අතර මේ කර්තෘභාග අයිතීන් පිළිබඳවද එහිදී කරුණු සැල කර සිටියහ. වහා ක්‍රියාත්මක වූ එතුමා එවකට ගරු වෙළෙඳ අමාත්‍යවරයාව සිටි ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා වෙත එම පිරිස යොමු කළේ මේ බුද්ධිමය දේපළ පිළිබඳ කටයුතු අයත් වන්නේ වෙළෙඳ අමාත්‍යාංශයට බැවිනි. එතැන් සිට ගරු ඇමතිතුමාත්, අමාත්‍යාංශ ලේකම්තුමාත්, බුද්ධිමය දේපළ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමාත් සමඟ OSCA සංවිධානය විසින් මේ කරුණ ඉටු කර ගැනීම පිළිබඳව දිගින් දිගටම කටයුතු කරන්නට විය. ඊ ළඟ වෙළෙඳ අමාත්‍යවරයා වූයේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාය. එතුමාද මේ පිළිබඳව මහත් ඕනෑකමින් ඉදිරියට කටයුතු කර ගෙන ගියේය. අතිගරු ජනාධිපතිතුමා ද මේ පිළිබඳව විටින් විට නිරීක්ෂණය කිරීමට අමතක කළේ නැත.

අවසානයේ කලාකරුවන්ගේ මේ අධිෂ්ඨානය ඉටු විය. බුද්ධිමය දේපළ කටයුතු භාර නව අමාත්‍යවරයා වන ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා විසින් පසුගියදා කර්තෘභාග පනතට අදාළ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කොට සම්මත කරවා ගෙන එය ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළේය. එහි සඳහන් පරිදි ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන සියලු ගුවන් විදුලි නාලිකාවන් විසින් තම නාලිකා තුළින් ප්‍රචාරය කරන සියලුම ගීත හා සංගීත ඛණ්ඩවල පද රචනය, තනු හා සංගීත නිර්මාණ හා ගායන යන තෙවැදෑරුම් අංශයන්හි දායක වන්නන් වෙත මින් ඉදිරියට එක් අයෙකුට එක් ගීතයකට එක් වරකට රුපියල් 3 බැගින් ගෙවිය යුතු වන අතර, රූපවාහිනී නාලිකාවන්හිද එසේම ප්‍රචාරය කරන ගීත හා සංගීත ඛණ්ඩවල තෙවැදෑරුම් හිමිකරුවන්ට අමතරව රූප රචකයාට ද එක් ගීතයකට එක් වරකට රුපියල් 10 බැගින් ගෙවිය යුතු වනු ඇත. මුදලේ වටිනාකම හැටියට මේ මුදල සුළු මුදලක් ලෙස ඇතැමුන් තර්ක කිරීමට ඉඩ ඇතත් මෙම නීති රෙගුලාසි ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට එකතු වීම අතිශයින් වැදගත් වන අතර එමඟින් කලාකරුවන්ගේ වෘත්තීයමය අයිතීන් මෙන්ම මානව හිමිකම්ද සුරැකෙන බව සඳහන් කළ යුතුය.

මෙහි කූටප්‍රාප්තිය ලෙස පසු ගියදා ශ්‍රී ලාංකීය ගීත ක්ෂේත්‍රයේ ප්‍රවීණතම ජ්‍යෝෂ්ඨතම කලාකරුවන් පිරිසකගේ ගීත නිර්මාණ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නාලිකා තුළින් ප්‍රචාරය කිරීම වෙනුවෙන් බුද්ධිමය දේපළ පනතේ නියෝග අනුව ඔවුනට හිමි විය යුතු කර්තෘභාග මුදල් ගෙවීම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් පසු ගියදා අරලියගහ මන්දිරයේදී සිදු විය. පණ්ඩිත් අමරදේව, මහාචාර්ය සනත් නන්දසිරි, ආචාර්ය දයාරත්න රණතුංග සහ අමරා රණතුංග යුවළ, කලාශූරී අරිසෙන් අහුබුදු, ගීත රචක ඇලෝයි ගුණවර්ධන, මහාචාර්ය සුනිල් ආරියරත්න ආදී කලාකරුවන්ට මෙන්ම අප අතරින් වියෝ වූ ප්‍රවීණ කලාකරුවන් වන සෝමදාස ඇල්විටිගල, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, ඩෝල්ටන් අල්විස් වැනි අයගේ බිරින්දෑවරුන්ට ද තම දයාබර සැමියන් වෙනුවෙන් මේ කර්තෘභාග මුදල ලැබුණි. මේ අවස්ථාව සංවිධානය කරන ලද්දේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති හඩ්සන් සමරසිංහ මහතා සහ එම කාර්ය මණ්ඩලය විසිනි. 2011 ජනවාරි මස 05වන දිනැති අංක 1687/28 දරන ගැසට් පත්‍රයේ බුද්ධිමය දේපළ පනතේ අදාළ වගන්ති යටතේ ප්‍රකාශයට පත් කර ඇති නියෝගය ප්‍රකාර මෙය සිදු කෙරිණි. සංකේතාත්මකව සීමාසහිත පිරිසකට එදින මෙම කර්තෘභාග මුදල ලබා දීම සිදු කළ අතර සංගීත ක්ෂේත්‍රයේ නියැළෙන අනිකුත් සියලු කලාකරුවන්ට ද මේ හිමිකම ඉදිරියේදී ලබා දෙනු ඇත.

"Ring Tones" සහ "Down Load" තුළ ලක්ෂ ගණනින්ද ප්‍රසිද්ධ සංදර්ශන තුළ දසදහස් ගණනින්ද මුදල් උපයන ජනප්‍රිය සක්‍රීය කලාකරුවන් බොහෝ සිටිතත් දශක ගණනාවක් පුරා වෘත්තීමය අයිතිය භුක්ති නොවිඳි සංගීත ක්ෂේත්‍රයේ දැඩි කම්කටොලු මැද දීර්ඝ ගමනක් පැමිණ වර්තමානය් ඔත්පළව සිටින බොහෝ අසරණ කලාකරුවන්ට මේ කර්තෘභාග මුදල ලැබීම විශාල ශක්තියක් වනු නොඅනුමානය.

රූපවාහිනී නාලිකා 25කින් සහ ගුවන්විදුලි නාලිකා 10කින් පමණ එකතු වන මේ කර්තෘභාග මුදල ඔවුන්ගේ විශ්‍රාම වැටුප නොවන්නේද? මෙය, ඔවුන්ගෙන් මතු යැපෙන දරුවන්ගේත්, බිරින්දෑවරුන්ගේත් ආදායම් මාර්ගයක් වනු ඇත.

මේ සියලු දේ ශුභවාදීව සතුටුදායක ලෙස ඉටු වන්නේ, සියලු විද්‍යුත් නාලිකා මේ නීතියට හිස නමා ගරු කරමින් තමන්ගේ නාලිකා පවත්වා ගෙන යෑමට අවශ්‍ය පූර්ණ සම්පත් දායකත්වය ලබා දෙන මේ කලාකරුවන්ට කෘතවේදීව මේ කර්තෘභාග ගෙවීම අවංකව හා විනිවිදභාවයෙන් යුතුව ඉටු කළහොත් පමණි. නොයෙකුත් සට කපටකම් තුළින් මේ නීතියෙන් රිංගා යන්නට උත්සාහ නොකර කලාකරුවන් වෙත තමන් තුළ ඇති සෙනෙහස, ගෞරවය, කෘතවේදිත්වය මේ යැයි මුළු රටටම විදහා දැක්වීමට දැන් සියලු නාලිකාවලට අවස්ථාව උදා වී ඇත. මෙහිදී ලැබෙන මුදලේ මුහුණත වටිනාකම ගැන සැලකීමට වඩා, මෙය නීති රෙගුලාසි ලෙස ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට එකතු වීම අතිශයින් වැදගත් වන අතර, එමඟින් කලාකරුවන්ගේ -කලාකරුවාද තවත් එක් ස්වයං රැකියාවක නිරතවන්නකු බැවින්- වෘත්තීයමය අයිතිය, ජීවනෝපාය මෙන්ම, ඔවුන්ගේ මානව හිමිකම සහ විශ්‍රාම වැටුපද මෙමඟින් ස්ථාවර වන බව සෘජුවම නොපෙනුනද සත්‍යය එයයි.

මේ සියලු කරුණු කාරණා ගැන සැලකීමේදී මෙය විශාල පිරිසකගේ වැටුප් ස්ථිර කිරීමකට, විශ්‍රාම වැටුප් ලබා දීමට ඉදිරිපත් කරනු ලබන නියෝගයක් ලෙස වග කීමෙන් හඳුන්වා දිය හැක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් අවස්ථාවේදී මා මේ ගරු සභාවේ අවධානයට තවත් කරුණක් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. එනම්, පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුපක් ලබා දීමට විරුද්ධව ක්‍රියා කරන අවස්ථාවක ඒ පිළිබඳව මාගේ මතය වන්නේ රැකියාවක නියුතු සෑම ශ්‍රී ලාංකිකයෙකුටම විශ්‍රාම වැටුපක් හිමි විය යුතු බවයි. ඒ නිසා මෙම විශ්‍රාම වැටුප් යෝජනාව ඉතාම කාලෝචිත සහ දූරදර්ශී ක්‍රියාවක් බව පැවසිය යුතුමය.

එමෙන්ම මේ අවස්ථාවේ තවත් කරුණක් මේ ගරු සභාවට අවධාරණය කිරීමට කැමැත්තෙමි. ශ්‍රී ලාංකීය සිනමා ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන රංගන ශිල්පීන්, කාර්මික ශිල්පීන් සහ අනෙකුත් සෑම කලා ක්ෂේත්‍රයක්ම නියෝජනය කරනු ලබන පිරිස් සඳහා ද විශ්‍රාම වැටුපක් හිමි විය යුතුයි යන්න මාගේ අදහසයි. එය මා මේ අවස්ථාවේදී මේ ගරු සභාවට යෝජනාවක් ලෙස ඉදිරිපත් කරමි. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමිය. මී ළඟට ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා.

[අ.භා. 3. 15]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

අද මෙම විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැනත්, විශේෂයෙන්ම ප්‍රවීණ නිළියක වන ගරු මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමියගේ කථාවෙන් පස්සේ වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැනත් මම ඉතාම සන්තෝෂ වනවා.

මෙම වෘත්තියේ වෘත්තීයමය වශයෙන් නියැළී සිටින දහස් ගණනක් කලාකරුවන් කෘති නිර්මාණය කරලා, නිෂ්පාදනය

කරලා, ජනතාව අතට පත් කරලා ප්‍රසිද්ධිය ලැබුවායින් පසු, ඒ කෘතිවල අයිතිය, උරුමය ඒ අයගේ අවසරයකින් තොරව විශාල වශයෙන් ප්‍රසිද්ධියේ පරිහරණය කරන අවස්ථාවක, අතිශය කාලෝචිත අන්දමින් මේ අවස්ථාවේ ඉදිරිපත් වන මේ නියෝග පිළිබඳව නොයෙකුත් අදහස් ඉදිරිපත් කරපු නිසා මම හිතනවා මෙහි අතිශය වැදගත්කම ගැන නැවත නැවත කියනවාට වඩා මෙම නියෝගවලින් පසු මෙය සුරක්ෂිත කර ගැනීම ගැන අපි කථා කළ යුතුයි කියලා.

අද අපි මේ කථා කරන මේ ප්‍රකාශන හිමිකම් විෂය කාලීන මෙන්ම ඉතාම වැදගත් විෂයකි. මෙය සුරක්ෂිත කිරීම හා මෙයට වටිනාකමක් ලබා දීම අපගේ වග කීමකි. මෙය අද ඊයේ සිදු වූවක් නොවේ. මා සිතන හැටියට මෙය රෝම යුගය කාලයේදී තිබෙන්නට ඇති. කෙසේ වෙතත් මේ පිළිබඳව ප්‍රථම ව්‍යවස්ථාව ආරම්භ වන්නේ 1709 දී ඈන් රැජින විසින් පවත්වන ලද ආඥාපනතිනි.

රටක නිෂ්පාදනය වන ප්‍රකාශන ඉතාම වැදගත්. ඒ තුළින් රටක සභ්‍යත්වය, සංස්කෘතිය හා එම රටෙහි ඇති අනන්‍යතාව සුරැකෙනවා. ඒවා පුවත් පතක්, කෘතියක්, කවියක්, ගීතයක්, සී පදයක්, තැටියක්, නාට්‍යයක් හෝ චිත්‍රපටයක් වෙන්න පුළුවන්.

මේවා බහු පිටපත්කරණයකදී ප්‍රතිඵලය විය යුත්තේ එහි කර්තෘත්වය හා ඔහුගේ නීත්‍යානුකූල අයිතිය ලබන්නා වූ ප්‍රකාශයක් තුළින් ඒ අයට නීතිමය රැකවරණය සහ පාරිතෝෂිකයක් ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීමයි.

නවීන තාක්ෂණයත් සමඟ මුද්‍රණය මෙන්ම පටිගත කිරීම් ක්‍රම නිසා ශාස්ත්‍රීය හා කලාත්මක කෘති සමානුපාතික සුළු වියදමකින් බහු පිටපත්කරණය සිදු වනවා. එයත් සමඟම එබඳු කෘති සඳහා ඉල්ලුම වැඩි වීම හේතු කොට ගෙන නීත්‍යානුකූල නොවන ප්‍රතිනිෂ්පාදනයන්ට එරෙහිව කතුවරයාට, ඔහුගේ පැවරුම්කරුවන්ට සහ ප්‍රකාශකයන්ට නීතිමය රැකවරණය සැලැස්වීමේ අවශ්‍යතාව පවතිනවා. ප්‍රකාශන නීති පද්ධතිය පුළුල් කිරීම තුළින් කතුවරයාගේ බුද්ධිමය දේපොළ විකිණිය හැකි ස්වරූපයකට පත් වූ විට ඔහුගේ කෘතිය සෙසු අය විසින් පරිහරණය කරන විටදී මුල් කතුවරයාට ගෙවීමක් කිරීම ඇතුළු කොන්දේසි නියම කිරීමක් තුළින් වාසියක් ලබා දීමේ මූලික පදනම විය යුත්තේ අනවසර පරිහරණයක් හෝ ආවසරික පරිහරණයක් සඳහා ගෙවීමක් සහතික කිරීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ද්‍රව්‍යයන්, ප්‍රකාශනයේ මාධ්‍ය පමණි. කෘතිය වනාහි කතුවරයාගේ පෞද්ගලිකත්වය නිරූපණය කරන්නාවූත්, ඔහුගේ සම කාලීනයන්ට ඔහු අනාගතයට පැවරීමට අපේක්ෂා කරන්නාවූත් පණිවුඩයකි. ඕනෑම සමාජයක ලොකු හෝ කුඩා වේවා, කාර්මික අතින් සංවර්ධනය වන රටක් වේවා, සෙසු අයට වඩා බුද්ධිමය නිර්මාණ සඳහා ස්වාභාවික දායාදයක් ඇති අය බොහෝ සිටිනවා. මේ අය නවකතාකරුවන්, කවියන්, නාට්‍යකරුවන්, ගීත රචකයන්, චිත්‍ර ශිල්පීන්, මූර්ති ශිල්පීන්, ගෘහ නිර්මාණ ශිල්පීන් ආදීන් වන්න පුළුවන්. නිර්මාණාත්මක කෘතිවල නිර්මාතෘවරුන් ආරක්ෂා කළ යුතු බවත්, ස්වාභාවික යුක්තිය අනුව ඔවුන්ගේ ශ්‍රමයන්හි ඵල භුක්ති විඳීමට ඔවුන්ට ඉඩ දිය යුතු බවත්, කුමන සංවර්ධන අවධියක සිටියද ලෝකයේ සියලුම රටවල් මේ නිර්මාණකරුන්ට සාධාරණයක් ඉටු කළ යුතු බවත් මා පවසා සිටිනවා. කර්තෘවරුන් ආරක්ෂණය කිරීම තුළින් ඉතාම සාර්ථක නිර්මාණ ඉදිරියේදී කිරීමට උනන්දු කරනු ලබන හෙයින් එමඟින් රටේ සාහිත්‍ය, නාට්‍ය, සංගීතය යනාදී වූ සම්භාව්‍ය කෘතීන් එළි දැක්වීමට ඉඩ තිබෙනවා. ඒ තුළින් රටේත්, ජාතියේත් සාමාජික, ආර්ථික හා සංස්කෘතික සංවර්ධනයේ පදනම නිර්මාණශීලීත්වය තුළින් දකින්නටත් පිළිවන් වනවා.

ඒ විතරක් නොවෙයි. කතුවරයකුගේ කෘති තුළින් ඒ රටේ සිරිත් විරිත් හා සංස්කෘතික දායාද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වනවා. කිසි යම් රටක් නිර්මාණ කිරීම සඳහා ඒ රටේ කතුවරුන් උනන්දු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, ඔවුන්ට කාර්ය සාධන ප්‍රකාශන හිමිකම් ආරක්ෂණයන්ද ලබා දිය යුතුයි. සම්භාව්‍ය කෘති නිෂ්පාදනය කිරීම තුළින් රටක සභ්‍යත්වය, සංස්කෘතිය සහ අනන්‍යතාව සුරැකෙනවා මෙන්ම රටේ දළ දේශීය නිෂ්පාදනයටද දායකත්වයක් ලබා දීමට පිළිවන් වනවා.

උදාහරණයක් හැටියට කිව්වොත්, 1970 දශකයේදී සංවර්ධිත රටක් වන ස්වීඩනය ඔවුන්ගේ දළ ජාතික නිෂ්පාදනයට සියයට 6.6ක දායකත්වයක් මෙම කෘතීන් තුළින් ලබා දී තිබෙනවා. තවදුරටත් කියනවා නම් ඒ ප්‍රකාශන හිමිකම් ක්ෂේත්‍රය තුළින් සියයට 4.4ක් පෞද්ගලික අංශයෙන්ද, සියයට 2.2ක් රාජ්‍ය අංශයෙන්ද ලබා දී තිබෙනවා. 1980 දශකයේදී ඕස්ට්‍රේලියාවේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 5ක් බුද්ධිමය දේපොළ ක්ෂේත්‍රය තුළින් උපයා ගෙන තිබෙනවා. මේ යුගයේ අපේ රටේ බුද්ධිමය දේපොළ පරිහරණය කිරීමේදී එහි හිමිකාරිත්වයට වඩා ආදායම් උපයනු ලබන්නේ වෙනයම් මාධ්‍ය ආයතනයි. උදාහරණයක් හැටියට කිව්වොත්, 1960 දශකයේ නිර්මාණය වූ ගීත කලාව අරගෙන බලන්න. මාගේ මේ කියමනට මේ ගරු සභාව එකඟ වේවි. නව පරපුරේ ගායක ගායිකාවන් හා කලාකරුවන් පැරණි නිර්මාණ පරිහරණය කිරීමෙන් හා භාවිත කිරීමෙන් ලබා ගන්නා ජනප්‍රියත්වයත්, ඒවා ඉදිරිපත් කරන ආයතන ලබා ගන්නා මූල්‍යමය ශක්තියත් යළි කිසි දිනක මේ නිර්මාණවල මුල් හිමිකරුවන්ට නොලැබෙන බැව් සත්‍යයක්. වර්තමානයේ සිදු වන මේ ක්‍රියාකාරකම් තුළින් උපයන මුදලින් කොටසක් අප රටේ සංවර්ධනයට ලබා ගැනීමට හැකි වන සේ සහ මෙම නිර්මාණයන්ගේ කර්තෘත්වයට ලබා දීමට හැකි වන සේ වැඩ පිළිවෙළක් යොදන මෙන් මේ ගරු සභාවට යෝජනා කරනවා. මේ තුළින් මෙහි මුල් කලාකරුවන්ට විශාල සාධාරණයක් ඉටු කිරීමට අපට හැකි වනවා.

ඒ විතරක් නොවෙයි. 2010 අගෝස්තු 13 වන දා අතිගරු ජනාධිපතිතුමන් සමඟ කලාකරුවන් කෙරුණු සාකච්ඡාවකට අපේ මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමියත් සහභාගි වුණා. මේ වෙනුවෙන් නියෝග පැනවිය යුතු බව එහිදී තීරණය කෙරුණා. එම නියෝග කෙටුම්පත් ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමාත්, ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති ඇමතිතුමාත් 2010 දෙසැම්බර් 08 වන දා කැබිනට් පත්‍රිකාවක් මඟින් ඉදිරිපත් කර තිබුණා. ඒ වාගේම 2011 ජනවාරි 05 වන දා අංක 1687/28 දරන රජයේ ගැසට් පත්‍රයේ ඒ පිළිබඳව සඳහන් වී තිබෙනවා.

ඒ අනුව දශක 2ක් පුරාවට අපේ රටේ බුද්ධිමය දේපළ වංචා කිරීම දිගින් දිගටම සිදු වීම නැවැත්වීම නීතිමය ක්‍රියාදාමයක් බවට පත් වෙලා තිබෙනවා. බොහෝ ප්‍රවීණ ශිල්පීන්ගේ, ශිල්පිනියන්ගේ ගීත සොර රහසේම පිටපත් කොට අඩු මිල ගණන්වලට වෙළෙඳ පොළට බෙදා හරිනවා. මෙය වැළැක්වීමට අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි නීති කෙටුම්පත් සකස් කර තිබෙනවා. මේ අන්දමින් කෙරෙන බුද්ධි වංචා පිළිබඳව පසු ගිය කාලය පුරාම වාගේ අපගේ ප්‍රවීණ කලා ශිල්පීන් වන මහාචාර්ය සුනිල් ආරියරත්න, නන්දා මාලනී වැනි නිර්මාණකරුවන් තම අයිතිය වෙනුවෙන් අධිකරණය ඉදිරියේ නඩු ගොනු කොට ජයග්‍රහණයන් හිමි කර ගෙන තිබෙනවා. බොහෝ කලාකරුවන්ට ඔවුන්ගේ කෘතිවල අයිතිය ඉල්ලා නඩු හබවලට පැටලෙන්නට තරම් ආර්ථික ශක්තියක් නැති බව මා පෞද්ගලිකව දන්නවා. ඔවුන්ට මේ පිළිබඳව කියන්නට සිදු වී ඇත්තේ ඔවුන් අදහන ධර්මයට හෝ ආගමට පමණි. නවීන තාක්ෂණයත් සමඟ ගීත දහස් ගණනින් පටිගත වන්නා වූ ක්‍රමවේදයන් නිසා මෙම බුද්ධි මංකොල්ලය නතර කිරීමට නොහැකි තරමට එය සමාජගත වෙලා තිබෙනවා.

[ගරු තිලංග සුමතිපාල මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව මෙම උත්තරීතර සභාවේ විශේෂ අවධානය යොමු කොට ඔවුන්ගේ කලා කෘතින්වල අයිතිය සුරැකීම සඳහා මේ ගන්නා වූ පියවර අප අගය කරන ගමන් තවත් එක දෙයක් කිව යුතුව තිබෙනවා. මට මතකයි ඒ දවස්වල මාගේ පියා චිත්‍රපට නිෂ්පාදනය කළා. අහසින් පොළොවට, ගහ අද්දර වැනි චිත්‍රපට. ඉතාම ජනප්‍රිය වුණු මිල්ටන් මල්ලවආරච්චි මහතාගේ "උපුල් නුවන් විදහා" වැනි ගීත මට මේ වෙලාවේ මතක් වෙනවා. ඒ වාගේම ගහ අද්දර චිත්‍රපටය සඳහා විජය කුමාරතුංගයන් ගායනා කළ "ගහ අද්දර" ගීතය, ඒ වාගේම "රන් ටිකිරි සිනා" වැනි ගීතවල අයිතිය ඒවායේ පද රචනය කළ අය වාගේම සංගීතය සැපයූ අය සහ ඒවා ගායනා කළ අයට තිබුණත්, ඒවායින් ප්‍රසිද්ධියක් සහ ප්‍රතිලාභ ලබා ගත්තේ ඒවාට සම්බන්ධ නොවුණු, ශ්‍රම දායකත්වය, කෘතින් මඟින් වන දායකත්වය, එහෙමත් නැත්නම් කලාත්මක දායකත්වය මුල්වරට දීපු නැති අයයි. අලුත් සමාජයක අලුත් නිර්මාණවලට එන තරුණ පිරිස පැරණි අයගේ ගීත ගායනා කිරීමේ වරදක් මා දකින්නේ නැහැ. නමුත් අලුත් විද්‍යුත් මාධ්‍ය ආයතන වෙන්න පුළුවන්, එහෙම නැත්නම් නොයෙකුත් කලා රංගනවලට ඉදිරිපත් කරන අය වෙන්න පුළුවන් ඒ අය විශාල වශයෙන් ආර්ථිකමය වාසියක් ගන්න මේවා පාවිච්චි කරනවා. හේතුව, විශේෂයෙන්ම ඒ මඟින් ඒවායේ හිමිකරුවන්ට කිසිම ප්‍රතිලාභයක් නොදී බේරිලා යන්න පුළුවන් ක්‍රමවේදයක් අද තිබෙන නිසයි. ඒ නිසා එයින් වන අසාධාරණය අපි ආදර්ශවත් ලෙස නතර කළ යුතු යුගයක් මේක.

අදාළ කණ්ඩායම් තුනම, විශේෂයෙන්ම ගීත රචක, සංගීතය සපයන්නා, ඒ වාගේම ගායනා කරන්නා යන තිදෙනාම වෙනුවෙන් මුදලක් අය කිරීම අනුමත වෙලා තිබුණත් එය ක්‍රියාත්මක වීමේ දෝෂයක් තිබුණා. ඒ නිසා අපි නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලිනුත් ඉල්ලීමක් කරන්න ඕනෑ, පැහැදිලි ලෙසම නීත්‍යානුකූල නොවන විධියට යම් කිසි විධියකට කැසට් පට හදලා ප්‍රසිද්ධියට පත් කරනවා නම්, එසේ ප්‍රකාශයට පත් කරන අයට, කැසට් ගහන අයට, CDs ගහන අයට විරුද්ධව නීත්‍යානුකූලව දැඩි තීන්දු ගන්නය කියලා. එසේ දැඩි තීන්දු ගත්තේ නැත්නම් අපි මේ ගන්නා වූ උත්සාහයෙන් ප්‍රයෝජනයක් නැති වෙනවා. ඒ විධියට නීති ක්‍රියාත්මක කළොත් ඉදිරියේදී ඒ වැරැදි වැඩවලට පෙළඹීමෙන් වැළකෙනවා. ඒ වාගේම විද්‍යුත් මාධ්‍ය හෝ අනෙකුත් මාධ්‍ය ආයතන මෙවැනි කෘතින් පාවිච්චි කරනවා නම් එම කෘතීන් හිමි අය ඇගැයීමට ලක් කරලා, ඒ අය දැනුවත් කරලා එය කළ බවටත්, ඒ අයගේ අවසරයකින් තොරව කිසි දෙයක් නොකරන ලෙසත් ඒ විද්‍යුත් මාධ්‍ය දැනුවත් කළ යුතුයි. එසේ කරනවාද කියා සොයා බැලීමේ වගකීම විශේෂයෙන්ම පොලීසියට, එහෙම නැත්නම් නීතිය හසුරුවන සෙසු ආයතනවලට තිබෙනවා. ඒ නිසා බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම සඳහා මේ උත්තරීතර සභාවේ අනුමැතිය ලබා දුන්නත්, ඒවා ක්‍රියාත්මක කරන වෙලාවට, ඒ කියන්නේ අඩුම ගණනේ ඉදිරි අවුරුදු දෙකක් වැනි කාලයේදීවත් දැඩි මහන්සියක් දැරුවොත් තමයි මේ උත්සාහයෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නේ කියා මා විශ්වාස කරනවා. ඒ නිසා නැවත වරක් මා සඳහන් කරනවා, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කලාකරුවන් වෙනුවෙන්, කෘතින් වෙනුවෙන් මෙය ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන දැඩි අධිෂ්ඨානයෙන් යුතුව අවංකව හා කැපවීමෙන් රැස්වීම් රාශියක් පවත්වලා මෙයට දායක වුණු බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලාව නියෝජනය කරන මන්ත්‍රීවරියන් කිප දෙනෙකුම ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට කැඳවා තිබෙනවා. ඒ අනුව ඒ අයට හඬක් නැඟීමේ අවස්ථාව ලබා දී තිබෙනවා. ඒ හඬ තුළින් නීතිය ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් ලබා දී තිබෙනවා. මේ සියලු දෙය පිටුපස තිබෙන්නේ පැහැදිලි ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජ නියෝජනය පුළුල් කරන වැඩසටහනක්. ඒ තුළින් දක්ෂතාවය, සහජ හැකියාව තිබෙන පුද්ගලයා ඇගයීම වාගේම ඒ කෘතීන් තුළින් ඔහුට මූල්‍යමය වශයෙන් ආදායමක් ලබා ගැනීමටත් සැලසුම් කර තිබෙනවා. මට මේ අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දැන් අපි ආරාධනය කරමු, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාට.

[අ.භා. 3.28]

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධිමය දේපළ පනත යටතේ ඉදිරිපත් කර ඇති නියෝග ඉතාමත් වැදගත් ඓතිහාසික දෙයක් හැටියටයි මා පුද්ගලිකව සලකන්නේ. එසේම කලාව වෙනුවෙන් ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් පත් වූ, කලාව මූර්තිමත් කරන මුළු ජීවිත කාලයේම කලාව දීප්තිමත් කළ ගරු මාලිනී ෆොනසේකා මැතිනිය මෙම විවාදය ආරම්භයේදීම කළ කථාව -ලංකාවේ සමස්ත කලාකරුවන් වෙනුවෙන් කළ ඒ ඉල්ලීම- ඉතාම සාධාරණ ඓතිහාසික ඉල්ලීමක්. එතුමිය ආ මේ පාර්ලිමේන්තු ගමනේ ඉතාම සාර්ථක පියවර මෙයයි කියා මම විශ්වාස කරනවා.

එසේම බුද්ධිමය දේපළ පිළිබඳව ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කථා කළා. මා එතුමාගේ පියා දන්නවා; ආශ්‍රය කර තිබෙනවා. එතුමා තරුණ කාලයේදීත්, වැඩිහිටි කාලයේදීත් චිත්‍රපට, කලාව ආදී දේ පිළිබඳව එක්තරා අන්දමක නිර්මාණශීලීව කටයුතු කළා. ඒ සම්ප්‍රදාය දරුවන්ටත් හිමි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂ දෙයක් කිව යුතුව තිබෙනවා. ඉන්දියාවේ සංස්කෘතිය භාරගත් අය හැටියට ඉන්නේ රබීන්ද්‍රනාත් තාගෝර්තුමා. ඊට පස්සේ කාන්තාවන් වෙනුවෙන් ඉන්නේ ලතා මංගේෂ්කාර් කියන කෝකිලාවියයි. ඒ දෙදෙනා තමයි, අද ඉන්දියාවේ තිබෙන ආභරණ දෙකක් හැටියට ඉන්දියානු සමාජය සලකන්නේ. අපෙත් මේ වාගේ අය හිටියා. තමුන්නාන්සේලා දන්නවා. අපේ රට අවුරුදු එකසිය පණහක් ඉංග්‍රීසිකාරයෝ යටතේ තිබෙන කොට අප අනාථ ජාතියක් හැටියට හිටියේ. අපට රජෙක් හිටියේ නැහැ. අපේ කිරීටය; ඔටුන්න තිබුණේ නැහැ. අපේ රාජ්‍ය භාෂාව -ලංකාවේ සිංහල භාෂාව- අවලංගු කළා; බුද්ධාගම අවලංගු කළා; සිංහල නීතිය අවලංගු කළා. සිංහ කොඩිය ලංකාවේ ප්‍රදර්ශනය කිරීම 1815 සිට අවුරුදු සියයක් තහනම් කර තිබුණා. අපේ සිංහ කොඩිය නොදැක්ක අවුරුදු සියයක පරම්පරාවක් ලංකාවේ හිටියා.

මෙහෙම තිබෙනකොට තමයි ලංකාව ආපසු හෙම්හිට පිබිදෙන්නට පටන් ගත්තේ. ලංකාව පිබිදෙනකොට මේ අපේ සංස්කෘතිය අවුරුදු දෙදහස් පනසියයක් ඇද ගෙන ආවේ කොළඹ ඉන්න අයවත් විශ්වවිද්‍යාලයේ ඉන්න අයවත් නොවෙයි. ගමේ ඉස්කෝල මහත්තයා; ගමේ පන්සලේ හාමුදුරුවෝ; ගමේ වෙද මහත්තයා; ගමේ නක්ෂත්‍ර ආචාර්යවරයා; ගමේ වන්නම් ගුරුතුමා. මේ හත් අටදෙනා තමයි සුද්දෝ මේ රට පාලනය කළ කාලයේ මේ රටේ අපේ අවුරුදු දෙදහස් ගණනක තිබුණු සංස්කෘතික උරුමය ඉදිරියට ගෙනාවේ. ඒක එතැනින් නතර වුණේ නැහැ. ඒක තව ගම දිගේ ආවා. ඇවිත්, මේ අලුත් ගුවන්විදුලි ශිෂ්ටාචාරය, ටෙලිවිෂන් ශිෂ්ටාචාරය, ඉලෙක්ට්‍රොනික් ශිෂ්ටාචාරය එනකොට මේක තවදුරටත් ගමේ තියටර් එක උඩ ගම්වල මිනිසුන්ගේ කටේ රැව් පිළිරුව් දුන්නා. ඒ අයගේ සිංදු තමයි අද අපට තවමත් අහන්නට ලැබෙන්නේ.

ගරු මාලිනී ෆොන්සේකා මන්ත්‍රීතුමිය ගැන මා ඉතාම සන්තෝෂ වෙනවා. පාර්ලිමේන්තුවට ගෙනා බුද්ධිමය දේපළ පනත යටතේ නියෝගය අනුව සමස්ත ලංකාවේ කලාකරුවන් වෙනුවෙන් භේදයක්, තරාතිරමක්, වෙනසක් නැතිව කළ මේ ඉල්ලීම ඇත්තවශයෙන්ම ජාතික ඉල්ලීමක්; සංස්කෘතික ඉල්ලීමක් හැටියටයි මා හිස නමා ආචාර කර කියන්නේ. අද පුදුම තත්ත්වයකුයි උදා වෙලා තිබෙන්නේ. මහා මනහර ගීත රචනා අද අභාවයට ගිහින් තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා "යශෝදරා වත" කියන පැරණි කවි පොත හැදුවේ ගමේ හිටපු ගමේ කවියෙක් බව. "යශෝදරා වත" කියන කවි පොත අදත් ජාත්‍යන්තරව ඉහළම මට්ටමේ සංස්කෘතික කලා නිර්මාණයක් හැටියට සැලකෙනවා. "යශෝදරා වත", "වෙස්සන්තර ජාතකය" තමයි අවුරුදු ගණනක් අපේ හදවත් පෝෂණය කළේ. අපේ ගෙවල්වල කාන්තාවෝ යශෝදරා වතේ කවි ළමයි නළවන කොට කියන්න පටන් ගත්තා. එහෙම කියා ගෙන ඇවිල්ලා, මහා බාරදූර පණිවුඩයක් අරන් 2011 වෙන කොට මෙතැනට ඇවිල්ලා තිබෙනවා. දැන් වාසනාවකට හෝ අවාසනාවකට ජනමාධ්‍ය වෙනස් වෙලා තිබෙනවා; අධ්‍යාපනය වෙනස් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පාසල් යන කොට හතේ පන්තියේදී සතියට එක දවසක් කාල සටහනේ පැයක් අපට කවි ලියන්න වෙන් කරලා තිබුණා. ඒක බල කරලා තිබුණා. අපි හතේ පන්තියේදී කවි ලියන්න ඕනෑ. කවි හදන්න ඕනෑ. එළිසමය උගන්වලා තිබුණා. වචනවල තේරුම තිබුණා. ණ -න, ල - ළ භේදය කියලා දුන්නා. මේකෙන් තමයි කවි හැදුවේ. දැන් අපේ අලුත් පරම්පරාවට, අපේ ළමා ලෝකයට ඒ මහා දැවැද්ද අපි උරුම කළ යුතුයි. අද මුළු ලෝකයම ආපහු බලන්න පටන් අරන් තිබෙනවා දේශීය ජන කලාව පිළිබඳව. ගරු මාලනී ෆොන්සේකා මැතිනිය යහපත් දෙයක් ගැන කිව්වා. ඒ මැතිනිය කිව්වා "කලාකාරයින්ගේ දේපළ උදුරා ගෙන වෙන අය හම්බ කරනවා" කියලා. ඒක සම්පූර්ණ ඇත්තක්. මේක ඛේදවාචකයක්.

මේ කාරණයත් මම විශේෂයෙන් කියන්න ඕනෑ. අමරදේව මැතිතුමා වාගේ ගාන්ධර්වයෙක් අපේ ඉතිහාසයේ ආපහු සැහෙන කාලයකට මතු වෙන්නේ නැහැ. කලාකාර, ගාන්ධර්ව අමරදේව මැතිතුමා මට නම් මේ ළඟදී හරි අරියාදුවක් කළා. මම පොතක් ලියන්න මාස පහක් තිස්සේ ලෑස්ති වෙලා පොත් හරවා ගෙන, bookmarks තියලා, පිටවල් හදා ගෙන, මේසයක එහෙම්පිටින්ම විසුරුවා ගෙන ලියන්න පටන් ගත්තා. බොහොම රමණීය ලෙස ලියා ගෙන යන කොට මොකද වුණේ? මම ලියා ගෙන ගියේ 17වෙනි පිටුවට විතරයි. මම television එක දැම්මාම, මෙන්න television එකෙන් අමරදේව උන්නැහේ "බඹරෙකු ආවයි නිරිත දිගේයා....." කියලා මගේ මේසෙට කඩා පැන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සින්දුවෙන් -මම ආසා කරන සින්දුවක්- එහෙම්පිටින්ම මගේ සිතුම්පැතුම් පීලි පැන්නා. මම පෑන තියලා ටිකක් වෙලා සින්දුව අහලා ඉවර වෙලා ආයිත් ලියන්න පටන් ගත්තා. කිසිම තාලෙක මට ඒ පොත ආපහු ලියන්න බැරි වුණා. මම අමරදේව මහත්තයා හම්බ වෙලා කිව්වා "තමුන්නාන්සේ මගේ 06 මාසයක වැඩ එක සින්දුවකින් වතුරේ ඇරියා. මට අලාභයක් ගෙවන්න ඕනෑ" කියලා. ඒ තරම් සංගීතය ප්‍රබලයි මහත්වරුනි. ඒ සංගීතයට අපි සලකන්නේ කොහොමද? අමරදේවලා අපට ආපහු එනවාද? මේ උතුම් කට්ටියට අපි සලකන්නේ කොහොමද? ඒ නිසා අද මෙතුමිය කියනවා එක්තරා ගෙවීමක් කළ යුතුයි කියලා. මේක සාධාරණයි. මේ කලාකාරයන්ට, අපේ ගමේ අපේ උගත්තුන්ට මොකක්ද අපි දෙන තෑග්ග? අපි ලොකු hall එකක් අරන් උත්සවයක් පවත්වනවා. පිට පළු කෑල්ලක් අරන් ඒකට පිත්තල තහඩුවක් ගහලා "මෙන්න සම්මානය" කියලා මේ කෙහෙල් මල දෙනවා. මම මහා ප්‍රභූ කලාකරුවන්ගේ ගෙවල්වලට ගියා. ඒ දීලා තිබ්බ ඒවා මේස යට දාලා තිබුණා. සංස්කෘත භාෂාවෙන් චූඩාමාණික්‍යය, ශිරෝමණිය ආදී කියලා ගහලා තිබුණා. මම ඇහුවා මොකද එහෙම තිබෙන්නේ කියලා. "අනේ මහත්තයෝ වැඩක් නැහැ, මේකට ගිය සල්ලි මට නිකම් දුන්නා නම් මම ආපසු ටැක්සිය නැතුව ගෙදර එනවා" කිව්වා. මම ගන්නේ නැහැ.

කවුරු මට දුන්නත් මා භාර ගන්නේ නැහැ, අර පිට පළුවට පිත්තල තහඩුව ගහලා දෙන තෑග්ග. මේවා නොවෙයි කලාකරුවා ජාතියට කරපු සේවය වෙනුවෙන් මැරෙන තුරු ජීවත් වෙන්නට පුළුවන් අන්දමේ වේතනයක්, දීමනාවක්, ප්‍රසාද මුදලක් ලබා දිය යුතුයි. ඔබතුමියට පින් සිද්ධ වනවා, මේ මාතෘකාව ගැන. අතිගරු ජනාධිපතිතුමා මේ කළ යෝජනාව ක්‍රියාවට නංවනවා. මෙය ක්‍රියාවට නංවන්න ඕනෑ. මොහිදීන් බෙග් නමැති ශ්‍රේෂ්ඨ ගායකයෙක් අපට හිටියා. එතුමා මැරුණාට පසු බෞද්ධ ගීතයක් අහන්නත් නැහැ. මූලාසනයේ සිටින ඔබතුමා පවා ආඩම්බර විය යුතුයි, මුස්ලිම් ජාතිකයෙක් හැටියට එතුමා අපේ රටට කර තිබෙන අති විශිෂ්ට සේවය ගැන.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ වාගේම ඊබ්‍රහිම් මාස්ටර්, මොහොමඩ් සාලි මාස්ටර් ඉතිහාසයේ බෞද්ධ ගී ගැයුව අය. ඒ වාගේමයි ඒ.ජේ. කරීම් මහතා.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
"තම රට දේවල් පිට රට පටවා..." කවුද එහෙම කියන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ලක්ෂ්මි බායි, මගේ නැන්දම්මා.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
අපිට කියන්න බැරි දේවල් ලක්ෂ්මි බායි කිව්වා නේ, "තොපිට ලජ්ජා නැද්ද පිට රටින් ගෙනැවිත් කන එක" කියා. අවුරුදු 75කට ඉස්සෙල්ලා හරිම වටිනා චරිතයක් එතුමිය කියන්නේ. එතුමිය තවම ජීවතුන් අතර සිටිනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ. එතුමියගේ සහෝදරිය ඉන්නවා.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
ඒ සියලු දෙනාවම තමුන්නාන්සේලා අරගෙන, මා කිව්ව පිට පළු කෑල්ලකට පිත්තල තහඩුව ගහපු ඒවායින් නොව ජීවත් වන්න පුළුවන්, ජීවිතය රැක ගන්න පුළුවන්, ගෞරවණීය සැලකිල්ලක් අද වුණත් කරන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙමයි.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය අපේ කලාකරුවන්ගෙන් නොමනා ප්‍රයෝජනයක් ගන්නවා. කලාකරුවෝ බඩගින්නේ.

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

කලාකරුවන්ගේ නම මැකිලා ගිහින්. ඉලෙක්ට්‍රොනික්කාරයෝ තැන අරගෙන තිබෙනවා. ඒ නිසා ඔබතුමියට පින් සිදු වනවා මේ යෝජනාව මේ ගරු සභාවට ගෙන ඒම ගැන. මේ යෝජනාව අනුමත කරමින්, ඊට සහය දෙමින්, ඒ වාගේම මෙම නියෝග ඉක්මනින් සාක්ෂාත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15යි.

[අ.භා.3.40]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම බුද්ධිමය දේපළ පනත පිළිබඳව නැවත මේ ගරු සභාවේ සාකච්ඡා කරන අවස්ථාවේදී අදහස් කිහිපයක් දක්වන්න ලැබීම ගැන මා සතුටු වනවා. 2003 නොවැම්බර් මාසයේ 09 වන දා සම්මත කරපු බුද්ධිමය දේපළ පනතට 2011 වන විට වයස අවුරුදු 08ක් වනවා. 2011 දක්වා අවුරුදු 08 කාලය තුළ අපේ රටේ නිර්මාණකරුවන්ට සිද්ධ වන අසාධාරණයන් වෙනුවෙන් ලැබුණු රැකවරණය පැත්තෙන් හිතුවොත්, බුද්ධිමය දේපළ පනතෙන් සිද්ධ වුණු ආවරණයන් පැත්තෙන් හිතුවොත් ඇත්තටම ප්‍රමාණවත් ප්‍රයෝජනයක් සිද්ධ වෙලා නැහැ කියන එක අපි බොහොම අවංකව පිළිගන්නවා. අසාධාරණයට ලක් වන පාර්ශ්වයන්ට ඒ නීතියෙන් සහනයක් දෙන්න අපට ප්‍රායෝගික ක්‍රමවේදයක් නැත්නම්, ප්‍රායෝගික මැදිහත්වීමක් නැත්නම් අපි බුද්ධිමය දේපළ ආරක්ෂාව වෙනුවෙන් නීති සම්පාදනය කළාට වැඩක් නැහැ. මෙතැන තිබෙන ගැටලුව මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නූතන තාක්ෂණයත් එක්ක, නූතන විද්‍යාවේ දියුණුවත් එක්ක පවතින තත්ත්වය ඇතුළත ගීත රචනයක්, ගීත නිර්මාණයක්, චිත්‍රපට නිර්මාණයක් වැනි ඕනෑම නිර්මාණයක් තනි පුද්ගල නිර්මාණයක් වන්නේ නැති බව අපි දන්නවා. ඒක සාමූහික ප්‍රයත්නයක් වනවා; collective work එකක් වනවා. හැබැයි, මේ සාමූහික ප්‍රයත්නය එක තත්පර ගණනකින්, මිනිත්තුවකින්, පරිගණක පද්ධතියක මෘදුකාංගයකින් ඕනෑ කෙනෙකුට පැහැර ගන්න පුළුවන්කම තියෙනවා. මහා දැවැන්ත නිර්මාණයක්, ගීතයක් වන්න පුළුවන්. ගීත රචකයාගේ ඔළුවේ නිර්මාණය වන පරිකල්පනය වන දේ සංගීත අධ්‍යක්ෂවරයා සංගීතය මුසු කරලා ගායකයාගේ සහජ හැකියාවෙන් ඒක එළිදැක්වූවාට පසු නිර්මාණ මං කොල්ලයේදී පරිගණක පද්ධතියකට තත්පර ගණනකදී පුළුවන් ඒක තමන්ගේ කර ගන්න. එහෙම දේවල් වෙලා තිබෙනවා. අපේ රටේ අසහාය නිර්මාණකරුවන් අද අධෛර්යට පත් වෙලා සිටිනවා. ඒ අය මේ ක්ෂේත්‍රයෙන් අයින් වෙලා තමන්ගේ පෞද්ගලික ජීවිතය පවත්වා ගන්න වෙනත් ක්ෂේත්‍රවල කර්මාන්තයන්ට බහින්න සිද්ධ වෙලා තිබෙනවා.

අපි කොච්චර කිව්වත් සුනිල් ආරියරත්න මහත්මයාට හරි, අමරදේව මහත්මයාට හරි, රෝහණ වීරසිංහ මහත්මයාට හරි උසාවි ගානේ රස්තියාදු වෙලා පෙරකදෝරු මහත්වරු අල්ලා ගෙන තමන්ගේ නිර්මාණ අයිතිය වෙනුවෙන් නඩු කියන්න බැහැ. ඒ අය නඩු කියන්න උසාවි යවනවා නම් ඒකත් අසාධාරණයි. හැබැයි, ඒ වෙනුවට මොකක්ද තිබෙන්න ඕනෑ? ඒ අයගේ සින්දු ටික කැසට් පටියකට, CD එකකට copy කරලා සොරකම් කරන ජාවාරම්කාරයන්ට එරෙහිව කටයුතු කරන්න මෙන්න මේ බුද්ධිමය දේපළ පනතින් ආවරණයක් තිබෙන්න ඕනෑ; ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයක් තිබෙන්න ඕනෑ. අද ජාතික බුද්ධිමය දේපොළ කාර්යාලයේ මූලිකත්වය දරන මහත්වරු ජාවාරම්කාරයන්ට බයයි කියන එක අපි අවංකව කියන්න ඕනෑ. ඒ ජාවාරම්කාරයින් අල්ලන්න යන්න බයයි. ඒකට මැදිහත් වීමක් කරන්න බයයි. නැත්නම් -[බාධා කිරීමක්] මම කියන්නේ ඒක තමයි. මම ඒකට යෝජනාවක් තමයි මේ කරන්නේ. ගරු ඇමතිතුමනි, ඒකට යෝජනාවක් තිබෙනවා. දැන් ඔබතුමන්ලා හැම තැනකම වැටලීමේ හමුදාවන් හදනවා නේ. හැම එකටම වැටලීම් තිබෙනවා නේ. හැම එකටම වැටලීමේ හමුදාවක් තිබෙනවා. හෝටල්වල කෑම නරක් වෙලා තිබුණොත් නගර සභාවේ PHI මහත්මයා පොලිසියත් එක්ක ගිහිල්ලා වැටලීමක් කරනවා. මේ බුද්ධිමය දේපොළ මංකොල්ලය සිද්ධ වන්නේ ලංකාව පුරාම නොවෙයි, හැම තැනම නොවෙයි. ප්‍රධාන නගරවල, ප්‍රධාන වීදිවල තමයි ඒක සිද්ධ වන්නේ. ඔබතුමා පිටකොටුවේ මල්වත්ත පාරට ගියොත්, හරස් වීදියකට ගියොත් ලංකාවේ තිස්ස නාගොඩවිතාන මහත්මයා ළඟ නැති චිත්‍රපට තිබෙනවා දකින්න පුළුවන්. ලංකාවේ අධ්‍යක්ෂතුමන්ලා ළඟ නැති, ධර්මසේන පතිරාජ මහත්මයා ළඟ නැති චිත්‍රපට pavement එකේ තිබෙනවා. ඒ සඳහා අද කරන්න පුළුවන්කම තිබෙන්නේ මොකක්ද? ජාතික බුද්ධිමය දේපොළ කාර්යාලය යටතේ කාර්ය සාධන කණ්ඩායමක් හදන්න. බුද්ධිමය දේපොළ මංකොල්ල කෑම වළක්වන්න පුළුවන් වැටලීමේ කණ්ඩායමක් හදන්න. පනතින් ඒ සඳහා නීතියේ ආවරණය තිබෙනවා. ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයයි ඕනෑ. ඒ කාර්යාලයේ ශීතල කාමරයක වාඩි වෙලා කාගෙන්ද පැමිණිල්ලක් එන්නේ කියලා බලා ගෙන ඉන්න මහත්මයකුට මේ වැඬේ කරන්න බැහැ. අපි හිතමු, චිත්‍රපට නිෂ්පාදනය කරන කෙනකුගේ චිත්‍රපටයක් මංකොල්ල කාලා ඒක copy ගහලා පාරේ විකුණන කොට චිත්‍රපට අධ්‍යක්ෂතුමා නැත්නම් නිෂ්පාදකතුමා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ඉන්න ප්‍රධාන නිලධාරි මහත්මයාට කථා කරලා ඒ ගැන කිව්වා කියලා ඒ නිලධාරියාට ගිහිල්ලා ඒක වටලන්න බැහැ. එහෙම කරන්න බැහැ. රටේ නීතිය ඕනෑම දෙයකට ක්‍රියාත්මක කරනවා ඔබතුමන්ලා. ඒ නිසා අපි කියන්නේ මෙවැනි බුද්ධිමය දේපොළ ආරක්ෂාව වෙනුවෙන් වැටලීමේ කණ්ඩායමක් ජාතික බුද්ධිමය දේපොළ කාර්යාලය යටතේ තිබෙන්න ඕනෑ කියන එකයි. ඒකට පැමිණිලි එන තෙක් ඉඳලා හරියන්නේ නැහැ. හෝටල්වල කුණු වෙච්ච කොත්තු රොටී තිබෙනවාද කියලා සොයන්න පැමිණිල්ලක් එන තෙක් ඉන්නේ නැහැ නේ. පැමිණිලි කරලා ගිහිල්ලා කවදාවත් අල්ලන්නත් බැහැ. පැමිණිල්ලක් ආවාම ගිහිල්ලා මේවා අල්ලන්න බැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා විශ්වාස කරන්න, ශ්‍රේෂ්ත ආනන්ද නිර්මාණ ශිල්පියා අවසාන කාලයේ දී කැසට් පටයක් හදලා පිටපත් 1,000ක් අලෙවි කරන කොට pavement එකේ 10,000ක් අලෙවි වුණා. ශ්‍රේෂ්ත ආනන්ද කියන කලාකරුවා මිය යන්න හිත් වේදනාවෙන් පෙළෙන්න ඒකත් හේතුවක් බවට පත් වුණා. ඒ අය ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවන්. අපි කියන්නේ ඒකයි. රෝහණ වීරසිංහ මහත්මයාට හරි, අමරදේව මහත්මයාට හරි උසාවි යන තත්ත්වය හදන්න එපා. කුරුණෑගල වන්න පුළුවන්, ගාල්ලේ වන්න පුළුවන්, මහනුවර වන්න පුළුවන්, කොළඹ වන්න පුළුවන් ප්‍රධාන නගරවල තමයි මේ නිර්මාණ මංකොල්ලය සිද්ධ වන්නේ. ඒක pavement එකේ සිදු වන වැඩක්. ඒ නිසා ඒ අයට ආරක්ෂාව හදන්න ජාතික බුද්ධිමය දේපොළ කාර්යාලය යටතේ කාර්ය සාධන කණ්ඩායමක්, ඒකකයක් අනිවාර්යයෙන්ම පිහිටුවන්න ඕනෑකම තිබෙනවා. මේ සාධනීය යෝජනා ඔබතුමන්ලා කොච්චර දුරට භාර ගන්නවාද කියලා අපි දන්නේ නැහැ. නමුත් එවැනි ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයක් නැතිව මේ අවුරුදු අටට මොකක්ද කරලා තිබෙන්නේ? මේ අවුරුදු අට තුළ බුද්ධිමය දේපොළ පනතක් හදලා ඒ පනතින් අපේ රටේ බුද්ධිමය දේපොළ ආරක්ෂාව වෙනුවෙන් ලබා ගෙන තිබෙන ප්‍රතිඵලය මොකක්ද? ඒ වෙනුවෙන් අර ගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද? තාක්ෂණය දියුණු බව ඇත්ත. අපි

කාටවත් තාක්ෂණය වහන්න බැහැ. අපි කාටවත් විද්‍යාව නතර කරන්න බැහැ. ඒ එක CD පටියකට සින්දු 100ක් දමන්න පුළුවන්. ඩබ්ලිව්.ඩී. අමරදේව මැතිතුමාගේ සින්දු 100ක් තිබෙන CD පටියක් රුපියල් 125ට, රුපියල් 80ට ගන්න pavement එකේ තිබෙනවා.

චිත්‍රපටි 4ක් තිබෙනවා, එක CD එකේ. බලන්න පුළුවන් එකපාරයි, දෙපාරයි තමයි. නමුත් එතකොට ඒ කර්මාන්තයේ ඉන්න අයට මොකද වෙන්නේ? තිස්ස නාගොඩවිතාන මහත්තයා චිත්‍රපටි සංරක්ෂණය වෙනුවෙන් අයිතිය ගත්තාට වැඩක් නැහැ, එතුමාගේ චිත්‍රපට 4ක් එක CD එකක දාලා රුපියල් 80ට පේව්මන්ට් එකේ විකුණනවා. අමරදේව මහත්තයා අපේ රටට සම්පතක් කියලා කොච්චර කිව්වත් වැඩක් නැහැ, අමරදේව මහත්තයාගේ සිංදු 200ක් විතර CD එකක දාලා රුපියල් 80ට පාරේ විකුණනවා. එතකොට ඒකට එතුමාට කරන්න තිබෙන්නේ සිංදුවක් කියනවා, පැමිණිල්ලක් දමනවා; සිංදුවක් කියනවා, උසාවි යනවා. එහෙම කර කර ඉන්න බැහැ නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Will an Hon. Member propose the Hon. J.R.P. Sooriyapperuma to take the Chair?

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான் - கால்நடை வளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Arumugan Thondaman - Minister of Livestock and Rural Community Development)
I propose that the Hon. J.R.P. Sooriyapperuma do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහාතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* THE HON. J.R.P. SOORIYAPPERUMA *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථාව කර ගෙන යන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම යෝජනා කළේ මේකයි. බුද්ධිමය දේපළ පනත හඳුන්වා දීලා අවුරුදු අටක් වුණාට වැඩක් නැහැ, ඒ ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මේ බලය පාවිච්චි කරන අය ජාවාරම්කරුවන්ගේ අතකොළු වෙලා ඉන්නවා නම්; ජාවාරම්කරුවන්ට භය නම්. පිටකොටුවට ගිහිල්ලා රෑ දහයට දොළහට බස් එකකට නැග්ගොත්, මාලනී ෆොන්සේකා හෙළ සිනමා රැජිණ වුණු ලංකාවේ තිබෙන චිත්‍රපටි රුපියල් 80ට ගන්න පුළුවන්. අහස් ගව්වේ සිට බඹරු ඇවිත් චිත්‍රපටිය දක්වා තිබෙනවා. ඒකයි, ඉතින් ඒ තත්ත්වයට වට්ටන්න එපා. ඒ නිසා අපි තමුන්නාන්සේට මුලින්ම යෝජනා කරන්නේ, පුළුවන් නම් මේකට අවශ්‍ය කරන බලය ක්‍රියාත්මක කරන්න පුළුවන්, අඩු තරමින් හය මාසයක් හරියට බලය ක්‍රියාත්මක කරන්න පුළුවන් ඒකකයක් නිර්මාණය කරන්න කියලායි.

ඊළඟ කාරණය, මේ නිර්මාණ කියන්නේ සාමූහික ප්‍රයත්නයක්. මම කලිනුත් මේක කිව්වා. හැබැයි ගීතයක් ප්‍රකාශයට පත් වුණාට පස්සේ ගීත ගායකයාට තමයි ගණනක් හම්බ වන්නේ. එෆ්.එම්. නාලිකා ගොඩක් තිබෙනවා, විද්‍යුත් නාලිකා ගොඩක් තිබෙනවා. ගෙවීම කෙරෙන්නේ ගායකයාට. හැබැයි මේ නිර්මාණය ඇතුළේ ඉන්නවා ගීත රචකයාත්. නිර්මාණය ඇතුළේ ඉන්නවා සංගීත අධ්‍යක්ෂවරයාත්. සංගීත අධ්‍යක්ෂවරයා නැතුව, ගීත රචකයා නැතුව, සංගීතය සපයන සංගීත කණ්ඩායම නැතුව ඒ ගීතය ගීතයක් වන්නේ නැහැ. නාට්‍ය දර්ශනයක් ගත්තත් එහෙමයි. ටෙලි නාට්‍ය ජවනිකාවක් ගත්තත් එහෙමයි. ඒකේ අයිතිය නිෂ්පාදකයාට තමයි. ඒක ඇත්ත. අයිතිය නිෂ්පාදකයාගේ වුණාට නිර්මාණයක් ගත්තොත් ඒ නිර්මාණය සාමූහිකයි; නිර්මාණය සමාජමයයි. සමාජමය නිෂ්පාදනයක් වනවා ඒක. සාමූහික නිෂ්පාදනයක් වනවා ඒක. සාමූහික ප්‍රයත්නයක් වනවා ඒක.

ද ඔබතුමන්ලා අද යෝජනා කරන ගෙවීම ගත්තොත්, ගීතයට හෝ ගීතයක කොටසකට රුපියල් තුනයි ගෙවන්නේ. [බාධා කිරීමක්] ගීතයක් ගත්තොත් ගීතයේ කොටසකට රුපියල් තුනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රේඩියෝ එකේ ගීතයෙන් කොටසක් ගයලා නතර කරන්නේ නැහැ නේ. ගීතයම විකාශනය වනවා. එතකොට ගීත 200ක් ගායනා කළොත් තමයි රුපියල් 600ක් හම්බ වන්නේ. අපි හිතමු, නාලිකාවක හෝ මොකක හෝ මාසයකට ගීත 200ක් ගායනා කළා කියලා. එතකොට ඒ ගීත 200 පෙන්වූවාම තමයි රුපියල් 600ක් හම්බ වන්නේ. අපේ මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමිය කියන ආකාරයට ඒ රුපියල් 600 තුන් දෙනාටම බෙදුවොත් එහෙම-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තුන් දෙනාටම රුපියල් තුන බැගින් හම්බ වෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
තුන් දෙනාටම රුපියල් තුන බැගින් හම්බ වෙනවා? එහෙම වුණොත් ටිකක් හෝ බේරෙනවා. තුන් දෙනාටම ඒ ගණන බෙදුණොත් නම් මොකුත්ම හම්බ වන්නේ නැහැ. රුපියල් දෙසීය තමයි. පොල් ගෙඩි දෙකයි. නමුත් තුන් දෙනාටම රුපියල් තුන ගණනේ හම්බ වනවා නම් 600යි. පොල් ගෙඩි 12යි. නමුත් අපට පුළුවන් නම් මේ රටේ නිර්මාණයක් අගය කරන්න, අපි මීට වඩා දායකත්වයක් සපයන්න ඕනෑ.

අතිගරු ජනාධිපතිතුමා අරලියගහ මන්දිරයට කලාකරුවන් කැඳවලා, ඔවුන් වට කර ගෙන, කෑම වේල් දීලා, පාටි දාලා, හුභාක් උත්සව පවත්වලා කරන ඒ අගය කිරීමට යන වියදම ඩු තරමින් මේ නිර්මාණයකට ගෙව්වොත් මම හිතනවා ඇත්තටම එම ගණන රුපියල් 8ක්වත් කර ගන්න පුළුවන් කියලා. පොල් ගෙඩි තුන වෙනුවට පොල් ගෙඩි පහක් හයක්වත් ගන්න පුළුවන්. මම මේ පොල් ගෙඩිය සංකේතවත් කළා විතරයි. මේ ගණන රුපියල් තුනට බාල්දු කරන්නේ ඇයි? රුපියල් තුනක් හෝ හම්බ වන කොට, උන්න හැටියට මළා මදැයි කියලා හොඳයි තමයි. නමුත් රුපියල් තුනට මේක බාල්දු කරන්නේ ඇයි?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු මන්ත්‍රීතුමා, ආරම්භය-

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ආරම්භයම හොඳ අතකින් මුල් ගලක් තියෙනවා වාගේ මේක අතිගරු ජනාධිපතිතුමාගේම යෝජනාවක් කියනවානේ. මම දන්නා තරමට හුඟ දෙනෙක් එහෙම නේ කිව්වේ. මේක ජනාධිපතිතුමා කලාකරුවන් එකතු කරලා කරපු යෝජනාවක ප්‍රතිඵලයක් කියලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, පිත්තල කැල්ලකට පිට ලැලි කැල්ලක් ගහලා දෙන සම්මානයකට වඩා ඒ දෙන චෙතනය -දීමනාව- වටිනවා කියලා. මම පෞද්ගලිකව එහෙම හිතන්නේ නැහැ. මොකද මම හිතනවා, සමහර විට සම්මානයක් ලැබෙන කොට ඒකේ නිරූපිත අගය තමයි පිත්තල සහ දැව කොටස කියලා. නමුත් ඒකේ අන්තර්ගත ගුණාත්මක වටිනාකම ජීවිත කාලයටම සදාකාලික දෙයක්. මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමියගේ සම්මානයක් නැති වුණාම ඒක මුදලින් අය කරන්න බැහැ. ඒක හොරු අරගෙන ගියපු දවසේ එතුමියගේ හදවතේ පතුළට දැනිච්ච වේදනාව මුදල්මය වටිනාකමක් නොවෙයි; ලෝහමය වටිනාකමක් නොවෙයි; පිට ලැලි වටිනාකමක් නොවෙයි. මොකද තමන්ගේ ජීවිතයේ ස්වර්ණමය අවස්ථාවන් තමයි ඒකෙන් සංකේතවත් කරලා තියෙන්නේ. ස්වර්ණමය වටිනාකම් ඒවා ඇතුළේ තියෙන්නේ. ගුණාත්මක වටිනාකම ගත්තොත් එහෙම ලෝහමය වටිනාකමට, දැව වටිනාකමට වඩා එහා ගිහිපු දෙයක් ඒකේ තිබෙනවා.

මම කියන්නේ මේකයි. පටිගත කරලා නිර්මාණය කරපු ගීතයක් විකාශනය වන වාරයකට අඩු තරමින් රුපියල් 10ක්වත් දෙන්න ඇයි අපට බැරි? ජීවන වියදමට සරිලන විධියට නම් හිතුවොත් මේක රුපියල් 100ක්වත් වෙන්න ඕනෑ. ජීවන වියදම් පැත්තෙන් හිතන්නේ නැතිව නිර්මාණමය අගය පැත්තෙන් හිතුවත් මේ රුපියල් තුන කියන එක නම් සාධාරණ නැහැ.

අනික් එක තමයි රූප රාමු සම්බන්ධයෙන් තිබෙන කාරණය. ඒ කියන්නේ ගීතයක් රූප රාමුවක් හැටියට රූපවාහිනී නාලිකාවක විකාශනය වන එකක් නම් ඒක විකාශනය වන වාරයකට රුපියල් දහයයි. නමුත් අපි දන්නවා, location හොයන්න ගිහිල්ලා, පෙට්‍රල් ගහගෙන වාහන අරගෙන ගිහිල්ලා, මුළු කණ්ඩායම් අරගෙන ගිහිල්ලා, ඒ කණ්ඩායමේ තේ හදන කෙනාගේ ඉඳලා අට්ටාල හදන අයගේ ඉඳලා විවිධ තැන්වල රූකලා මේ ස්ථාන වෙන් කරගෙන ඒ දක්වන වෙහෙස මහන්සිය ගත්තොත් එහෙම ඒක ඉතාමත්ම විශාල එකක් කියලා. ලක්ෂ ගණනක් මුදල් වැය කරන වැඩක්. ලක්ෂ ගණනක ශ්‍රමයක්. ඒ විතරක් නොවෙයි ලක්ෂ ගණනක මුදල් වටිනාකමින් මිල කරන්න බැරි මහා දැවැන්ත නිර්මාණමය දායකත්වයක් තිබෙනවා. මට තේරෙන්නේ නැහැ, අඩු තරමින් මේ වර්ගීකරණය කොහොමද කරන්නේ කියලා. නවක නිර්මාණකරුවන්ට එක්කෝ සාධාරණ කාලයක් තියෙනවා, තව නිර්මාණ ක්ෂේත්‍රයේ නියැළෙන්න. නමුත් විමල් කුමාර ද කොස්තා, නවනන්දන විජේසිංහ වැනි වෘත්තීයමය වශයෙන් මහා දැවැන්ත සමාජමය සේවයක් කරපු, මහා දැවැන්ත කාර්ය භාරයක් කරපු නිර්මාණ ශිල්පීන් අපේ රටේ ඉන්නවා, අද ජීවත් වන්නවත් හරිහමන් තැනක් නැතිව. සමහර අයට ජීවිතය පවත්වාගෙන යන්න විධියක් නැහැ. ක්‍රමවේදයක් නැහැ.

අපි දන්නවා නවනන්දන විජේසිංහ වාගේ කලාකරුවෙක් එක කාලයක ඉතාම විශාල කාර්ය භාරයක් කරපු කෙනෙක් කියලා. විමල් කුමාර ද කොස්තා වාගේ කලාකරුවන් එක කාලයකදී විශේෂ කාර්ය භාරයක් කරපු නිර්මාණකරුවන්. අද ඒ අය රඟපාන්නේ නැති වෙන්න පුළුවන්. හැබැයි ඔය රූපවාහිනී නාලිකාවල ඒ අයගේ චිත්‍රපට විකාශනය වනවා. ඒ විකාශනය වන්නේ සමහර විට මාසයකටම එක පාරයි. ඉතින් එතුමාට කිව්වොත් මාසේ අන්තිමට ඔබගේ චිත්‍රපටයක් විකාශනය වුණා, ඔබට රුපියල් 10ක cheque පතක් තිබෙනවාය කියලා ඒක ගෙනෙන්න යන්න යනවා රුපියල් 100ක් විතර. ඉතින් රුපියල් 10ක cheque එක ගේන්න යන්නේ නැහැ නේ කවුරුවත්. ඒක නිසා මම කියන්නේ ඔබතුමන්ලාට පුළුවන් නම් සාධාරණ විධියකට හිතලා කටයුතු කරන්න කියලායි. මේක සංකේතාත්මක අගයක් වෙන්න පුළුවන්. නමුත් මීට වඩා සාධාරණ දෙයක් ඒ කලාකරුවන් වෙනුවෙන් කරන්න. මොකද මේ නාස්ති කරන මුදල්වල හැටියට ඊට වඩා දෙයක් අපට කරන්න පුළුවන්කම තිබෙනවා.

මේ මාතෘකාව සාකච්ඡා කරන අද දවසේ මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, අපි දන්නවා ඉතා මෑතකදී අපේ දැයෙන් අරිසෙන් අහුබුදු ශූරීන් සමු ගත්තාය කියලා. අරිසෙන් අහුබුදු ශූරීන් කියන්නේ අපේ රටට මහා දැවැන්ත බුද්ධිමය සම්පතක්; මහා දැවැන්ත බුද්ධිමය දායකත්වයක්. මේ රටේ දේශමාමක බලවේගයන්ට ආලෝකයක් සපයපු කෙනෙක්. විශේෂයෙන් එතුමා නාට්‍ය ක්ෂේත්‍රයේ, ගීත රචනා ක්ෂේත්‍රයේ, කලා ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි, අපේ රටේ දූ දරුවන් ලක්ෂ ගණනකට නම් තැබූ ගුරු පියෙක්.

මහා දැවැන්ත බුද්ධිමය සම්පතක්. ඉතින් අද අපි මෙහෙම ඉඳලා එතුමාගේ නිර්මාණවලට සාධාරණයක් ඉෂ්ට නොකළොත් අරිසෙන් අහුබුදු ශූරීන් කියන්නේත් තවත් එක නමක් විතරයි. එතුමාගේ බුද්ධිමය සම්පත් අපි ආරක්ෂා කළොත් විතරයි එතුමා අපට බුද්ධිමය වටිනාකමක් වෙන්නේ. විශේෂයෙන්ම ප්‍රේමසිරි කේමදාස මාස්ටර් ගැන කතා කළොත් එතුමා තමයි අපේ යුගයේග අපේ ඇහෙන්ම දැකපු මහා දැවැන්ත සංගීතඥයා. ප්‍රේමසිරි කේමදාස මාස්ටර් ගැන අද නොවෙයි අපි කතා කරන්නේ. තව අවුරුදු පනහකින්, සියයකින් තමයි අපි එතුමා ගැන කතා කරන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කතාව අවසාන කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ වෙලාවෙන් හෝ වෙන් කරලා මට තව විනාඩි කිහිපයක් දෙන්නය කියා මම ඉල්ලනවා. කේමදාස මාස්ටර් නියෝජනය කරන පරම්පරාව ඇතුළේ එතුමා ගැන කතා කෙරෙන්නේ නැහැ. ලෝක ඉතිහාසය ගත්තත් එහෙම තමයි. බුද්ධිමය දාර්ශනිකයන් ගැන කතා කළොත් ඔවුන් ජීවත්ව සිටි යුගයේ එක්කෝ ඔවුන් සමාජ විරෝධීයි. එහෙම කියා ඔවුන් එල්ලා මරන තත්ත්වයට පත් කරනවා. ගැලීලියෝ ගැන කතා කළේ ගැලීලියෝ ජීවත්ව සිටි කාලයේදී නොවෙයි. ටෝල්ස්ටෝයි ගැන කතා කළේ ටෝල්ස්ටෝයි ජීවත්ව සිටි කාලයේදී නොවෙයි. මැක්සිම් ගෝර්කි ගැන, ඔහු ජීවත්ව සිටි කාලයට වඩා අද යුගයේදී තමයි කතා කරන්නේ. කේමදාස මාස්ටර් ගැන වුණත් එහෙම තමයි. බීතෝවන් ගැන කතා කළේ ඔහු ජීවත්ව සිටි කාලයේදී නොවෙයි. බීතෝවන් මිය ගිහින් අවුරුදු සියගණනක් ගියාට පසුවයි. ඒ වාගේම තමයි කේමදාස මාස්ටර් අපේ ලංකාවේ කලාවට, චිත්‍රපට, සංගීත ක්ෂේත්‍රවලට එකතු කරපු දායකත්වය, ඔපෙරා කලාවට එකතු කරපු දායකත්වය ගැන අපේ යුගයේදී කතා කෙරෙන්නේ නැති බව අපි දන්නවා. හැබැයි කොයි යුගයකදී හෝ කතා කරන්න, අනාගතයේදී හෝ කතා කරන්න අපේ රටේ ඉතිහාසය ලියන යුගයකදී හෝ කතා කරන්න ඒ බුද්ධිමය දේපළ ආරක්ෂා වෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කතාව අවසන් කරන්න. විනාඩි පහකුත් වැඩියෙන් ගත වෙලා තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒ සම්පත් ආරක්ෂා කරන්න නම් මීට වඩා රැකවරණයක් මේ පනතේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය තුළින් ඇති වෙන්න ඕනෑ. අන්න ඒ නිසා අද යුගයේ ඉන්නා කලාකරුවන් වෙනුවෙන් මා ඉල්ලා සිටිනවා, කාර්යසාධන ඒකකයක් හදන්නය කියා. මේ බුද්ධිමය දේපළ මංකොල්ලය වළක්වන්න පුළුවන් වැටලීමේ හමුදාවක් හෝ හදා මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්නය කියා රජයෙන් ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.00]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොතරම් අනර්ඝ අවස්ථාවක්ද? බුද්ධිමය දේපළ ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී බුද්ධි මහිමයෙන් පරිපූර්ණ වූ ඔබතුමා මූලාසනයට පැමිණ සිටීම අප ලත් භාග්‍යයක් හැටියටයි මා හිතන්නේ. මේ නියෝග අපේ ගරු ටී.බී. ඒකනායක ඇමතිතුමා අද පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළා. අපි ඉතාමත් සන්තෝෂ වෙනවා, එතුමාගේ නායකත්වයෙන් සංස්කෘතික කලාවේ දියුණුව ඉතා වේගයෙන් කෙරී ගෙන යන එක ගැන. ටවර් හෝල් යුගය නැවතත් එන්නටයි යන්නේ. දැන් ටවර් හෝල් එක නවීකරණය කරලා එහි අධ්‍යක්ෂතුමා විශාල සේවයක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටවර් හෝල් යුගය ගැන කතා කරන කොට ඔබතුමා මතක් කළ නමක් තමයි ලක්ෂ්මි බායි. අපි එදා පිට රට දේවල් එන තෙක් බලා ගෙන සිටියා. අන්තිමට පැදුරයි, මෙට්ටයයි එන තෙක් බලා ගෙන ඉන්න ජාතියක් අප අතර තිබෙන බව අද විරුද්ධ පක්ෂය දිහා බලන කොට පෙනෙනවා. ලක්ෂ්මි බායි මොන තරම් අර්ථවත්ව එදා ඒ දේවල් ප්‍රකාශ කළාද කියා අපට හැඟෙනවා. ඒ එක්කම ලතීෆ් බායි වැනි අය සිටියා. ගුවන් විදුලි සංස්ථාවේ සභාපති හඩ්සන් සමරසිංහ මැතිතුමා ළඟදී ඉඳලා අලුත් අලුත් දේවල් ඉදිරිපත් කරනවා. - නවීකරණය- He has innovative ideas. දැන් ඔබ, අපි සියලු දෙනාම මේ සභාවේ සාකච්ඡා කරන ගත්කරුවන්ට, සංගීතඥයන්ට, නළුවන්ට, නිළියන්ට බුද්ධිමය දේපළ පනත යටතේ යම් උදව්වක් කරන්න ඕනෑ; උපකාරයක් කරන්න ඕනෑ; දායකත්වයක් දෙන්න ඕනෑ. එදා තිබුණු ජනාධිපති උපහාර උළෙල - Presidential Awards - මේ අවස්ථාවේදී මට මතක් වෙනවා. ඒ ක්‍රමය නැවතත් ගෙනෙන්න ඕනෑ. ජනාධිපතිතුමා ඒ දවස්වල දුන්නු "දේශබන්ධු" වැනි සම්මාන දැන් පිළිකන්නේත් දෙනවා. ඒ වචන දැන් පාවිච්චි කරනවා. ඇත්ත වශයෙන්ම මම ඒක ජනපතිතුමාගේ අවධානයට ගෙනාවා, මේක නවත්වලා අනික් රටවල වාගේ පිළිගත හැකි, ස්ථිරසාර, ගෞරවාන්විත උපහාර උළෙලවල් පවත්වන්න ඕනෑය කියා.

දැන් ඉන්දියාවේ එහෙම බැහැ. "පද්ම විභූෂණ" කිව්වොත්, ඒ සම්මානය ඉන්දියාවේ රජය පමණයි දෙන්නේ. එක් එක් තැන්වල, කඩ පිල්වල දෙන්නේ නැහැ. අන්න එවැනි ක්‍රමයක් අපි නැවත ඇති කළොත් මේ කලාවේ පුනර්ජීවයක් ඇති කරන්න පුළුවන්. කලාව පමණක් නොවෙයි, සාහිත්‍යය පමණක් නොවෙයි, දේශපාලන පැත්තෙන්, වෛද්‍ය අංශය පැත්තෙන් පවා මේ උපහාර උළෙලවල් පවත්වලා ඒ ගොල්ලන්ට ගෞරව කරන්න පුළුවන්.

හඩ්සන් සමරසිංහ මැතිතුමා දැන් පරණ records නැවත ප්‍රචාරය ආරම්භ කරලා තිබෙනවා. අපව භාෂා රසයෙන් කුල්මත් කළ ඇනස්ලි, බර්ටි, ඒ වාගේම සැමුවෙල් රුද්‍රිගු යන අයගේ රසවත් වැඩ සටහන් උදේ පාන්දර දැන් අපට හැම දාම අහන්න පුළුවන්. ඒ වාගේම පැරණි ගායක ගායිකාවන්ට එතුමා උදවු කරනවා. ඒක ඉතාම අගය කළ යුතුයි. නවීන අදහස්වලින් උද්දීපනය වී හඩ්සන් සමරසිංහ මහත්මයා මේ කරන්නේ ඉතාම වටිනා ජාතික මෙහෙවරක් කියලා මම මේ ගරු සභාවේදී අද සතුටින් ප්‍රකාශ කරන්නට කැමැතියි. ඒ පැරණි දේවල් ආරක්ෂා කරන්න ඕනෑ. ඒ ගොල්ලන්ට යම් දෙයක් දෙන්නට ඕනෑ.

මාර්ටින් වික්‍රමසිංහ, ඩබ්ලිව්.ඒ. ද සිල්වා, ටී.ජී.ඩබ්ලිව්. ද සිල්වා යන අයගේ ග්‍රන්ථ සහ සිරිසේන විමලවීර මහත්මා නිෂ්පාදනය කළ චිත්‍රපට අප ආරක්ෂා කරන්නේ නැද්ද? අපේ අග්‍රගණ්‍ය ශිල්පී ලෙස්ටර් ජේම්ස් පීරිස් මැතිතුමාත් රටට ඉතා වටිනා සම්පතක්. අපේ අග්‍රගණ්‍ය නිළි ගරු මාලනි ෆොන්සේකා මන්ත්‍රීතුමියට, he has proposed a film archive. You must have that. Have you got the documents of කඩවුණු "පොරොන්දුව", "අශෝකමාලා", "අම්මා" වැනි චිත්‍රපටවල? මේවා අපේ සිරිසේන විමලවීර මහත්මයා තමයි නිෂ්පාදනය කළේ. මේවා ආරක්ෂා කරලා තිබෙනවාද? නැහැ. අන්න අද ගුවන් විදුලියේ හඩ්සන් සමරසිංහ මැතිතුමා ඒ තැටි සංරක්ෂණය කිරීමේ කටයුත්තට අත තියලා තිබෙනවා. ඒ ගැන අපට ඉතාම සන්තෝෂයි.

එදිරිවීර සරච්චන්ද්‍ර මහතා "සිංහබාහු", "මනමේ" වැනි නාට්‍යවලින් ප්‍රකට වූ කෙනෙක්. දයානන්ද ගුණවර්ධනගේ "ඉබී කටුව", හෙන්රි ජයසේනයන්ගේ "හුණු වටයේ කථාව" වැනි නිර්මාණත් අපට අමතක කරන්න බැහැ. ටෝනි රණසිංහ කියන්නේත් ප්‍රවීණ නළුවෙක්. ඒ වාගේම "සාජන්ට් නල්ලතම්බි"හි රඟ පෑ නිහාල් සිල්වා අපට අමතක කරන්න බැහැ. එතුමන්ලා කළ දේවල්වලට මේ සමාජය කොහොමද වන්දි ගෙවන්නේ? අපේ ගරු ඇමතිතුමාගේ බල මහිමයෙන් අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග යටතේ දැන් අපට ඒ කටයුතු කරන්නට පුළුවන්. ඒ වාගේම ජෝ අබේවික්‍රම වැනි අයත් අපට අමතක කරන්නට බැහැ. මේ රටේ මිනර්වා නාට්‍ය කණ්ඩායම ආරම්භ කරලා එඩී ජයමාන්න, රුක්මනී දේවි වැනි නළු නිළියන් රඟපෑමෙන් දායක වෙලා, බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්න මහතාගේ නිෂ්පාදනවලින් මොන තරම් අගනා සේවයක් කලාවට, චිත්‍රපටවලට කළා දැයි කියන එක අපට මේ අවස්ථාවේදී මතක් වෙනවා. ටයිටස් තොටවත්ත, එම්.ඒ. ගෆූර්, ලෙනින් ප්‍රනාන්දු, they were all great photographers in this country අනික් එක්කෙනා තමයි "චරිත හතක්" හි රඟපාපු විල්සන් ගුණරත්න මහත්මයා. ඇමෙරිකාවේ ඉන්නවා මේ වාගේ චරිත රඟපාන අය. එංගලන්තයේ ඉන්නවා, ජපානයේ ඉන්නවා, චීනයේ ඉන්නවා. ඒ වාගේ චරිත රඟපාන අද ලංකාවේ ඉන්න එකම එක නාට්‍යවේදියා තමයි විල්සන් ගුණරත්න නමැති ඒ චරිතය කියලා මම කියනවා. ඉතාම අලංකාරයි. නාට්‍යයක් බලන්න ගිය වෙලාවේ ඉඳලා ඥානාන්විතව හිනා වෙන්නට පුළුවන්; බුද්ධිමත්ව හිනා වෙන්නට පුළුවන්. එතුමා අපව කුල්මත් කරනවා.

මාලනී ෆොන්සේකා මැතිනිය ගැන කියන්නට වුවමනා කරන්නේ නැහැ. එතුමිය අපේම ගරු මන්ත්‍රීතුමියක්. එතුමියගේ කාලයේ හිටියා කියලා අපි හිතනවා ස්වර්ණා මල්ලවාරච්චි, සන්ධ්‍යා කුමාරි, සබීතා පෙරේරා, නීටා ප්‍රනාන්දු වැනි අය. අපේ නිරූපමා රාජපක්ෂ මැතිනිය මට මතක් කරනවා ගීතා කුමාරසිංහ මහත්මිය පිළිබඳවත්. හොඳයි තවත් මතක් කරන්න. රවීන්ද්‍ර රන්දෙනිය මහත්මයා මේ ගරු සභාවේ හිටපු ගරු මන්ත්‍රීවරයෙක්. මොන තරම් උසස් අන්දමින් එතුමා කලාවට දායක වෙලා තිබෙනවාද කියලා අප මොහොතක් කල්පනා කර බැලිය යුතුයි. සනත් ගුණතිලක කියන්නේ අමතක කරන්නට බැරි චරිතයක්. එදා මා එතුමාත් සමඟ හැප්පුණා. දැන් අපි අරලියගහ මන්දිරයේදී -"Temple Trees" එකේදී- හමු වුණාම, "ඒ දවස්වල උඹ අපිට

[ගරු අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා]

අරවා මේවා කිව්වා නේද?" අහනවා. දැන් අපි ඒ වාගේ බොහෝම සුහදව කථා කරනවා. "තමුන්නාන්සේ රඟපෑමට දක්ෂයි, ඒක මම සම්පූර්ණයෙන්ම පිළිගන්නවා, ඔබ හොඳ නළුවෙක්" කියලා මම එතුමාට කියනවා. ගාමිණී ෆොන්සේකා මහත්මයා "දෙලොවක් අතර" චිත්‍රපටයේ කළ රංගනය ඉතාම විශිෂ්ටයි. ඉතින් අපට අමතක කරන්න පුළුවන්ද එතුමාගේ නම? මෙතුමන්ලාට අපි කොහොමද වන්දි ගෙවන්නේ? විජය කුමාරණතුංග මහත්මයා "ගඟ අද්දර" චිත්‍රපටයේ රඟපාමින් ගායනා කළ ඒ ගීතයෙන් අදත් රට කුල්මත් වෙනවා. ඒ වාගේම තමයි රෝහිනී ප්‍රනාන්දු, හියුගෝ ප්‍රනාන්දු, මාක් සමරනායක, නවනන්දන විජේසිංහ වැනි ශිල්පීනුත්. මේ නවනන්දන විජේසිංහ කියන මහත්මයා ඒ දවල්වල මාත් එක්ක Air Ceylon එකේ වැඩ කළා. ප්‍රේමා ගනේගොඩ වැනි දක්ෂ නිළියන් හිටියා. එතකොට පී.එල්.ඒ. සෝමපාල සහ චිත්‍රා සෝමපාල අපට අමතක කරන්න බැහැ. ඒ කාලයේ මේ අය ඒ පැරණි ගීත ඉතාම ලස්සනට කිව්වා. "පනාමුරේ... පනාමුරේ.. පනාමුරේ ඇත් රාජා.." කියන සින්දුව කොයි තරම් ලස්සනද? ඒ වාගේම දඹුල්ල, ඉසුරුමුණිය හා තිසා වැව වැනි ස්ථාන පිළිබඳවත් ඔවුන් ඉමිහිරි ගීත ගයා ලොවක් සැනසුවා. මේ පාර්ලිමේන්තුවේ ඒ දෙපොළගේ පුත්‍ර රත්නය -රෝහණ සෝමපාල මහතා- වැඩ කරන බව මා සතුටින් සඳහන් කරනවා.

නීල් රූපසිංහ, විජේරත්න වරකාගොඩ, පණ්ඩිත් අමරදේව මැතිතුමා, නන්දා මාලනී, නිරෝෂා විරාජනී වැනි අය අද ඉන්න දක්ෂ නිෂ්පාදක-ගායක ගායිකාවන්. ලක්ෂ්මී බායි ගැන මම කිව්වා. ක්ලැරිස් ද සිල්වා, රීටා රත්නායක, ඩොමී ජයවර්ධන, ක්‍රිස්ටි ලෙනාඩ් පෙරේරා, උදුලා දාබරේ, ෆ්‍රෙඩී සිල්වා, ආනන්ද ජයරත්න, ශේෂා පලිහක්කාර, අශෝක පොන්නම්පෙරුම, පුන්‍යා හීන්දෙනිය, ජී. එස්. බී. රානි පෙරේරා, අනුලා කරුණාතිලක, කාන්ති කුලතුංග, විවියන් බොරලැස්ස, ඇන්ජලීන් ගුණතිලක, ශීලා පීරිස්, කෝකිල දේවි වීරතුංග, මෙන්න මේ වාගේ නම් මගේ මතකයට නිතැතින්ම නැඟෙනවා, තිබෙනවා. ඒක නිසා we have to honour these great cultural and art Ambassadors. Their names must be inscribed in the history of this country. I think well-planned and very progressive steps must be taken in this regard.

දෙමළ කලාකරුවන් දිහා බැලුවාම අපේ ඉන්නවා, ආරිෆා ෂෙයිරහීම්සහීද් කලෙයිසෙල්වම්, "ලියාවුල් ෆන්නාන්-කලාභූෂණ" රවුෆ් වැනි අය. මේ රටේ ඉස්සෙල්ලාම නිෂ්පාදනය කළ චිත්‍රපටිය, "தோட்டக்காரி". சமுதாயம், நான் உங்கள் தோழன், அனுராகம், වැනි දෙමළ චිත්‍රපට නිෂ්පාදනය වුණා. මේ ළඟදී මුස්ලිම් නිෂ්පාදකයෙක් "ඉරේනාලීල්" කියලා චිත්‍රපටියක් නිෂ්පාදනය කළා. අපේ කුමාර් අබේසිංහ මැතිතුමා ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිතුමා වශයෙන් විශාල සේවයක් අද මේ ක්ෂේත්‍රයේ කරන බව අප සතුටින් මතක් කරන්න ඕනෑ. ඉස්ලාමීය රාජ්‍ය ගැන කථා කරන කොට ඉරානය ගැන කියන්න ඕනෑ. There was an Iranian Cultural Week. මොන තරම් ලස්සන, ඉතාම උසස් ගණයේ වටිනා චිත්‍රපට, very quality films produced by Iran were shown at the National Film Corporation, which was organized by our very good friend His Excellency Mahmoud Rahimi Gorji, Iran Ambassador in Sri Lanka.

Sir, there were persons such as T.F.A. Latheef, A.J. Kareem and also A.L.M. Yusuf, a talented radio artiste, who can sing *Ghazal* and *Qawwali* very well in Sinhalese and Tamil too. හරුන් ලන්ත්‍රා, ටෝනි හසන්, ඒ.ජේ. කරීම්, මොහිදීන්බෙග්, වාගේම ඉම්තියාස් මාකාර් කියලා දක්ෂ ගායකයෙක් හිටියා. අපේ සාහිරාවේ එම්.ඒ. මොහොමඩ් ආචාර්යතුමා හිටියා. මම ඉතාම සන්තෝෂයෙන් මේ ගරු සභාවේ කියන්න ඕනෑ, එතුමා තමයි ප්‍රථමවරට මුස්ලිම්වරුන්ගෙන්ම සැදි චරිත ගොඩ නඟලා, සිංහල වේදිකා නාට්‍යයක් වේදිකාගත කළේ. එය කොළඹ සාහිරාවේ, ලුම්බිණි රඟහලේ, ටවර් හෝල් රඟහලේ, බොරැල්ලේ වයි.එම්.බී. ශාලාවේ වේදිකාගත වුණා; අපි හැම තැනම එම නාට්‍ය නඟදැක්වූවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම සංතෝෂයෙන් කියනවා මේ සභාවේ ඒකේ ප්‍රධාන නළුවා මමයි කියලා. එදා මාත් එක්ක ෂෆා මහ්මූර්, මිස්රුල් හනීමා, ඔසිලා දාවුද් වැනි අය රඟ පෑවා. ටී.එෆ්. ලතීෆ් මහතා සංගීතය සැපයුවා. එතකොට තවත් කලාකරුවෙක් හිටියා; ඩී.එම්.එම්.රවුෆ්, කරුණාරත්න අබේසේකර හා සැසඳිය හැකි අයුරින් ගීත රචනය කළා. කවුරුත් ඒ ගැන එදා පුදුම වුණා. ඒ පළමුවැනි මුස්ලිම්-සිංහල වේදිකා නාට්‍යයේ නම "හෘදය සාක්ෂිය" -"The Conscience"- එම නිසා මම ඉතාම සන්තෝෂයි. ගිය සුමානේ there was a workshop on the useage of Tri Languages. අපේ සුනිමල් ප්‍රනාන්දු මැතිතුමාගේත්, ලලිත් වීරතුංග මැතිතුමාගේත් Tri Languages සංකල්පය පිළිබඳව ඒ වැඩ මුළුව පැවැත් වුණා. They took a lot of interest to hold this workshop. At this workshop, the Tamil film, "Meera" starred M.S. Subbuluxmi of Tamil Nadu fame. She was an singing an inspiring melody very well and those academics attending the workshop said it must be translated into Sinhala and sung by Nanda Malini Gokula or Nirosha Viragini or singers of that calibre. එම්.එස්. සුබ්බු ලක්ෂ්මී "காற்றினிலே வரும் கீதம்" It is very, very melodious and most enjoyable.

ඊළඟට, නඩරාජා, මුත්තුසාමි වැනි අය, ඔහුගේ පුත් මොහන්රාජ් ගුරු, තබ්ලා මාස්ටර් නඩරා, බටනලා වාදක ඩී.ඩී. ඩැනී වැනි කලාකරුවන් මට මේ අවස්ථාවේදී සිහි වෙනවා. ඒ වාගේමයි අරිසෙන් අහුබුදු ශූරීන්. එතුමාගේ අවමඟුල් උත්සවයට මම එදා සහභාගි වුණා. එතුමා තමයි සිංහල බස ප්‍රගුණ කළේ මේ රටේ. එතුමා ගීත රචකයෙක්. ඒ වාගේම සිංහල සාහිත්‍යය, සිංහල කලාව වෙනුවෙන් අප්‍රමාණ සේවයක් කළ උත්තමයෙක්. එතුමාට අපේ ගෞරවාචාරය මේ අවස්ථාවේදී පුද කරනවා. මට අමතක කරන්න බැරි නාමයක් තමයි නාරද දිසාසේකර කියන නාමය. ඉතාම මියුරු හඬින් ගීත කියන ගායකයෙක්. මේ වාගේ දහස් ගණනක් ඉන්නවා. නමුත් ඒ ඔක්කෝගේම නම් කියන්න අද මට වෙලාවක් නැහැ. සිංහල සංගීත ගාන්ධර්වයා තමයි මොහොමඩ් ගවුස් මාස්ටර්. අමතක කළ නොහැකි නමක් ඒ.

Finally, Sir, I have a duty to perform. The other day, the Hon. Leader of the Opposition's beloved mother, Mrs. Nalini Wickremasinghe, passed away. See how generous and large-hearted our President was. He issued a condolence message which states: "In this moment of bereavement, the President commended the role of a mother played by late Nalini Wickremasinghe 'who bequeathed to the country leaders committed to serve the nation.' " That was the opinion of the President of this country. Irrespective of party politics, he and the First Lady visited her house, paid their respects at the funeral and issued that condolence message for the whole world to know. We too condole her death because I myself knew Madam Nalini Wickremesinghe well. I used to go to the 5th Lane house when when Mr. Esmond Wickremesinghe was living. In those days, I, as Minister of State for Muslim Religious and Cultural Affairs, used to present Mrs. Wickremasinghe with a packet of dates, annually. She used to write to me in handwriting beautiful letters, which are in my possession still.

But, I am sorry to say that the son of this great lady, without keeping up to her expectations - අද පාරට බැහැලා ඝෝෂාවක් කරනවා. මොනවාට එහෙම කරනවාද දන්නේ නැහැ. මේ රට ආරක්ෂා කර ගැනීමේ අවස්ථාවයි මේ පැමිණ තිබෙන්නේ. අපේ වීරෝදාර රණ හමුදාව මේ රට ආරක්ෂා කරලා දුන්නා. විජාතිකයන්ට මේ රට ආපසු භාර දෙනවාද, විදේශික ඔත්තුකාරයන්ට මේ රට භාර දෙනවාද කියලා අපි අහනවා. ඒ නිසා මේ ඔක්කෝම අකුළා ගෙන රට හදන්න ඉදිරිපත් වෙන්න. මවගේ නාමයෙන් මේ රට හදන්න අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ අත් වැල් බැඳ ගන්න කියා මම මේ අවස්ථාවේදී විරුද්ධ පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගෙන් බැගෑපත්ව ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් බුද්ධිමය දේපළ පනත පිළිබඳව කියන්න ඕනෑ. ඊයේ පෙරේදා පුත්‍රසිගාමනී කියන very senior journalist, who also comes here to report House proceedings, gave me a paper bag. This is a bag in which somebody had sold something in the market of Kandy. It has the scriptures of the Holy Quran "*Bismillahir Rahmanir Raheem*" - "In the name of Allah, the most Gracious, the most Merciful", inscribed on it. All the *surahs* of the Holy Quran start with that, you know it very well, Mr. Presiding Member. I am very happy to address this House on this subject when you are presiding. These bags have been made out of the pages of the textbooks published by the Department of Education. Somehow or the other, those have reached the "*kadalakarayas*" and the other paper vendors in the market and they have made these bags out of these. We are against that and are always against exhibiting pictures of even Lord Buddha, Jesus Christ and other religious persons for commercial purposes. They should be punished. I will be bringing this matter to the notice of the Government and the Hon. Prime Minister, who is also the Minister of Buddha Sasana and Religious Affairs. This should be stopped forthwith and the culprits who took the pages out of the school textbooks issued by the Department of Education and sold it to the "*kadala kade*" for them to make these bags should be punished. Sir, I can see you bending, signalling me to sit down. Sir, there is another Regulation to be brought before the House, on which I may say a few words.

Thank you very much again, Sir, and I say that this is a great and one of the happiest moments in my life in Parliament since I was able to address the House on this subject when an Hon. Member of your calibre, talent and intellectual capacity was presiding.

[අ. භා. 4.16]

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත මඟින් පද රචකයන්, සංගීතඥයන් හා ගායකයන් වැනි කලාකරුවන්ගේ අයිතිවාසිකම් සඳහා එම අයිතිවාසිකම් කළමනාකරණය කිරීම හා බලාත්මක කිරීම සඳහා විධිවිධාන සලසා තිබෙනවා. ඒ අනුව පද රචකයන්ට, සංගීතඥයන්ට සහ ගායකයන්ට සිය පද මාලා සංගීතය හා ගායනයෙන් රූපවාහිනී හා ගුවන්විදුලි ආයතන වැනි විකාශන සංවිධාන මඟින් වාණිජ අරමුණු සඳහා භාවිත කිරීමේදී කර්තෘභාගය ලබා ගැනීමට හිමිකම් තිබෙනවා. අදාළ නෛතික ප්‍රතිපාදන පැවතියද විකාශන සංවිධාන මඟින් ගීත විකාශනය කිරීමේදී කර්තෘභාගය ගෙවීම පිළිබඳව විවිධ ගැටලු කාලයක් තිස්සේ පැවතුණා. මේ තත්ත්වය මත එසේ ගෙවිය යුතු ප්‍රමාණය අවම වශයෙන් හෝ දක්වමින් බුද්ධිමය දේපළ පනත යටතේ නියෝග පැනවීමේ අවශ්‍යතාව පැන නැඟුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අවස්ථා කිපයකදීම ඊට සම්බන්ධ විවිධ පාර්ශ්වයන් සමඟ මේ පිළිබඳව සාකච්ඡා කළා. අතිගරු ජනාධිපතිතුමා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වශයෙන් 2009 වසරේ අය වැය කථාව ඉදිරිපත් කරමින් විද්‍යුත් මාධ්‍ය තුළින් ගීත විකාශනය වන සෑම අවස්ථාවකදීම ගීතමය නිර්මාණවලට පද මාලාවෙන් හා සංගීතයෙන්, ගායනයෙන් දායක වූ නිර්මාණකරුවන්ට ප්‍රතිලාභ ලබා දීමට යෝජනා කළා. ඉන් අනතුරුව අදාළ පාර්ශ්වයන් සමඟ පැවැත්වූ සාකච්ඡාවකදී අතිගරු ජනාධිපතිතුමා මේ යෝජනාව තවදුරටත් සාකච්ඡාවට ගෙන සැලකිල්ලට භාජනය කළා. කලාකරුවන්ගේ අදහස් ඔවුන්ට නීත්‍යනුකූලව හිමි විය යුතු කර්තෘභාගය ලබා දීමේ වැදගත්කම ද සැලකිල්ලට ගනිමින් ඒ සඳහා අවශ්‍ය නියෝගයන් බුද්ධිමය දේපළ පනත යටතේ කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා විසින් සකස් කරනු ලැබුවා. එසේ සකස් කරන ලද නියෝගයන් 2011 ජනවාරි 05 වැනි දිනැති 1687/28 දරන ගැසට් පත්‍රයේ පළ කෙරුණා. මේ අවස්ථාවේ සැලකිල්ලට ගනු ලබන්නේ එසේ සකසා පළ කරන ලද නියෝගයි.

පද මාලාව හා සංගීත නිර්මාණවල හිමිකරුවන්ටත්, එම ගීත ගායනා කරන ගායක ගායිකාවන්ටත් විකාශන සංවිධානය විසින් ගෙවිය යුතු අවම කර්තෘභාග ප්‍රමාණයන් හිමි නියෝග මෙමඟින් ප්‍රකාශිතයි. ඊට අමතරව ගීතවල රූප රචනා විකාශනය කිරීම වෙනුවෙන් එම හිමිකරුවන්ට ගෙවිය යුතු අවම ගාස්තු දක්වා තිබෙනවා. මෙම නියෝගයන්ගේ පරමාර්ථය වන්නේ නීතියෙන් පිළිගත් තම අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමටත්, තම නිර්මාණයන් විකාශන ආයතන මඟින් භාවිත කිරීමේදී ලැබිය යුතු අවම කර්තෘභාගය ලබා ගැනීමටත් කලාකරුවන්ට පහසුකම් සලසා උපකාර කිරීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප විසින් මෙම නියෝග සකසා ඇත්තේ රටේ සංවර්ධන ක්‍රියාවලියේ විප්ලවීය නව යුගයක් සනිටුහන් වන අතරතුරදීයි. මෙම නියෝගයන් දීර්ඝ ගමනක එක් පියවරක් පමණයි. අපගේ ආර්ථික හා සමාජ සංවර්ධන ප්‍රමුඛතාවන් මෙන්ම එම ප්‍රමුඛතාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කෙරෙන නවීන උපක්‍රම ක්‍රමවේදයන් ද ඇතුළත් ජාතිය ගොඩ නැඟීමේ ප්‍රතිපත්ති මාලාව අතිගරු ජනාධිපතිතුමා "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" මඟින් ප්‍රකාශයට පත් කර තිබෙනවා. එහි ප්‍රධාන අරමුණක් වන්නේ ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමයි. එසේම එම අරමුණ දිනා ගැනීම සඳහා ශ්‍රී ලංකාව දැනුම පිළිබඳ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට ද අපේක්ෂා කරනවා. මෙම පරමාර්ථයන් ඉටු කර ගැනීමේදී ප්‍රධාන වශයෙන්ම දැනුම නිර්මාණය කිරීම, දැනුම හිමි කර ගැනීම හා දැනුම ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී භාවිත කිරීම යන කරුණු අතිශයින් වැදගත් වෙනවා. එවැනි ක්‍රියාමාර්ගයන් අප හා ආර්ථික වශයෙන් සංවර්ධිත රටවල් අතර පවත්නා දැනුම පිළිබඳ වෙනස හැකි තාක් දුරට අඩු කිරීමට උපකාර වෙනවා. එමෙන්ම ඒ තුළින් වර්තමාන හා අනාගත දැනුම මත පදනම් වූ ගෝලීය ආර්ථික රටාවක් සමඟ දේශීය ආර්ථිකය සම්බන්ධ කිරීමේ අවස්ථාව පහසු කිරීමක් සිදු වෙනවා. ඒ සඳහා දේශීය නව නිර්මාණකරණය ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වනවා. එසේම එම නිර්මාණශීලි පරිසරය තුළින් පැන නඟින අලුත් නිර්මාණයන් නිසි ලෙස ආරක්ෂා කිරීමද රටේ සහ නිර්මාණකරුවන්ගේ යහපත සඳහා නිසි ලෙස කළමනාකරණය කිරීමද අත්‍යවශ්‍ය වෙනවා. දැනුම එසේ ආරක්ෂා කිරීම සහ කළමනාකරණය ප්‍රධාන වශයෙන්ම සිදු වන්නේ රටක බුද්ධිමය දේපළ ක්‍රමය ආශ්‍රයෙනුයි. ඒ අනුව අපගේ බුද්ධිමය දේපළ ක්‍රමය

[ගරු ජයරත්න හේරත් මහතා]

රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයේදී වඩාත් අනුගත වූ අංගයක් බවට පත් වෙමින් තිබෙනවා. බුද්ධිමය දේපළ යනු මානව නිර්මාණකරණයේ ප්‍රතිඵලයි. වෙළඳාම, කර්මාන්ත, කෘෂි කර්මය, තාක්ෂණය, කලාව, පරිසරය හා සෞඛ්‍ය වැනි මිනිස් ජීවිතයේ තීරණාත්මක ක්ෂේත්‍රයන් රැසක් පුරා බුද්ධිමය දේපළ සක්‍රිය සහභාගිත්වයක් දරනවා.

ඒ අනුව දේශීය නව නිර්මාණකරණය මඟින්ද, බුද්ධිමය දේපළ හිමිකම් බිහි කිරීමෙන්ද, එසේ බිහි කරන ලද හිමිකම් නිසි ලෙස කළමනාකරණය හා භාවිතා කිරීමද දේශීය ආර්ථිකය නැංවීමේ හා දුගී බව පිටු දැකීමේ උත්සාහයට මහත් රුකුලක් වනවා. ජාතිය ගොඩනැඟීමේ හා සංවර්ධන ක්‍රියාවලියේ දී දේශීය නිර්මාණකරණය ප්‍රවර්ධනය කිරීමට සුදුසු පරිසරයක් තිබීම අත්‍යවශ්‍ය වනවා. ඒ දැනුම හා බුද්ධිමය දේපොළ නිර්මාණය කෙරෙන පරිසරයක් මෙන්ම, දැනුම හා බුද්ධිමය දේපොළ නිසි ලෙස කළමනාකරණය කෙරෙන, භාවිතා කෙරෙන, ගරු කෙරෙන පරිසරයක් ද විය යුතු වනවා. අපගේ බුද්ධිමය දේපොළ ක්‍රමය තව තවත් සංවර්ධන ක්‍රියාවලියට ඍජු ලෙස දායක කර ගැනීම අත්‍යවශ්‍යයි. ඒ අනුව නව නිර්මාණකරණය පිළිබඳ පණිවුඩය අප විසින් සමාජ තලය වෙත ගෙන යා යුතු වනවා. අප විසින් සෑම පුද්ගලයකු හා ආයතනයක්ම නව නිර්මාණකරණය සඳහා උනන්දු කළ යුතු වනවා. එසේ තමන්ගේ සමස්ත ජාතියේද යහපත වෙනුවෙන් එම නිර්මාණයන්ගෙන් පැන නඟින අයිතිවාසිකම් හෙවත් බුද්ධිමය දේපොළ අයිතීන් නිසි ලෙස කළමනාකරණය හා භාවිතා කිරීම කළ යුතු වනවා. ඊට අමතරව බුද්ධිමය දේපොළ හා සම්බන්ධ අප සතු විවිධ ජාතික වත්කම් අපි නිසි ලෙස කළමනාකරණය කළ යුතු වනවා. ඒ අතරට Ceylon tea සහ Ceylon cinnamon වැනි වැවිලි දර්ශකයන්ද, අපගේ පාරම්පරික දැනුමද, අපට ආවේනික වු විවිධ ජාන සම්පත් නිසි ලෙස ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීමද වැදගත් වනවා. මෙම ක්ෂේත්‍රයන් හා අනුබද්ධ බුද්ධිමය දේපොළ කෙරෙහි අප අමාත්‍යාංශයේ දැඩි අවධානය යොමු වී තිබෙනවා.

ශ්‍රී ලංකාව ආසියාවේ දැනුම පිළිබඳ කේන්ද්‍රස්ථානයක් කිරීමේ කාර්ය භාරයේ දී අපගේ අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු කාර්ය භාරය නිසි ලෙස තේරුම් ගෙන අප විසින් අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පසුබිම තුළ මේ ගරු සභාව ඉදිරියේ ඇති නියෝගයන් ඉතාම කාලෝචිත වනවා. එමඟින් කලාකරුවන්ගේ දීර්ඝ කාලීන බලාපොරොත්තු ඉටු කිරීමට මඟ සැලසෙනු ඇතැයි විශ්වාස කරනවා. තමන්ට ලැබිය යුතු හිමිකම් ලැබීම තුළින් කලාකරුවන් තම නිර්මාණකරණයන් තව තවත් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනවා ඇතැයි බලාපොරොත්තු වනවා. එසේ නිර්මාණාත්මක ක්‍රියා මාර්ගයන් දේශීය කලා මෙන්ම, කලාව හා සම්බන්ධ කර්මාන්තයන් සංවර්ධනය කිරීමටද උපකාරී වනවා. එසේම මෙම නියෝගයන් බුද්ධියටද, නිර්මාණකරණයටද, නිර්මාණකරුවන්ගේ අයිතිවාසිකම්වලටද ගරු කිරීමේ සංස්කෘතියක් බිහි කිරීම සඳහා අප විසින් දරනු ලබන උත්සාහයේ තවත් පියවරක් වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Mr. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON.J.R.P.SOORIYAPPERUMA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බුද්ධිමය දේපළ පනත යටතේ ඉදිරිපත් කර තිබෙන මෙම නියෝග කලාකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පමණක් නොව, දේශීය නිර්මාණකරණය ප්‍රවර්ධනය කිරීම සඳහාද කාලීන බලපෑමක් වනවා.

මෙම නියෝග පැනවීමට විධිවිධාන සලස්වා ගැනීම සඳහා අද දින මේ උත්තරීතර සභාවට මෙම නියෝග ඉදිරිපත් කර විවාද කරන අවස්ථාවේ විශේෂයෙන්ම ජයන්ත කැටගොඩ මන්ත්‍රීතුමා රූපවාහිනී නාළිකා සම්බන්ධව කතා කරමින් දේශපාලන හිතවතුන් උපයෝගි කර ගෙන ඒ නාළිකා පාවිච්චි කරමින් අනිසි ලෙස ඔවුන්ට ආදායම් මාර්ගයක් සැපයීමේ වක්‍රාකාර වැඩ පිළිවෙළකට රජය සම්බන්ධ වනවාය කියලා චෝදනාවක් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම චෝදනාව කිසිසේත්ම සාධාරණ චෝදනාවක් නොවෙයි කියලායි මම හිතන්නේ. අපි ඒ සියල්ල බැහැර කරනවා. ඒ වාගේම සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරමින් මතක් කළා, බුද්ධිමය දේපොළ රැක ගැනීම සඳහා බුද්ධිමය දේපොළ කාර්යාංශය විසින් ස්වෙච්ඡාවෙන් දිගින් දිගටම මේ සම්බන්ධව වැටලීම් කළ යුතුයි කියලා. මා හිතන්නේ එවැනි තර්කයකයි සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සිටියේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක ඒ තරමම පදනම් සහිත තර්කයක් නොවෙයි. මොකද, මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රායෝගිකව විශාල දුෂ්කරතාවන්වලට අපට මුහුණ දෙන්නට සිදු වනවා. බුද්ධිමය දේපොළ පනත ක්‍රියාත්මක කරන නිලධාරින් ප්‍රායෝගිකව විශාල අකරතැබ්බවලට මුහුණ දෙනවා. අපි උදාහරණයක් විධියට කිව්වොත්, එම වැටලීම් කරන නිලධාරින් පිටකොටුවේ මල්වත්ත වීදියේ කැසට් පට විකුණන කඩයකට ගිහිල්ලා වැටලීමක් කරලා එම කැසට්පට අත්අඩංගුවට ගත්තාම, ඒවා මුල් පිටපත්ද, එහෙම නැත්නම් ව්‍යාජ ලෙස සකස් කරන ලද කැසට් පටද කියලා සොයා ගන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා බොහෝ වේලාවට එම නිලධාරින් කරන්නේ ඒ සියල්ලම අත් අඩංගුවට අරගෙන පොලිස් ස්ථානය කරා රැගෙන ඒමයි. ඒ වාගේම මේ ව්‍යාපාරිකයන් විශාල වැය බරක් දරලයි මේ ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යන්නේ.

ඊට පසුව මේ ගොල්ලෝ ඊට ගැළපෙන -සුදුසු- අධිකරණවලට යනවා. ඒ ගොල්ලෝ ගිහින් කියනවා, ඒ ගොල්ලන්ගේ මානව හිමිකම් උල්ලංඝනය කළාය, මේ නිලධාරින් නීතිය අතට අරගෙන ගිහින්, ස්වෙච්ඡාවෙන් ජීවත් වන්න වෙර දරන ඒ ගොල්ලන්ගේ වටපිටාව, පරිසරය සහමුලින්ම විනාශ කළාය කියලා. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විමසීමකට ලක් වනවා, "ඇත්තටම ඔවුන්ගේ මානව හිමිකම් කඩ කළාද?" කියලා. මේ වාගේ විවිධ දුෂ්කරතාවන් මතු වන නිසා සාමාන්‍යයෙන් සිරිතක් විධියට මේ බුද්ධිමය දේපළ පනත ක්‍රියාත්මක කරන වග කිව යුතු නිලධාරින්ට සිද්ධ වෙලා තිබෙන්නේ අනිවාර්යයෙන්ම පැමිණිල්ලක් ලැබුණොත් විතරක් එවැනි ස්ථානයකට යන්නයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. තමන්ගේ ඒ නිර්මාණ කවුරුන් හෝ පැහැර ගත්තාය, එය අනුකරණය කරමින් ව්‍යාජ ලෙස පිටපත් කළාය, එහෙම නැත්නම් එය වෙළෙඳ පොළට නිකුත් කළාය කියා කවුරුන් හෝ පැමිණිල්ලක් කරනවා නම් ඒ සම්බන්ධව මේ නිලධාරින්ට ක්‍රියාත්මක වන්න පුළුවන්. එහෙම නැතුව දුම්රිය දෙපාර්තමේන්තුවේ ටිකට් පරීක්ෂකලා වාගේ, ලංගමයේ ටිකට් පරීක්ෂකලා වාගේ ස්වෙච්ඡාවෙන් ගිහින් පරීක්ෂා කරන්න පුළුවන්කමක් නැහැ. එම නිසා නීතිමය ප්‍රතිපාදන යටතේ කටයුතු කරනවා මිසක් ඊට එහාට ගිහින් කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ.

රජය බොහොම සද්භාවයෙනුයි මේ නියෝග ඉදිරිපත් කරන්නේ. මීට අවුරුදු 8කට කලින් බුද්ධිමය දේපළ පනත්

කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත කළත්, ඊට සම්බන්ධ ශ්‍රව්‍ය, දෘශ්‍ය ආයතන මේ පිළිබඳව වැඩි උනන්දුවක් දැක්වූයේ නැහැ. මේ සම්බන්ධව දිගින් දිගටම සාකච්ඡා කළත් ප්‍රතිඵලයක් අත් පත් කර ගන්න අපට බැරි වුණා. එම නිසා අවසානයේ අතිගරු ජනාධිපතිතුමා රජයේ පාර්ශ්වයන් විධියට රජයට සම්බන්ධ නාළිකාවල ප්‍රධානීන් කැඳෙව්වා. පෞද්ගලික නාළිකාවල ප්‍රධානීන් කැඳෙව්වා. ඒ වාගේම කලාකරුවන්, විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් එකතු කරලා සාකච්ඡා කළා. අවසානයේදී අතිගරු ජනාධිපතිතුමා කිව්වා, කරුණාකරලා මේක ආදර්ශයක් විධියට, මේක ආරම්භයක් විධියට අවම මුදලක් ඇතුළත් කරලා මේ නියෝග පනවන්න, මේක අවම මුදලක් මිසක් උපරිමයක් නොවෙයි කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා දිගින් දිගටම කිව්වා, "මේ මුදල මදි"යි කියලා. මේක අවම මුදලක් වශයෙනුයි මේ ගැසට් නිවේදනයෙන් නියෝග පනවා තිබෙන්නේ. මා හිතන හැටියට ඉදිරි අනාගතයේදී වඩාත් සක්‍රියව මේ නියෝග ක්‍රියාත්මක කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන්, බුද්ධිමය දේපළ පනතේ 204වන වගන්තිය යටතේ මෙම නියෝග අනුමැතිය සඳහා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා. දේශීය නිර්මාණකරණයටත්, ප්‍රවර්ධනය කිරීමටත්, නිර්මාණකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් අප විසින් දරනු ලබන ප්‍රයත්නයන්හි තවත් එක් සලකුණක් වන මෙම නියෝග සඳහා මෙම උත්තරීතර සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ හෘදයංගම ඒකමතික අනුමැතිය අපි ඉතාම ගෞරවයෙන් අපේක්ෂා කරනවාය කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ. භා. 4.29 ]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාමත්ම වැදගත් කාරණයක් සම්බන්ධයෙන් වචන කිහිපයක් හෝ කථා කරන්නට ලැබීම සන්තෝෂයට කාරණයක්. විශේෂයෙන්ම බුද්ධිමය දේපළ පනත යටතේ ප්‍රධාන අංශ දෙකක් ආවරණය වනවා. එකක් තමයි, කාර්මික අංශය. අනික් එක තමයි, ප්‍රකාශන අංශය. මෙම අංශ දෙකේ කාර්මික සහ කාර්මික විද්‍යාත්මක, වෛද්‍ය වැනි අංශ සඳහා නව සොයා ගැනීම් වෙනුවෙන් කාර්මික අංශයේ අයිතිය ලබා දීමත් සිදු වනවා. ලෝකයේ දියුණු රටවල නව සොයා ගැනීම් සඳහා අය වැය ලේඛනයෙන් යම් කිසි මුදලක් වෙන් කරනවා. එම නිසා කවුරුත් මේ ගැන උනන්දු වෙලා නව සොයා ගැනීම් සඳහා විශාල වෙහෙසක් දරනවා. ඒක තමයි යථාර්ථය.

ලංකාවේ පසු ගිය කාලයේ තිබුණු තත්ත්වය උඩ සංගීත සංදර්ශන පැවැත්වීමේ කාලය පවා සීමා කළා. රාත්‍රී 10.00න් පසුව සංගීත සංදර්ශන පවත්වන්න බැරි වුණා. රාත්‍රී 10.00න් පසුව ඒවා නතර කළා. නමුත් අද යුද්ධයේ නිමාවත් සමඟම රජය කලාකරුවන්ට හොඳ තැනක් ලබා දීමට කටයුතු කිරීමේ මූලික පියවරක් වශයෙන් මේ නියෝග පැනවීම ඉතා වැදගත් කරුණක් විධියටයි මා දකින්නේ.

කාර්මික පැත්තෙන් බලද්දී, ඉස්සෙල්ලාම බෙන්ස් කාර් ගැන කථා කළොත්, "ඩෙම්ලර්" කියන එක් කෙනා තමයි බෙන්ස් කාර් එක හැදුවේ. ඊට පස්සේ "බෙන්ස්" කියන එක් කෙනා, රුපියල් කෝටි ගණනක් ගෙවලා ඒ අයිතිය ගත්තා. කාර්මික අයිතිය ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් යටතේ තමයි ගත්තේ. ලෝකයේ කිසිම දෙයක් අලුතින් බිහි වන්නේ නැහැයි කියලා තමයි ප්‍රකාශ කරලා තිබෙන්නේ. කොහේ හෝ තිබෙන දෙයක් තමයි තවත් තැනක අලුත් දෙයක් වන්නේ. අලුතින් කිසිම දෙයක් බිහි වන්නේ නැහැයි කියලා තමයි පොත්පත්වල සඳහන් වන්නේ. දැනට තිබෙන දෙයක් අලුත් දෙයක් වන එක තමයි සිද්ධ වන්නේ. අනික් පැත්තෙන් නව සොයා ගැනීම් සඳහා නිපදවීමේ අයිතිය ලබා ගත් පසු එය මං කොල්ල කෑමට හෝ වෙනත් පුද්ගලයන්ට ලබා දීමට ක්‍රියා කළොත් ඔවුන්ට එරෙහිව දැඩි නීතිරීති ක්‍රියාත්මක වනවා.

ලංකාවේ එහෙම නීතියක් නැහැ. තිබුණත් ශක්තිමත් නැහැ. දැනට තිබෙන නීතිය ශක්තිමත් නැහැ. මීට පෙර බීතෝවන් නැමැති එංගලන්ත ගායකයාගේ ජනප්‍රිය ගීතයක සංගීතයේ ඉතා කුඩා කොටසක් මයිකල් ජැක්සන් විසින් ගීතයකට යොදා ගත්තා. බීතෝවන් එංගලන්තයේ බුද්ධිමය දේපොළ යටතේ ඊට විරුද්ධව නඩුවක් පවරලා විශාල වන්දියක් ගත්තා. ඒක බොහොම ප්‍රසිද්ධ කාරණයක්. ලංකාවේත් ඒ වාගේ උදාහරණ කිහිපයක් තිබෙනවා. හඩ්සන් සමරසිංහ මහත්තයා ලියාපු "අන්න බලන් සඳ" ගීතය පසු කාලයේ සංගීත් විජේසූරිය -වර්තමාන නව පරපුරේ කලාකරුවෙක්- ගායනා කරපුවාම හඩ්සන් සමරසිංහ මහත්තයා නඩු පවරලා වන්දි අරගෙන තිබෙනවා. ඒ වාගේම විශාරද ගුණදාස කපුගේ මැතිතුමා -එතුමා සංගීත විශාරදයෙක්- ගායනා කළ "දවසක් පැල නැති හේනේ" ගීතයේ පද රචකයා වුණේ අභාවප්‍රාප්ත රංබණ්ඩා මහතායි. නමුත් වේග රිද්මය යටතේ මේ ගීතය ගායනා කළා සන්ෆ්ලවර් වාදක මඩුල්ල. සංගීත සංදර්ශනවලට ගියාම මේ ගීතය වේග රිද්මයට පරිවර්තනය කෙරුවා. ඒකටත් නඩුවක් පවරලා අවසානයේදී ඒකට වන්දි ගත්ත බව අප කවුරුත් දන්නවා. ඒ වාගේ සිද්ධි රැසක් තිබෙනවා.

ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය අනුව අද ගීතයක තනුව, සංගීතය, පද රචනය වෙනුවෙන් පුද්ගලයින් තිදෙනෙක් දායක වෙනවා. කොච්චර හොඳට පද රචනය කෙරුවත් ගායකයා හොඳ නැත්නම් ඒකේ රසයක් විඳින්න බැහැ. එම නිසා මේ තුන් දෙනාටම යම් කිසි ප්‍රතිලාභයක් ලැබෙන විධියක් තිබුණොත් මා හිතන්නේ ඉතාමත්ම හොඳ දෙයක් කියායි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තුන් දෙනාටම ලැබෙනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
බොහොම හොඳ දෙයක්. ඒ තුන් දෙනාටම ලැබෙනවා නම් ඒක ඉතාමත්ම හොඳ දෙයක්. එහෙම නම් කලාකරුවකුගේ, විශේෂයෙන්ම සංගීතයට යොමු වුණු අයකුගේ අවසාන කාලයේ දුක් විඳින්නට ඕනෑ නැහැ. ඒ අයට යමක් ඉතිරි වෙනවා. ඒ ගොල්ලන්ට අර විශ්‍රාම වැටුපක් අවශ්‍යත් නැහැ. මේක විශ්‍රාම වැටුපක් බවට පරිවර්තනය කර ගන්න පුළුවන්. ඔය බොරුවට උද්ඝෝෂණය කෙරුවත් මේකත් වයසට ගිය කාලයට පාවිච්චි කරන්න පුළුවන් එක්තරා ප්‍රතිලාභයක්.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
මේක දුන්නාය කියලා පෙළපාළි යාවිද දන්නේ නැහැ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ඔබතුමා කියන එක හරි. මේක දුන්නාය කියලාත් පෙළපාළි යාවිද දන්නේ නැහැ. ඒ වාගේ තත්ත්වයකුයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලස්සන සින්දුවක් මතක් වෙනවා. මේක බොහොම ජනප්‍රිය ගීතයක්. මේ ගීතය මමත් බොහොම ප්‍රිය කරන ගීතයක්. මේකෙන් කියැවෙන්නේ අවුකන බුදු පිළිමය ගැනයි. ඒ ගීතයේ මෙසේයි:

මේ තරම් සියුමැලි ද කළුගල්
හිතන්නටවත් බැරි නිසා
මම ගියා අවුකන බුදුන්ටත්
දැස් දුන් මිනිසා සොයා

කලා වැව ළඟ ඉලුක් සෙවණක
මැටි පැලක පැදුරක් එළා
දැස් පිරිමදිමින් බලයි ඔහු
මැරෙන ඉපදෙන රළ දිහා

ඉසුරුමුණියේ නුඹ තැනූ
පෙම්බරිය කොතැනද කියා
මා ඇසූ විට හිනැහුණා ඔහු
තවම තනිකඩ යයි කියා

ඔහු කියනවා, අවුකන බුදු පිළිම වහන්සේට දැස් දුන් මනුෂ්‍යයා සොයා ගියා කියලා. එවිට මොනවාද ඔහු දැක්කේ? සොයා ගෙන ගිය මනුෂ්‍යයා දැක්කේ මැටි පැලක පැදුරක් මත ඉඳ ගෙන මැරෙන ඉපදෙන රළ දෙස බලා ගෙන සිටින කෙනෙක්. ඔහුගෙන් පෙම්බරිය ගැන අහපුවාම ඔහු කිව්වේ, "තවම මම තනිකඩයි" කියලායි. ඉසුරුමුණියේ පෙම් යුවළ නිර්මාණය කර තිබෙන්නේත් එතුමායි. කොච්චර ආදරය ගැන ලිව්වත්, කොච්චර කලාව ගැන ලිව්වත්, කලාව කොච්චර සුන්දර වුණත් ඔහුටත් තවම විවාහ වෙන්න බැරිව ඉන්න බවයි කියැවෙන්නේ. මොකද, පෞද්ගලික ජීවිතයක් නැහැ කලාකරුවාට. සමහර කලාකරුවෝ ආදරයේ සුන්දරත්වය ගැන ලියනවා. "ආදරය සුන්දර වරදකි" කියලා සමහරු ලියනවා. ඒ කොහොම වුණත් ඒ නිර්මාණශීලීන් බොහෝ දෙනකුගේ පෞද්ගලික ජීවිතය හාත්පසින්ම වෙනස් බව අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාත් මගේ දේශපාලන ජීවිතය ආරම්භ කෙරුවේ කලාකරුවකුගේ ඉල්ලීම පිට. ඒ, විජය කුමාරණතුංග මැතිතුමා. මම තවමත් භක්තියෙන්, ගෞරවයෙන් යුතුව එතුමාව සිහිපත් කරනවා. එතුමාව සමරනවා විතරක් නොවෙයි, මගේ ධර්මයේ හැටියට මම පල්ලියකට ගියත් නිතරම එතුමා වෙනුවෙන් යාඥාවක් කිරීම මගේ පුරුද්දක් වී තිබෙනවා. එතුමාගේත් හදවත බොහොම නිර්මලයි, සුන්දරයි. එතුමා ඒ දවස්වල ගීත ගායනා කළා. අවුරුදු 23කට, 24කට කලින් එතුමා මිය ගියත් එදා ගායනා කරපු ගීත අදත් ජනප්‍රියයි.

එච්.ආර්. ජෝතිපාල මැතිතුමා අවසාන කාලයේ ගායනා කරපු සින්දු වඩාත්ම ජනප්‍රිය වුණේ කොයි කාලයේද? දැන් තමයි ජනප්‍රිය වෙලා තිබෙන්නේ. අද ඔය Superstars, අර stars, මේ stars, Megastars, මොන stars වුණත් අවසානයේදී ඉවර වෙන්නේ ඒ පැරණි සංගීතයෙන්. බලන්න කොච්චර සුන්දරද කියලා. මොකද, මනසටත් ආහාර අවශ්‍යයිනේ. අපට එක කටක් තිබෙන්නේ, නමුත් කන් දෙකක් තිබෙනවා. මේ කන් දෙකට අවශ්‍ය සුන්දරත්වය ලබා දුන්නොත් ඉස්සෙල්ලාම සැහැල්ලු වන්නේ සිත. එහෙනම් මේ සිත සැහැල්ලු කිරීමට කලාකරුවකුට කොච්චර දෙයක් කරන්න පුළුවන්ද? මානසික ආතතිය නැති කිරීමට දැන් අලුත්ම උපක්‍රමය විධියට සොයා ගෙන තිබෙන දේ තමයි සංගීතය - sound waves. ඒ වාගේම සංගීතයට අපේ ශරීරයේ immunity එක වැඩි කරන්න පුළුවන් කියලා NASA එකෙන් හොයා ගෙන තිබෙනවා. මේ ආකාරයෙන් අලුත්ම විද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රම රැසක් සංගීතය අනුසාරයෙන් සොයා ගෙන තිබෙනවා. එම නිසා සංගීතය ප්‍රේමයේ ආහාරය විතරක් නොවෙයි, සංගීතය සෞඛ්‍යයේ ආහාරය බවටත් අද පත් වෙලා තිබෙනවා. ඉතින් මේවා ගැන කල්පනා කරද්දී විශේෂයෙන්ම රජය විසින් මේ ගත්තු කාලෝචිත පියවර ගැන අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

අද බුද්ධිමය දේපළ අයිතිය ලබා ගැනීමට තිබෙන ඒවා තමයි ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන්. Films, teledramas, පොත්, පොත් පිංචලල්, articles, computer programmes, other writings, speeches, lectures, dramatic works, stage productions, musical works with words and without words, workshop articles, paintings and photographic works. මේ සියලුම දේවල් අයිති වෙනවා copyrightsවලට. ඒකේ දෙකක් තිබෙනවා, economic rights සහ moral rights කියලා. Moral rightsවලට නම පාවිච්චි කරන්න පුළුවන්, නම වෙනුවට අන්වර්ථ නාමය පාවිච්චි කරන්න පුළුවන්. අයථා අන්දමින් වෙනත් අය පාවිච්චි කරනවා. මෙයට නීතිය ඉදිරියේදී විරෝධය දැක්වීමට පුළුවන්. Economic rightsවලට, විකිණීම හා පරිවර්තනය ආදී ඒවා අයත් වෙනවා. ඒ යටතේ ජීවිත කාලය තුළදී වෙනත් කෙනකුට පැවරීම සිදු කළ හැකියි, කර්තෘ භාගය ලබා ගත හැකියි. ලංකාවේ සාමාන්‍යයෙන් copyright holder කෙනකුට ඔහු මිය ගියායින් පස්සේ අවුරුදු 70ක් දක්වා එහි අයිතිය තිබෙනවා.

බලන්න, අපේ කතෝලික ආගමේ තිබෙනවා choir එකක්. ඒ කියන්නේ පුංචි කාලයේ ඉඳලාම ගීතිකාවෙන් දෙවිඳුන් නමදිනවා. ඒ වාගේම බෞද්ධාගමේත් අද බොදු බැති ගී තුළින් පොසොන් උත්සවවලට, වෙසක් උත්සවවලට වැදගත්ම ප්‍රවේශයක් ලබා දීලා තිබෙනවා.

විශේෂයෙන්ම බණක් කියනවාට වඩා -තමුන්නාන්සේ මාත් එක්ක උරණ වෙයිද දන්නේත් නැහැ- සංගීතයෙන් මේක හදවත තුළට දැම්මෙන් ලොකු බුද්ධාලම්බන ප්‍රීතියක් ඇති වන බව ප්‍රායෝගිකව අපි දැකලා තිබෙනවා. ඒ නිසා නිර්මාණශීලී අයෙකුට ඒ අයිතිය ඇති කිරීමට යම්කිසි උදව්වක් උපකාරයක් කරලා, ඒ පිළිබඳව අගැයීමක් කරලා ඒකට ආරම්භයක් වශයෙන් සොච්චමක් හෝ ලබා දීම ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කරපු විශාල කාර්යභාරයක් විධියටයි අපි දකින්නේ. අපි ඒ ගැන ආඩම්බර වෙනවා. අමාත්‍යතුමාටත් අපි ස්තුතිවන්ත වෙනවා, බොහොම මහන්සි වෙලා එවැනි දෙයක් කිරීම ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාත් චිත්‍රපටයක් නිෂ්පාදනය කළා, "රජ වංශයේ එකෙක්" කියලා. හැබැයි එකම චිත්‍රපටයයි කළේ. ලංකාවේ ඉන්න දක්ෂතම කලාකාරිනිය වන මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමිය ඒ ගැන දන්නවා. ඒ කාලයේ නම් චිත්‍රපටවලට ලොකු තැනක් තිබුණා. මේ television එක ආවාට පස්සේ ඒවා ටිකෙන් ටික වෙනස් වෙලා, දැන් චිත්‍රපට බලනවා වෙනුවට CD එකක් අරගෙන බලන්න පුරුදු වෙලා. දැන් චිත්‍රපටි copy කරපු CD ඕනෑ තරම් තිබෙනවා. චිත්‍රපටයක් නිෂ්පාදනය කරන්න රුපියල් කෝටි ගණනක් වියදම් වුණත් ඒක නැවත ආයෝජකයාට උපයා ගැනීමේ අපහසු තත්ත්වයක් තිබෙනවා. මොකද, චිත්‍රපට වෙළෙඳ පොළෙන් මිල දී ගත හැකියි. අද චිත්‍රපටයක් කළා නම් හෙට රුපියල් 100ක් දීලා ඒ CD එක ගත හැකියි. මේවා වළක්වා ගැනීමට උපක්‍රම යොදනවා නම්; ඒ වෙනුවෙන් යම්කිසි දෙයක් කරනවා නම් ඉතාමත් කාලෝචිත බව මගේ හැඟීමයි.

විශේෂයෙන්ම අද අපි සන්තෝෂ වෙන්න ඕනෑ, අද රට පත් වෙලා තිබෙන තත්ත්වය ගැන. විශේෂයෙන්ම අපි අද ආඩම්බර වෙන්නේ ඇයි? කලාවක් වුණත් රස විඳින්න නම් භීතිය නැති වෙන්න ඕනෑ. අද බයක් නැහැ. ඉස්සර මේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට එන්නේ කොච්චර බයෙන්ද? අපේ ජේවීපී එකේ සමහර සහෝදර මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවෙන් එළියට යනකොට

වාහන මාරු කර ගෙන ගියා. එක වාහනයක යනවා. එහා පැත්තට ගියාම තව එකකට මාරු වෙනවා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේත් බෝම්බ ගැහුවා. ඇයි ඒ? මේ වෛරවාදී වැඩ පිළිවෙළ නිසා. මේ වෛරය නැති කිරීමට හොඳ ප්‍රතිකාරයක් තිබෙනවා. ප්‍රතිකාරය තමයි සංවේදී හදවත් ඇති කර ගැනීම. වෛරයකින් තොරව හදවත සංවේදී වෙනවා නම්, නම්‍යශීලී වෙනවා නම්, දුකේදී දුක දැනෙනවා නම්, අනුන්ගේ දුක අපට දැනෙනවා නම්, අනුන්ගේ ප්‍රීතියේදී අපට ප්‍රීතියක් දැනෙනවා නම්, ඊ ළඟට අපි අනුන් වෙනුවෙන් යමක් කරන්න අධිෂ්ඨානයක් කර ගෙන තිබෙනවා නම් වෛරයක් ඇති වන්නේ නැහැ. ඒ හොඳ ලක්ෂණ ඇති වන්නේ කලාත්මක හැඟීම් තිබෙන මිනිසුන්ට. මෘගයන්ට නොවෙයි. මෘග සිතුවිලිවලින් ඉවත් වෙන්න නම් මම හිතන්නේ අපේ ජනතා විමුක්ති පෙරමුණේ කට්ටියත් පොඩ්ඩක් හරි කලාවට ටිකක් බර වෙන්න ඕනෑ. කලාබර වෙන්න ඕනෑ. වෛරයට බර වෙන්නේ නැතුව කලාබර වුණොත් හොඳයි. නමුත් අර කලාබර ආසියා තමයි කුට්ටමේ දාලා කපන්න හදන්නේ. ඒක වැරදියි. කොහෙන් හරි ගහන්න හදනවා. කොතැනද වැරැද්දක් තියෙන්නේ කියලා පොඩ්ඩක් අඩු පාඩු තියෙන තැනක් බලලා එතැනට ගිහිල්ලා උද්ඝෝෂණය කරලා කාව හරි මරලා ඒක විකුණා ගෙන ලේවලින් උඩට එන්න හදනවා. ඒ විධියට ලේවලින් උඩට එන ක්‍රමය අපි නැති කරන්න ඕනෑ.

අපි දන්නවා, අපේ කලාකාරයාව; මාව දේශපාලනයට ගෙනාපු නායකයාව අමු අමුවේ මරලා දැම්මා. කොහාටද වෙඩි තිබ්බේ? වෙඩි තිබ්බේ එතුමාගේ ඇඟට නොවෙයි, ඔළුවට. තුන් පාරක් වෙඩි තියලා තිබුණා. ඇයි? ඒ මුහුණේ ලස්සන ස්වරූපය දකින්න අකැමැති වුණා. ලස්සනට ඇති වන ආකර්ෂණයට බය වුණා. ඒ වෛරවාදය. ලස්සනට තිබෙන ඒ මුහුණේ සුන්දරත්වයට ජනතාවගේ තියෙන ආකර්ෂණය වැඩි වෙයි කියලා බයක් තිබුණා. ඒ වාගේම ජනාධිපතිතුමා මේ යුද්ධය නතර කරලා මේ රට බේරා ගෙන මේ තත්ත්වයට රට ගෙනාවාට පස්සේ එතුමාගේ ජනප්‍රියත්වයට අකුල් හෙළන්නේ කොහෙන්ද, ගහන්න ඕනෑ කොතැනටද, පාවිච්චි කරන්න ඕනෑ ආයුධය මොකක්ද කියලා තමයි ඒ අය බලන්නේ. මේකට මට පෙනෙන පුංචි විසඳුමක් තමයි අපේ විශ්වවිද්‍යාලවල ළමයින්ට නායකත්ව පුහුණුව දෙනවා වාගේ මේ ගොල්ලන්වත් කොහාට හරි අරගෙන ගිහිල්ලා මේ ගොල්ලන්ට dance එකක් දාලා සින්දුවක් කියලා රස විඳින්න පුළුවන් ක්‍රමයක් හදලා දුන්නොත් මේ ගොල්ලන්ගේත් ඔළු වෙනස් වෙලා සුන්දරත්වයට නැඹුරු වුණාම මේ ගොල්ලනුත් ඒ සුන්දරත්වයේ ආශ්වාදය විඳලා ඒක රසයක් බවට පරිවර්තනය කර ගෙන වෛරවාදය නැති කර ගෙන යුද්ධය පිළිකුල් කළාම අපි කාටත් හොඳින් ඉන්න පුළුවන් වෙයි. එසේ වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සත්ව පනත: නියෝග
## விலங்குச் சட்டம்: ஒழுங்குவிதிகள்
## ANIMALS ACT : REGULATIONS

[අ. භා. 4.45 ]

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

Mr. Deputy Chairman of Committees, I move,

"That the Regulations made by the Minister of Livestock Development under Section 35, read with Section 3, 3AA, 11, 26 and 34 of the Animals Act, No. 29 of 1958 and published in the Gazette Extraordinary No. 1629/17 of November 26th 2009, which were presented on 05.04.2011 be approved.

(Cabinet approval signified)"

As far as the legal provisions with regard to animals and animal products are concerned, Animals Act, No. 29 of 1958 plays a pivotal role to save and safeguard the valuable animals in the country. This was initially enacted in 1958 to regulate the slaughter of animals; enable the restriction, control or regulation of the removal of animals from one district to another; make provision for the branding animals and for the issue of vouchers in respect of animals which have been branded and to regulate the sale and transport of such animals; provide for the seizure and detention of animals which commit trespass and for the assessment and recovery of damages of such trespass; provide for measures for the improvement of the breed of animals.

The unique animal identification system has been already developed and implemented throughout the country which will enable easy traceability with the use of special ear-tags replacing the conventional branding system.

I would also like to inform that we have already started awareness programmes for all stakeholders and the Department of Police also. The special handout has been designed, published and circulated to all Divisional Secretaries, Police Stations and to relevant stakeholders in order to make the public aware of it.

In this connection, I also like to mention that the following programmes have been developed for the improvement of dairy sector during the period 2010-2015 in order to make the country self-sufficient in milk:

- Production system based on smallholder dairy farms development programmes
- Medium-scale dairy development programmes
- Feed resources development programmes
- Consumption promotion programme of domestically produced milk and milk products
- Improving efficiencies in milk marketing chain programme
- Cattle breeding programme
- Veterinary services improvement programme
- Research programmes
- Manpower development programmes and
- Institution development programmes

According to the requirements, the said Act has undergone three amendments by Act No. 10 of 1968, Act No. 46 of 1988 and Act No. 10 of 2009 in order to regularize the shortcomings in the Act. However, the regulations formulated under the provisions of Animals Act, No. 29 of 1958 and subsequent amendments are not adequately fulfilling the legal requirements to achieve the intended national objectives.

[ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා]

Therefore, more strong regulations have to be formulated covering every aspect to address the present demand and the global trends in achieving national and international standards in livestock farm registration, identification and traceability of animals, safety of foods of animal origin, animal welfare, animal care centres, usage of animal in research and depopulation of animals. Improvement of livestock sector has become an indispensable part in the accelerated development that takes place in the country in line with the "Mahinda Chintana" which envisages doubling the number of milk cows enabling self-sufficiency in milk in the country.

Mr. Deputy Chairman of Committees, in achieving this task there are many obstacles to be curbed such as illegal transport and slaughter of cows, cruelty to animals, poor supporting services and substandard animal husbandry practices.

Contagious diseases of animals that could easily be spread through illegal transport of animals is also considered as a major threat affecting productivity of animals as well as the well-being of the public.

These regulations have been formulated in order to strengthen the previously formulated regulations and newly formulated regulations for establishment and maintenance of animal care centres, more specific animal identification and traceability system, introducing animal transport system conforming to the welfare of animals and active involvement of veterinarians in the whole process. In achieving the daunting task spelt out in "Mahinda Chintana - Vision for the Future" these regulations will contribute enormously by supporting and facilitating the huge development programmes already planned, launched and initiated by the Ministry of Livestock and Rural Community Development.

Sir, I would like to mention here that two of our Members in this august Assembly have proposed two Private Members' Motions in this regard.

Under these circumstances, I believe that the regulations I have presented become very important. These regulations solve the problems confronting the facts I have mentioned earlier.

Even at present, five welfare centres have already been registered. Apart from this, I have instructed the National Livestock Development Board to separate a suitable farm land for this purpose. I have also planned to commence small-scale welfare centres at the District Secretary's level .

Thank you.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Anura Dissanayake. You have 30 minutes.

[අ. භා. 4.52]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1958 අංක 29 දරන සත්ව පනත යටතේ පනවා තිබෙන නියෝග ගණනාවක් සම්මත කර ගැනීමේ වුවමනාව වෙනුවෙන් අද එම නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ නියෝග පිළිබඳව විශාල විවාදයක් අප තුළ නැහැ. මොකද, අපේ රටේ සත්ව ගහනය ආරක්ෂා කර ගැනීම අතිශය වැදගත් නිසා. කිරි නිෂ්පාදනය ඉහළ නංවනවා නම්, කිරි නිෂ්පාදනය කරන factoryය වන ඒ ගව සම්පත ආරක්ෂා කර ගත යුතුයි. එසේ ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සකස් කරලා තිබෙන මේ නියෝග මම හිතන හැටියට වැදගත් නියෝග කීපයක් තමයි. හැබැයි ප්‍රධාන ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. ප්‍රධාන ප්‍රශ්නය අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් කර්මාන්තශාලාවක් නම්, කර්මාන්තශාලාව ස්ථාපිත කරලා, machines ටිකක් සවි කරලා, අලුතින් සේවක සේවිකාවන් ටිකක් බඳවා ගෙන, ඒ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරලා නිෂ්පාදනය ඉක්මනින් දෙගුණයක් කරන්න පුළුවන්; තෙගුණයක් කරන්න පුළුවන්; වේගයෙන් වර්ධනය කරන්න අපට පුළුවන්. ඒ කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරන්නේ ඇඟලුම් නම් එක factoryයක් වෙනුවට factory දෙකක් දැම්මොත් නිෂ්පාදනය දෙගුණයක් කරන්න පුළුවන්. හැබැයි, වෙනත් කර්මාන්ත ක්ෂේත්‍රයක් ඒ විධියට වර්ධනය කරනවා වාගේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න බැහැ. පළමුව ගවයෙක් ඉපදෙන්න ඕනෑ. ඒ ඉපදෙන ගවයන්ගෙන් සාමාන්‍ය අනුපාතයක් හැටියට ගත්තොත් එක්කෙනෙක් ගැහැනු, එක්කෙනෙක් පිරිමි. සියයට 50ක වාගේ අනුපාතයකින් තමයි ඒ ගවයන් ඉපදෙන්නේ. ඒ ඉපදෙන ගැහැනු සතා නැවත ගැබ් ගන්න ඕනෑ. ඒකට කාලයක් අවශ්‍යයි. ඊට පස්සේ නැවත පැටවෙක් හදන්න ඕනෑ. ඒ පැටවුන්ගෙන් සියයට 50ක් ගැහැනු සහ පිරිමි ලෙස උපදින්නේ. මේ විධියට ගත්තාට පස්සේ, නිෂ්පාදනය වැඩි කිරීම ඉලක්ක කර ගෙන අනෙකුත් සාමාන්‍ය කර්මාන්තශාලාවල නිෂ්පාදනය වැඩි කරනවා වාගේ කිරි කර්මාන්තයට අදාළ සත්ව ගහනය වැඩි කිරීම ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි.

මේ වන විට අපේ රටේ මී ගවයන් ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයකුත්, එළ ගවයන් ලක්ෂ 12කට ආසන්න ප්‍රමාණයකුත් තමයි සිටින්නේ. තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශයට අදාළ දෙපාර්තමේන්තුව විසින් කෘත්‍රිම සිංචන ක්‍රියාවලියක් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැබැයි දැන් තිබෙන සංඛ්‍යා දත්ත, තොරතුරු අනුව කෘත්‍රිම සිංචන ක්‍රියාවලිය අසාර්ථකත්වයට පත් වෙන්නේ ඇයි? ඒ කෘත්‍රිම සිංචනය තුන් දෙනෙකුට දුන්නොත් එකයි සාර්ථක වෙන්නේ. ඒ කියන්නේ ප්‍රතිඵලය තුනට එකයි. ඇයි මෙහෙම වෙලා තිබෙන්නේ? අපි ලබා දෙන semenවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන හැටියට ඒකත් ඒ තරම් අදාළ වෙලා නැහැ.

අපේ රටේ semen නිෂ්පාදනය කරන ගොවිපොළවල් කීපයක් තිබෙනවා. ඒවායේදී නිෂ්පාදනය කරන semen ගුණාත්මකභාවයෙන් යුතුයි. ඒ නිසා ඒක ප්‍රශ්නයක් බවට මතු වෙලා නැහැ. ඒ

කාරණය තමයි එම semen ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාවලිය. සාමාන්‍ය ක්‍රමයකට semen ආරක්ෂා කර ගන්න බැහැ. නයිට්‍රජන් දියරවල තැන්පත් කරලා තමයි ඒවා ආරක්ෂා කර ගන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාවලිය දැන් තිබෙන්නේ පශු වෛද්‍ය කාර්යාලයේ. ඒ පශු වෛද්‍ය කාර්යාලයේ එක ටැංකියක් තිබෙනවා. ඒ ටැංකියේ බහා තබා තමයි මේවා ආරක්ෂා කර ගන්නේ. මේ ක්‍රමය පැතිරිලා නැතත් ඒවා ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාවලියත් ඒ තරම් දෝෂ සහිත නැහැ. ඒ ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාවලියෙන් යම් ප්‍රමාණයකට semen ආරක්ෂා කර ගන්න පුළුවන්කම තිබෙනවා. එසේ තිබියදී මේ කෘත්‍රිම සිංචන ක්‍රියා තුනක් කළොත් එකක් තමයි සාර්ථක වෙන්නේ. දෙකක්ම අසාර්ථකයි. හැබැයි තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශය ගොවි මහතෙකුට මේ කටයුත්ත නිකම් කරලා දෙන්නේ නැහැ. සතුන් ගැබ් ගැනීම සඳහා සිදු කරන මෙම කෘත්‍රිම සිංචන ක්‍රියාවලියට දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය නිලධාරිතුමා හෝ සත්ව සංවර්ධන නිලධාරි මහත්තයා හෝ සහභාගි වෙනවා නම් එය සාර්ථක නොවී තිබෙන්නේ මොකක් නිසාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රධාන ලෙසම ගත්තොත් මේ සිංචන ක්‍රියාවලිය අවශ්‍ය මොහොතේදී ඉටු කරන්නේ නැහැ. මේක තමයි අද තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. පශු වෛද්‍ය කාර්යාලයේ තමයි මේ ටැංකිය තිබෙන්නේ. ඒ ටැංකියේ තමයි අවශ්‍ය semen ටික තිබෙන්නේ. හැබැයි ගව ගැහැනු සතාගේ ඒ මද කිපෙන අවස්ථාව -අපි සාමාන්‍යයෙන් ගම්වල භාවිත කරනවා මද මෝරන අවස්ථාව කියලා.- ගොඩාක් වෙලා තිබෙන්නේ නැහැ. ඉතා කෙටි කාලයක් තිබෙන්නේ. ඒ අවස්ථාවේදී අවශ්‍ය වන semen ටික ඇතුළු කළ යුතුව තිබෙනවා. නමුත් එහෙම ඇතුළු කරන්නේ කොහොමද? තමුන්නාන්සේලාගේ පශු වෛද්‍ය කාර්යාල කීයද තිබෙන්නේ? බොහෝ දුරට ගත්තොත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටවත් එකක් නැහැ. ඉතින් ගමේ ගොවි මහත්මයා තමන්ගේ ගෙදර ඉන්න එළදෙන දිහා බලා ගෙන -එළදෙනගේ පස්ස පැත්ත දිහා බලා ගෙන- ඉන්නවා දැන් ඇයට ඒ මෝරන අවස්ථාව ඇවිල්ලා තිබෙනවාද කියලා. පස්ස පැත්තේ දර්ශනයෙන් ඒක බලා ගන්න පුළුවන්. ගොවි මහත්මයා ඒක දැක්කාට පස්සේ පශු වෛද්‍ය මධ්‍යස්ථානයට කථා කරන්න දුරකථනයක් නැත්නම් බයිසිකලය අරන් පශු වෛද්‍ය මධ්‍යස්ථානයට දුවනවා. පශු වෛද්‍ය මධ්‍යස්ථානයේ පශු සංවර්ධන නිලධාරි මහත්මයා හෝ පශු වෛද්‍ය මහත්මයා නැත්නම් එන තෙක් බලා ගෙන ඉන්න ඕනෑ. එන තෙක් බලා ගෙන ඉඳලා ඒ දොස්තර මහත්මයාට කියනවා, "දොස්තර මහත්තයෝ මාර වැඩේ වෙලා තිබෙන්නේ ඉක්මනට යමු" කියලා. ඉතින් බයිසිකලයක් හොයා ගන්නවා. බයිසිකලේ දා ගෙන දොස්තර මහත්මයා එක්ක එනවා. ආවාට පස්සේ පශු වෛද්‍යතුමා හෝ පශු සංවර්ධන නිලධාරි මහත්මයා - DI මහත්මයා- ආපසු හැරිලා යන්නේ නැහැ. ඔහු හොඳටම දන්නවා මේ අවස්ථාවේ මෙය ඉටු කළාට සාර්ථක ගැබ් ගැනීමක් සිදු වෙන්නේ නැහැ කියලා. හැබැයි, එහෙම දැන ගෙන ඔහු එන්නත ඇතුළු කරලා තමයි යන්නේ. මොකද, එන්නත ඇතුළු කළොත් විතරයි ඔහුට රුපියල් 1,500ක් හම්බ වන්නේ. ඒ නිසා මේ ක්‍රියාවලියෙන් අපේ රටේ දියුණු සත්ව ගහනයක් ඇති කරන්න බැහැ.

ගරු ඇමතිතුමනි, සත්ව ගහනය සම්බන්ධව තමුන්නාන්සේ ළඟ සංඛ්‍යා දත්ත තොරතුරු තිබෙනවා. අපේ රටේ එළ ගවයන් ඉන්නේ ලක්ෂ 12යි. වර්ෂයකට ලක්ෂ දෙකහමාරක් මිය යනවා. වර්ෂයකට ලක්ෂ දෙකහමාරක් මේ සංඛ්‍යාවට ඇතුළු වෙනවා. ඊක තමයි වෙන්නේ. ඒ නිසා මේ ලක්ෂ 12 සීමාවේ තමයි ඒ ප්‍රමාණය තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර වර්ෂවල එළ ගවයන්ගේ සංවර්ධනය සෘණ දශම එකයි. ඉන්නවාට වඩා සත්ව ගහනය අඩු වෙමින් තිබෙන්නේ. ඉන්නවාට වඩා අපේ රටේ එළ ගවයන් ප්‍රමාණය අඩු වෙච්ච වර්ෂ පවා තිබෙනවා. සියයට සෘණ දශම එකක සංවර්ධන වේගයක් තමයි තිබෙන්නේ. ඒ නිසා අපේ රටේ කිරි නිෂ්පාදනය ඉහළ දමන්න බැහැ, පළමුකොටම සත්ව ගහනය වැඩි කරන්න හොඳ සැලැස්මක් නැතුව. ඊ ළඟට ගුණාත්මකභාවයෙන් යුතු අලුත් පැටවුන් අපි බෝ කර ගන්නේ නැත්නම් ඒ බෝ කර ගන්නා ලද පැටවුන්ගෙන් කිරි ක්ෂේත්‍රයට ඇති වන ලොකු දායකත්වයක් නැහැ. ඒ නිසා අද පැති දෙකක අර්බුදයක් තිබෙනවා. එකක් තමයි අපේ සත්ව ගහනය වැඩි කර ගන්නේ කොහොමද කියන එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම හිතන හැටියට ඒ සත්ව ගහනය වැඩි කිරීමේදී අමාත්‍යාංශය පැත්තෙන් සිද්ධ වන අවධානය නම් බොහොම මදි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් සිද්ධ වන දේ තමයි ඉන්න සතා එහාට මෙහාට විකුණන එක. එකම සතා තමයි. එක කාලයක ඒ සතා ඉන්නවා මොනරාගල දිස්ත්‍රික්කයේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවියෙක් තමන්ට එළදෙනෙක් ඕනෑ වෙලා හොයපුවාම ආරංචියක් එනවා මොනරාගල ඉන්නවා කියලා. එයා මොනරාගලට ගිහිල්ලා අරන් එනවා. හැබැයි ලංකාව ඇතුළේයි මේ මාරුව සිද්ධ වන්නේ. ඒකෙන් සත්ව ගහනය වැඩි වන්නේ නැහැ. මේ සත්තු එහාට මෙහාට යන එක විතරයි සිද්ධ වන්නේ. එක විටෙක කුරුණෑගල ඉන්න ගවයා තව විටෙක රත්නපුරේ ඉන්නවා. රත්නපුරේ ඉන්න ගවයා තව විටෙක නුවරඑළියේ ඉන්නවා. ඒ හැරුණු කොට අලුත් සත්ව ගහනයේ වැඩි වීමක් සිද්ධ වෙන්නේ නැහැ. සත්ව ගහනය වැඩි කර ගන්නේ නැතුව මේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා ගවයන් රථයකට පටවන්නේ කොහොමද, කොච්චර ප්‍රමාණයක්ද ඉන්න ඕනෑද, වාතාශ්‍රය තිබෙන්න ඕනෑ ආදි වශයෙන් නියෝග හදනවා. කමක් නැහැ. ඒක හොඳයි. ඔවුන්ව පැටවීමේදී හා මස් සඳහා ගෙන යෑමේදී හදන නීති වගේම තමුන්නාන්සේලාගේ අවධානය යොමු වෙන්න ඕනෑ අපේ රටේ සත්ව ගහනය වැඩි කරන්නේ කොහොමද කියන එක පිළිබඳව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනා අර ගෙන බැලුවාම ඒ යෝජනාවල තිබෙනවා සාමාන්‍යයෙන් කොහොමද ගවයන් ගෙන යන්නේ කියලා.

මේ ගවයින් කොහොමද ප්‍රවාහනය කරන්නේ, ඒ ප්‍රවාහනය කරන්නට ඉල්ලුම් කරන්නේ කොහොමද ආදී කරුණු ගොඩක් තිබෙනවා. එකක් තමයි, ප්‍රවාහනය කරන ලොරියේ "සතුන් ප්‍රවාහනය කිරීම" කියා පුවරුවක් හදන්න ඕනෑ. මේ නියෝග නිකුත් කර බොහෝ කල් වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ නියෝග නිකුත් කළේ 2009 නොවැම්බර් මාසයේ 8 වන දා. ගරු සී.බී. රත්නායක අමාත්‍යතුමා විසින් තමයි මේ නියෝග ගැසට් කළේ. හැබැයි මේ නියෝග දැන් ක්‍රියාත්මක වෙනවාද? ඕනෑ තරම් ඒ බෝඩ් එක නැතිව සතුන් ගෙන යනවා අප දැක තිබෙනවා. එම නිසා මේ නියෝග සම්මත කළාට වැඩක් නැහැ, පසු විපරම් ක්‍රියාවලියක් තිබෙන්නට ඕනෑ, මේවා ක්‍රියාත්මක වෙනවා ද කියා. ඒ වාගේම අදාළ පුවරුවේ ප්‍රමාණය තිබෙනවා. අදාළ බලධාරීන්ට මේ ගෙන යන සතුන් පහසුවෙන් පරීක්ෂා කිරීම සඳහා පහසුකම් තිබෙන්නට ඕනෑය කියනවා. සතුන් මානුෂික අන්දමින් පැටවීමට හා ඉවත් කිරීමට වාහනයේ බෑවුම් වේදිකාවක් තිබිය යුතුය කියනවා. නිකම්ම නොවෙයි සතා පටවන්නේ, බාන්නේ. බෑවුම් වේදිකාවකුත් තිබෙන්නට ඕනෑ. මෙහෙම ගත්තාම ගොඩක් නිර්නායක තිබෙනවා. වාහනයේ බිම ප්‍රවාහනය කරනු ලබන කිසියම් හෝ සතෙකුට තුවාල සිදු විය හැකි සිදුරු හෝ පැළීම් ආදියෙන් තොර විය යුතුයි. වාහනයේ සිදුරු තිබෙන්නට බැහැ; පැළීම් තිබෙන්නට බැහැ. වෙන වෙන අවස්ථා තිබෙන්නට බැහැ කියා කියනවා. වාහනය මනා ලෙස පිරිසිදු කරනු ලැබුවක්, නඩත්තු කරනු ලැබුවක් විය යුතුය. කාලගුණය, උෂ්ණත්වය, භූ විෂමතාවය, සතුන් ප්‍රමාණය, ප්‍රවාහනය කරන සත්ව වර්ගය මේ ආදී බොහෝ දේවල් සතුන් ප්‍රවාහනය කිරීමේදී නියෝග හැටියට ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රධාන ප්‍රශ්නය මෙයයි. මේ ගවයින් ප්‍රවාහනය කරන්නට හදා තිබෙන නීතිරීති අපේ රටේ

[ගරු අනුර දිසානායක මහතා]

ජනතාව ප්‍රවාහනය කරන්නවත් හදා නැහැ. බස් රථයක නැඟ යන ජනතාවටවත් මේ තරම් නීති සමුදායක් හදා නැහැ. බස් එකේ ඉඩ, වාතාශ්‍රය, ඒ යන්න ඕනෑ කොහොම ද කියා හදා නැහැ. ඒ විතරක් නොවෙයි සාමාන්‍ය දේශපාලන ක්‍රියාකාරකම්වලටවත් ඒ ඉඩක් හදා නැහැ. පහරක් එල්ල කරන්න බැහැ; තුවාල සිදු කරන්න බැහැ; ඒ සියලුම රැකවරණ ටික ගවයින්ට දී තිබෙනවා. හරකෙකුට යන කලක්වත් මිනිහෙකුට යන්නේ නැති සමාජයක් තිබෙන වෙලාවක; ඒ නිදහසවත් තමුන්නාන්සේලා හදා නැති වෙලාවක ගවයින් ප්‍රවාහනය පිළිබඳව නීතියක් සම්පාදනය කර තිබෙනවා. ඒක හොඳයි. ඒක වැරදි නැහැ. හැබැයි තිබෙන ප්‍රශ්නය තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගවයින් ප්‍රවාහනය කිරීම සඳහා සකස් කර තිබෙන මේ නීතිය පමණක් අද අපේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න ප්‍රමාණවත්ද කියන එක. මේකට අපට මෛත්‍රීය දක්වන්නට පුළුවන් වෙවි. කරුණාව දක්වන්නට පුළුවන් වේවි. උපේක්ෂාව මේ ආදී සියල්ල අපට දක්වන්නට පුළුවන් වේවි. නමුත් ඒක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. අපේ රටේ දියුණු කළ යුතු කර්මාන්තයක් ලෙස කිරි කර්මාන්තය තෝරා ගෙන තිබෙනවා ද? ඒකයි පළමුවන ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඊයේ කිව්වා මා දැක්කා, අපේ රටේ සියයට තිහක කිරි නිෂ්පාදනයක් ගන්නවාය කියා. මා දන්නේ නැහැ. ඒ සංඛ්‍යා දත්ත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නටය කියා අප ඉල්ලා සිටිනවා. මොකද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවමත් අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට තිහක් නිෂ්පාදනය වෙනවාය කියා මා විශ්වාස කරන්නේ නැහැ. මට මතක විධියට ඊයේ පාර්ලිමේන්තුවේදී සියයට තිහක්ය කියා කිව්වා. ඔබතුමා සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරන්න. මීට අවුරුදු හතරකට පමණ පෙර තිබුණේ සාමාන්‍යයෙන් සියයට 15ක පමණ ප්‍රතිශතයක්. ඔබතුමා සියයට30 දක්වා එය වැඩිකර තිබෙනවා නම් හොඳයි. ඔබතුමා සංඛ්‍යා, දත්ත ඉදිරිපත් කරන්න. හැබැයි වැඩි වන්නට ඕනෑ. අපේ රටේ කිරි නිෂ්පාදනයේ ප්‍රතිශතය වැඩි විය යුතු වන්නේ, කිරි පරිභෝජනය අඩු වීමෙන් නොවෙයි. අපේ රටේ කිරි පරිභෝජනය අඩු කරලත් නිෂ්පාදනයේ ප්‍රතිශතය වැඩි කරන්න අපට පුළුවන්. කිරි පරිභෝජනය අඩු වුණාට පස්සේ අපේ රටේ කිරි නිෂ්පාදනය ප්‍රතිශතයක් හැටියට වැඩි වෙනවා. අපේ රටේ ජනතාවට කිරි ඕනෑද නැත්ද කියා විවාදයක් තිබෙනවා. ඒක සෞඛ්‍ය පිළිබඳ ප්‍රශ්නයක්. ඒක වෙනම ප්‍රශ්නයක්. ඒ විවාදයට අප පැටලෙන්නට අවශ්‍ය නැහැ. කිරි අවශ්‍ය ද, නැද්ද, මව්කිරි විතරක් ප්‍රමාණවත් ද කියා ලොකු විවාදයක් තිබෙනවා, වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ. ඒක වෙනම සාකච්ඡාවක්. නමුත් දැන් අපි කිරි පරිභෝජන භාණ්ඩයක් හැටියට පාවිච්චි කරමින් තිබෙනවා. ඒ පාවිච්චිය අඩාළ කරමින්, ඒක කඩා වට්ටමින් අපේ රටේ ප්‍රතිශතය ඉහළ දම්මන එක වැඩක් නැහැ. අපේ රටේ කිරි පරිභෝජනය සුලභ කරමින් එය වර්ධනය කරමින් තමයි අපේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කළ යුතු වන්නේ.

නිෂ්පාදනය වැඩි කිරීමේදී පළමුකොටම අවශ්‍ය වන්නේ අපේ රටේ සත්ව ගහනය වැඩි කිරීමයි. මා හිතන විධියට අද සත්ව ගහනය ලක්ෂ 12කට ආසන්න ප්‍රමාණයක් තමයි වාර්ෂිකව හැම දාම තිබෙන්නේ. ඒක වැඩි වෙලා නැහැ. වාර්ෂිකව දශම එකක ප්‍රමාණයකින් අඩු වෙවී යනවා. දෙවන කරුණ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්න සතුන්ගේ ගුණාත්මක වර්ධනයයි. ඔවුන්ගෙන් වැඩි කිරි ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමයි. එම නිසා අපේ රටේ සත්ව සංවර්ධන නිලධාරි මහත්වරුන්ට විශාල කාර්ය භාරයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වතුර විතරක් නියමිත පරිදි ලබා දෙන්නට ක්‍රමයක් සැලැස්වුවහොත් අපේ රටේ කිරි නිෂ්පාදනය තව වැඩි කරන්නට පුළුවන්කම තිබෙනවා. එම නිසා අපේ රටේ සත්ව පාලනයට යොමු වී තිබෙන ගොවි ජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාවලියක් අප ආරම්භ කරන්නට ඕනෑකම තිබෙනවා. සැබවින්ම සතෙකුගෙන් උපරිම කිරි නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා ඔවුන්ට ආහාර වේල සකස් කර දිය යුත්තේ කොහොමද? ඔවුන්ට වතුර ලබා දිය යුත්තේ කොහොම ද? ඔවුන්ගේ ගව මඩුව සකස් විය යුත්තේ කොහොම ද කියන කරුණු පිළිබඳව තවත් සැලස්මක් ආරම්භ කළ යුතුයි. තිබෙන සැලැස්ම ප්‍රමාණවත් නැහැ කියලා ඔබතුමාත් දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම දැන් මේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන් වෙන්නේ කොහොමද කියන එක ගැන අපි අවධානය යොමු කරන්න ඕනෑකම තිබෙනවා. එක කාලයකදී, 2005 දී විතර ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණු එක් අපේක්ෂක මහත්මයෙක් කිව්වා, හැම ගෙදරකටම එළ හරකෙක් ලබා දෙනවාය කියලා. හැම ගෙදරකටම එළ හරකෙක් ලබා දීමෙන් කිරි නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන් කියලා ඔහු කිව්වා. ඒක අසත්‍යයක්. එහෙම කරන්න බැහැ. ගෙවල්වලට, ගම්වලට එළ හරකෙක් බෙදලා ඒ මඟින් කිරි නිෂ්පාදනය වැඩි කරන්න බැහැ. පළමු කොටම අපේ කිරි නිෂ්පාදනය කර්මාන්තයක් බවට වර්ධනය කළ යුතුයි. ඒක කර්මාන්තයක් වෙන්න ඕනෑ. කිරි නිෂ්පාදනය අපේ රටට අවශ්‍යයි කියලා පිළිගන්නවා නම් පළමු කොටම එය කර්මාන්තයක් බවට පත් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගමේ ඉන්න ගොවි මහත්තයාට හරක් දෙන්නෙක් තුන්දෙනෙක් බෙදලා එය කර්මාන්තයක් බවට පත් කරන්න බැහැ. අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් කිරි නිෂ්පාදනයට කැඳවා ගෙන ඒමයි අපි පළමු කොටම කරන්න ඕනෑකම තිබෙන්නේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් කිරි ක්ෂේත්‍රයට එන්නේ නැතිව අපේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අඩුම තරමින් සත්තු 200ක් ඉන්න ගොවිපොළවල් 100ක්වත් අපේ රටේ තිබෙන්නට ඕනෑ. හැබැයි අවාසනාවකට සත්තු 200ක්වත් ඉන්න රජයේ ගොවිපොළවල් එකක් දෙකක් හැරුණු කොට අපේ රටේ විශාල ප්‍රමාණයක් නැහැ. ඒ නිසා සත්තු 200ක්වත් සිටින මධ්‍ය පරිමාණයේ ගොවිපොළවල් සැලකිය යුතු ප්‍රමාණයක් අපි හදන්නට ඕනෑ. ඔවුන් තමයි නව පර්යේෂණ කරන්නේ. ඔවුන් තමයි තාක්ෂණය ගේන්නේ. ඔවුන් තමයි හොඳ සත්වයා ගේන්නේ. ඒක තමයි ගමට පැතිරෙන්නේ. ගමේ ගොවි මහත්තයාට තාක්ෂණය ගේන්න බැහැ. ගමේ ගොවි මහත්තයාට අලුත් සතෙක් හඳුන්වා දෙන්නට බැහැ. ගමේ ගොවි මහත්තයාට නව ක්‍රියාදාමයකට අවතීර්ණ වෙන්න බැහැ. හැබැයි මධ්‍ය පරිමාණ කිරි නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයක් අපි ආරම්භ කළොත්, ඒ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා කිරි නිෂ්පාදනයට අවතීර්ණ වුණොත් ඔහු හරහා ගමට තාක්ෂණය ගේන්න, නව පැටවුන් ගහණයක් ඇති කරන්න, නව ක්‍රියාමාර්ග විසුරුවන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මධ්‍ය පරිමාණ ගොවිපොළවල් කිහිපයක් ආරම්භ කිරීම කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑකම තිබෙනවා.

විශේෂයෙන්ම අපි දන්නවා, ලංකාවේ විශාල ඉඩම් තිබෙන බව. සාමාන්‍යයෙන් අක්කර 100 ගොවිපොළවල් කිහිපයක් ආරම්භ කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහිදී සාමාන්‍යයෙන් අනෙකුත් දේවල්වලට ආයෝජනය කරන්න තිබෙන කැමැත්ත කිරි නිෂ්පාදනයට අද නැහැ. ව්‍යාපාරිකයන් ගත්තාම, කැසිනෝ ශාලාවක් දාගන්න තිබෙන කැමැත්තේ තරමට, "බාර්" එකක් දාගන්න තිබෙන කැමැත්තේ තරමට, "රෙස්ටෝරන්ට්" එකක් දාගන්න තිබෙන කැමැත්තේ තරමට, ඒවාට ආයෝජනය කරන්න තිබෙන කැමැත්ත හා සන්සන්දනය කර බලන කොට ඒ ව්‍යවසායකයන් කිරි කර්මාන්ත ක්ෂේත්‍රයට ආයෝජනය කරන්න තිබෙන කැමැත්ත අල්පයි. සාමාන්‍යයෙන් ව්‍යවසායකයන් කිරි කර්මාන්ත ක්ෂේත්‍රය හඳුනා ගෙන තිබෙන්නේ තමන් යොදවන ආයෝජන මුදලට සැලකිය යුතු සාධාරණ ලාභාංශයක් ලැබෙන්නේ නැති ක්ෂේත්‍රයක් හැටියටයි. ඒ නිසා පුද්ගලික ව්‍යවසාකයන් කිරි ක්ෂේත්‍රයට ආයෝජනය කරන්න තිබෙන පෙළඹවීම අඩු වෙලා තිබෙනවා. ඒ නිසා දැන් කළ යුතුව තිබෙන්නේ මොකක්ද? පෞද්ගලික මැද පරිමාණ ව්‍යවසායකයන් කිරි ක්ෂේත්‍රයට ආයෝජනය කර ගැනීම සඳහා යම් පහසුකම් ජාලයක් හදලා දෙන්න ඕනෑ. සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑය කියලා කොළඹ නගරයේ වටිනාම ඉඩම් අක්කර 16ක් "ෂැන්ග්‍රි-ලා" සමාගමට සහ "කැටික්" කියන සමාගමට කිසිදු බදු

මුදලක් නැතුව තමුන්නාන්සේලා සින්නක්කරව දුන්නා. තමුන්නාන්සේලා ඒ තීරණය ගන්නේ මොකක් නිසාද? සාමාන්‍යයෙන් අපේ රටේ ඉඩමක් විදේශිකයකුට විකුණනවා නම් සියයට 100ක බද්දක් අය කළ යුතුව තිබුණා. හැබැයි තමුන්නාන්සේලා ගෝල් ෆේස් පිට්ටනිය ළඟ රටේ අගනගරයේ වැදගත්ම ඉඩමක් -හමුදා මූලස්ථානය තිබුණු ඉඩම- අක්කර 10 කොටසක් සහ අක්කර 6 කොටසක් "ෂැන්ග්‍රි-ලා" සමාගමට සහ "කැටික්" සමාගමට දුන්නා. බදු ලෙස ශතයක්වත් ගත්තේ නැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

ඒ පිළිබඳව මට වචනයක් කියන්න ඕනෑ. ඇත්තවශයෙන්ම ඔබතුමා කිව්වා වාගේ ඒක සින්නක්කර විකිණීමක් නොවෙයි සිදු වුණේ. අනූනම අවුරුදු බදු දීමක් තමයි කළේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැහැ, වැරදියි ඇමතිතුමා. මේ පාර්ලිමේන්තුවේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් අපි අහපු ප්‍රශ්නයකට ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා පිළිතුරක් ලබා දුන්නා. ඒ අනුව එය සින්නක්කරව තමයි ලබා දීලා තිබෙන්නේ. එය සින්නක්කර පැවරීමක් කරලා තිබෙන්නේ. ඒ කියන්නේ "ෂැන්ග්‍රි-ලා" සමාගම විසින් කොන්දේසියක් දැම්මා "බදු පදනමින් එන්න අපි සූදානම් නැහැ" කියලා. ඒ නිසා ඒක සින්නක්කරව ලබා දුන්නා. මේක තමයි ඇත්ත කථාව. අපේ රටේ නීතියක් තිබෙනවා, විදේශිකයෙකුට සින්නක්කරව ඉඩමක් ලබා දීමේදී සියයට 100ක් බදු අය කරන්න ඕනෑ. [බාධා කිරීමක්] ඒක තමයි. ඒ ව්‍යාපෘතිය ආවේ කොහොමද? නීතියෙන් රිංගලා ඒ ව්‍යාපෘතිය ආවේ ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතියක් ලෙසයි.

සාමාන්‍යයෙන් අපේ රටේ පවතින නීතිය අනුව විදේශිකයෙකුට ඉඩමක් සින්නක්කර විකුණන්න බැහැ. එහෙම නීතියක් තිබුණා. මාත් දන්නවා, ඔබතුමා ඉන්න කොට මාත් ඒක ඉදිරියට ගෙනිච්ච නිසායි මම කියන්නේ. ඒ වාගේම 99 අවුරුද්දක බදු පදනමකට දෙන්න පුළුවන්. හැබැයි ඒ මිල වාගේ සියයට 100ක බද්දක් ගෙවන්න ඕනෑකම තිබුණා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

අපි විදේශ ආයෝජකයන් ගෙන්වා ගත යුතුයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔව්. මම කියන්නේ ආයෝජනය ලොකුයි-

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

විදේශ විනිමය කෝටි පන්දහසකට ආසන්න සංඛ්‍යාවක් ලංකාවට එනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

රුපියල්වලින්ද?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ඔව්. රුපියල්වලින්. කෝටි පන්දහසකට ආසන්න සංඛ්‍යාවක්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමා, මම ඒක පිළිබඳව විවාදයක් නොවෙයි කරන්න හදන්නේ. මම කියන්නේ කොළඹ නගරයේ තිබෙන ඒ වාගේ වටිනා අක්කර 16ක ඉඩමක් - මම හිතන්නේ කොළඹ නගරයේ ඒ තරම් ලොකු භූමියක් කාටවත් සොයා ගන්න බැරි වේවි. අක්කර 10ක කොටසක් සහ 06ක කොටසක්- කිසිම බදු මුදලක් නැතිව සින්නක්කරව දුන්නා. කිසි බදු මුදලක් නැහැ. ආයෝජන මණ්ඩලයේ ආයෝජන ව්‍යාපෘතියක් කියන ඇතුළෙන් තමයි නීතිය රිංගුවේ. මම කියන්න හදන්නේ ඒක හොඳද, නරකද කියන එක නොවෙයි. සංචාරක ක්ෂේත්‍රයට ආයෝජනයන් ගෙන්වා ගැනීම සඳහා තමුන්නාන්සේලා එවැනි විශේෂ වරදාන, වරප්‍රසාද දෙනවා.

ඒ ක්ෂේත්‍රයට එහෙම දෙනවා නම් කිරි කර්මාන්ත ක්ෂේත්‍රයට ආයෝජනයන් කිරීම සඳහා එවැනි සහන දෙන්න අපට බැරි ඇයි? ඒකයි මගේ තර්කය. හෝටල් කර්මාන්ත ක්ෂේත්‍රයටත් එවැනි සහන දෙනවා නම්- [බාධා කිරීමක්] ඔව්. ඒක තමයි මම කියන්නේ. මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට තිස් අවුරුදුවලට, පණස් අවුරුදුවලට ඉඩම් ටිකක් ලබා දිය යුතු වෙනවා. ඒ වාගේම තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් තව කාර්ය භාරයක් කරන්න ඕනෑ. දැන් අපේ රටේ පශු වෛද්‍යවරු ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පේරාදෙණිය පශු වෛද්‍ය පීඨයෙන් එළියට ඇවිල්ලා දැනුත් රක්ෂා නැතුව පශු වෛද්‍ය උපාධිය ලබා ගත්ත විශාල ප්‍රමාණයක් එළියේ ඉන්නවා. අවුරුදු පහක පාඨමාලාවක් හදාරලා පශු වෛද්‍ය උපාධිය ලබා ගත්තු පශු වෛද්‍ය උපාධිධාරින් විශාල ප්‍රමාණයක් එළියේ ඉන්නවා. ඒ වාගේ සැලකිය යුතු පශු වෛද්‍යවරු ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව ඇතුළේත් ඉන්නවා. හැබැයි දෙපාර්තමේන්තුව ඇතුළේ ඉන්න පශු වෛද්‍යවරුන්ගේ ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ. ඒ නිසා සිද්ධ වෙලා තිබෙන දේ තමයි උපාධිය ගත්ත පශු වෛද්‍යවරයාට රක්ෂාවක් නැතිව ඉන්නවා. දෙපාර්තමේන්තුව ඇතුලේ ඉන්න පශු වෛද්‍යවරයාට තිබෙන කාර්ය භාරය කර ගන්න ප්‍රමාණවත් නැතිව ඉන්නවා. කාර්ය භාරයක් නැහැ. [බාධා කිරීමක්] මම කියන්නේ ඒකයි. දැන් කරන්න ඕනෑකම තිබෙන්නේ මොකක්ද? සතුන් 200කට වඩා ඉන්න ගොවිපලකට රජයෙන් පශු වෛද්‍ය මහත්තයෙක් දෙන්න ඕනෑ. ප්‍රශ්නයක් නැහැ. මොකද, ගමේ ඉන්න පශු වෛද්‍යවරයා ගවයෝ 200ක් බලා ගන්නේ නැහැ. සතුන් 200ක් බලා ගන්නේ නැහැ. සමහර මහත්වරු Pomeranian බල්ලන්ට injection ගගහා ඉන්නවා. හොඳට වැඩ කරන මහත්වරු ටිකකුත් ඉන්නවා. හැබැයි ඒ වාගේම පිරිසක් ඉන්නවා ඒ අයගේ ප්‍රධානම වැඩේ තමයි නෝනලා ටික අරන් එන බලු පැටියන්ට බෙහෙත් කරන එක. ඒක තේ ඇත්ත කථාව. ඒගොල්ල ගමට ගිහිල්ලා, ගමේ ගොවිපලට ගිහිල්ලා, ගව ගාලට රිංගලා ඇතුළේ පර්යේෂණ කරන්නේ නැහැ. වැදගත් විධියට වැඩ කරන මහත්වරු ටිකක් ඉන්න අතර බහුතරයක් ඔය කාර්යයේ නිරත වෙමින් ඉන්නවා. ඒ නිසා අපට ප්‍රශ්නයක් වෙන්න විධියක් නැහැ. සතුන් 200කට වඩා ඉන්න ගොවිපලකට රජයෙන් පශු වෛද්‍යවරයෙක් දෙන්න තීරණයක් ගන්න ඕනෑ. ඒක පාඩුවක් නොවන්නේ ඇයි? ගමේ ඉන්න පශු වෛද්‍යවරයා සතුන් 200ක් රැක බලා ගන්නේ නැහැ. සතුන් 200ක් පරීක්ෂාවට භාජනය කරන්නේ නැහැ. අපි ගොවිපලක් හදලා ඒ ගොවිපලට පශු වෛද්‍යවරයෙක් නොමිලයේ දෙනවා කියලා තීරණයක් ගන්න ඕනෑ. මම කියන්නේ අපි එවැනි පහසුකම් ජාලයක් සකස් කරලා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවා, ව්‍යවසායකයා අපේ රටේ කිරි ක්ෂේත්‍රයට කැඳවා ගෙන එන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,

[ගරු අනුර දිසානායක මහතා]

එහෙම කැඳවන්නේ නැතිව අපේ රටේ කිරි නිෂ්පාදනය මීට වඩා ඉහළ දමන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා සුළු හා මධ්‍ය පරිමාණ ගොවිපල කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊ ළඟ ප්‍රශ්නය තමයි, අපේ රටේ පශු වෛද්‍ය මහත්වරු මුහුණ දී ඇති ප්‍රධාන ගැටලුවක් තිබෙනවා. වර්ෂ ගණනාවක් තිස්සේ, 2006 අවුරුද්දේ සිට ඔවුන්ගේ සේවා ව්‍යවස්ථාවේ විශාල ගැටලු ගණනාවක් මතු වී තිබෙනවා. සේවා ව්‍යවස්ථාව සකස් කරලා අවසන් කර දෙන්න තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තිබෙන සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමත් වෙලා නැහැ. ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා දැන් II (I) ශ්‍රේණියට උසස් වීම් ලබා ගන්න ඉන්න පශු වෛද්‍ය මහත්වරුන්ට සහ I ශ්‍රේණියට උසස් වීම් ලබා ගන්න ඉන්න පශු වෛද්‍ය මහත්වරුන්ට දැන් අවුරුදු හතරක් පහක් තිස්සේ උසස් වීමේ ක්‍රියා පටිපාටියක් නැතිව නතර වෙලා තිබෙනවා. ඔවුන් එක පැත්තකින් සේවයේ නිරත වෙනවා. හැබැයි සේවා ව්‍යවස්ථාවක් සම්මත වෙච්ච නැති සේවයක් තිබෙනවා. ඒ පශු වෛද්‍ය සේවය. ඒ නිසා ඔවුන්ට උසස් වීමක් ලැබෙන්නේ නැහැ. ඔවුන්ගෙන් ලබා ගන්නා, ඔවුන්ව යොදවන කාර්යයට අනුව යම් ගෙවීමක් කෙරෙන්නේ නැති තත්ත්වයක් මතු වී තිබෙනවා. ඒ නිසා පශු වෛද්‍ය මහත්වරුන්ගේ සේවා ව්‍යවස්ථාව ඉක්මනින්ම සකස් කරලා දෙන්න ඕනෑ. සේවා ව්‍යවස්ථාව සකස් කරන්නේ නැතිව අපි මොන සැලසුම් හැදුවත් පශු වෛද්‍ය ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන්න පුළුවන්කමක් නැහැ.

මේ විෂය නිසාම ඊ ළඟ කාරණයට ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කැමැතියි. විශේෂයෙන්ම අපට මතක ඇති කාලයකදී තමයි මෙහෙම අපේ රටේ බිත්තර සහ කුකුළු මස් පිට රටින් ගෙනෙන්න සිදු වුණේ. අද උදේ මා සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවාම එතුමා කිව්වා, බිත්තර ලක්ෂ 99ක් පිට රටින් ගෙනාවා; කුකුළු මස් මෙට්‍රික් ටොන් 496ක් පිට රටින් ගෙනාවා කියා. ඒක විශාල තොගයක්. ඇයි, පිට රටින් ගෙනෙන්න සිද්ධ වුණේ? අපේ රටේ මස් සහ බිත්තර නිෂ්පාදනය සමාගම් කිහිපයක අධිකාරිත්වයක් යටතේ තිබෙන්නේ. කුලියාපිටියේ කුකුළු ගොවිපොළ තිබුණත් ඒකත් අයිති එක සමාගමකට. උඩුබද්දාවේ කුකුළු ගොවිපොළ තිබුණත් ඒකත් අයිති තවත් සමාගමකට. සමාගම් තුන හතරක් අපේ රටේ කුකුළු ගොවිපොළ ක්ෂේත්‍රයේ මුළු ආධිපත්‍ය යටත් කර ගෙන තිබෙනවා. පැටව් ටික ඒ ගොල්ලන්ගේ. බෙහෙත් ටික ඒ ගොල්ලන්ගේ. ආහාර ටික ඒ ගොල්ලන්ගේ. මිලදී ගන්නේ ඒ ගොල්ලන්. අවසානයේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අඩුම තරමේ කුකුළු ගොවියාට දෛනික වැටුපවත් ලැබෙන තත්ත්වයක් නොවෙයි තිබෙන්නේ. ගණන් හදලා බලන්න. දින 45කින් broiler කුකුළන් ගත්තාට ඒ සඳහා තමන් යොදවන ශ්‍රමයවත්, ඒ ශ්‍රමයට මිලක්වත් අද ගොවිපොළ හිමියාට ලැබෙන්නේ නැහැ. සමාගම් කිහිපයක් අතේ අපේ රටේ මුළු බිත්තර සහ කුකුළු මස් නිෂ්පාදනය රඳා පවතිනවා. ඒ සමාගම් කිහිපයේ ඒකාධිකාරත්වය බිඳින්න ඕනෑ. ඒ සමාගම් කිහිපයේ ඒකාධිකාරත්වය බිඳින්නේ නැතුව සාමාන්‍ය පාරිභෝගික ජනතාවට බිත්තර සහන මිලටත්, කුකුළු මස් සහන මිලටත් ලබා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ අධිකාරත්වය බිඳින්නේ නැතුව ඒ ක්ෂේත්‍රයේ නියැළෙන ගොවීන්ටත් සාධාරණ මිලක් ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. පසු ගිය කාලයේ මිල ඉහළ යන්න හේතු වුණේ මෙහෙමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පෞද්ගලික අංශයක hatcheries දෙකක් කැඩිලා තිබුණා. අවශ්‍ය විධියට දෛනික පැටව්, දවසේ පැටව් නිෂ්පාදනය කර අවශ්‍ය විධියට දෙන්න බැරි වුණා. අපට නිෂ්පාදනය කරන්න ආයතනයක් තිබුණේ නැහැ. ඒ නිසා මොකක්ද සිද්ධ වුණේ? මා එම ආයතනය ගැන කියන්නම්. ප්‍රීමා ආයතනය. අපේ රටේ කුකුළු පැටව් නිෂ්පාදනයෙන් බහුතරයක් අද ඉටු කරන්නේ ප්‍රීමා ආයතනය. ප්‍රීමා ආයතනයේ hatcheries දෙක කඩා වැටිලා තිබුණාට පස්සේ පැටවුන්ගේ හිඟයක් ඇති වුණා. එහෙම වුණාම ඊට අනුරූප වන පරිදි මස් සහ බිත්තර හිඟයක් ඇති වුණා. ඒ බිත්තර හිඟය ඒ සමාගම් කිහිපය නැවත උපයෝගී කර ගත්තා. ඒ නිසා මා කියන්නේ කුකුළු පැටව් නිෂ්පාදනයට රජය අවතීර්ණ විය යුතුයි කියා. කුකුළු පැටව් නිෂ්පාදනය කරන්න රජයට මූලික සමාගමක් වෙන්න බැරි නම් රජය අඩුම තරමේ අර්ධ රාජ්‍ය ආයතනයක් හෝ අපේ රටේ ගොඩ නහන්න ඕනෑකම තිබෙනවා. ඒක තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට කරන්න පුළුවන්. [බාධා කිරීමක්] ඒක මදි නේ ඇමතිතුමා. ඔබතුමාත් දන්නවා නේ. නුවර තිබෙන එක නේ කියන්න හදන්නේ. කුණ්ඩසාලේ එක. ඒක මොකක්ද කරන්න ඕනෑකම තිබෙන්නේ. ඒකෙන් පැටව් කීයද හදන්න පුළුවන්? ඔබතුමාත් සංඛ්‍යා ලේඛන හොයලා බලන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද කුකුළු පැටව් නිෂ්පාදනයට රජය මැදිහත් වන්න ඕනෑකම තිබෙනවා. අඩුම තරමේ අර්ධ රාජ්‍ය ආයතනයක් හෝ ගොඩ නහන්න ඕනෑ. කුකුළු ආහාර නිෂ්පාදනය ගනිමු. ඒ සඳහා පොල්ගහවෙල ආයතනයක් තිබුණා. ඒක ප්‍රමාණවත් නැහැ. නමුත් කුකුළන්ගේ ආහාර නිෂ්පාදනයට රජය මැදිහත් වන්න ඕනෑ. රජය ඒවා ගොවීන්ට බෙදා හරින වැඩ පිළිවෙළක් සහ මිලදී ගැනීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ. තවදුරටත් අපේ රටේ ගොවි ජනතාව සමාගම් කිහිපයක ගොදුරු බවට පත් කරන, පාරිභෝගික ජනතාව සමාගම් කිහිපයක ගොදුරු බවට පත් කරන මේ ව්‍යසනයෙන් ගලවා ගන්න ඕනෑකම තිබෙනවා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය අපේ රටේ වැදගත් අමාත්‍යාංශයක්. අපේ රටේ ජාතික නිෂ්පාදනයෙන් විශාල ක්ෂේත්‍රයක් නියෝජනය කරන අමාත්‍යාංශයක් තමයි තමුන්නාන්සේලා හොබවන්නේ. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අමාත්‍යාංශයෙන් අපේ රටට සිදු විය යුතු කාර්ය භාරය පිළිබඳවත් මනා දැක්මක් සැලැස්මක් සහ වැඩ පිළිවෙළක අවශ්‍යතාව අද පැන නැඟිලා තිබෙනවා. ඒ නිසා මෙම නියෝගවලින් ගනු ලබන සාධනීය පියවර පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. ඊට වඩා සාර්ථක පියවරක් ආරම්භ කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවා ඇතැයි කියා බලාපොරොත්තු වෙමින් මා නතර වනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Thank you. The next speaker is the Hon. (Dr.) Rohana Pushpakumara. Before that, will an Hon. Member propose the Hon. Shantha Bandara to take the Chair?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

I propose that the Hon. Shantha Bandara do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SHANTHA BANDARA *took the Chair.*

[අ. භා. 5.22 ]

**ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, සත්ව පනත යටතේ විශේෂයෙන්ම සතුන්ගේ අයිතිවාසිකම් සහ ඔවුන්ගේ ආරක්ෂාව සඳහා ඉදිරිපත් කර තිබෙන නියෝග පිළිබඳව කථා කරන විට, අපේ හිටපු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය අනුර කුමාර දිසානායක මැතිතුමාගේ කථාවෙන් පසුව කථා කරන්නට ලැබීම ගැන මම බෙහෙවින් සන්තෝෂ වනවා. එතුමා මේ රටේ ගව සම්පතින් ලබා ගන්නා කිරි ධාරිතාව වැඩි කර ගැනීම ගැන කථා කළාට, එතුමා අමාත්‍යවරයා වශයෙන් ඉන්න කොට ඒවා ක්‍රියාත්මක කළාද නැද්ද කියන ප්‍රශ්නය අද අපට මතු වනවා. ඒ කෙසේ වෙතත් එතුමාගේ කථාවේදී කිව්වා මේ රටේ ජනතාවටවත් නැති නිදහසක් මේ පනතට ඉදිරිපත් කර තිබෙන නියෝග යටතේ සතුන්ට -හරකුන්ට- ගෙනැවිත් තිබෙනවා කියලා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අවුරුදු තිහක් තිස්සේ මේ රටේ පැවැති යුද්ධය අවසන් කරලා, ජනතාවට දීලා තිබෙන නිදහස සහ පහසුකම් පිළිබඳව වෛරයෙන් දැකපු අවස්ථාවක් විධියට තමයි මම එය දකින්නේ.

ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ කථාව කෙසේ වෙතත් 2600 සම්බුද්ධත්ව ජයන්තිය සමරපු මේ කාලය තුළ මේ රටේ ජනතාවට නිදහස ලබා දුන්නා වාගේම, අයිතිවාසිකම් ලබා දුන්නා වාගේම, මේ රටේ ජීවත් වන සතුන්ටත් ඔවුන්ගේ නිදහස හා අයිතිවාසිකම් ලබා දෙන අවස්ථාවක් විධියට තමයි එක පැත්තකින් මම මෙය දකින්නේ. මම එහෙම කියන්නේ ඇයි? මේ රටේ බොහෝ සත්වයන් හිංසාවට පත් වුණු අවස්ථා මම දැක තිබෙනවා. මම ජීවත් වන බණ්ඩාරවෙල ප්‍රදේශය ගත්තාම හම්බන්තොට, වැල්ලවාය ප්‍රදේශවලින් හරක් ප්‍රවාහනය කිරීමේ දී සමහර අවස්ථාවල ඒ වාහනය තුළ දවස, දවස් එකහමාර තියා ගෙන ඒ සතුන්ට හිරිහැර වුණු අවස්ථා අපි අනන්තවත් දැකලා තිබෙනවා. ඒ නිසා අපේ ගරු අමාත්‍යතුමා මේ පනත යටතේ නියෝග තුළින් සතුන් ප්‍රවාහනය පිළිබඳව වැදගත් කාරණා කිහිපයක් ඉදිරිපත් කිරීම ගැන අපි එතුමාට ස්තුතිවන්ත වන්නට ඕනෑ. විශේෂයෙන්ම හරකුන් ප්‍රවාහනය කිරීමේ දී වාහනය තුළ ගෙන යෑමට නියමිත සතුන් ප්‍රමාණය මෙයින් ප්‍රකාශයට පත් කර තිබෙනවා. කලින් මේවා නීතිගත කර තිබුණත් සතුන් හිංසාවට පත් වුණු අවස්ථා අපි දැකලා තිබෙනවා. අපි ඒ අත් දැකීම් ලබලා තිබෙනවා. ඒ නිසා මේක ඉතා වැදගත් කටයුත්තක්. මේ කාර්යය කිරීමේ දී පශු වෛද්‍යවරු ඒවා ක්‍රියාත්මක කරන්නේ නැහැයි කියලා ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා. පශු වෛද්‍යවරු තමයි ගම්වලට ගිහිල්ලා මේ සතුන් පිළිබඳව, ඔවුන්ගේ ධාරිතාව පිළිබඳව, ඔවුන්ගේ ලෙඩ රෝග පිළිබඳව සොයා බලන්නේ. ඇත්තටම මේ රටේ පශු වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතිනවාය කියන එක අපි පිළිගන්න ඕනෑ. අපේ ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළා නවක පශු වෛද්‍යවරු බඳවා ගත්තාය කියලා. මේ රටේ කෘෂිකාර්මික දියුණුව වාගේම සත්ව සම්පත දියුණු කිරීම සඳහා පශු වෛද්‍යවරුන්ගේ හිඟය පියවීම ඉතාමත්ම වැදගත් කාර්යයක් විධියට මම දකිනවා. ඒ වාගේම පසු ගිය කාලය තුළ හරකුන්, අලින් ම්ලේච්ඡ ආකාරයට ප්‍රවාහනය කරලා බොහොම කනගාටුදායක සිද්ධීන් අපට අහන්න ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම මම මතක් කරන්න ඕනෑ මාංශ සඳහා පාවිච්චි කරන සතුන් ප්‍රදර්ශනය කිරීමට, සමාජයට ඒ සතුන් පෙන්නුම් කිරීමට නීතිය අනුව හැකියාවක් නැහැයි කියන එක.

මම ජීවත් වන පරිසරයේ, මගේ ආසනයේ ඝාතනය කරන්න ඉන්න හරක් බැඳ තබන්නේ ප්‍රසිද්ධ ස්ථානවලයි. අපි පාරේ යන කොට මරන්න ඉන්න කුකුළන් පාර අයින දිගේ තබා තිබෙනවා අපට දකින්නට ලැබෙනවා. සමහර විට ළමයින් මේවා දැක්කාම මේ ගැන අහනවා. කුකුළන් වාගේ සතුන් ඒ විධියට හිර කර ගෙන, කූඩු කර ගෙන ඉන්නේ ඇයි කියලා අහන අවස්ථා තිබෙනවා. ඒ නිසා මස් සඳහා පාවිච්චි කරන සතුන් පරිසරයට ඇස නොගැටෙන විධියේ සැලැස්මක් සකස් කිරීම ඉතාමත් වැදගත් කියන එක මම මතක් කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම සතුන් සුරැකීම පිළිබඳව කථා කිරීමේදී අපි බොහෝ වෙලාවට කථා කරන්නේ වනජීවී දෙපාර්තමේන්තුව පිළිබඳව විතරයි. අද මේ සතුන්ට නිදහස තිබෙනවා වාගේම මේ සතුන්ගේ නිදහස නිසාම සමාජයට සිදු වන හානි ගැනත් අප දන්නවා.

දියතලාව ප්‍රදේශයේ -මම ජීවත් වන ප්‍රදේශයේ- Army Camp එකක් තිබෙනවා. ඒ වටේ හරකුන් දහස් ගණනක් නිදහසේ ඉන්නවා. එක පැත්තකින් පින් ගොන්නු කියලා කොට්ඨාසයකුත් ඉන්නවා. හැබැයි ඔවුන්ගෙන් පරිසරයට සහ එහි ජීවත් වන සමාජයට හානියක් සිදු වනවා වාගේම, ඔවුන්ටත් හානියක් සිදු වනවා.

අපි දකිනවා, පාරේ යන කොට මාර්ග අධිකාරියෙන් නොයෙකුත් බෝඩ් ගහලා තිබෙනවා. පාසලක් තිබෙනවා නම් පාසලක් ඉදිරියෙන් තිබෙන බව හැඟවෙන බෝඩ් ගහලා තිබෙනවා; රේල් පාරක් තිබෙනවා නම් රේල් පාර ඉදිරියෙන් තිබෙන බව හැඟවෙන බෝඩ් ගහලා තිබෙනවා. ඒ වාගේම හරකුන් ඇඳපු බෝඩ් ගහලා තිබෙනවා. ඒ කියන්නේ ඒ ප්‍රදේශය නිදහසේ හරකුන් ගැවසෙන ප්‍රදේශයක් බවයි. ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. මේ ගවයන්, ඒ වාගේම අනෙකුත් සතුන් නිදහසේ ගැවසීම ඒ සතුන්ට වාගේම අද මේ රටේ සිදු වන අනතුරුවලට කොයි ආකාරයෙන් හේතු සාධක වනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. මම උත්සාහ ගත්තා, එවැනි සතුන් නිසා ලංකාවේ සිදු වුණු අනතුරු පිළිබඳව සංඛ්‍යා ලේඛන හොයා ගන්න. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සතුන් නිසා සිදු වෙච්ච අනතුරු හා මරණ ප්‍රමාණය ගැන තොරතුරු මට කොහෙන්වත් ලබා ගන්න බැරි වුණා. ඒ නිසා මම එක ඉල්ලීමක් කරනවා, මේ දත්තයන් ලබා ගන්නා ක්‍රමවේදයකුත් මේ තුළ සකස් වෙන්න ඕනෑයි කියලා.

මට හැඟෙන පරිදි විශේෂයෙන්ම මේ පනතේ තිබෙන්නේ සතුන්ගේ අයිතිය තහවුරු කිරීමයි. ගවයන් ගැන කථා කළත් සමස්තයක් විධියට සතුන්ට තිබෙන හිංසනය ගැන කථා කිරීම තමයි මෙහි අදහස. මෙහිදී බල්ලන් ගැනත් කාරණා කීපයක් කියන්න මට අවශ්‍ය වෙලා තිබෙනවා. මොකද, මේ වන කොට ලංකාවේ ජනගහනය අනුව ලංකාවේ සුනඛයින්ගේ ප්‍රමාණය 8:1ක අනුපාතයකට පැමිණ තිබෙනවා. අද සමාජයට මේ සතුන් හිංසාවක් බවට පත් වෙලා තිබෙනවා. අද අපට රෝහලකට යන්න බැහැ; පන්සලකට යන්න බැහැ; එහෙම නැත්නම් වෙළෙඳ මධ්‍යස්ථානයකට යන්න බැහැ. එවැනි ආකාරයෙන් සත්ව ප්‍රමාණය වර්ධනය වීම නිසා අද බල්ලන් විසින් හපා කාලා තුවාල ලබන ප්‍රමාණය ඉතාමත් අධික වෙලා තිබෙනවා. මේ කාරණය පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයට අදාළ වනවාද නැද්ද කියන එක පිළිබඳව මට අවබෝධයක් නැහැ. නමුත් මේ පිළිබඳව අපි කටයුතු කරන්න ඕනෑයි කියන එක මම මතක් කරන්නට ඕනෑ. මොකද, විශේෂයෙන්ම මේ සඳහා උදවු කරන නොයෙක් රාජ්‍ය නොවන ආයතන සහ උදවු කරන අය සිටිනවා. විශේෂයෙන්ම Blue Paw Trust, ඒ එක්කම Human Society International, World Society for the Production of Animals සහ emBark වාගේ රාජ්‍ය නොවන ආයතන මේ සඳහා කටයුතු කරනවා.

අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන්නේ මේ රටේ මානව හිතවාදී, ඒ වාගේම නිදහස්, නිවහල් පරිසරයක ජීවත්

[ගරු වෛද්‍ය රෝහණ පුෂ්පකුමාර මහතා]

වන්න පුළුවන් මිනිස් සමාජයක් නිර්මාණය කිරීමයි. ඒ වාගේම මේ පනත, මේ රටේ ආර්ථිකයට ශක්තියක් ධෛර්යයක් දෙන, සතුන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දෙන පනතක් විධියට මම දකිනවා.

මේ පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග ඉතාමත් අගය කරමින් තව එක්තරා කාරණයක් මම මතක් කරන්න ඕනෑ. අපි කොයි තරම් අණ පනත් පාර්ලිමේන්තුවට ගෙනැවිත් සම්මත කළත් නීතිය ක්‍රියාත්මක කිරීමේදී පොලිස් නිලධාරින් මේ පිළිබඳව දැනුවත් වීමේ අඩු පාඩුවක් තිබෙනවා. ඒ නිසා මේ ගෙනෙන අලුත් අණපනත්වල; මේ ගෙනෙන නියෝගවල තිබෙන නීතිය පිළිබඳව අදාළ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වනවා නම් ඉතාමත් වැදගත් කියන එක -

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු මන්ත්‍රීතුමා, දැනට රජය විසින් ඒ කටයුතු කරනවා.

**ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)
බොහොම ස්තුතියි. ඒ ගැන කටයුතු කිරීම පිළිබඳව මම ස්තුතිවන්ත වනවා. පොලීසිය, ඒ එක්කම පශු වෛද්‍යවරුන් මේ ක්‍රියාවලිය ග්‍රාමීය මට්ටමට ගෙන යන්න කටයුතු කරනවා නම් එය ඉතාමත් වැදගත්ය කියන එක මතක් කරනවා. මේ රටේ ඉතා වැදගත් පනතක් යටතේ නියෝග ගෙනැවිත්, මේ රටේ සංවර්ධනය සඳහා දායකත්වය දරන, ඒ වාගේම මේ රටේ පෝෂණය සඳහා දායකත්වය දරන ඒ සතුන් පිළිබඳව යම් කිසි වග කීමක්, යම් කිසි හැඟීමක් ඇති කිරීමට මෙන්ම ඒ සතුන්ටත් නිදහසක්, වරප්‍රසාදයක් ලබා දෙන්න කටයුතු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

[பி.ப. 5.34]

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற விலங்குச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான விவாதத்தில் உரையாற்றுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். கிழக்கு மாகாணத்திலே மட்டக்களப்பு மாவட்டத்தில் கால்நடை வளர்ப்பு, குறிப்பாக மாடு வளர்ப்பு அதிகமாகக் காணப்படுகின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் மட்டும் ஏறக்குறைய 1,65,000 கால்நடைகள் உள்ளன. அந்தக் கால்நடைகளின் மேய்ச்சலுக்காக அங்கு காணிகள் ஒதுக்கப் பட்டிருக்கின்றன. இவ்வாறு மேய்ச்சல் தரைக் காணிகள் ஒதுக்கப்பட்டுள்ள பல பிரதேசங்களில், குறிப்பாகப் பட்டிப்பளை, வெல்லாவெளி, வவுணதீவு போன்ற பிரதேச செயலாளர் பிரிவுகளிலுள்ள காணிகளில் அத்துமீறிய குடியேற்றங்களைச் செய்வதினூடாக அங்கு கால்நடைகளை வளர்க்க முடியாத ஒரு துர்ப்பாக்கிய சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டில், மானாவாரி நெற்செய்கைக் காலத்தில் கால்நடைகளை மேய்ச்சலுக்குக் கொண்டு செல்வதற்காகவே அந்த இடங்கள் அரசாங்கத்தினால் ஒதுக்கப்பட்டிருக்கின்றன. எனினும், யுத்தம் முடிவடைந்ததற்குப் பிற்பாடு வெளிமாவட்டங்களிலிருந்து வருகின்றவர்கள் தன்னிச்சையாக அந்தக் காணிகளைப் பிடிப்பதன் காரணமாக - அத்துமீறிக் குடியேறுவதன் காரணமாக - அங்கு மாடுகளை வளர்க்க முடியாத சூழ்நிலை காணப்படுகின்றது.

தற்பொழுது, அங்கு யுத்தம் நிறைவடைந்துள்ள சூழ்நிலையில், காட்டு யானைகளின் தொல்லை காணப்படுகின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் மாத்திரம் இதுவரை யானை தாக்கி 11 பேர் மரணித்திருக்கின்றார்கள்; ஏறக்குறைய 260 வீடுகள் சேதமாக்கப்பட்டுள்ளன. இந்நிலை தொடருமாக இருந்தால், அங்குள்ள யானைகளைக் கட்டுப்படுத்த முடியாததொரு சூழ்நிலை உருவாகும். ஆகவே, யானைகளைக் கட்டுப்படுத்தவேண்டிய தேவை அங்கு காணப்படுகின்றது.

இதனைவிட, கிழக்கு மாகாணத்திலுள்ள பிரதான வீதிகளில் கால்நடைகள் - மாடுகள் - நடமாடுவதன் காரணமாக பல விபத்துக்கள் நேருகின்றன. குறிப்பாக பொலன்னறுவை - கல்முனை பிரதான வீதியில் இரவு வேளைகளிலும் அதிகாலை நேரங்களிலும் அதிகளவான மாடுகள் நடமாடுவதனால் அவை வாகனங்களில் மோதி இறக்கின்றன. கடந்த மாதத்தில் மட்டும் மன்னம்பிட்டி- வெலிக்கந்தைப் பகுதியில் ஒரு நாளைக்கு 3 மாடுகள் வீதம் இறந்ததை நாங்கள் கண்கூடாகக் காணக்கூடியதாக இருந்தது. இதனைத் தடுப்பதற்கு, அந்த இடங்களிலுள்ளவர்கள் மாடு வளர்ப்பை வேறொரு இடத்தில் மேற்கொள்ளவேண்டும் அல்லது மாடுகள் வீதிகளுக்கு வராமல் பாதுகாக்கவேண்டும். இவற்றைக் கவனத்திலெடுத்துச் செயற்படவேண்டிய கடமை அதுசார்ந்த அமைச்சுக்கு இருக்கின்றது.

இதைவிட, வன்னி மாவட்டத்தில் பல கிராமங்களில் மீள்குடியேற்றம் செய்யப்பட்டிருக்கின்றது. கடந்தகால போரின் காரணமாக விதவைகளான 89,000 பெண்கள் வடக்கு, கிழக்கில் வாழ்ந்துகொண்டிருக்கின்றார்கள். அவர்களுக்கு கால்நடை வளர்ப்புத் திட்டத்தின்கீழ் மாடுகளை வழங்குகின்ற ஒரு நடைமுறை காணப்படுகின்றது. எனினும், மீள்குடியேற்றம் செய்யப்பட்ட பல விதவைகளுக்கு அத்திட்டத்தினூடாக மாடுகளை வழங்குகின்ற எந்தவொரு செயற்பாடும் இதுவரையில் மேற்கொள்ளப்படவில்லை.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
You can make a request, then we can look into that.

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
Okay, I will do that.

பொதுவாக நாங்கள் பேசுகின்றபொழுது, மிருகங்களுக்கு ஐந்தறிவு என்றும் மனிதர்களுக்கு ஆறறிவு என்றும் கூறுகின்றோம். நாங்கள் நன்றி செலுத்துகின்ற பண்பை நாயிடமிருந்து கற்றுக் கொள்ளவேண்டும் என்றதொரு கருத்து காணப்படுகின்றது. ஆனால், இக்கருத்துக்கு முரணான சில கருத்துக்களையும் நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. நாய் நன்றியுள்ள ஒரு மிருகம்! யாருக்கு நன்றியுள்ள மிருகம்? மனிதனுக்குத்தான் நாய் நன்றியுள்ள மிருகமாக இருக்கின்றதே தவிர, ஒரு நாய் இன்னுமொரு நாய்க்கு நன்றியுள்ள மிருகமாக இல்லை. அதேபோல்தான் மனிதனும் இன்னொரு மனிதனுக்கு நன்றியுடையவனாக இல்லை. எனவே, நாங்கள் நாயிலிருந்து நன்றி செலுத்துகின்ற பண்பைக் கற்றுக்கொள்கின்றோம் என்று பழமையைக் கூறிக் கொண்டிருப்பது எல்லாத் தருணங்களிலும் பொருத்தமான ஒரு விடயமாக இருக்கமுடியாது. இன்று வடக்கு, கிழக்கிலுள்ள மக்கள்

சுதந்திரமும் உரிமைகளும் இல்லாத ஒரு சமூகமாக வாழ்ந்துகொண்டு இருப்பதற்கும் கடந்த 61 வருடங்களாக மனிதருக்குள் இருந்த மிருகக் குணங்கள்தான் காரணமாக இருக்கின்றன. மனிதன் மனிதனுக்குரிய குணங்களை உடையவனாக இருந்திருந்தால் வடக்கு, கிழக்கில் வாழ்ந்த மக்களாகிய நாங்கள் நிச்சயமாகச் சுதந்திரமாக வாழ்ந்திருப்போம் என்பதை விலங்குகள் சம்பந்தப்பட்ட இந்த விவாதத்தில் கூற வேண்டியிருக்கிறது. ஏனெனில் கடந்த காலங்களில் இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்த அரசாங்கங்கள் வடக்கு, கிழக்கிலுள்ள தமிழர்களாகிய எங்களை மிருகங்களைப்போன்று நடத்தியதன் காரணமாகவும் மிருகத்தன்மையுடன் நடந்துகொள்வதனாலும்தான் நாங்கள் தொடர்ச்சியாகச் சுதந்திரமின்றி வாழ்ந்து கொண்டிருக்கின்றோம். ஆகவே, இனிமேலாவது வடக்கு, கிழக்கிலுள்ள தமிழர்கள் மிருகங்களல்ல, அவர்களும் மனிதர்கள்தாம்; அம்மக்களுக்குரிய உரிமைகள் வழங்கப்பட வேண்டும் என்ற கொள்கையை இந்த அரசாங்கம் கடைப்பிடிக்குமாயின், அது கூறுவதைப்போன்று, இந்த நாட்டிலே எல்லோரும் நிச்சயமாக ஒன்றிணைந்து ஒற்றுமையாக வாழக்கூடிய சூழ்நிலை ஏற்படும் என்பதையும் இச்சந்தர்ப்பத்திலே நாங்கள் சுட்டிக்காட்டவேண்டியவர்களாக இருக்கின்றோம்.

வடக்கு, கிழக்குப் பிரதேசத்திலிருந்து குறிப்பாக வன்னி மாவட்டத்திலிருந்து மக்கள் பல விதமான இன்னல்களுக்கு மத்தியில் இடம்பெயர்ந்தபொழுது பல இலட்சம் பெறுமதியான கால் நடைகளை இழந்திருக்கிறார்கள். இன்று அம்மக்கள் அந்தக் கால்நடைகளுக்கு என்ன நடந்தது என்றுகூடத் தெரியாத நிலையிலே இருக்கின்றார்கள். வன்னிப் பிரதேச மக்களுடைய சொத்துக்களாகிய கால்நடைகள் - ஆடு, மாடுகள் - அங்கிருந்து வாகனங்களில் ஏற்றப்பட்டு வெளிமாவட்டங்களுக்குக் கொண்டு சென்று இறைச்சிக்காகவும் வேறு வகையிலும் விற்பனை செய்யப்படுவதாகவும் இதன் பின்னணியில் சில அமைச்சர்கள் செயற்படுவதாகவும் நாங்கள் அறிகிறோம். இது சம்பந்தமாக நாங்கள் இன்று மட்டுமன்றி இதற்கு முன்பும் பல கூட்டங்களில் பேசியிருக்கின்றோம். வன்னிப் பிரதேச மக்கள் அங்கு மீள்குடியேற்றப்பட்டிருக்கின்றார்கள். ஆனால் அவர்களுக்குத் தேவையான பொருளாதார வசதிகள் வழங்கப்படவில்லை. அப்பிரதேச மக்கள் தமது வாழ்க்கையைக் கொண்டு நடத்துவதற்காக கால்நடைகளை, கோழிகளை வளர்த்தார்கள். ஆனால், இன்று அம்மக்களுக்கு எந்தவொரு கால்நடையும் வழங்கப்படவில்லை என்ற செய்தி வெளிவந்துள்ளது. இது ஒரு பரிதாபகரமான நிலைமையாகும். ஆகவே, விலங்குச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள இவ்வேளையில் இதனைக் கவனத்திலெடுத்து அம்மக்கள் இழந்த பொருளாதாரத்தை மீளளிப்பதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அதேவேளையில், நான் ஏற்கெனவே கூறியதைப்போன்று வன்னிப் பிரதேசத்தில் யானைகளின் தொல்லை அதிகரித்துள்ளது என நாங்கள் தொடர்ந்து சுட்டிக்காட்டி வருகின்றோம். அந்த யானைகளைக் கட்டுப்படுத்துவதற்காக மின்சார வேலிகள் அமைக்கும் திட்டம் ஏற்படுத்தவிருப்பதாக அரசாங்கம் அறிவித்துள்ளது. ஆனால் அவ்விதம் யானைகளுக்காக மின்வேலிகளை அமைப்பதனால் கால்நடைகள் அவ்வேலிகளில் சிக்கி இறக்கக்கூடிய அபாயநிலை தோன்றக்கூடும். ஆகவே, யானைத் தொல்லையிலிருந்து மக்களைக் காப்பாற்றுவதற்குப் பொருத்தமான, முறையான ஒரு செயற்றிட்டத்தை ஏற்படுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

எனக்கு முன்னர் பேசிய உறுப்பினர் விசர் நாய்க்கடி தொடர்பாகத் தெளிவாகக் குறிப்பிட்டிருந்தார். இப்பொழுது காலநிலை மாற்றத்தின் காரணமாக வடக்கு, கிழக்கிலுள்ள பல பிரதேசங்களிலே விசர் நாய்கள் பரவலாக அலைந்து திரிகின்றன. ஏற்கெனவே இராணுவ முகாம்களைச் சுற்றியுள்ள பகுதிகளில் திரிந்த நாய்கள் இப்பொழுது மக்களின் மீள்குடியேற்றத்தைத் தொடர்ந்து மக்களை நோக்கிப் பாய்கின்ற நிலைமை காணப்படுகின்றது. ஆகவே, அவ்விசர் நாய்களை அகற்று வதற்கான திட்டத்தைப் பாரியளவில் மேற்கொள்ள வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன். பல ஆண்டுகளுக்கு முன்பு விசர் நாய்களைக் கொன்றழிக்கும் திட்டம் இருந்தது. ஆனால், இப்பொழுது அமுலிலுள்ள சட்டத்தின் பிரகாரம் அந்த நாய்களையும் கொல்ல முடியாது. இப்பொழுது நாய்களைக் கொல்லும் திட்டத்துக்குப் பதிலாகத் தமிழர்களைக் கொல்லும் திட்டம் அமுலிலுள்ளது. இந்த நாட்டில் பயங்கரவாதத்தை அழித்த இந்த அரசாங்கத்துக்கு விசர் நாய்களைக் கொல்வது என்பது கஷ்டமான செயலல்ல. ஆகவே, இந்த விசர் நாய்களைக் கொல்வதற்கு உரிய நடவடிக்கைகள் எடுப்பது உகந்ததெனக் கேட்டு, இந்தச் சந்தர்ப்பத்தை வழங்கிய தலைமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[අ. භා. 5.43 ]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, it is very appropriate for me to make certain comments on these important Regulations presented by the Hon. Minister of Livestock and Rural Community Development. I think this House would definitely give its approval for the Regulations under the Animals Act.

எனக்கு முன்னர் பேசிய உறுப்பினர் கூறியதைப்போன்று இந்தச் சபையிலே மிருகங்கள், மிருகங்களைப் பற்றிப் பேசுகின்றன. ஆச்சரியப்படாதீர்கள்! ஐந்தறிவு படைத்த மிருகங்களைப் பற்றி ஆறறிவு படைத்த மனிதன் பேசக்கூடிய நிலைமை இங்கு ஏற்பட்டுள்ளது. ஆகவே, ஆறறிவு படைத்த மனிதன் ஐந்தறிவு படைத்த மிருகங்களையும் பட்சிகளையும் ஏனையவற்றையும் காப்பாற்ற வேண்டிய கடப்பாடுடையவனாக இருக்கின்றான். அந்தக் கடமையைப் புரிவதற்காகத்தான் இச்சபை இந்த ஒழுங்குவிதிகளுக்கான உங்களின் சம்மதத்தைக் கோரி நிற்கின்றது. இந்த நாட்டில் கால்நடைகள் பரவலாக உள்ளன. அந்தக் கால்நடைகள் பல தேவைகளுக்காகப் பயன்படுத்தப் படுகின்றன.

අපි දන්නවා ජේවීපී භීෂණය පැවති කාලයේදී හරකුන්, එළදෙනුන් ආදී සතුන් වාගේම කැලෑවල සිටි සත්තුත්, ගෙවල්වල , ඉඩම්වල සිටි සත්තුත් මරලා කෑවාය කියන එක. ඒක ඉතිහාසයට එක් වුණු පරිච්ඡේදයක්. ඒක නිසා අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මේ ගැන කතා කරනකොට මට පුදුම හිතුණා. එතුමා කියනවා සත්ව ගහනය වර්ධනය කරන්න ඕනෑලු. ජේවීපී භීෂණය පැවති යුගය එහෙම පිටින්ම සත්තු නැති කරපු යුගයක් කියන එක අපි මේ සභාව තුළින් රටට හෙළි කරන්න ඕනෑ. නැගෙනහිර ප්‍රදේශයේ වෙංකලඩියේ සිට මහඔය දක්වා සැතපුම් 30ක 40ක පමණ ප්‍රදේශයේ හිටපු සත්වයන් ඔක්කෝම එදා ජේවීපියෙන් සහ ඊට පසු එල්ටීටීඊ කොටින් විසින් මරා ගෙන කෑවා. එරාවුර් සහ අනිකුත් ප්‍රදේශවල ඒ ගොවිපොළවල ගොවිතැන් කරන්න ඒ ගොල්ලට ඉඩක් තිබුණේ නැහැ. සත්වයන් පමණක් නොවෙයි මිනිස්සුත් මැරුවා.

அங்குள்ள மக்கள் தமது காணிகளிலே விவசாயம் செய்ய முடியாது. இந்த நாட்டிலே மனிதர்களை மாத்திரமன்றி மிருகங்களையும் அழித்தொழித்த - மாக்களை மட்டுமல்ல மக்களையும் கொன்றுகுவித்த - பயங்கரவாத யுகம் ஒன்று தெற்கிலே JVP என்னும் போர்வையிலும் வடக்கிலே புலி என்னும்

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

போர்வையிலும் இருந்தது உங்களுக்குத் தெரியும். ஏறாவூரில் இருந்த எழுத்தாளரும் கவிஞருமான எங்களுடைய அன்புக்குரிய நண்பர் யூ.எல்.தாவூத் அவர்கள் எங்குபோய் மறைந்தார் என்பது இன்றுவரையில் எவருக்கும் தெரியவில்லை. அந்த இருண்ட யுகம் இப்பொழுது முடிவடைந்துவிட்டது. ஆகவே, அதனைப்பற்றி எவரும் அலட்டிக்கொள்ளத் தேவையில்லை. அந்தப் பயங்கர சூழலிலிருந்து, இந்த நாட்டை மீட்டெடுத்து சுதந்திர வாடை எங்கும் வீசக்கூடிய நிலைமையை மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் உருவாக்கியிருக்கிறார். இதனை இச்சபையில் அமர்ந்திருக்கின்ற எமது அன்புக்குரிய நண்பர் அடைக்கலநாதன் அவர்களும் மறுப்பின்றி ஏற்றுக்கொள்வார் என்பது எனக்கு நன்றாகத் தெரியும்; அவருடைய அழகான புன்சிரிப்பிலிருந்து எனக்கு அது விளங்குகிறது. கௌரவ உறுப்பினர் சரவணபவன் ஐயா அவர்களே! நீங்கள் மிருகங்களைக் காப்பாற்றுவதற்காகச் சரணாலயங்களை அமைத்து அரசாங்கத்துக்கு உதவி செய்ய வேண்டும்.

நாடு கடந்து சென்றவர்கள் இன்று இங்குள்ள மக்களின் மனித உரிமைகளைப் பற்றியும் அவர்களின் உரிமைகள் மீறப்பட்டதாகவும் பேசுகின்றார்கள். வன்னியில் இருந்த இரண்டு இலட்சத்து அறுபதாயிரம் பேர் வரையிலான மக்கள் மிருகங்களை விடவும் மோசமாக நடத்தப்பட்டு, அடித்துத் துரத்தப்பட்டுப் பின்னால் இருந்து சுடப்பட்டார்கள்.

Two hundred and sixty thousand people escaped from the LTTE and ran away to safe areas. The security forces led by our great, gallant soldier, Mr. Gotabhaya Rajapaksa saved them.

Technical colleges and other educational centres have been established in those areas. Vast amount of development is taking place in those areas daily. The Mahinda Rajapaksa regime has ensured not only the right of the man but also the right of the animal. This must be borne in mind. அம்மக்களைப் பயங்கரவாதப் புலிகள் கொன்றபொழுது மனித உரிமை மீறப்படவில்லையா?

Where were the human rights activists in the worlds when people were chased away and killed by the bayonet of the Tigers? What were the people who are now fighting for the human rights in the world doing then? These questions must be asked from all conscious and right-thinking people. What is happening across the Palk Strait is politics. Let them do their politics; Hon. Saravanapavan, let us do our politics together here in order to revive the society, relocate the people and give them habitable places, make them educated, build hospitals and roads for them and give them electricity. All those things are done under the "Mahinda Chintana." 'வடக்கின் வசந்தம்'! முழு நாட்டையும் தழுவி வீசிக் கொண்டிருக்கின்றது அந்த வசந்தம்! 'மஹிந்த சிந்தனை'யின் அடிப்படையிலே கோடானுகோடி ரூபாய் அங்கே - வடக்கு, கிழக்கில் - செலவழிக்கப்படுகின்றது, அபிவிருத்திகளுக்காக.

நான் நேற்று முன்தினம் பி.பி.சி. சேவைக்கு ஒரு பேட்டியளித்தேன். I gave an interview to the BBC. In that I produced all these three books, "Mahinda Chintana" written in English, Tamil and Sinhala. Also, there is a book written in Tamil for the first time, "Mahinda", written by our good friend, Mr. S. Thilainathan. எங்களுடைய முஸ்லிம் மாணவ, மாணவிகள் இங்கே திரளாக பார்வையாளர் கலரியில் அமர்ந்திருக்கின்றார்கள். அவர்களும் இந்தப் புத்தகத்தைப் படிக்க வேண்டும். இலங்கையின் சகல பாடசாலைகளுக்கும் இது வழங்கப்படும். A comprehensive book written for the first time on the life and deeds of His Excellency President Mahinda Rajapaksa is now out and it will be issued to schools, libraries and other places. I quoted "Mahinda Chintana" for the BBC, and described it as our *Magna Carta.* I quote:

"Blending all your thoughts
Develop man towards preserving the family
Develop family towards preserving the village
Develop village towards preserving the country
And develop country to win the world."

This is what "Mahinda Chintana" states in Sinhala:

"ඔබ සැමගේ සිතුවිලි කැටිකොට
මිනිසා ගොඩ නඟා පවුල රකින්නටත්
පවුල ගොඩ නඟා ගම රකින්නටත්
ගම ගොඩ නඟා රට රකින්නටත්
රට ගොඩ නඟා ලොව දිනන්නටත් ...."

මොන තරම් අලංකාර, සාහිත්‍යමය රසයෙන් යුත් වචන මාලාවක්ද කියලා කියවලා බලන්න. When I read this out to the BBC interviewer, he was surprised and said, "So far nobody has told us what the contents are". This is not only an Election Manifesto, but it is a philosophy of a President who thinks well about his countrymen, his citizenry.

"Mahinda Chintana" is also a development manifesto. This is the *Chintanaya* that unites Sri Lanka. This is the *Chintanaya* that fights against all the foreign forces in this country, all the conspirators who try to destabilize the country, whether they are here or abroad. Some of the people in the Opposition - I do not want to name them -

බලන්න, අද අප සත්වයන් ගැන කථා කරනවා. එක සත්වයෙක්වත් නැහැ විරුද්ධ පක්ෂයේ; එක්සත් ජාතික පක්ෂයේ. කකුල් දෙකේ සත්වයින් එක් කෙනෙක්වත් නැහැ මේ ගරු සභාවේ. අපිත් සත්වයෝ. අපිට සත්තුන්ට වඩා, මංගයන්ට වඩා එකක් වැඩියෙන් තිබෙනවා; ඥානයක් තිබෙනවා. ඒකයි අපට මනුෂ්‍ය සත්වයෝ කියලා කියන්නේ. කොහේද ඔවුන් ගිහින් තිබෙන්නේ? අන්න ගිහිල්ලා බෝඩ් අල්ලා ගෙන කෑ ගහනවා ලු. අපි දන්නේ නැහැ මොකටද, කාටද කියලා. විදේශීය බලවේගයන්ට, විදේශීය කුමන්ත්‍රණකරුවන්ට මේ රට පාවා දීමට නේද මේ ගොල්ලන් මේ අර අදින්නේ? ඒකට අපිට ඉඩ දෙන්න බැහැ. මේ රට අපි බේරා ගත්තා. ඒ නිසා මේ රටේ සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර්, මැලේ, බෝරා, මෙමන් යන සියලු ජාතීනුත්, කේරළයේ ඉඳලා ආපු අයත්, මධ්‍යම කඳුකරයේ වාසය කරන අයත් කවදාවත් ඉඩ දෙන්නේ නැහැ මේ රට බෙදන්නට. ඒක නිසා මම අර වෙලපහින් කිව්වා වාගේම, විරුද්ධ පක්ෂයේ නායකතුමාට ආරාධනා කරනවා. He knows the world condition. This is a very crucial time for Sri Lanka. It is the development we are trying to achieve. We are trying to make a wonderful Sri Lanka for the future generations. Therefore, he must join hands with the President in order to develop this country. This is his country and my country. If we get together, there will be a beautiful and united Sri Lanka for us to live happily.

இன்னொரு விடயத்தையும் நான் சொல்ல வேண்டும். அதாவது மிருக வதையை இஸ்லாம் தடை செய்கின்றது. அந்த முக்கியத்துவத்தைப் பற்றி நான் இங்கு பேச வேண்டும்.

සතුන්ට හිංසා කිරීම ගැන ඉස්ලාම් ධර්මය සහමුලින්ම විරුද්ධයි. ඒක ශුද්ධ වූ කුරාණයේත් තිබෙනවා; නබි නායකතුමාගේ වදන්වලත් තිබෙනවා. එක නිදසුනක් මම කියන්නම්. එක ස්ත්‍රියක් පූසෙකුට ගැහුවා; තැළුවා; පෙළුවා. එයා

මරණීන් මතු යන්නේ නිරයටයි කියලා කිව්වා. තවත් සුනඛයෙක් ළිඳකට වැටුණාම කොහොම හරි ඒ සුනඛයාව ළිඳෙන් ගොඩට අරගෙන තමන්ගේ සාරි පොටින් වතුර ටිකක් අරගෙන ඒ සුනඛයාට පොවලා ඌට ජීව දානය දුන්නා. එයා යනවා ස්වර්ගයට. මෙන්න මේකයි ඉස්ලාම් ධර්මය, අපේ නබි නායකතුමා කිව්වේ ඒකයි. නමුත් එකක් තිබෙනවා, எங்களுடைய இஸ்லாமிய முறைப்படி நாங்கள் பெருநாள் தினங்களிலே குறிப்பாக ஹஜ் பெருநாள் தினங்களிலே *குர்பானி - உள்ஹிய்யா* கொடுக்க வேண்டும். அந்தக் காலப் பகுதியில் குறித்த கால்நடைகள் வாகனங்களில் அங்குமிங்கும் ஏற்றிச் செல்லப்படும்.

This morning we discussed this matter at the Consultative Committee presided over by the Hon. Arumugan Thondaman. The Hon. M.L.A.M. Hisbullah and the Hon. Mohamed Aslam were also present. I am very happy that the authorities concerned have now issued certain circulars to the police and about the precautions they have taken. The circulars are in regard to how many animals could be taken in a vehicle, prohibition of their torture, and issuance of medical certificates as to the health of the animals. Yes, according to Islam, you must have healthy animals, not sick animals. That is specific as far as the Qurbani Law is concerned. The Hon. A.H.M. Fowzie, our senior Minister, is here. Once, he was in charge of the Muslim Affairs in this country. He knows it well. I brought to the notice of the Hon. Minister that bringing Regulations is one thing, but when these animals are transported, it is well and good if we see to the safety of the animals and that they are not tortured. அவற்றுக்கு வதை கொடுக்கக்கூடாது. හිංසා ඇති කරන්නට නරකයි. "මේ වාහනයේ මෙන්න මෙච්චරයි ගෙන යන්නට පුළුවන් - this lorry or the transporting vehicle can transport only this number of animals or cattle, not beyond that" කියලා රෙගුලාසි සකස් කර තිබෙනවා. We accept that. Therefore, we are very happy that the Ministry has prepared those guidelines and given to the police stations but what happens in certain areas is, there is always mischief makers. People are harassed. They have to obtain the medical certificate, the Grama Sevaka certificate, the Divisional Secretary's certificate and all that. All those should be complied with by whoever who wants to transport animals. We agree with that, but harassment should not be there.

The police have been very helpful to us. I remember, Sir, the other day, the Hon. Basil Rajapaksa had a conference in which the former IGP, Dr. Mahinda Balasuriya, the Hon. A.H.M. Fowzie and the Governor, Mr. Alavi Moulana and all of us participated. There, the Hon. Basil Rajapaksa gave certain instructions because the Constitution guarantees us our religious freedom. According to that, "*Qurbani, Ulhiyya"* has got to be given by the Muslims and there should not be any sort of impediment to that. Strict instructions must be given to Police regarding this matter of transporting animals for *Qurban*.

Sir, there is another matter. There is a copy of a flag that has been sent to me by some farmers from Jaffna, which says, "මැයි 27 ජාතික රණවිරු සැමරුම" - "National War Heroes Memorial" - "මව්බිමේ විරුවනට ජාතියේ උත්තමාචාරය!" Now, this flag is being sold in schools as well in Jaffna. But, there is no Tamil in that. Earlier, I said in this House that a paper was given to me by a well-known journalist, Mr. Puththirasigamoney, one of your friends, Hon. Saravanapavan. That is about *Bismillahir Rahmanir Raheem.* That is a different thing. This was given to me by another senior journalist, Mr. F.M. Fairoos. I am thankful to him. I have brought that to the notice of the Minister of Buddha Sasana and Religious Affairs. Sir, they asked me to inform the Government. I spoke to the Defence Secretary, Mr. Gotabaya Rajapaksa. He was surprised that such a flag has been printed only in Sinhala and English in Jaffna. Straightaway, he ordered withdrawal of this. That is the way our Leaders who understand - he did not know that this has happened - and respect the Tamil culture and the Tamil community act. Our President has gone down in history that on behalf of the 70 million Tamils living in this world, the only person who spoke in Tamil in the United Nations is none other than His Excellency Mahinda Rajapaksa, our dear President. This is the way that he treats the Tamils and the Tamil language. We may have certain difficulties about journalists in the North. He is looking after all those things. He is very friendly with you, Hon. Swaminathan. He is friendly with all the journalists. Which leader of a country would invite journalists to have breakfast with him every month at his official residence? It is done only by our President Mahinda Rajapaksa.

Therefore, Sir, I an happy to say that this has been corrected and timely action has been taken. On behalf of the Tamil-speaking people, I thank Mr. Gotabaya Rajapaksa and also my good friend, Mr. Puththirasigamoney who brought this to our notice through certain farmers of the Northern Province. - [*Interruption.*] Yes, of course, the Hon.. Saravanapavan has all the right to interrupt me. Hon. Saravanapavan, I will give way.

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

A letter was sent by the Ministry in charge of the Tamil language. But, the entire letter is in Sinhala. I bring that matter to your kind notice.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Please do that. We will bring that to the notice of the higher authorities once again and definitely attend to it.

Sir, the Medical Research Institute has recommended that an individual must consume about 100 millilitres of milk per day. See, how much of attention His Excellency the President is paying to these matters; he is definitely

[ ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

receptive to the needs and requests of the people. He promised, in the last Budget, that the price of a litre of liquid milk would be increased to Rs. 50. So, if the JVP, without killing cattle, rear about 50 cows or produce about 50 litres of milk per day, they will earn about Rs. 5,000 a day. They can definitely increase their income if they could rear about 100 cattle. So, let them do that instead of killing four-footed animals and double-footed human beings; let them rear these cattle and earn a good income.

Also, I would recommend to the Hon. Leader of the Opposition and the others in his rank to have a good cup of milk daily. හොඳ කිරි වීදුරුවක් බොන්න. ඒක හොඳයි. That is very good, Sir.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have two more minutes.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අපේ සජිත් ප්‍රේමදාස මහත්තයා පෝෂණය ගැන ප්‍රශ්න අහනවා. ඔන්න පෝෂණයට ජනාධිපතිතුමා දීලා තිබෙනවා, උත්තරය; උදවු කරලා තිබෙනවා; මුදල් දෙනවා. හොඳට බීලා පෝෂණය වෙන්න. එතකොට හොඳට, Hon. Leader of the Opposition එක්ක ගහ ගෙන, මොනවා හෝ කර ගන්න පුළුවන්. ඕනෑම දේයකට ශක්තිය එපායෑ.

බලන්න මේ ගරු සභාවේ විපක්ෂයේ එක් මන්ත්‍රීවරයෙක්වත් නැහැ. මොකක්ද මේ කරන කෝළම? ජාතික බලවේගයන්ට අපේ රට පාවා දෙන්න නේද මේ හදන්නේ? අද පාරේ යන්න පුළුවන්ද? මම අහනවා, මෙන්න මෙය. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ එතුමාගේ හෙංචයියලාට මහ පාරේ උද්සෝෂණයක් කරන්න පුළුවන්ද? කොටින්ගෙන් -එල්ටීටීඊ ත්‍රස්තවාදින්ගෙන්- මේ රට බේරා ගත්තේ නැත්නම් අද පාරට බහින්න පුළුවන්ද? උද්සෝෂණය කරන්න පුළුවන්ද? කෑ ගහන්න පුළුවන්ද? මෙතැනට ඇවිල්ලා ජේවීපී එකේ අයට කථා කරන්න පුළුවන්ද? ඒ ගොල්ලන් අද ජීවතුන් අතර ඉන්නවාද කියන එක ප්‍රශ්නයක් නේද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා මම එතුමන්ලාට කියනවා, මේ වාගේ කෝළම් නටන්න එපා; ලංකාව කෝළම් මඩුවක් නොවෙයි; ඉතාමත්ම ලස්සන රටක් කියලා. එදා අගමැතිතුමා කිව්වා වාගේ අපි විදේශ රටවලට ගියාම අපට හැම රටේම ප්‍රසාදය තිබෙනවා. ඔවුන් කියනවා, “Mahinda Rajapaksa, what a great man! - Sri Lanka, what a beautiful country! We like to go there over and over again” කියලා. Therefore, Sir, ස්වයංපෝෂිත රටක් හැදීම පිළිබඳ නියෝග ඒ කියන්නේ, කිරිවලින් පෝෂිත වූ රටක් හැදීම පිළිබඳ නියෝග අද ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකට ගරු සභාවේ අනුමැතිය ලැබෙනවාය කියන එක අපි හොඳාකාරවම දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ පිළිතුරු කථාව අවසන් කරනවා. Thank you.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர் )
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)
Mr. Presiding Member, I move, "That this Parliament do now adjourn."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## මත්ස්‍ය සම්පත ආරක්ෂා කර ගැනීම
## கடல்சார் வளங்களைப் பாதுகாத்தல்
## CONSERVATION OF FISHERIES RESOURCES

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனி)
(The Hon.Victor Antony)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අප රට වටා ඇති මුහුද තුළින් අප රටේ මුළු ආර්ථිකය ගොඩගත හැකිය යන චින්තනය, දර්ශනය අතිගරු ජනාධිපතිතුමා ධීවර අමාත්‍යවරයාව සිටි කාලයේ කළ ප්‍රකාශයක් වන අතර, එය එතුමාගේ චින්තනයකි.

ඒ අනුව ධීවර සම්පත් ප්‍රවර්ධනය කිරීම් සහ ධීවර ජන ජීවිතය නඟා සිටුවීම සඳහා එතුමා විසින් ආරම්භ කළ දේ බොහෝය.

වර්තමානයේ එතුමාගේ චින්තනය සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීම මහජන නියෝජිතයින් වශයෙන් අපගේ බාරදූර වග කීමකි.

විවිධ විනාශකාරී ක්‍රම හා ක්‍රියාවන් නිසා වඳ වී යන මත්ස්‍ය ප්‍රජනනය නැවත සකෘතිමත් කිරීම සඳහා ප්‍රජනන මධ්‍යස්ථාන හා කලාප වෙන්කර ආරක්ෂා කර පවත්වා ගැනීමත්, විනාශ වී ඇති ඉස්සන් වගාවට යොදා ගෙන ඇති ඉස්සන් කොටු වෙනත් මත්ස්‍ය වර්ග ඇති කිරීම සහ ජලජ පැලෑටි පිළිබඳ සමීක්ෂණය, අධීක්ෂණය කර ඒවා අප රටේ ආර්ථික ඵලදායිතාව ගොඩනඟා ගැනීම සඳහාත් අවශ්‍ය කටයුතු කර දීමට ගරු අමාත්‍යතුමාගේ මැදිහත්වීම හා අවධානය යොමු කර කටයුතු කර දෙන ලෙස යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලංකාව වටේම මුහුද තිබෙනවා. ඒ වාගේම ලංකාව පුරාම වැව් තිබෙනවා. කොහොමද මාළු හිඟයක් ඇති වෙන්නේ කියන ප්‍රශ්නය අද අපි කවුරුත් අහන ප්‍රශ්නයක්. තවමත් කරවල පිට රටින් ගෙන්වනවා. ටින් මාළු ගෙන්වනවා. අපි විධිමත්ව, සැලසුම් සහගතව ධීවර කටයුතු කරනවා නම්, අතිගරු ජනාධිපතිතුමා ධීවර අමාත්‍යවරයාව සිටි කාලයේ කිව්වා වාගේ -එතුමාගේ චින්තනය අනුව- අප රට වටා ඇති මුහුද තුළින් අපේ රටේ මුළු ආර්ථිකය ගොඩනඟා ගත හැකිය කියන තැනට අපට එන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. අද, එතුමා එවැනි චින්තනයක්, දර්ශනයක් ප්‍රකාශ කිරීමක් විතරක් නොවෙයි එය හරියටත් ක්‍රියාත්මකත් කළා. මැත මුහුදේ මාළු නොවෙයි ඈත මුහුදේ මාළු වෙරළට ගෙනෙන්න ඕනෑය කියන පදනම මත එතුමා තමයි වැඩිම වශයෙන් බහුදින ධීවර යාත්‍රා මේ රටට ගෙනාවේ. ඒ වාගේම ධීවර ජන ජීවිතය ශක්තිමත් කිරීමට, විශේෂයෙන්ම ධීවර ගම්මාන, ඉදිවර බැංකු, ඒ වාගේම විසිරි ධීවර නිවාස යෝජනා ක්‍රමය, නාවික හා පුහුණු ආයතනය, ෆයිබර් පුහුණුව වැනි දේවල් ධීවර ජනතාවට ලබා දුන්නේ එතුමායි.

එමෙන්ම විශ්ව දැනුමක් ධීවර දරුවාට ලබා දෙන්න ඕනෑ කියලා සාගර විශ්වවිද්‍යාලයක් ආරම්භ කළේත් එතුමායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට හිතා ගන්න පුළුවන් ධීවර අමාත්‍යතුමා වශයෙන් හිටපු කෙටි කාලයේ එතුමා ලස්සන සැලසුමක් අනුව මොන තරම් වැඩ කොටසක් කළාද කියන එක.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර නිශ්ශබ්ද වන්න. කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SHANTHA BANDARA *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ස්‍යයන් වඳ වී යෑමේ විනාශයට ප්‍රධාන හේතුව මොකක්ද? ඒ සඳහා බලපා තිබෙන විවිධාකාර කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම බලපා තිබෙන්නේ මත්ස්‍ය ප්‍රජනන මධ්‍යස්ථාන විනාශ වීමයි. අනෙක් කාරණය තමයි මත්ස්‍යයන් නෙළා ගැනීමේ අවිධිමත් ක්‍රම තහනම් දැල් ක්‍රම නිසා අපට සිද්ධ වෙලා තිබෙන හානිය. අද විශාල මාළු හිඟයක් තිබෙනවාය කියන කථාවක් තිබෙනවා නම් ඊට හේතුව වශයෙන් අපට උපුටා දක්වන්න පුළුවන් උලුප්පා දක්වන්න පුළුවන් කාරණය ඒක තමයි. විශේෂයෙන්ම ලයිලා දැල්, කුඩු දැල්, තල්ලු දැල්, බල්ලො දැල්, මාලා දැල් වාගේ මාළු අල්ලන නොයෙකුත් දැල් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තහනම් දැල්වලින් මොනවාද වෙන්නේ? සාමාන්‍යයෙන් මාළුන්ගේ ප්‍රජනන ක්‍රියාවලියක් තිබෙනවා. මෝය කට ආශ්‍රිතව පැටවුන් දැමීම, එහෙම නැත්නම් බිත්තර දැමීම සමහර මත්ස්‍යයන් විසින් කරනු ලබනවා. එය එම මත්ස්‍යයන්ගේ ප්‍රජනන ක්‍රියාවලියේ එක්තරා ස්ථානයක්. කලපුව හුඟක් දුරට මඩ සහිතයි. මෝය කටෙන් ඇතුළු වන මව් සතා පැටව් දමනවා; එහෙම නැත්නම් බිත්තර දමනවා. ඇතැම් මව් සතුන්ට පැටවුන් බලා ගන්න ක්‍රමයක් නැහැ. බිත්තර දැම්මා; පැටවුන් දැම්මා; නැවත වරක් මුහුදට ගියා. කුඩා කීටයන් වශයෙන් ඇති වන ඒ සතුන් කඩොලානවල තිබෙන පාසි, පෙඳ කාලා ඇසිත්තො වෙනවා. ඇසිත්තො ඇඟිල්ලෝ වෙලා ඊට පස්සේ තමයි මුහුදට හා විවිධ පළාත්වලට ගලා ගෙන යන්නේ. අද තහනම් දැල්වලින් මොකක්ද වෙලා තිබෙන්නේ? විශේෂයෙන්ම තල්ලු දැල්, කුඩු දැල් කියන ඒවා භයානක දැල් ක්‍රම. ඒ මඟින් මඩේ තිබෙන මාළු පාත්ති ටික සේරම සූරා ගෙන යනවා. ඒ වාගේම කකුළු පාත්ති විනාශ වෙලා යනවා. බිත්තර විනාශ වෙලා යනවා. ඉතින් මෙවැනි ක්‍රම නිසා මාළු හුඟක් අඩු වෙනවා. පසු ගිය කාලයේ අපට දකින්න, අහන්න ලැබුණා රටේ විශාල මාළු හිඟයක් තිබුණාය කියන එක. මේක තමයි ඇත්තම තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කඩොලාන කියන එක ආරක්ෂා කරන්නේ නැතිව බැහැ. කඩොලාන ආරක්ෂා කරලා ඒ මාළුන්ගේ ප්‍රජනන ක්‍රියාවලියට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් ඒක ඉතාම වැදගත් කියන එකයි මා මේ අවස්ථාවේ මතක් කරන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම අප අද මීරිදිය, කිවුල් දිය, කරදිය සම්බන්ධයෙන් අත් හදා බැලීම් කළ යුතුයි කියන එකයි මගේ අදහස. එය දැනටම කරනවා. අපේ ගරු අමාත්‍යතුමා විශාල වැඩ පිළිවෙළක් ගෙන යනවා. මේ සියලුම සතුන් ප්‍රජනනය කිරීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීම ඉතාම වැදගත්. මිරිදියේ, කිවුල් දියේ, කරදියේ මාළු බෝ කරනවා වාගේම කරදියේ මාළු කිවුල් දියේ මාළු මිරිදියට හුරු කරන්නත්, මිරිදියේ මාළු කරදියට හුරු කරන්නත් පුළුවන්කමක් තිබෙනවා නම් -එසේ පුරුදු පුහුණු කරන්න පුළුවන් නම්- බොහොම හොඳයි. මේවා පසු ගිය කාලයේ අත් හදා බලපු දේවල්. මේවා නැවත ප්‍රවර්ධනය කිරීමක් කරන්න පුළුවන් නම් අපට හොඳ ධීවර සම්පතක් නෙළා ගන්න පුළුවන් වේවි කියලා මම හිතනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අවිධිමත් ඉස්සන් කොටු ගණනාවක් තිබෙනවා. අවිධිමත් ක්‍රමය නිසා විනාශ වෙච්ච ඉස්සන් කොටු. මා හිතන්නේ වයඹ පළාතේ විතරක් හෙක්ටෙයාර් 12,000කට වැඩිය තිබෙනවා. විනාශ වෙච්ච ඒ ඉස්සන් කොටු ටික එක්කෝ වෙනත් මත්ස්‍ය වගාවක් ආරම්භ කරලා වැඩි දියුණු කරන්න -ප්‍රවර්ධනය කරන්න- ඕනෑ. ඒ ඉස්සන් කොටු හිමියන් ධෛර්යවත් කරලා, ආධාර දීලා, අනුබල දීලා ඒවා පටන් ගැනීමේ යම්කිසි ක්‍රියාවලියක් ආරම්භ කරන්න පුළුවන්.

ලංකාවේ මුහුදු ජලජ පැළෑටි වගාව ඉතාමත්ම අඩුයි. සමහර වෙලාවට මුහුදු ජලජ පැළෑටි මාළුන්ටත් වඩා බොහොම මිල වැඩියි. මේ විනාශ වෙලා තිබෙන ඉස්සන් කොටුවල ජලජ පැළෑටි වගා කිරීම ගැන අත් හදා බැලීමක් කරලා ඒක ශක්තිමත් කළොත් අපට අපේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න පුළුවන් වෙයි කියා මම හිතනවා. ඒක තමයි මේ යෝජනාවෙන් මා ඉදිරිපත් කරන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ මුළු රටේම ආර්ථිකය අපේ රට වටා තිබෙන මුහුදෙන් ගොඩ ගන්න පුළුවන්ය කියන ගරු ජනාධිපතිතුමාගේ චින්තනය අනුව, දර්ශනය අනුව අපට මත්ස්‍ය වගාව විධිමත් විධියට කරන්න පුළුවන් නම් රටට අවශ්‍ය මත්ස්‍ය සම්පත නෙළා ගන්නවා විතරක් නොවෙයි විදේශ රටවලට යවන්නත් පුළුවන්කමක් තිබෙනවා.

අද අපේ ධීවර අමාත්‍යතුමා ධීවර අමාත්‍යාංශයේ විශාල වැඩ කොටසක් කර ගෙන යනවා. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. එතුමා මේ වන කොට මේ රටේ තිබෙන මත්ස්‍ය හිඟයට පිළියමක් වශයෙන් පරිභෝජනයට අවශ්‍ය මාළු ප්‍රමාණය අඩුවක් නැතුව දෙන්න හුඟක් උත්සාහ කරනවා. ඒවාට අවශ්‍ය පිළියම් කරනවා. ඒක තමයි වෙන්න ඕනෑ. ඉතින් ඒ කාරණයේදී මත්ස්‍ය ප්‍රජනනය ඉතා වැදගත් වෙනවා. මිරිදිය මත්ස්‍ය වගාව සඳහා ප්‍රජනන මධ්‍යස්ථාන පිහිටුවා ඒවායින් ලංකාවේ වැව්වලට මිරිදිය මත්ස්‍යයින් බෙදා හැරීමේ වේගවත් ක්‍රමයක් ඇති කරන්න පුළුවන්. අද මත්ස්‍ය ප්‍රජනන මධ්‍යස්ථාන අඩුයි. මත්ස්‍ය ප්‍රජනන මධ්‍යස්ථාන ඇති කිරීමේ වේගවත් ක්‍රමයක් ඇති කළොත් ලංකාවේ සියලුම වැව්වලට මාළු පැටව් දමන්න පුළුවන්. ලංකාවේ වැව් දහස් ගණනක් තිබෙනවා. වයඹ ප්‍රදේශයේ විතරක් වැව් 7,000ක් තිබෙනවා. මම හිතන්නේ නැහැ, අපට තවම වැව්

[ගරු වික්ටර් ඇන්ටනී මහතා]

200කටවත් මාළු පැටව් දමන්න පුළුවන් වෙලා තිබෙනවාය කියා. ඒ වැව්වලට මාළු පැටව් දැම්මොත් එමඟින් මිරිදිය මත්ස්‍ය සම්පත බහුල වෙනවා. මම හිතන්නේ එහෙම වුණොත් රටේ ඒ තරම් මාළු හිඟයක් පවතින එකක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිවුල් දිය මාළු ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ. මා වයඹ පළාත් සභාවේ ධීවර ඇමතිවරයාව සිටි කාලයේදී අවිධිමත් ඉස්සන් වගාව නිසා කළපුව තනිකරම අපද්‍රව්‍යවලින් විනාශ වෙලා ගියා. සුළු ධීවරයාට ජීවත් වීම සඳහා ඉස්සන් පැටව් කළපුවට දමන්න මට සිද්ධ වුණා. මත්ස්‍ය පැටව් කළපුවට දමා ධීවරයාගේ ජීවිතය ගොඩ නඟන්න එදා මට සිද්ධ වුණා. එදා එවැනි තත්ත්වයක් ඇති වුණා. ඉතින් අපි මත්ස්‍ය ප්‍රජනන මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කළොත් හොඳයි කියන එකයි මම මේ යෝජනාවෙන් අදහස් කරන්නේ. ඒ වාගේම තහනම් දැල් ක්‍රම නිසා කළපුවල සිදු වන ඒ විනාශය මඟ හරවන්නත්, ප්‍රජනන කලාප වෙන් කරන්නත් කටයුතු කරන්න පුළුවන් නම් හොඳයි. මට මතකයි ඒ කාලයේදී මුන්දලම කළපුව "මොදා" එහෙම නැත්නම් sea bass කියන මාළුවා ප්‍රජනනය වෙච්ච මධ්‍යස්ථානයක් බවට පත්ව තිබුණා. පසුව ඒක මළ කළපුවක් බවට පත් වුණා. විසි හතර පොළකින් එය වහලා තිබුණා.

මට සිද්ධ වුණා ඒක ඇරලා නැවත වරක් ඒක සජීවීකරණය කරන්න. ඒ වාගේ තත්ත්වයකට පත් වුණා. අපට ඒ තත්ත්වය බලා ගෙන ඉන්න බැරි නිසා අපේ ධීවර ඇමතිතුමාත් එක්ක එකතු වෙලා මේ කටයුතුවලට මූලිකත්වයක් දෙන්නයි මා මේ යෝජනාව ගෙනාවේ කියන එක ප්‍රකාශ කරමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. යෝජනාව ස්ථිර කරන්නේ ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමා අත් දැකීම් සම්භාරයක් ගොනු කර ගෙන, ඒ අත් දැකීම් සම්භාරය උපයෝගී කර ගනිමින්, එතුමාගේ අදහස් අපේ වර්තමාන ධීවර ඇමතිතුමාට යොමු කිරීමට මේ ගෙනාපු යෝජනාව ස්ථිර කරන ගමන් වැව් ආශ්‍රිතව ජීවත් වන පුද්ගලයෙක් වශයෙන් මමත් ඒ ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න කැමැතියි.

මිරිදිය ධීවර කර්මාන්තය ගත්තොත්, අපි නිරන්තරයෙන්ම කථා කරන දෙයක් තමයි තහනම් දැල් ප්‍රශ්නය. අද ධීවර නිලධාරින්ට, ධීවර සමිතිවල නිලධාරින්ට සමහර වැව්වල මේ තහනම් දැල් නීතිය හරියට ක්‍රියාත්මක කිරීමට බැරි වී තිබෙන හේතුවක් හැටියට අපි දැක්කේ බොහෝ දුරට මේවාට දේශපාලන ඇඟිලි ගැසීම් තිබීමයි. මේ ඇඟිලි ගැහීම් තුළ සිදු වන්නේ ඒ ධීවර නිලධාරින්, ඒ වාගේම ධීවර සමිති සමාගම්වල නිලධාරින් එයින් මඟ හරින එක කියලා මම එක අවස්ථාවක ගරු ඇමතිතුමාව දැනුවත් කළා. යම් කිසි කණ්ඩායමක් තමන්ට අවශ්‍ය පරිදි වැව පරිහරණය කිරීම තුළින් ඒ අවශ්‍ය කරන මාළු -බෝ වෙමින් යන කුඩා මාළු- දැල්වලින් අල්ලලා ඒවා වෙළෙඳ පොළට එවීම නිසා මාළු බෝ වීමේ ප්‍රතිශතය අද බොහෝ දුරට අඩු වෙමින් පවතිනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. තහනම් ධීවර දැල් පාවිච්චි කරන අය බොහෝ දුරට අත් අඩංගුවට ගැනීම අපහසු තත්ත්වයක පැවතුණත් මම හිතනවා කුඩා මාළු විකිණීම තහනම් කළොත් ඉතා පහසුවෙන් මේ තහනම් ධීවර දැල් පාවිච්චිය අඩු කරන්න අපට පුළුවන් වනවාය කියා. සාමාන්‍යයෙන් අද ග්‍රෑම් 500ක මාළුවෙක් මාළු වෙළෙන්දෙකුගෙන් ලබා ගැනීම මම හිතන්නේ ඉතාම දුෂ්කරයි. ග්‍රෑම් 500කට මාළු පැටවු දහ දෙනෙක්වත් ඕනෑ වෙනවා. මේ සම්බන්ධව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. අද පෞද්ගලිකව මාළු අභිජනනය වන මධ්‍යස්ථාන, එහෙම නැත්නම් මාළු ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කරන මධ්‍යස්ථාන ධීවර කර්මාන්තයේ යෙදෙන පුද්ගලයන් විසින් පෞද්ගලිකව කර ගෙන යනවා. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

පසු ගිය වර්ෂා කාලය තුළ අපේ ප්‍රදේශයේ කලා ඔය අසබඩ මාළු ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කරන ඉතා හොඳ ස්ථානයක් තිබුණා. මම හිතන්නේ කලා ඔය පිටාර ගැලීම නිසා එය තදබල ලෙස විනාශ වෙලා ගියා. මම පාර්ලිමේන්තු එන්න පෙර දිනයේ එම ස්ථානය බලන්න ගියා. ඒ ස්ථානය පවත්වා ගෙන ගිය තැනැත්තා ඇත්ත වශයෙන්ම ඒ සඳහා හැම තැනින්ම ආධාර ඉල්ලුවත් කිසි ආධාරයක් ලැබුණේ නැතිව අද අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ ඔබතුමාගේ අවධානය ඒ සඳහාත් යොමු වුණොත් හොඳයි. ඔහු ඉතා විශාල සේවාවක් කරන්නේ. ඒක දැක්කාම මට හිතුණා එය රාජ්‍ය ආයතනයක තත්ත්වයට කර ගෙන යනවාය කියලා. ඔහුගේ පෞද්ගලික ධනය වියදම් කරලා පොකුණු ටික යථා තත්ත්වයට පත් කර තිබුණා. එය අපේ ප්‍රදේශයට ලොකු සම්පතක්. නමුත් කලා ඔය පිටාර ගැලීම නිසා අද ඒ ස්ථානය විනාශ වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බව කිව්වත්, මා හිතන්නේ එය ඉතා ඉක්මනින් කෙරෙන්නේ නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. එම නිසා මා ඔබතුමාගෙන් මේ අවස්ථාවේ දී ඉල්ලීමක් කරනවා, ඒ සඳහා ඔබතුමා මැදිහත් වන්නය කියලා.

පැලියගොඩ මාළු වෙළෙඳ සැලේ තිබුණු මාෆියාව නැති කරමින් තම කටයුතු හරියට කරන ඇමතිවරයකු වීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඔබතුමා ඒ තුළින් රටට ලොකු ආදර්ශයක් ලබා දුන්නා. ඒ ගැනත් මගේ ස්තුතිය මේ අවස්ථාවේ දී පුද කරමින් මම නිහඬ වනවා, ඔබ සැමට ස්තුතියි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින සභාව කල් තබන අවස්ථාවේ විවාදය සඳහා පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමා ඉතාම වැදගත් යෝජනාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. විශේෂයෙන්ම අපේ රටේ ධීවර කර්මාන්තය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඉස්සන් වගාව ප්‍රගමනය කරන්නට; ශක්තිමත් කරන්නට මේ යෝජනාව හරහා එතුමා විශේෂයෙන්ම ඉල්ලීමක් ඉදිරිපත් කර තිබෙනවා. එතුමා වයඹ පළාත් සභාවේ ධීවර අමාත්‍යවරයා වශයෙන් දීර්ඝ කාලයක් කටයුතු කළ නිසා ඒ ලැබූ අත් දැකීම් රාශියක් එක්ක තමයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

පුත්තලම දිස්ත්‍රික්කයේ මුහුදුබඩ සීමාව ඉස්සන් වගාව සඳහා විශේෂ ස්ථානයක් බවට පත් වෙලා තිබුණා. නමුත් අපි පැහැදිලිවම දන්නවා, මෑත කාලයේ දී එය ක්‍රමානුකූලව විනාශ වන තත්ත්වයකට පත් වෙලා තිබෙන බව. අතිගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ අද දක්ෂ අමාත්‍යවරයෙක් මේ රටේ ධීවර අමාත්‍යවරයා හැටියට කටයුතු කරනවා.

විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාත් අපේ රටට ධීවර කර්මාන්තය පිළිබඳ අලුත් සටහනක් තබපු, ඒ වාගේම අලුත් ව්‍යාපෘති හදපු හිටපු අමාත්‍යවරයෙක් හැටියට ඒ වැඩ කටයුතු ඉදිරියට ගෙන යන්නට අපේ රාජිත සේනාරත්න මැතිතුමාට භාර දීලා තිබෙනවා කියලා මා හිතනවා. දැනට එම ඉස්සන් බෝ වන ස්ථානවල විද්‍යාත්මකව මතු වෙලා තිබෙන විවිධ ගැටලු සහ එම ගැටලු මතු වීමට හේතු වූ කාරණා හරි හැටි පැහැදිලි කර ගෙන, ඒ තත්ත්වයන් නැති කරලා ඉස්සන් වගාවට විශාල දායකත්වයක් අපි දුන්නොත්, අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්නට එය ප්‍රබල සාධකයක් වනවා ඇතැයි අප විශ්වාස කරනවා.

විශේෂයෙන්ම මත්ස්‍ය ආහාර පිළිබඳව කථා කරද්දි අපි කවුරුත් දන්නවා, එය ප්‍රෝටීන් බහුල ඉතාම වැදගත් ආහාරයක් බව. අපේ රටේ අනාගත පරපුර ශක්තිමත් කිරීම සඳහා මේ මත්ස්‍ය ආහාරවල අවශ්‍යතාව සම්පූර්ණ කිරීම රටේ ජනතාව හැටියට අපි කවුරුත් බලාපොරොත්තු වන දෙයක්. මා ඊයේ පෙරේදා පුවත්පතක දැක්කා, විශේෂයෙන්ම අපේ රටේ කේන්ද්‍රස්ථානය හැටියට ගැනෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කරන ලද සමීක්ෂණයකදී හෙළි වුණාය කියලා, දරුවන්ගෙන් සියයට 23කට බෝ නොවන රෝග වැළඳීමේ අනතුරක් තිබෙනවාය කියලා. ඉතින් ඒක ඉතාම නරක තත්ත්වයක්. මොකද, අපේ රට ත්‍රස්තවාදයෙන් මුදා ගෙන ක්‍රමානුකූලව සංවර්ධනය කර ගෙන, ආසියාවේ ආශ්චර්යවත් රට බවට පත් කරන්නට යන මේ ගමනේ දී, ඒ වාගේම පංච මහා බල කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්නට සූදානම් වන මේ අවස්ථාවේ මේ විදියට මානව සෞඛ්‍ය පිරිහීමක් ඇති වුණොත් මා හිතන්නේ එය අපේ රටේ ජාතික ආර්ථිකයට විශාල වශයෙන් බලපානවා.

මේ රෝගවලට විශේෂයෙන් බලපාන්නේ අපේ ආහාර පුරුදුයි. අප ගන්නා ආහාරවල තත්ත්වයන් මෙයට විශේෂයෙන් බලපානවා. සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ සඳහා කටයුතු කරනවා වාගේම, විශේෂයෙන්ම ධීවර අමාත්‍යාංශය හැටියටත් ඉදිරි කාලය තුළදී මේ සම්බන්ධයෙන් විශාල වග කීමක් සහ කැප කිරීමක් කරන්නට සිදු වනවා ඇති කියලා මා හිතනවා. සමබර ආහාර වේලක් රටේ ජනතාවට ලබා දීමේ දී විශේෂයෙන්ම දරුවන්ට ප්‍රෝටීන් බහුල ආහාර වේලක් ලබා දීම සඳහා ධීවර අමාත්‍යාංශය පැත්තෙන් විශාල කාර්ය භාරයක් තවදුරටත් ඉටු විය යුතුව තිබෙනවාය කියන එකත් මේ ගරු සභාවේ දී මා මතක් කරන්නට කැමැතියි.

ඊළඟට, මේ කාරණයත් ඉතාම කෙටියෙන් වුවත් ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්නට ඕනෑ. පසු ගිය කාලය තුළ ඉන්දියන් සාගරයේ අපේ මුහුදු සීමාව තුළ ඉන්දියානු ධීවරයන් එක්ක ඇති වන විවිධ ප්‍රශ්න අනවශ්‍ය විධියට උලුප්පලා, දෙරට අතර යම් කිසි ප්‍රශ්න, මත භේද ඇති කිරීමේ අරමුණින් යම් කිසි කණ්ඩායම් ක්‍රියා කරන්නට යන බවක් අපි පැහැදිලිව දැක්කා, ගරු ඇමතිතුමනි. සාමාන්‍ය සුළු සිද්ධියක් පවා විශාල සිද්ධියක් බවට පත් කරලා, ඉන්දියාවත්, අපේ ශ්‍රී ලංකාවත් අතර තිබෙන ජාත්‍යන්තර සම්බන්ධතා බිඳ වැටෙන තත්ත්වයක් දක්වා ඒවා ඔඩු දුවන ආකාරයක් අපි දැක්කා. ඒ නිසා අත් දැකීම් බහුල ගරු අමාත්‍යවරයෙක් හැටියට මේ සම්බන්ධවත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වනවා. එවැනි සුළු තත්ත්වයන් උඩ ඇති වන ධීවරයන්ගේ ප්‍රශ්න හරහා අපේ රටවල් දෙක අතර යම් කිසි බෙදීමක්, ප්‍රශ්නයක් ඇති වන තැනට ඒ ප්‍රශ්න ඔඩු දුවන්න නොදී ඒවා පිළිබඳව සාකච්ඡා කර විසඳා ගැනීම මා හිතන හැටියට වඩාත් ඵලදායී කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා.

අපි ධීවර කර්මාන්තය පිළිබඳව කථා කරද්දී කියන්න ඕනෑ, පසු ගිය අවුරුදු 30ක කාලය තුළ අපේ රටේ තුනෙන් එකක පමණයි ධීවරයන්ට ඒ මුහුද ප්‍රයෝජනයට අරගෙන විශේෂයෙන්ම කර දිය ධීවර කර්මාන්තය කර ගෙන යන්න අවස්ථාව ලැබුණේ කියලා. නමුත් අද තත්ත්වය ගැන අපි ඉතාම සතුටින් මතක් කරන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ මානුෂීය මෙහෙයුම ඔස්සේ මේ රටේ ත්‍රස්තවාදය නිමාවට පත් කරපු නිසා අද අපේ රට වටේටම තිබෙන මුහුදු සීමාව උපයෝගි කර ගෙන අපේ රටේ ධීවර කර්මාන්තය ඉදිරියට ගෙන යන්න ඒ ධීවරයන්ට විශාල ශක්තියක් ගෙන දෙන්න අද අපට හැකියාව ලැබී තිබෙනවා. එම නිසා මතු දිනයකදී අපේ රටේ දේශීය ආර්ථිකය ගොඩ නඟන්න, ශක්තිමත් කරන්න විශේෂයෙන්ම කර දිය -සාගර - ආර්ථිකයට ශක්තිය ඉතාම කෙටි කාලයක් තුළදී උදා වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ඒ සම්බන්ධව ගරු ඇමතිතුමාටත්, විශේෂ මැදිහත් වීමක් කරමින්, එතුමාගේ හැකියාවන් එක්ක ඒ ස්ථානය කරා යන්න හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම ගරු වික්ටර් ඇන්ටනි මැතිතුමා ඉතාම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරමින්, ධීවර කර්මාන්තයේ කටයුතු සහ ධීවර අමාත්‍යාංශයේ කටයුතු ඉතාම සාර්ථකව ඉදිරියට ගෙන යන අවස්ථාවේ එය තවදුරටත් ශක්තිමත් කරන්න විශේෂ අවධානය යොමු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. ඊළඟට ගරු වෛද්‍ය රාජිත සේනාරත්න ඇමතිතුමාගේ පිළිතුරු කථාව.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමාට -හිටපු පළාත් සභා මන්ත්‍රීතුමාට- මා මුලින්ම ස්තුතිවන්ත වනවා, මෙම යෝජනාව ගෙන ඒම ගැන. එතුමාගේ යෝජනාවේ සංක්ෂිප්තය බැලුවොත් යෝජනා කිහිපයක් තිබෙනවා. පළමුවන යෝජනාව තමයි, විවිධ විනාශකාරී ක්‍රම හා ක්‍රියාවන් නිසා වඳ වී යන මත්ස්‍ය ප්‍රජනනය නැවත සක්‍රීයමත් කිරීම සඳහා ප්‍රජනන මධ්‍යස්ථාන හා කලාප වෙන් කර ආරක්ෂා කර පවත්වා ගැනීම. විවිධ විනාශකාරී ක්‍රම නවත්වා ගැනීම සඳහා ප්‍රජනන මධ්‍යස්ථාන ලබා දීමත්, කලාප වෙන් කිරීමත් මා පිළිගන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම විවිධ විනාශකාරී ක්‍රම පද්ධති තහනම් කරන්න. ඒවා නවත්වා දමන්න. එක පැත්තකින් මිනිස්සු ඒකේ මාළු ටික විනාශ කරන ගමන්, අනික් පැත්තෙන් ප්‍රජනනය කරන කලාප හදලා හරි යන්නේ නැහැ. ඒක විසඳුමක් නොවෙයි. එක පැත්තකින් විනාශ කරනවා. අනික් පැත්තෙන් හදනවා. ඉස්සෙල්ලා කරන්න ඕනෑ, විනාශය නැවැත්වීමයි. ඒ සඳහා පසු ගිය කාලයේ මා ඉතාමත්ම දැඩි තීන්දු ගත්තා. මා වෙනස් වුණේ නැහැ. ජනාධිපතිතුමාත් මා සමඟ සාකච්ඡා කළා. කිසිම විදියකින් මා වෙනස් වුණේ නැහැ.

නැඟෙනහිර ප්‍රදේශවල තනිකරම ඩයිනමයිට් දැමීම කළා. එක රැයකට ඩයිනමයිට් 12ක, 15ක ශබ්ද නින්දෙන් ඇහෙනවාය කියා මිනිස්සු කියනවා. ජපානයේ ඉඳලා research group එකක් ඒ ප්‍රදේශයට ඇවිත් සිටියා. ඒ විද්‍යාඥවරිය ඇවිල්ලා මට කිව්වා, රාත්‍රියට නිදා ගන්න බැහැ, ඩයිනමයිට් දමන ශබ්දය ඇසෙනවාය කියලා. ඒක නවත්වන්න බැරි වුණා. මොකද, එහේ සිටින ආරක්ෂක හමුදාවල සමහර අයත් ඒකට සම්බන්ධ වෙලා සිටියා. ඊට පස්සේ එදා හිටපු නාවික හමුදාපති තිසර සමරසිංහ මහත්මයාත් එක්ක එකතු වෙලා ඩයිනමයිට් වැඩ පිළිවෙළවල් සම්පූර්ණයෙන් විනාශ කරලා දැම්මා. අද එක රාත්‍රියකට එක

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ඩයිනමයිට් කරලක් පුපුරනවා ඇහෙන්නේ නැහැ, මුළු ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේම.

ඒ විතරක් නොවෙයි. ලයිට් කෝස් ක්‍රමය -ලයිට් එක ගහලා මසුන් විනාශ කරන ක්‍රමය- තමයි දකුණේ තිබුණේ. මේවා නවත්වන කොට මට විශාල බලපෑම් ආවා. මම ඒවා නවත්වන ක්‍රියාදාමය නැවැත්වුවේම නැහැ. මා ඉස්සෙල්ලාම නැවැත්වුවේ බේරුවල ප්‍රදේශයේයි. නාවික හමුදාපතිත් එක්ක එකතු වෙලා බේරුවල ප්‍රදේශයේ ලයිට් කෝස් ක්‍රමය නවත්වා, ඒ අයට දැඩි දඬුවම් දුන්නා. මා මුළු දකුණේම ලයිට් කෝස් ක්‍රමය නැවැත්වුවා. නමුත් එක තැනක මට නවත්වා ගන්න බැරි වුණා. ඒ තමයි හික්කඩුව ප්‍රදේශයේ. මා නාවික හමුදාව හික්කඩුව වරායට ගෙනැවිත්, අපේ කාර්යාලය අයින් කරලා, ඒ ගොඩනැඟිල්ල නාවික හමුදාවට දීලා, එහි නාවික හමුදාව පදිංචි කරවා ධීවරයන් දියඹට යෑම සම්පූර්ණයෙන්ම නැවැත්වුවා. දැන් ලයිට් කෝස් ක්‍රමය සම්පූර්ණයෙන්ම ඉවරයි. ඉමදුව ධීවර සංස්ථාවේ වෙළෙඳ සැල විවෘත කරන්න මා යන කොට, මා දැක්කා, සුළු ධීවර සංවිධාන මට ප්‍රණාමය පුද කරලා යාර 25න් 25ට බැනර් ගහලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, අද මාළු වෙළෙඳ පොළේ කුඩා මාළු වැඩි වෙලා තිබෙනවා. පසු ගිය අවුරුද්දේ මාළු නිෂ්පාදනය සියයට විසි ගණනකින් වැඩි වුණා. එයින් වැඩිම ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙන්නේ කුඩා මාළුයි.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)**

(மாண்புமிகு குணரத்ன வீரகோன் - மீள்குடியேற்ற அமைச்சர்)

(The Hon.Gunaratne Weerakoon - Minister of Resettlement)

මුහුද මඟුල් ගෙදර වාගෙයි තිබුණේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු ගුණරත්න වීරකෝන් ඇමතිතුමා කියනවා, මුහුද මඟුල් ගෙදර වාගේයි තිබුණේ කියලා. එතුමාගේ කලාපය නිසා එතුමා ඒ ගැන දන්නවා. ඒ ලයිට් කෝස් ක්‍රමය සම්පූර්ණයෙන්ම නැවැත්වුවා.

බේරුවල වැල්ලේ මගේ මිනිස්සු -මාදැල් කරන අය- කියනවා, "සර් දැන් තමයි මෝරපු හාල් මැස්සෙක් අහු වෙන්නේ" කියලා. අපේ පළාත්වල සවස් වරුවට එන කොට හාල් මැස්සන් රුපියල් 70ටත්, සාලයන් රුපියල් 20ටත් වාගේ මිලකට බැස්සා. ඒ තරමට මාළු අහු වුණා. ඒකෙන් තේරෙනවා, කුඩා මාළු විනාශ වීමෙන් කොයි තරම් අපරාධයක්ද කර ගත්තේ කියලා.

ඒ වාගේම ලයිලා දැල්, සුරුක්කු දැල් භාවිතය තහනම් කළා විතරක් නොවෙයි, ළඟ තබා ගැනීමත් තහනම් කළා. ළඟ තබා ගත්ත ගෙවල් පවා ඔක්කෝම raid කරලා අත් අඩංගුවට ගත්තා. ඒ විතරක් නොවෙයි. තංගුස් දැල් ලංකාවට ආනයනය කිරීමත් තහනම් කළා. තංගුස් දැල නිකම් දැම්මත් ඒ දැලට මාළුවා කැපෙනවා. ඒ සියල්ලම තහනම් කළා.

මා මේ අවස්ථාවේදී ස්තුති කරනවා, අතිගරු ජනාධිපතිතුමා සහ කැබිනට් මණ්ඩලය මට ඒ සඳහා දුන් සහයෝගය වෙනුවෙන්. සමහර ඇමතිවරුන් මේකට විරුද්ධ වුණා. මා දැඩි ස්ථාවරයක සිටියා. අතිගරු ජනාධිපතිතුමා කිව්වා, "මේ ගෙන යන වැඩ පිළිවෙළ ගෙන යන්න රාජිත ඇමතිතුමාට ඉඩ දෙන්න. ප්‍රශ්නයක් ඇති වුණොත් අපි පස්සේ නවත්වමු" කියලා. තංගුස් දැල් දැන් ලංකාවට ගේන්නත් බැහැ. ඒ වාගේම උතුරේ trawling ක්‍රමය තිබුණා. උතුරේ කුරුනගර්වල වරුවක් මට විරුද්ධව වර්ජනය කළා, trawling ක්‍රමය නැවැත්තුවාම. මම සැලුණේ නැහැ. මා ධීවර සංවිධාන පිහිටුවා ගෙන සිටි ඒ ද්‍රවිඩ සහෝදරවරුන්ට කථා කරලා වරුවෙන් ඒ වර්ජනය අවසන් කරලා trawling ක්‍රමය තහනම් කළා. මට අද ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ධීවරයින් ගැන මට දුකකුත් තිබෙනවා. මොකද, ඉන්දියානු ධීවරයින් ඇවිල්ලා මේ වැඩේම කරනවා. ඒක ජාත්‍යන්තර ප්‍රශ්නයක්. අපි ඒක සම්බන්ධයෙන් වෙනත් ක්‍රියාමාර්ග ගන්නවා.

ඊළඟට, අපි හක් බෙල්ලා -මුහුදු කුඩැල්ලා- ඇල්ලීම මම තහනම් කළා. ඒ තරම් විනාශකාරී විධියට පොඩි එකාගේ ඉඳලා ඇල්ලුවා. මම ඒ සම්බන්ධයෙන් සංගමයක් හදලා ඒ සංගමයට කොන්දේසි දාලා ඒකෙන් ඒවා විකුණපු මුදල් ගෙවන විධියට කටයුතු සැලැස්වූවා. හක්බෙල්ලෝ අල්ලලා ගන්න සල්ලිවලින් එදා රජයට ශත පහක් ගෙව්වේ නැහැ. කෝටි ගණන් හම්බ කරනවා. ශත පහක් ආණ්ඩුවට නැහැ. අපේ නිලධාරින්ට රුපියල් 25,000 වාගේ පගාව දෙනවා. ප්‍රවාහනය කිරීමට පගාව රුපියල් 50,000යි. ශත පහක් ආණ්ඩුවට නැහැ. අපි ගිවිසුම් ගැහුවා රුපියල් 25ක් හැම හක්බෙල්ලෙක්ගෙන්ම ධීවර සංස්ථාවට දෙන්න ඕනෑ කියලා. ඒ සම්බන්ධයෙන් agreement එකක් ගහලා, කොන්දේසි දාලා, පරීක්ෂා කරලා කටයුතු කරන්න සැලැස්වූවා. වෙරළට ආවාට පසු ප්‍රමාණය බලනවා. පොඩි හක්බෙල්ලන් ඇල්ලීම තහනම් කරලා ඒ පිළිබඳව සංගමයට වගකීම භාර දීමේ ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා.පොකිරිස්සන් බිත්තර, කුඩා පොකිරිස්සන් ළඟ තබා ගැනීම තහනම් කළා. මේකට ඉඩ දෙන්නය කියලා මට විශාල ප්‍රශ්න ආවා. පසු ගිය කාලයේ මේ ගරු මන්ත්‍රීවරුනුත් ඇවිල්ලා මට කිව්වා. මම කිව්වා මේකට ඉඩ දෙන්න බැහැ කියලා. ග්‍රෑම් 200කට වඩා අඩු පොකිරිස්සන් අල්ලලා තිබුණොත් අත් අඩංගුවට ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවාට නීති දාලා තිබුණා, නමුත් කවදාවත් ක්‍රියාත්මක කළේ නැහැ. නමුත් අද නීති ක්‍රියාත්මක වෙනවා. ඒ ගොල්ලන් කියනවා, රක්ෂාව නැති වෙනවා කියලා. රක්ෂාව නැති වෙනවාය කියලා මේ සාගරය විනාශ කරන්න ඉඩ දෙන්න බැහැ. ඒවාට විකල්ප යෝජනා ක්‍රම අපි ගේනවා. මතක තියා ගන්න, පසු ගිය 2010 අවුරුද්දේ මම 419 දෙනෙකුට විරුද්ධව නඩු දාලා තිබෙනවා. නඩු 419ක් දැම්මා. මේ අවුරුද්දේ මේ මාස පහට නඩු 83ක් දාලා තිබෙනවා. බොහොම අමාරුවෙන් හොරෙන් තමයි දැන් යමක් කරනවා නම් කරන්න සිද්ධ වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මත්ස්‍ය අභය භූමි ඇති කළා; මත්ස්‍යයන් අල්ලන්න තහනම් ප්‍රදේශ ඇති කළා. කල්පිටියේ Bar Reef එක, වාන්කාල් යන මේ ප්‍රදේශ දෙකම අද මත්ස්‍ය අභය භූමි. ඒ ප්‍රදේශවල මත්ස්‍යයන් අල්ලන්න බැහැ. ඒ වාගේම ප්‍රජනන කලාප වෙන් කළා. මන්නාරම් බොක්ක, පෝක් බොක්ක අභිජනන ප්‍රදේශ බවට declare කළා, ගැසට් මඟින්. පුළුවන් තරම් breed වෙන්න ඉඩ හැදුවා. මම එකක් කියනවා, ඉන්දියානු ධීවරයෝ මාළු මංකොල්ල කන්න ආවත්, ඒ ගොල්ලත් මේ කාලෙට එන්නේ නැහැ. මේ 15 වනදා වෙනතුරු ඒ ගොල්ලන් එන්නේත් නැහැ. මොකද, අර අභිජනනයට ඉඩ දීලා ඉන්නවා. නමුත් ඒවාටත් යටත් නොවන ධීවරයෝ ඉන්නවා. ඒ නිසා මම අභිජනන කලාප වෙන් කළා. ඒ වාගේම ප්‍රජනන මධ්‍යස්ථාන ඇති කළා. උඩවලව, දඹුල්ල, ඉඟිනියාගල සහ ඉරණමඩු යන ප්‍රදේශවල මේ වනකොට මිරිදිය මසුන් අභිජනන මධ්‍යස්ථාන ඇති කර තිබෙනවා. අපි මේ වෙනකොට මේ ස්ථානවලින් මත්ස්‍ය පැටව් මිලියන 40ක් නිෂ්පාදනය කරලා තිබෙනවා. දැනට මේ වාගේ ඒකක 25ක් ඇති කර තිබෙනවා. ඉදිරි කාලයේදී තව ඒකක 25ක් ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි නිදහස් කර ගත්ත ඉරණමඩුවලින් -ඒ කාලයේ ඒක තහනම්

ප්‍රදේශයක්- මම ආරක්ෂක ලේකම්වරයාට කථා කරලා එක කොටසක් ඉල්ලා ගත්තා, මේ අභිජනන වැඩ පිළිවෙළට. ඒකට එහේ ද්‍රවිඩ ජනතාව සහභාගි කරවා ගත්තා. විසිතුරු මසුන් නිෂ්පාදනය කරන රඹබඩගල්ල, ගිනිගත්හේන යන අභිජනන මධ්‍යස්ථාන වලින් 2010 වසරේදී විතරක් මත්ස්‍ය පැටව් 9,31,715ක් අපි නිෂ්පාදනය කළා.

ගරු වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමා ඉස්සන් කොටු සම්බන්ධයෙනුත් සඳහන් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 90 දශකය වෙනකොට ඉස්සන් වගාවට සුදු පුල්ලි රෝගය ඇති වුණා. ඒ සුදු පුල්ලි රෝගය ඇති වුණේ කරඅඳු ඉස්සාට; - Tiger Shrimp, Tiger Prawn -; අපි P. Monodon කියලාත් කියනවා. මෙන්න මේ P. Monodon ඉස්සාට තමයි සුදු පුල්ලි රෝගය ආවේ. අවුරුද්දකට මෙට්‍රික් ටොන් 3,500ක් නිෂ්පාදනය කරපු ඉස්සන් ප්‍රමාණය 2005 වෙනකොට මෙට්‍රික් ටොන් 1,570කට කඩා ගෙන වැටුණා. ඒ සඳහා අපි දැන් මේ වෙනකොට ක්‍රියා මාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. ඉස්සන් කර්මාන්තයේදී අධීක්ෂණයක් සිදු වුණේ නැහැ. ඉස්සන් කොටු විශාල වශයෙන් ඇති කරන්න පටන් ගත්තා. සමහර දේශපාලනඥයන් පවා ඉස්සන් කොටු ඇති කළා. දීපු කිසිම නියෝගයක් පිළිපැද්දේ නැහැ. ඒක නිසා අපි ප්‍රථමයෙන්ම ඉස්සන් වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකකයක් පිහිටුවලා තිබෙනවා. ඒ කිසිම ව්‍යාපෘතියක් ආරම්භ කරන්න දෙන්නේ නැහැ, අපි approve කරන්නේ නැතුව. ඊට පස්සේ අපි ඒක අධීක්ෂණය කරන්නට ඒකකයක් හදලා තිබෙනවා; නිලධාරින් යොදලා තිබෙනවා. කිවුල්දිය මත්ස්‍ය සෞඛ්‍ය හා පරිසර ආරක්ෂණ රසායනාගාරයක් පිහිටුවා තිබෙනවා. බත්තුලුඔය ඒ රසායනාගාරයට ඒ මාළුන්ගේ සාම්පල්ස් ගෙනැල්ලා ඒ මාළුන්ගේ සෞඛ්‍ය තත්ත්වය test කරන්න අපි දැනටමත් කටයුතු ආරම්භ කර තිබෙනවා.

ඕලන්ද ඇළ පුනරුත්ථාපනය කරන්න රුපියල් මිලියන 150ක වියදමින් අපි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම වගා කාල සටහනක් - crop calendar එකක්-අපි හඳුන්වලා දෙනවා. ඒ වාගේම අපි දැන් සැරෙන් සැරේ අභිජනනාගාරවල ඉන්න මව් ඉස්සන් ගෙනැල්ලා මේ සුදු පුල්ලි රෝගය හැදිලා තිබෙනවාද කියලා පරීක්ෂා කර බලනවා. ඒ වාගේම පොකුණුවල තැන්පත් කිරීමට පෙර පසු කීටයන් රෝග කාරකයන් සඳහා පරීක්ෂාව කරනු ලබනවා. පොකුණුවල වගාව සඳහා යහපත් කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දෙනවා. මේ ඔක්කොම ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. ඒ වාගේම peneaus monodon කියන ඉස්සා වෙනුවට peneaus vannamei කියන පොඩි ඉස්සා ඇති කරන්න පුළුවන්ද කියා සොයා බලනවා. සුදු පුල්ලි රෝගය නිසා කරඅඳු ඉස්සාට විකල්පයක් වශයෙන් මේ peneaus vannamei කියන ඉස්සා අද ආසියාවේ ජනප්‍රිය වෙමින් එනවා. මුලින් ඉන්දියාව මේකට විරුද්ධ වුණා. නමුත් පසුව ඉන්දියාවත් අනුමත කළා. දැන් මටත් ඒක ආරම්භ කරන්න යෝජනා වෙලා තිබෙනවා. නමුත් අපි ඉඩදීලා නැහැ. මොකද, මම FAO එකේ ආචාර්ය සුබසිංහ මහතා එක්ක මේ ගැන කථා කළා. FAO එකේ එතුමාගෙනුත් තවම ඒ ගැන හරි මතයක් ලැබුණේ නැහැ. මේ ජූනි මාසයේ FAO එකේ විශේෂඥයෙක් එනවා. එතුමා ඇවිල්ලා මාස කිහිපයකින් අපට සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරනවා. ඒ වාර්තාව උඩ, ඒ වාර්තාව සාර්ථක නම් peneaus vannamei කියන ඉස්සා මෙහාට ගේන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, අපි ආරම්භ කරනවා වෙක්කයා - milkfish - කියන මත්ස්‍යයා ඇති කිරීම. අද උතුරේ ජනතාව අතර ඉතා ජනප්‍රිය මාළුවෙක්. ඒ මාළු පිට රට යවන්නත් පුළුවන්. මේ මාළුවා, කෙළවල්ලා මාළුවා අල්ලන්න ඇමට - bait එකට - පාවිච්චි කරනවා. ඒ සඳහා විශාල වෙළෙඳ පොළක් අපට තිබෙනවා. ඒ නිසා "වෙක්කයා" කියන මාළුවා බෝ කර ගැනීමට මීගමුවේ, තලාහේනේ අභිජනනාගාරයේ මේ වර්ගයේ මවු මත්ස්‍යයින් 40ක් අපි හදා ගෙන යනවා.

ගරු වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමා කිව්වා වාගේම, "මොදා" මාළුවා ඇති කරන්නත් FAO ආධාරයෙන් අපි දැන් කටයුතු කර ගෙන යනවා. ඒ සඳහා මැලේසියානු විශේෂඥයෙක් ඇවිල්ලා නැක්ඩා ආයතනයත් එක්ක කථා කරනවා. මවු සත්තු රැස් කරලා, ඒ විශේෂඥයන්ගේ දැනුමත් එක්ක "මොදා වැඩ පිළිවෙළ" කොටුවල ආරම්භ කරනවා. අද ඒ මාළුවා අපනයනයේදී ඉතා හොඳ වෙළෙඳ පොළක් තිබෙන මාළුවෙක්. අපි එංගලන්තයට ගිහිල්ලා ඉල්ලුවත් හොඳම මාළු ව්‍යඤ්ජනය හැටියට ඉස්සෙල්ලාම පිඟානට එන්නේ මොදා මාළු ව්‍යඤ්ජනය තමයි.

ඒ වාගේම ඉස්සන් වගා කරන කලාප ගැනත් සඳහන් කරන්න ඕනෑ. මඩකළපුවේ හෙක්ටෙයාර් 2,820ක ඉතා ඉක්මනින්ම අලුතෙන් ඉස්සන් වගාව අපි ආරම්භ කරනවා. මම අනුමත කරලා ඒ ඉඩම් පරීක්ෂා කරලා, වෙන් කරලා තිබෙනවා, හෙක්ටෙයාර් 2,820ක්. ඒ කියන්නේ අක්කර 5,000ක් විතර. ඒ වාගේම ත්‍රිකුණාමලයේ හෙක්ටෙයාර් 2,012ක් අපි හඳුනා ගෙන තිබෙනවා. මඩකළපුව ව්‍යාපෘතියට ආයෝජනය කරන්න ඒ දිස්ත්‍රික්කයේම ජාත්‍යන්තර දැනුම ඇති, හොඳ ද්‍රවිඩ ව්‍යාපාරිකයෙක් අපට ඉන්නවා. ඒ වාගේම ත්‍රිකුණාමලයේත් ඒ කටයුතු ආරම්භ කරන්න අපි ලෑස්ති කරලා තිබෙනවා. ඒකත් අපි ආරම්භ කරනවා. මේ සුදු පුල්ලි රෝගය නැති වෙනත් ප්‍රදේශවල අපි මේ වගාව ආරම්භ කරනවා.

අපේ අවසාන යුද සටන තිබුණු නන්දිකඩාල් කළපුවට - ප්‍රභාකරන් හිටපු කළපුවට - මේ වෙන කොට ඉස්සන් පැටව් මිලියන 1.4ක් මුදා හැර තිබෙනවා. ඒ වාගේම මුහුදු කුඩැල්ලන් කෘත්‍රිම ලෙස අභිජනනය කරන්නට - artificial insemination - මන්නාරම, ඔලෙයිතුඩුවාව ප්‍රදේශයේ අපි අභිජනනාගාර ලෑස්ති කරලා තිබෙනවා. මුහුදු කුඩැල්ලන්ටත් හොඳ වෙළෙඳ පොළක් තිබෙනවා.

ජලජ පැළෑටි, කර්මාන්තයක් වශයෙන් ව්‍යාප්ත කිරීමට පටක රෝපණ විද්‍යාගාරයක් රඹබඩගල්ලේ අපි දැන් ආරම්භ කරලා තිබෙනවා. අපේ රඹබඩගල්ල මධ්‍යස්ථානයේ වෙනම විද්‍යාගාරයක් ආරම්භ කරලා අපි ඒකේ ඒ ව්‍යාපාරිකයන්ව පුහුණු කරනවා. මමත් ගියා ඒක බලා ගන්න. ඉතාම ලස්සනට ඒ කටයුත්ත කරනවා. මේකේ "කප්පිපාසි" හෙවත් "ග්‍රැසිලාරියා" කියන ඒ මුහුදු පැළෑටිය වගා කරනවා. ඒක ඛනිජ ද්‍රව්‍ය වැඩි, විටමින් වැඩි මුහුදු පැළෑටියක්. ඉදිරියේදී මේ වගාව ස්වයං රැකියාවක් වශයෙන් ධීවරයින් අතර ප්‍රචලිත කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම "කැරගනීන්" සංඝටකය අඩංගු "ඉයුකීමා" කියන පැළෑටිය "දිවි නැඟුම" වැඩසටහන යටතේ උතුරේ වගා කිරීමටත් කටයුතු අපි ආරම්භ කරනවා. ඒ තුළින් උතුරේ 20,000කට රැකියා ලබා දෙන්න ජපන් ව්‍යාපාරිකයෙක් එක්ක අපි කථා කරලා තිබෙනවා. පිට රට මේ පැළෑටියට හොඳ වෙළෙඳ පොළක් තිබෙනවා.

මේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා හැම ක්ෂේත්‍රයකම අදාළව අපි විශාල උපදේශක සභාවක් හදලා තිබෙනවා. මේ අමාත්‍යාංශයේ එම උපදේශක සභාව අවුරුදු පහකින් රැස් වෙලා තිබුණේ නැහැ. අපි ඒ කටයුතු ආරම්භ කරලා ඒ උපදේශක සභාවේ උපදේශනත් එක්ක තමයි දැන් වැඩ කරන්න යන්නේ.

ධීවර කළමනාකරණ ප්‍රදේශ ගැසට් කරලා අපි දැන් ඒ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ කළමනාකරණයට සැලසුම් හදලා තිබෙනවා. ඒ අතර මීගමු කළපුව, පුත්තලම් කළපුව, මඩකළපුව, පුත්තලමේ ඉඳලා මන්නාරම දක්වා මුහුදු තීරය, ගාල්ලේ ඉඳලා මාතර දක්වා මුහුදු තීරය, හම්බන්තොට මුහුදු තීරය, මාතර - මඩිහ - පොල්හේන ප්‍රදේශය, යාලට නුදුරින් පිහිටි මුහුදු තීරය, තිම්ටිටා කළපුව, කෝමාරි කළපුව, මුරුක්කදන් කළපුව ආදී මේ සියලු ප්‍රදේශවල කොයි විධියටද මේ මත්ස්‍ය කළමනාකරණය කරන්නේ කියලා ඒ කටයුතු කරන පුද්ගලයන්ට අපි උපදෙස් දෙනවා; උදවු කරනවා.

[ගරු(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

මිරිදිය ජලාශ 71ක කළමනාකරණ වැඩ සැලසුම් අපි දැන් ලෑස්ති කරලා තිබෙනවා. ලංකාවේ "දිවි නැගුම" වැඩසටහනෙන් සියයට 25ක් අපි තමයි කරන්නේ. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගෙන් ඒ සඳහා අපි රුපියල් මිලියන 170ක් ඉල්ලුවා. ඒ මිලියන 170ම ලබා දෙන්න කියලා එතුමා කිව්වා. මොකද අපි තමයි ඉතාම හොඳම යෝජනා ටික ඉදිරිපත් කළේ. මුළු "දිවි නැගුම" වැඩසටහනෙන් හතරෙන් එකක ව්‍යාපෘතියක් කරන්නේ අපි. ඒ යටතේ අපි පොකුණු තුළ මත්ස්‍යයින් හා මිරිදිය ඉස්සන් වගාව කරනවා. එහි ප්‍රතිලාභීන් 584යි. පොකුණු මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම කරනවා. එහි ප්‍රතිලාභීන් 160යි. බෙල්ලන් වගාව කරනවා. එහි ප්‍රතිලාභීන් 150යි. මුහුදු පැළෑටි වගාව කරනවා. එහි ප්‍රතිලාභීන් 104යි. කාලීන ජලාශවල මත්ස්‍ය වගාව ජලාශ 625ක කරනවා. එහි ප්‍රතිලාභීන් 6,250යි. වතු ජලාශවල මත්ස්‍ය වගාව කරනවා.

වතු ජලාශ පනහක මත්ස්‍ය වගාවේ ප්‍රතිලාභීන් 500යි. විසිතුරු ජලජ පැළෑටි වගාවේ ප්‍රතිලාභීන් 30යි. විසිතුරු මත්ස්‍ය වගාවේ ප්‍රතිලාභීන් 325යි. මේ අනුව මුළු ලංකාවේම ව්‍යාපෘති 2,228ක් අපි දැන් සම්බන්ධ කරලා තිබෙනවා. ප්‍රතිලාභීන් 7,057ක් අද මේ ව්‍යාපෘති එක්ක එකතු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ඉතාමත් සතුටින් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා ඇති 2009 දී මේ රටේ ආර්ථික වර්ධනයට ධීවර කර්මාන්තය සහාය දුන්නේ සියයට 1.7කින් බව. 2010 දෙවන කාර්තුව වන කොට ඒකේ තිබුණු විශාල වෙනස කොච්චරද කියලා කිව්වොත් සියයට 18.35ක දායකත්වයක් අපි ලබා දුන්නා. අපි ලංකාවේ තුන්වැනියා වුණේ සංචාරක ව්‍යාපාරයටත්, සුළු අපනයන බෝගවලටත් විතරයි. අපි ලංකා ඉතිහාසයේ පළමුවැනි වරට තුන්වැනි තැනට ආවා. Central Bank එකෙන් ඒ දත්ත ආපු දවසේ මට බැසිල් රාජපක්ෂ මැතිතුමා කථා කරලා කිව්වා, "රාජිත, මේ ලබලා තිබෙන දියුණුව දැකලා මම මවිතයට පත් වුණා " කියලා. මම වාගේම එතුමාටත් ඒ ගැන හොඳ අවබෝධයක් තිබෙන නිසා තමයි ඉල්ලන සියලුම මුදල් ඒකට ලබා දෙන්නේ. ඒ විතරක් නොවෙයි. මම එදා කිව්වා, "මම සියයට 18.35කින් සතුටු වෙන්නේ නැහැ, ජනාධිපතිතුමාට මේ රටේ ආර්ථික වර්ධනයට සියයට 50ක දායකත්වයක් ලබලා දෙනවා." කියලා. මගෙන් සමහර කට්ටිය ඇහුවා ඕවා කරන්න පුළුවන්ද කියලා. අපි ජනාධිපතිතුමාට ජනවාරි මාසය වන කොට ආර්ථික වර්ධනය වෙනුවෙන් සියයට 24ක දායකත්වයක් ලබලා දුන්නා. තමුන්නාන්සේලාත්, අපි හැමෝමත් දන්නවා අපේ රටේ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය බැලුවොත් -එක්කෙනෙකුට තිබෙන්නේ- අවුරුද්දකට කිලෝ 11.4යි. ඒ නිසා මගේ ඉලක්කය, මගේ වැයම 2013 වන විට ඒක කිලෝ 22ක් දක්වා වැඩි කරන්නයි. ඒ සඳහා 2009 තිබුණු මෙට්‍රික් ටොන් 3,39,000ක ගණන වැඩි කරන්න ඕනෑ මෙට්‍රික් ටොන් 6,85,000කට.

අපේ ශාන්ත බණ්ඩාර මැතිතුමා කිව්වා වාගේ දරුවන්ගෙන් සියයට 21ක් මන්ද පෝෂණයෙන් පෙළෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය කියනවා 2013 අවසානය වන කොට එතුමන්ලා ඒක සියයට 12කට බස්සනවා කියලා. මම භාර ගත්තා, ඒ සියයට දොළහ බින්දුවට ගේන්න. ඇත්තටම මන්ද පෝෂණය කියන්නේ ප්‍රෝටීන් ඌනතාවයි. නැත්නම් මේදවලවත්, කාබොහයිඩ්රේට්වලවත් නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ප්‍රෝටීන් ඌනතාවයේයි ප්‍රශ්නය තිබෙන්නේ. ප්‍රෝටීන් ඌනතාව සඳහා හොඳම ප්‍රෝටීන් එක මොකක්ද? මම ඇමතිවරයා වශයෙන් වැඩ භාර ගන්න කොට ලංකාවේ මාළු පරිභෝජනය තිබුණේ සියයට 72යි. අද ප්‍රෝටීන්වලින් සියයට 85ක් ලබන්නේ මාළුවලින්. ඒ මොකද, මාළු මිල පසු ගිය කාලයේ පහත වැටීම නිසා කුකුළු මස් පරිභෝජනය සියයට 20කින් අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මේක තමයි මන්ද පෝෂණය අවසන් කරන්න අපට තිබෙන ආයුධය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන ජනාධිපතිතුමා කැඳවපු රැස්වීමකදී WHO එක, FAO එක, ADB එක, World Bank එක ඒ ඔක්කෝම ඉදිරියේ ප්‍රකාශ කළාම ඔවුන් ඉතාමත් සතුටු පත් වුණා. WHO එක මට කිව්වා, සම්පූර්ණ සහයෝගය දෙනවා කියලා. FAO එක, ADB එක ඒ සියලුම කට්ටිය කිව්වා මේ වැඩ පිළිවෙළ ගෙන යනවා නම් සම්පූර්ණ සහයෝගය දෙන්නම් කියලා. ඒ ගොල්ලන්ගෙන් ආධාර ලබා ගන්න මම ඒ ව්‍යාපෘති වාර්තා දැන් සකස් කරමින් යනවා. මේක පෝෂණ මාසය. ඊයේ අපේ සාගර දිනය; ඒ කියන්නේ හොඳ නිල්පාට සාගරයක් ලබා ගැනීමේ දිනය. ඒ සඳහා අපි ඊයේ හොඳ නිවේදන නිකුත් කළා, අපි ගත්තු ක්‍රියාමාර්ග සම්බන්ධව. හොඳ පරිසරයක්, හොඳ සාගරයක් ඇති කිරීමට අපි ගත්තු ක්‍රියාමාර්ග මොනවාද කියලා අපි නිවේදන නිකුත් කළා. විනාශකාරී පද්ධති සියල්ලම විනාශ කරලා අපි ආරම්භ කරපු ඒ වැඩ පිළිවෙළ ගැන විස්තර කළා.

2013 වන කොට අපේ ඉලක්කය මන්ද පෝෂණයෙන් තොර දරු පරම්පරාවක් ඉන්න රටක් හැදීමටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා අපේ වෙරළාසන්න මුහුද තිබෙනවා, නාවික සැතපුම් 24ක් යන කල්. වෙරළාසන්න මුහුදේ අපේ දකුණ දැන් සංතෘප්තයි. දකුණු වෙරළාසන්න මුහුදට තව බෝට්ටු ඕනෑ නැහැ. ඒ පැතිවලට ඕනෑ තරම් ප්‍රමාණවත්. නමුත් අපේ උතුර, නැඟෙනහිර අවුරුදු 30ක යුද්ධයක් තිබුණා. සරවනපවන් මන්ත්‍රීතුමනි, අපට උතුරෙන් තමයි එදා වැඩි දායකත්වයක් දුන්නේ. Your area produced 43 per cent of our national production before the insurrection in the1980s. That had reduced to 7 per cent by the time we liberated the North. සියයට 43ට තිබුණු එක 2009 මැයි මාසය වන කොට සියයට 7කට කඩා ගෙන වැටිලා තිබුණා. අපි ගිය අවුරුද්ද වන කොට සියයට 9 දක්වා සියයට 2කින් වැඩි කර ගත්තා. ඒ නිසා මම එහාට විශාල බෝට්ටු සංඛ්‍යාවක් ලබලා දුන්නා; දැල් දුන්නා; ඒ අයට මම මුදල් දුන්නා; ණය දුන්නා; නොයෙකුත් ආධාර දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මාළු පැටවු මිලියන ගණනාවක් ගෙනැල්ලා ජලාශවල බෙදා හැරියා. ඒ සියලු ගම්වල මිනිස්සු ගෙන ගිහින් ධීවර කර්මාන්තයට යොදා ගන්න, ඉරණමඩු ජලාශය මට නිදහස් කර දෙන්නය කියා මම ඉල්ලීමක් කර තිබුණා. මා බලාපොරොත්තු වෙනවා, ආරක්ෂක ලේකම්තුමාත් එක්ක සාකච්ඡා කර කොහොම හරි ඉතා ඉක්මනින් ඒක කර ගන්න. ඒ කලාප වෙන් කර දෙන්න මට පොරොන්දු වෙලා තිබෙනවා. ඒ නිසා අපට උතුර ඉතා වැදගත්. ලංකාවේ මාළු නිෂ්පාදනයෙන් සියයට පණහක් උතුරෙන් ගන්න අප බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා වරායවල් විශාල ගණනාවක් මම උතුරේ ආරම්භ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මයිලිඩ්ඩි වරාය අපට කොරියාවෙන් නිකම් හදා දෙනවා. ඊයේ ආවා නෝර්වේ රාජ්‍යයෙන්. මම උතුරේ වරායවල් හතක් නම් කර දුන්නා. ඒ ටික බලන්න ඒගොල්ලෝ අද පිටත් වුණා. ඒගොල්ලෝ භාර ගන්නා ටික කරනවාය කියා මට කිව්වා. ගුරුනගර් , ශිලාවතුරෙයි කියන වරායවල් දෙකේ වැඩකටයුතු දැන් ඩෙන්මාර්කය ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා feasibility report එක දැන් සකස් කරමින් යනවා. ගන්දර වරාය ආරම්භ කරනවා. රොනී ද මැල් මහත්මයාත් බැරිය කිව්ව ගන්දර වරාය -මීටර නවයක් ගැඹුර තිබෙන වරාය- දකුණේ හොඳම වරායක් වෙනවා. එය ආරම්භ කරන්න විශාල දැවැන්ත ක්‍රියාවලියක් අප ආරම්භ කරනවා.

ගැඹුරු මුහුද ගත්තොත්; ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය මේ වාගේ සියයට එකසිය අනූහතරකින් වැඩි කරන්න පුළුවන්. ඒ කියන්නේ තුන් ගුණයක්. ගැඹුරු මුහුදේ මත්ස්‍ය සම්පත වැඩි කරන්නට ඕනෑ. ඒක කරන්න බැහැ මේ තිබෙන බෝට්ටු සංඛ්‍යාවෙන්. ඒ සඳහා විශාල longliners කියන ඒවා ගේන්න

ඕනෑ. ඒවා ගේන්න සවුදි අරාබියත් එක්ක ගිවිසුම් ඇති කර ගන්නයි දැන් තියෙන්නේ. ඒ රටේ රජතුමාගේ දරුවා -කුමාරයා- ඇවිත් මා සමඟ සාකච්ඡා කළා. එයත් එක්ක ඉදිරියේදී අපි ඩොලර් මිලියන 300ක ගිවිසුමකට එනවා. කෝටි තුන්දාහක් අපට ලබා දෙනවා. ඒ අනුව අප ඒක පාවිච්චි කර ගැඹුරු මුහුද සහ ජාත්‍යන්තර මුහුද තරණය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒකක 25ක් සඳහා අප කටයුතු කර තිබෙනවා. තව ඒකක 25 ක් ඉදිරි කාලයේදී අප ආරම්භ කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප රට වටේ තිබෙන්නේ ඉන්දියානු සාගරය වුණත් ඒකේ සියයට 47ක් මාළු ටික අල්ලා ගෙන යන්නේ යුරෝපා සංගමයයි. ඒ ගොල්ලෝ මාත් එක්ක ගැටුණා. යුරෝපා සංගමය දැනුත් ඇවිත් කියා තිබෙනවා, 21 වන දා එනවාය කියා. අපව පරාද කරලා අපව තහනම් කරන්න හිටියා. මතක තියා ගන්න, මා ඇමති වෙනකොට අපව blacklist කරන්න තිබුණේ තව මාසයයි. තව මාසයක් පරක්කු වෙලා මා ඇමතිකමට ආවා නම් ලංකාව blacklist.. එහෙනම් මේ එකක්වත් කථා කරන්න බැහැ. රුපියල් බිලියන 21ක මාළු; මිලියන 21,000ක මාළු අපි අපනයනය කරනවා. ඒවා ඔක්කොම නවතිනවා. කර්මාන්තශාලා 32ක් වැහිලා යනවා. සේවකයෝ විතරක් ලක්ෂයකට වැඩියෙන් අතරමං වෙලා යනවා. තවත් ලක්ෂ ගණනාවක් ධීවරයෝ නැති වෙලා යනවා. මොකද, අවුරුදු ගණනාවක් ඉන්දියානු සාගර කොමිසමට අප ගිහින් තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, IUU - Illegal, Unregulated and Unreported- යටතේ අපට විරුද්ධව දැඩි චෝදනා ආවා. අපි unregulated vessels පාවිච්චි කරනවා කියලා චෝදනාවක් තිබුණා. අපි මේ රටේ නීතිවිරෝධී ආම්පන්න පාවිච්චි කරනවාය, නීතිවිරෝධී අන්දමින් මාළු අල්ලනවාය, registered නැතිව මේවා හොරෙන් කරනවාය - unregulated විධියට; වැරදි ක්‍රමයට අපි මේවා පාවිච්චි කරනවාය- වෙනත් කලාපවලට කඩා ගෙන පනිනවාය ආදී වශයෙන් අපේ රට හඳුන්වා තිබුණේ හරියට සෝමාලියාව රට වාගේයි. අවසානයේදී මා කල් ඉල්ලා ගෙන ඉන්දියානු සාගරයේ කලාප - ඒ ඇමතිවරුන්ව- වෙනම කොළඹට කැඳෙව්වා, යුරෝපා සංගමයේ මේ අභියෝගයට මුහුණ දෙන්න. මා එයට සාර්ථකව මුහුණ දී ඉන්දියානු සාගර කොමිසමේ රටවල් 28කින් රටවල් 17ක් මාත් එක්ක එක්කාසු කර ගත්තා. එහෙම කරලා ඔවුන්ගේ මුළු ප්‍රයත්නයම මා පරාජය කළා. ඔවුන් එක්කාසු කර ගෙන ආවේ මට fish quota ගේන්න. Fish quota එක කියන්නේ; ඉන්දියානු සාගරයේ මෙට්‍රික් ටොන් එක් ලක්ෂ හතළිස් දාහක් අප හඳනවා. ඒ ගොල්ලෝ ඒක මෙට්‍රික් ටොන් 369ට ගේන්න හැදුවේ. මෙට්‍රික් ටොන් 369ට නම් මට එක longliner එකක් තිබුණාම ඇති. ඉවරයි එහෙම වුණා නම්. හැබැයි මා ඒක පරාද කර ගත්තා. නමුත් ඔවුන් දැඩිව හිටියා. ඔවුන් කිව්වා, "මේ ඉන්දියානු සාගර කොමිසම යටතේ මම තව regional කොමිසමක් හදනවා"ය කියා. " එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ යුරෝපා සංගමය හදන්න තමුන්නාන්සේලාට හොඳ නම්, අපේ ආසන්න රාජ්‍යයන් එක්කාසු වෙලා මේක යටතේ තව එකක් හදන්න බැරි ඇයි "කියා මා ඇහුවා. අද යුරෝපා සංගමය මානව අයිතිය ගැන කථා කළත් මේ රටේ ඇවිත් මානව අයිතීන් උල්ලංඝනය කරමින් සියලු දෙයම කරනවා. ඔවුන් මාළු මරන හැටි, විනාශ කරන හැටි ඒ සියලුම දේවල් මා පෙන්නුවා. පරාද වෙලත් ඔවුන් ගිහින් පෙත්තුම් කරන්න උත්සාහ කර තිබෙනවා, බලපෑම් කරලා තමයි මේක ජයග්‍රහණය කළේ කියා.

මා මේ වෙලාවේදී ඉන්දියාවට ඉතාමත් ම ස්තුතිවන්ත වෙනවා. ඉන්දියානු නියෝජිතයා නැඟිට කිව්වා, "ලංකාවේ ධීවර ඇමතිවරයාගේ සෙවනැල්ල වාගේ මා හිට ගෙන මේක ක්‍රියාත්මක කරනවා" ය කියා. ඔවුන් මාව සභාපති ධුරයට පත්කර ගෙන මේ ක්‍රියා මාර්ගය ගත්තා. මේ අවස්ථාවේදී මා සිහිපත් කරන්නට ඕනෑ, ආචාර්ය හිරාන් ජයවර්ධන මැතිතුමාව; NARA එකේ සභාපති. මේ සම්බන්ධයෙන් විශාල දැනුමක් තිබෙන එතුමා තමයි මට උදව් කළේ. එතුමා තමයි IOMAC එකේ සභාපති. ඒ වාගේම අනෙක් සියලුම නිලධාරීන් මට උදව් කළා. විශාල කඩුල්ලක් අප පැන්නා. එම නිසා යි ඇමතිවරයා හැටියට මා කියන්නේ, කරුණාකර තහනම් දැල් ආම්පන්න, ක්‍රම පාවිච්චි කරන්න ඉල්ලන්න එපා කියා. මේ යුද්ධය මට තිබෙන්නේ ලංකාවේ නොවෙයි; පිට රටයි. ජාත්‍යන්තරව තිබෙන ප්‍රශ්නය තමුන්නාන්සේලා අවබෝධ කර ගන්න. මේවාට චණ්ඩි පාට් කථා කර හරියන්නේ නැහැ. වේදිකාවල කයිවාරු ගැහුවාට ජාත්‍යන්තර ප්‍රජාවගේ මේ ප්‍රශ්නය අපට විසඳා ගන්නට බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට මොළය පාවිච්චි කරලා අපි බුද්ධිමත් අන්දමින් ප්‍රවිෂ්ට වෙන්න ඕනෑ. ඒ වාගේම මේවා ඇතුළේ තිබෙන ප්‍රශ්න ගැන සුන්දර විධියට කථා කරලා, ඡන්ද ගන්න ක්‍රමයට කථා කරලා මේවායින් ගැලවෙන්න අපට බැහැ. ධීවර කර්මාන්තයට අදාළ ආම්පන්න IUU කියන category එකෙන් අපි දිගටම ඉවත් වුණා කියලා යාත්‍රා 13ක ලැයිස්තු ඒ අය මට ඉදිරිපත් කළා. ඒ දහතුනේම licences මම cancel කළා. ඒ රටවලට ගිහිල්ලා අහු වෙලා ඒ අයට දඩ ගැහුවා. ඒ ගොල්ලෝ මාව හම්බ වුණා. "කරන්න දෙයක් නැහැ" කියලා මම කිව්වා. “මම ඔබලාගේ යාත්‍රා 13 ආරක්ෂා කරන්න ගියොත් ලංකාව blacklist වෙනවා, එතකොට යුරෝපා සංගමය අපේ අපනයන සම්පූර්ණයෙන්ම නවත්වනවා” කියලා මම කිව්වා.

මම එංගලන්තයට ගිහිල්ලා Bell Pottinger කියන ආයතනයත් එක්ක කතා කළා ඔවුන්ගේ ආධාරයෙන් අපේ සියලුම මත්ස්‍ය සම්පත ලබා දෙන්න; Marks & Spencer, Tesco, Sainsbury's, England Sea fish, European Fish කියන සියලුම දැවැන්ත ව්‍යාපාරිකයනුත් සමඟ සාකච්ඡා කළා. මට හිනා වෙලායි ඔවුන් වාඩි වුණේ. “We have a lot of things in our bag for you” කියලා තමයි සාකච්ඡාව ආරම්භ කළේ. මගේ කථාව අවසන් වුණාට පස්සේ මම අන්තිමට ඇහුවා, “Is there anything left in your bags for me?” කියලා. එතකොට කිව්වා, “No, excellent.” -"ඉතාමත් අනර්ඝයි"- කියලා. එහෙම කියලා ඔවුන් මට පොරොන්දු වෙලා තිබෙනවා. ඒ අනුව දැන් ඒ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ජාත්‍යන්තර සංවිධානයක් මඟින් අපේ ධීවර කර්මාන්තය ජාත්‍යන්තර ප්‍රමිතියේ ධීවර කර්මාන්තයක් බවට පත් කරලා ජාත්‍යන්තර Marine Certificate එක ගැනීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒකේ pre-assessment වැඩ පිළිවෙළ දැන් අපි ආරම්භ කර තිබෙනවා. ඒක අවසන් වුණාට පස්සේ ඒ assessment එක කරනවා. ඒකෙන් පස්සේ ඒ ගොල්ලෝ මට එක දෙයක් පොරොන්දු වුණා. අවසානයේ ඩේල් හාර්නි කියන දැවැන්ත ව්‍යාපාරිකයා සියලුම අය වෙනුවෙන් ප්‍රසිද්ධියේ කිව්වා, "අපට මේක ඉවර කරලා දෙන්න. අපට මාළුවල මිල ප්‍රශ්නයක් නැහැ. මතක තියා ගන්න Minister, ඊට පස්සේ අපි සියයට 100ක්ම මාළු ගන්නේ ලංකාවෙන්" කියලා. "ඔබතුමන්ලා දෙන ප්‍රමාණය අරගෙන balance එක තමයි ආසියාවේ අනෙක් රටවලින් ගන්නේ" කියලා කිව්වා. ඒ අනුව තමයි අපි දැන් වැඩ කරගෙන යන්නේ. ඒ නිසා අපට විශාල අභියෝගයක් තිබෙනවා. ඒ අභියෝගයට අනුව අපි වැඩ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ලේකම්තුමිය, අධ්‍යක්ෂ ජනරාල්වරු ඇතුළු පිට පළාත්වල සිටින අපේ අය දැනුවත් කරලා, බොහොම මහන්සි වෙලා, දුක් විඳලා මේ තත්ත්වයෙන් ගොඩ ගන්න කැපවීමකින් යුතුව අපි විශාල වැඩ කොටසක් කරගෙන යනවා. මොකද, අපේ රට වාගේ අට ගුණයක් අපට මුහුද තිබෙනවා. විසිතුන් ගුණයක සාගර බිම් සම්පත අපි DEOCOM Project එකෙන් ඉල්ලනවා. වර්තමාන ජනාධිපතිතුමාගේ කාලයේදීම ඉතා ඉක්මනින් ඒ විසිතුන් ගුණයක සාගර බිම් සම්පත අපට ලබා ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයත් එක්ක මම සාකච්ඡා කරලායි තිබෙන්නේ. ඒක හම්බ වුණොත් අපට

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

petroleum, ඛනිජ ද්‍රව්‍ය ආදී මුහුදු සම්පතේ තිබෙන සියලුම සම්පත් විසිතුන් ගුණයක් අපට ලැබෙනවා. [බාධා කිරීමක්] ඔව්, ඒක මම පසු කාලීනව කියන්නයි හිටියේ. තමුන්නාන්සේලා දැන ගන්න ඕනෑ, සෞදි අරාබියේ ඒ වැඩ පිළිවෙළේ දී ඇමරිකානු ඩොලර් මිලියන 300 ගෙනැල්ලා අපත් සමඟ ආයෝජනය කළාම එයින් ලැබෙන ලාභයෙන් සියයට 25ක් වෙන් කළා මට ඕනෑම තීන්දුවක් ගන්නය කියලා. මම කිව්වා, "මට සල්ලි එපා, ඒ මුදල් ධීවර ප්‍රජාවගේ සුභසාධනයට දෙන්න" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක් කියන්නේ රුපියල් කෝටි 3,000ක්. රුපියල් කෝටි 3,000කින් තුනෙන් එකක් ලාභය ආවත් රුපියල් කෝටි 1,000ක් තිබෙනවා. ලාභයෙන් සියයට 25ක් කියන්නේ රුපියල් කෝටි 250ක්. ධීවර ප්‍රජාවගේ සුභසාධනය වෙනුවෙන් ඒ සම්පූර්ණ මුදලට මම ව්‍යවස්ථාව හැදුවා. දැනට අපි රුපියල් 750ක සොච්චම් මුදලකින් රුපියල් ලක්ෂ 3ක් දක්වා රක්ෂණය කරන්න ධීවර රක්ෂණ වැඩ පිළිවෙළ ආරම්භ කරලා තිබෙනවා. අතුරුදහන් වුණොත්, මිය ගියොත්, ඒ විතරක් නොවෙයි ණයක් අරගෙන මිය ගියොත් ඒ ණයත් ගෙවලා, වන්දියත් ගෙවලා සියල්ලම ගෙවන්න පුළුවන් රක්ෂණයක්. ඒ එක්කම රුපියල් 10,000ක pension එකක්. මගේ pension වැඩ පිළිවෙළ අද මම ඉදිරිපත් කරන කොට හැමෝම අත්පුඩි ගැහුවා. හැම කොනාටම රුපියල් 10,000ක pension එකක්, ඒ වාගේම තමන්ගේ පවුලේ අයට ස්වං රැකියාවක්, ඒ වාගේම ජනාධිපතිතුමා ආරම්භ කළ ධීවර නිවාස වැඩසටහන, ඒ සියල්ලම තව මාස ගණනාවකින් මම ආරම්භ කරනවා. එම ගිවිසුම අත්සන් කිරීම සඳහා කැබිනට් මණ්ඩලය ඊයේ මට අනුමැතිය ලබා දුන්නා.

1960 ගණන්වල ධීවර සංස්ථාව ආරම්භ කළ කාර්මික ආඥාපනත යටතේ බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීමේ හැකියාවක් කොහෙත්ම නැහැ. මම ඉදි කිරීම් භාර අමාත්‍යවරයා වශයෙන් සිටියදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවටත් ඒ වාගේ සංශෝධන ගෙනැල්ලා තමයි ඉදි කිරීම් කර්මාන්තය පිට රටට අරගෙන ගියේ. ඒ නිසා ඉදිරියේදී ඒ සංශෝධනය මම පාර්ලිමේන්තුවට ගේනවා. ඒ සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා. ඒ සමඟම මේ වෙන කොට මාස 4ක් ඇතුළත මගේ ධීවර සම්මේලනයට 75,000කට වැඩි පිරිසක් බැඳිලා ඉන්නවා. මම සතුටුයි කියන්න, උතුරු නැඟෙනහිර ප්‍රදේශවලින් තමයි එහි වැඩිම සාමාජිකත්වය අරගෙන තිබෙන්නේ කියලා.

In Batticaloa, I have over 9,000 members; in the Jaffna District, I have over 8,000 members and in the Mannar District, I have over 4,000 members. It is the same with Batticaloa and Kalmunai. If you take the first six districts, there is only one district from the South - that is Puttalam. All other districts are from the North and the East. Actually, that shows the confidence the fishermen have in us and in our progamme. Even yesterday, my Friend, the Hon. Selvam Adaikkalanathan, Member of Parliament, brought 200 odd people from Waikkal. The first thing they wanted was to join my Organization.

අද අපි ඒ ධීවර ජනතාවත් එක්ක, ඒ අහිංසක, දුප්පත් මිනිස්සුත් එක්ක රටත් හදලා, ධීවර කාර්මිකයාවත් නඟා සිටුවලා 2013 වසර අවසන් වෙන කොට ලංකාවේ ධීවර කර්මාන්තය ලෝකයේ දියුණු රටක ධීවර කර්මාන්තයක් බවට පත් කරන්නට සැලසුම් කරලා තිබෙනවා.

මට මේ විවාදයට අවස්ථාව ලබා දීම ගැන ගරු වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා. එතුමා හුඟාක් වෙලාවට මාත් එක්ක කථා කරනවා. එතුමාට බොහොම හොඳ ප්‍රායෝගික අවබෝධයක් තිබෙනවා. එතුමාත් එක්ක මම ඕනෑම වෙලාවක කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත්, ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාටත් -සියලු දෙනාටත්- ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.58 ට, 2011 ජුනි 10 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.58 மணிக்கு பாராளுமன்றம், 2011 யூன் 10, வெள்ளிக்கிழமை பி. ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.58 p.m. until 1.30 p.m. on Friday, 10th June, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.